# දණ්ඩ නීති සංග්‍රහය

## 19 වෙනි අධිකාරය

1991 අංක 32

1995 අංක 22

1998 අංක 29

2002 අංක 12

2006 අංක 16

දරන සංශෝධන සහිත

2016 මුද්‍රණය (සංශෝධිත)



https://ezofz.web.lk/
Scanned with CamScanner

1973 මුද්‍රණය
1979 මුද්‍රණය
1984 මුද්‍රණය
1990 මුද්‍රණය
1993 මුද්‍රණය
2000 මුද්‍රණය
2002 මුද්‍රණය
2007 මුද්‍රණය
2008 මුද්‍රණය
2010 මුද්‍රණය
2011 මුද්‍රණය
2012 මුද්‍රණය
2013 මුද්‍රණය
2015 මුද්‍රණය (සංශෝධිත)
2016 මුද්‍රණය (සංශෝධිත)

H 048041 – 2,000 (2016/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

https://ezofz.web.lk/
Scanned with CamScanner

# 19 වෙනි අධිකාරය

## දණ්ඩ නීති සංග්‍රහය

**දිවයින සඳහා සාමාන්‍ය දණ්ඩ නීති සංග්‍රහයක් සැපයීම පිණිස පැන වූ ආඥාපනතකි**

## I වෙනි පරිච්ඡේදය

**1.** මේ ආඥාපනත දණ්ඩ නීති සංග්‍රහය යයි හැඳින්විය හැකි ය. මින් පසු එය මෙහි සාමාන්‍යයෙන් සඳහන් කෙරෙන්නේ "මේ සංග්‍රහය" යනුවෙනි. — ලුහුඬු නාමය.

**2.** මේ සංග්‍රහයෙහි විධිවිධානවලට පටහැණි වූ සියලු ම ක්‍රියා හෝ නො කර හැරීම් සම්බන්ධයෙන් දිවයින තුළ වැරදිකාරයා වන්නා වූ සෑම තැනැත්තකු අන් ලෙසකින් නො ව, මේ සංග්‍රහය යටතේ පමුණුවන ලබන දඬුවම්වලට යටත් විය යුතු ය. — දිවයින තුළ කරනු ලැබූ වරද වලට දඬුවම් ලැබිය යුතු බව.

**3.** "එක්සත් පළාත්වල අපරාධ නීතිය" හෝ "රෝම ලන්දේසි නීතිය" යනුවෙන් හැඳින්වෙමින් මෙතෙක් මේ දිවයිනෙහි ක්‍රියාවේ යෙද වූ අපරාධ නීතියෙහි හැම ප්‍රමාණයක් ම මෙයින් අවලංගු කරනු ලැබේ. — රෝම-ලන්දේසි අපරාධ නීතිය අවලංගු කිරීම.

**4.** විශේෂ හෝ ප්‍රදේශික නීතියක විධිවිධාන කිසිවක් අවලංගු කිරීමට, වෙනස් කිරීමට අත් හිටවීමට හෝ ඒ කිසිවක් කෙරෙහි බල පැවැත්වීමට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට අපහාස කිරීමේ චෝදනාවලට වැරදි කරුවන් වූ තැනැත්තන් හට ද, තමන්ගේ වෘත්තියෙහි යෙදී සිටීමෙහි දී අනිසි හැසිරීමේ චෝදනාවලට වැරදිකරුවන් වූ අධිනීතිඥයන්හට හා නීතිඥයන්හට ද ලුහුඬින් දඬුවම් කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය හෝ එහි විනිශ්චයකාරයකු වෙත මෙතෙක් තිබුණු බලය කෙරෙහි බල පැවැත්වීමට මේ සංග්‍රහයෙහි කිසිවකින් අදහස් කරනු නො ලැබේ. — ඇතැම් නීති කෙරෙහි බල පැවැත්වීමක් නැති බව.

## II වෙනි පරිච්ඡේදය

### සාමාන්‍ය පැහැදිලි කිරීම

**5.** මේ සංග්‍රහය පුරා ම වරදක සෑම විස්තර කිරීමක් ද, සෑම දණ්ඩන විධිවිධානයක් ද, එබඳු සෑම විස්තර කිරීමක හෝ දණ්ඩන විධිවිධානයක සෑම නිදර්ශනයක් ද, එකී විස්තර කිරීමෙහි හෝ දණ්ඩ විධිවිධානයෙහි හෝ නිදර්ශනයෙහි නැවත නැවතත් සඳහන් — විස්තර කිරීම් ව්‍යතිරේක වලට යටත්ව තේරුම් ගත යුතු බව.



https://ezofz.web.lk/
Scanned with CamScanner

කොට නොමැති වුව ද, "සාමාන්‍ය ව්‍යතිරේක" යන ශීර්ෂයෙන IV වෙනි පරිච්ඡේදයෙහි ඇතුළත් ව්‍යතිරේකවලට යටත් ව, තේරුම් ගත යුතු ය.

**නිදර්ශන**

(අ) මේ සංග්‍රහයේ වරදවල විස්තර කිරීම ඇතුළත් වගන්තිවලින් වයස අවුරුදු අටකට අඩු ළමයකු විසින් එ බඳු වැරදි කිරීමට නො හැකි බව ප්‍රකාශ නො වේ. එහෙත්, වයස අවුරුදු අටකට අඩු ළමයකු විසින් කරනු ලැබූ කිසිවක් වරදක් නො විය යුතු බව දක්වන සාමාන්‍ය ව්‍යතිරේකයට යටත් ව, එකී විස්තර කිරීම තේරුම් ගත යුතු ය.

(ආ) පොලිස් නිලධාරියකු වූ "ඒ" මිනීමැරුමක් කළ "ඉසෙඩ්" වරෙන්තුවක් නොමැති ව අත් අඩංගුවට ගනියි. ඉසෙඩ් අත් අඩංගුවට ගැනීමට ඔහු නීතියෙන් බැඳී සිටි බැවින් අයුතු ලෙස සිර කර තැබීමෙහි වරදට මෙහි දී ඔහු වරද කාරයෙක් නො වේ. ඒ නිසා "යමක් කිරීමට නීතියෙන් බැඳී ඇති තැනැත්තකු කරන ලද කිසිවක් වරදක් නො වේ." යනු සලස්වන සාමාන්‍ය ව්‍යතිරේකයට මේ සිද්ධිය ඇතුළත් වේ.

වරක් පැහැදිලි කරනු ලැබූ පාඨය සංග්‍රහය පුරා එම අර්ථයෙන් ම යෙදේ.

**6.** මේ සංග්‍රහයෙන් යම් කොටසක පැහැදිලි කර දෙනු ලැබූ සෑම පාඨයක් ම ඒ පැහැදිලි කිරීමට සමානත්වයෙන් යුතු ව මේ සංග්‍රහයෙහි සෑම කොටසක ම යෙදේ.

ලිංගය.

**7.** "ඔහු" යන සර්වනාමය හා එහි ප්‍රභේද පුරුෂයකු හෝ ස්ත්‍රියක වූ කවර තැනැත්තකුට වුව ද යොදනු ලැබේ.

සංඛ්‍යාව.

**8.** පද සංසන්දනයෙන් විරුද්ධ අර්ථයක් නො පෙනෙතොත් මිස, ඒක වචනය අඟවන වචනවලට බහු වචනය ද ඇතුළත් වෙයි. එසේ ම, බහු වචනය අඟවන වචනවලට ඒක වචනය ද ඇතුළත් වෙයි.

"මිනිසා" "ගැහැණිය".

**9.** "මිනිසා" යන වචනයෙන් කවර වයසක වුව ද පුරුෂයකු දැක්වේ. "ගැහැණිය" යන වචනයෙන් කවර වයසක වුව ද ස්ත්‍රියක දැක්වේ.

"තැනැත්තා".

**10.** "තැනැත්තා" යන වචනයෙහි නීති ගත කළ හෝ නො කළ සමාගමක් හෝ සමිතියක් හෝ තැනැත්තන් මණ්ඩලයක් ඇතුළත් වෙයි.

"මහජනයා".

**11.** "මහජනයා" යන වචනයෙහි මහජනයාගේ යම් පංක්තියක් හෝ යම් ජනතාවක් ඇතුළත් වෙයි.

"රජතුමා".

**12.** "රජතුමා" යන වචනයේ මහා බ්‍රිතාන්‍යයේ හා උතුරු අයර්ලන්තයේ එක්සත් රාජධානියෙහි තත් කාලයෙහි අධිපති රජකම දරන්නකු දැක් වේ.

"රජතුමා ගේ සේවකයා".

**13.** "රජතුමාගේ සේවකයා" යන වචනවලින් අධිරාජ්‍ය ආණ්ඩුව විසින් හෝ යටතේ හෝ මේ දිවයිනෙහි ආණ්ඩුව විසින් හෝ යටතේ මේ දිවයිනෙහි සේවයෙහි යොදනු ලැබූ සියලු නිලධාරීන් හෝ සේවකයන් දැක් වේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

14. විස්තරාත්මක හෝ වර්ණනාත්මක වචනාවලින්, නැතහොත් පද සංසන්දනයෙන් වෙනත් අර්ථයක් නො දැක්වුනු විටක "ආණ්ඩුව" යන වචනයෙන් ද "ලංකාණ්ඩුව" හෝ "ලංකාවේ ආණ්ඩුව" යන යෙදුම්වලින් ද 1946 හා 1947 (ආණ්ඩුක්‍රම හා නිදහස්) රාජ සභා ආඥාවලින් පිහිටුවනු ලැබූ ලංකාවෙහි මහ රජතුමාණන්ගේ ආණ්ඩුව අදහස් විය යුතු ය. "ආණ්ඩුව".

15. "මේ දිවයින" හා "ලංකාව" යන වචනවලින් වෙන වෙනම ලංකාද්වීපය දැක්වේ. "මේ දිවයින" "ලංකාව".

16. "අග්‍රාණ්ඩුකාරතුමා" යන වචනයෙන් අග්‍රාණ්ඩුකාරතුමා සහ දිවයිනේ ප්‍රධාන අණ දෙන නිලධාරි තුමා දැක් වේ. තව ද, තත්කාලයෙහි ආණ්ඩුව පාලනය කරන නිලධාරියා ද අග්‍රාණ්ඩුකාරතුමා වෙනුවට පත් කරනු ලැබ, වැඩ බැලීමට බලය ලැබී ඇති ප්‍රමාණයට නියෝජ්‍ය අග්‍රාණ්ඩුකාරතුමෙක් ද එහි ඇතුළත් ය. "අග්‍රාණ්ඩුකාරතුමා".

17. "විනිශ්චයකරු" යන වචනයෙන් විනිශ්චයකරුවකු වශයෙන් නිලයෙන් ම නම් කරන ලැබූ සෑම තැනැත්තකු පමණක් නො ව, සිවිල් හෝ අපරාධ නීති කෘත්‍යයක දී තීරණාත්මක විනිශ්චයක් හෝ ආයාචනා නොකළහොත් තීරණාත්මක වන විනිශ්චයක් හෝ වෙනත් බලධරයකු විසින් ස්ථිර කරනු ලැබුවහොත් තීරණාත්මක වන විනිශ්චයක් දීමට නීතියෙන් බලය ලත් සෑම තැනැත්තකු හෝ එබඳු විනිශ්චයක් දීමට නීතියෙන් බලය ලත් තැනැත්තන්ගේ මණ්ඩලයක කෙනකු ද දැක් වේ. "විනිශ්චයකරු".

**නිදර්ශන**

(අ) දඩයක් ගැසීමට හෝ බන්ධනාගාරගත කිරීමට තමාට බලය ඇති චෝදනාවක් සම්බන්ධයෙන් අධිකරණ බලය පාවිච්චි කරන සුලු අපරාධ විනිශ්චය කරුවෙක් විනිශ්චයකරුවෙකි.

(ආ) ගම්සභා අධිකරණයක විනිශ්චයකරුවෙක් හා එහි එක් එක් උපදේශකයෙක් ගම්සභා ආඥාපනත යටතේ අධිකරණ බලය පාවිච්චි කරන විට, විනිශ්චය කරුවෙකි.

(ඇ) ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයක දී ජූරි සභික බලය පාවිච්චි කරන විට ප්‍රාදේශික ලේකම් කෙනෙක් හෝ සහකාර ප්‍රාදේශික ලේකම් කෙනෙක් විනිශ්චයකරුවෙකි.

(ඈ) ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයක දී ජූරි සභිකයෙක් විනිශ්චයකරුවෙකි.

(ඉ) චෝදනාවක් සම්බන්ධයෙන් වෙනත් අධිකරණයක විභාග කරනු ලැබීම සඳහා ඉදිරිපත් කිරීමට පමණක් බලය ඇති අධිකරණ බලය පාවිච්චි කරන සුලු අපරාධ විනිශ්චයකරුවෙක්, විනිශ්චයකරුවෙක් නොවේ. එහෙත්, සාමදානය පැවැත්වීම හෝ යහපත් හැසිරීම සඳහා ඇප තබන ලෙස යම් තැනැත්තන්ගෙන් ඉල්වා සිටීමේ දී අධිකරණ බලය පාවිච්චි කරන විට, සුලු අපරාධ විනිශ්චය කරුවෙක් විනිශ්චයකරුවෙකි.

18. "අධිකරණය" යන වචනයෙන්, අධිකරණාත්මක ව තනි ව ක්‍රියා කිරීමට නීතියෙන් බලය දෙනු ලැබූ විනිශ්චය කරුවකු හෝ අධිකරණය පිළිබඳ ව ක්‍රියා කිරීමට මණ්ඩලයක් වශයෙන් බලය දෙනු ලැබූ විනිශ්චයකාර මණ්ඩලයක් එසේ අධිකරණාත්මක ව ක්‍රියා කිරීමේ දී දැක් වේ. "අධිකරණය".



https://ezofz.web.lk/
Scanned with CamScanner

"ජන්ද විමසීම". 18අ. "ජන්ද විමසීම" යන වචනයෙන් යම් ආඥාපනතක හෝ පාර්ලිමේන්තු පනතක හෝ, ප්‍රකාශිත ලෙස හෝ සැබැවින් ම හැඟවෙන ලෙස ලංකාද්වීපයට පැතිරෙන යම් අධිරාජ්‍ය ව්‍යවස්ථාවක හෝ රාජ්‍යසභාවේ රජතුමාගේ ආඥාවක හෝ ඒ යටතේ පැනවුණු ව්‍යවස්ථා හෝ නියෝගයන්හි බලය ප්‍රකාර හෝ යටතේ කවර කාර්යයක් සඳහා වුව ද, පවත්වනු ලැබූ ජන්ද විමසීමක් දැක්වේ.

"රජයේ සේවකයා." 19. "රජයේ සේවකයා" යන වචනවලින් මෙහි පහත දැක්වෙන යම් විස්තරයකට වැටෙන තැනැත්තකු දැක්වේ. එනම් :-

**පළමු වනු ව.**–රජතුමා විසින් හෝ රජතුමන්ගේ බලය යටතේ ප්‍රදානය කරනු ලැබූ යම් කොමිසමක හෝ බලපත්‍රයක බලය පරිදි ලංකාවෙහි යම් නිලයක් දරන සෑම තැනැත්තකු ;

**දෙ වනු ව.**–ලංකා සිවිල් සේවයේ සෑම සාමාජිකයකු ;

**තෙ වනු ව.**–රජතුමාගේ නාවුක, යුද්ධ හෝ ගගන හමුදාවන්හි කොමිෂන් බලයකින් පත් කරනු ලැබූ සෑම නිලධාරියකු ලංකාවේ සේවය කරන කාලය තුළ ;

**හතර වනු ව.**–සෑම විනිශ්චයකරුවකු ;

**පස් වනු ව.**–නීතිය හෝ සිද්ධිය පිළිබඳ, යම් කරුණක් ගැන පරීක්ෂා කිරීම හෝ වාර්තා කිරීම හෝ යම් ලේඛනයක් සෑදීම, සත්‍ය බව ප්‍රකාශ කිරීම හෝ තබා ගැනීම හෝ යම් දේපළක් භාර ගැනීම හෝ අලෙවි කිරීම හෝ යම් අධිකරණමය විධානයක් ඉෂ්ට කිරීම හෝ යම් දිව්රුමක් දිව්රවීම හෝ පරිවර්තනය කරදීම හෝ අධිකරණයේ සාමය පැවැත්වීම නිලයෙන් සිය යුතුකම වූ අධිකරණයක සෑම නිලධරයකු හා එ බඳු යුතුකමක් ඉෂ්ට කිරීමට විශේෂයෙන් ම අධිකරණයකින් බලය දෙනු ලැබූ සෑම තැනැත්තකු ;

**හය වනු ව.**–අධිකරණයකට හෝ රජයේ සේවකයකුට සහාය වන සෑම ජූරි සභිකයකු, විනිශ්චය සහායකයකු හෝ ගම් සභා අධිකරණයක උපදේශකයකු ;

**හත් වනු ව.**–යම් අධිකරණයක් විසින් හෝ වෙනත් සුදුසු මහජන බල මණ්ඩලයක් විසින් තීරණය සඳහා හෝ වාර්තා කිරීම සඳහා යම් නඩුවක් හෝ කරුණක් සමථකරුවකු වෙත හෝ වෙනත් තැනැත්තකු වෙත යොමු කරනු ලැබූ විට, එ බඳු සෑම සමථකරුවකු හෝ වෙනත් තැනැත්තකු ;

**අට වනු ව.**–සිය ධුරයේ බලය පරිදි යම් තැනැත්තකු සිර භාරයට ගැනීමට හෝ සිරභාරයේ තැබීමට බලය ලත් ධුරයක් දරන සෑම තැනැත්තකු ;

**නව වනු ව.**–වරද වැළැක්වීම හෝ වරදකරුවන් හට නීති මඟින් කටයුතු කිරීම සඳහා වරද දැනුම් දීම හෝ මහජන සෞඛ්‍යය, ප්‍රවේසම හෝ පහසුව ආරක්ෂා කිරීම නිලධාරියකු වශයෙන් සිය යුතුකම වූ ආණ්ඩුවේ සෑම නිලධාරියකු ;



https://ezofz.web.lk/
Scanned with CamScanner

**දස වනු ව.**–ආණ්ඩුව වෙනුවෙන් යම් දේපළක් ගැනීම, ලබා ගැනීම. තබා ගැනීම හෝ වැය කිරීම හෝ ආණ්ඩුව වෙනුවෙන් යම් මැනීමක්, තක්සේරුවක් හෝ ගිවිසුමක් ඇති කිරීම හෝ ආණ්ඩුවේ මුදල් සම්බන්ධතා පිළිබඳව යම් කරුණක් විභාග කිරීම හෝ එය ගැන වාර්තා කිරීම හෝ ආණ්ඩුවේ මුදල් සම්බන්ධතා පිළිබඳ ව යම් ලේඛනයක් සෑදීම, සත්‍ය බව කියා සිටීම හෝ තබා ගැනීම හෝ ආණ්ඩුවේ මුදල් සම්බන්ධතා ආරක්ෂා කර ගැනීම සඳහා පැනවුණු යම් නීතියක් කඩ කරනු වැළැක්වීම, නිලධරයකු වශයෙන් තම යුතුකම වූ සෑම නිලධාරියකු හා මහජන යුතුකමක් ඉෂ්ට කිරීම සඳහා ආණ්ඩුවේ සේවයෙහි සිටින හෝ ආණ්ඩුවෙන් පඩි ලබන හෝ ගාස්තුවලින් හෝ කොමිස් වලින් ගෙවනු ලබන සෑම නිලධාරියකු ;

**එකොලොස් වනු ව.**–යම් දේපළක් ගැනීම, ලබා ගැනීම, තබා ගැනීම හෝ වැය කිරීම හෝ මැනුමක් හෝ තක්සේරුවක් කිරීම හෝ යම් ගමක, නගරයක හෝ ප්‍රදේශයක ආගමික නොවන පොදු කාර්‍යයක් සඳහා අය බදු හෝ වරිපනම් පැනවීම හෝ යම් ගමක, නගරයක හෝ ප්‍රදේශයක ජනයින්ගේ අයිතිවාසිකම් නිශ්චය කර ගැනීම සඳහා ලේඛනයක් සෑදීම, සත්‍ය බව කියා සිටීම හෝ තබා ගැනීම නිලධාරියකු වශයෙන් තම යුතුකම වූ සෑම නිලධාරියකු ;

**දොළොස් වනු ව.**–ඡන්දදායක නාම ලේඛනයක් පිළියෙල කිරීමට, ප්‍රසිද්ධ කිරීමට, පවත්වා ගෙන යාමට හෝ සංශෝධන කිරීමට හෝ ඡන්ද විමසීමක් හෝ ඡන්ද විමසීමක කොටසක් පැවැත්වීමට බලය ලැබූ සෑම තැනැත්තකු.

**නිදර්ශන**

මහ නගර සභා පරීක්ෂකයෙක් රජයේ සේවකයෙකි.

මංමාවත් ආඥාපනත යටතේ කොට්ඨාශ නිලධාරියෙක් රජයේ සේවකයෙකි.

නියෝජ්‍ය පිස්කල් කෙනෙක් රජයේ සේවකයෙකි.

පොලිස් විදානේ කෙනෙක් රජයේ සේවකයෙකි.

**පැහැදිලි කිරීම 1.**–ආණ්ඩුව විසින් පත් කරනු ලැබුව ද, නො ලැබුව ද, ඉහත දැක්වෙන යම් වර්ණනාවකට වැටෙන තැනැත්තෝ රජයේ සේවකයෝ වෙති.

**පැහැදිලි කිරීම 2.** –"රජයේ සේවකයා" යන වචන සඳහන් වන සෑම තැනකදී ම, තිලය දැරීමට තමාගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් නීතියෙන් කවර දෝෂයක් ඇත ද රජයේ සේවක පදවියක් ඇත්ත වශයෙන් දරා සිටින සෑම තැනැත්තකු ම අදහස් වන ලෙස වටහා ගත යුතු ය.

**20.** "චංචල දේපළ" යන වචනවල ඉඩම් සහ පොළවට සම්බන්ධ වූ දේ හෝ පොළවට සම්බන්ධ වූ යමකට ස්ථිර ලෙස සවි කරනු ලැබූ දේ හැර සෑම අන්දමක ම ද්‍රව්‍යමය දේපළ ඇතුළත් ලෙස අදහස් කරනු ලැබේ. "චංචල දේපළ".



https://ezofz.web.lk/
Scanned with CamScanner

"අයුතු ලාභය".

**21.** ලබා ගන්නා තැනැත්තාට නීත්‍යනුකූල ව හිමි නැති දේපළක් නීති විරෝධි මාර්ගවලින් ලබා ගැනීම "අයුතු ලාභය" වෙයි.

"අයුතු අලාභය".

(2) අලාභය විඳින තැනැත්තාට නීත්‍යනුකූල ව හිමි වූ දේපළක් නීති විරෝධි මාර්ගවලින් නැති වීම "අයුතු අලාභය" වෙයි.

"අයුතු අලාභයට දේපල අයුතු ලෙස ලඟ තබාගැනීම ද ඇතුළත් ය."

(3) යම් තැනැත්තකු අයුතු ලෙස තබා ගන්නා විට මෙන්ම, අයුතු ලෙස ළඟ තබා ගන්නා විට ද, ඔහු අයුතු ලාභයක් ලබා ගන්නා ලෙස සලකනු ලැබේ.

"අයුතු අලාභයට" දේපළ භුක්ති විඳීමට අයුතු ලෙස ඉඩ නොදීම ද ඇතුළත් ය.

(4) යම් තැනැත්තකුගේ දේපළ අයුතු ලෙස පැහැර ගන්නා විට මෙන් ම ඔහුගේ දේපළ භුක්ති විඳීමට අයුතු ලෙස ඉඩ නො දෙන විට ද ඔහුට අයුතු අලාභයක් වූ ලෙස සලකනු ලැබේ.

"වංකලෙස".

**22.** එක් තැනැත්තකුට අයුතු අලාභයක් හෝ වෙනත් තැනැත්තකුට අයුතු අලාභයක් කරවන අදහසින් කිසිවකු කිසිවක් කලහොත් එය "වංකලෙස" කරන ලද්දක් ලෙස සලකනු ලැබේ.

"වංචක ලෙස."

**23.** යමකු අන් ලෙසකින් නො ව, වංචා කිරීමේ අදහසින් යමක් කරතොත් එය "වංචක ලෙස" කරන ලෙස සලකනු ලැබේ.

"විශ්වාස කිරීමට කරුණු" ඇති බව.

**24.** අන් ලෙසකින් නොව, යම් දෙයක් විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතු ඇති නම් කෙනකුට "විශ්වාස කිරීමට කරුණු ඇති" බව සලකනු ලැබේ.

භාර්‍යාවගේ හෝ ලිපිකරුගේ හෝ සේවකයාගේ ස්වාමිත්වයෙහි තිබෙන දේපළ.

**25.** යම් තැනැත්තකුගේ දේපළක් ඔහු ගණනේ ඔහුගේ භාර්‍යාවගේ, ලිපිකරුගේ හෝ සේවකයාගේ ස්වාමිත්වයෙහි තිබේ නම්, මේ සංග්‍රහයෙහි දී ඇති අර්ථය ඇතුළත එය එකී තැනැත්තාගේ ස්වාමිත්වයෙහි තිබෙන්නකි.

**පැහැදිලි කිරීම.**–ලිපිකරුවකු ලෙස හෝ සේවකයකු ලෙස තාවකාලික ව හෝ විශේෂ අවස්ථාවක දී සේවයට ගනු ලැබූ තැනැත්තෙක් මේ වගන්තියෙහි දී ඇති අර්ථය ඇතුළත ලිපිකරුවෙක් හෝ සේවකයෙක් වෙයි.

"කූට ලෙස තැනීම."

**26.** එක් දෙයක් තවත් දෙයක් හා සමාන ලෙස සෑදවීමෙන් රැවටීමේ අදහස පිට හෝ ඒ නිසා රැවටීමක් විය හැකි බව දැන දැන ම යම් තැනැත්තකු විසින් එක් දෙයක් තවත් දෙයකට සමාන ලෙස සෑදවීම ඔහු විසින් "කූට ලෙස තැනීම" යි කියනු ලැබේ.

**පැහැදිලි කිරීම.**–අනුකරණය සම්පූර්ණ ව පැවතීම කූට ලෙස තැනීමට අත්‍යවශ්‍ය නො වේ.

"ලේඛනය."

**පැහැදිලි කිරීම.**–අනුකරණය සම්පූර්ණ ව පැවතීම කූට හෝ මේ මාර්ග එකකට වැඩි ගණනකින් යම් ද්‍රව්‍යයක ප්‍රකාශ කරනු ලැබ හෝ විස්තර කරනු ලැබ යම් කරුණක සාක්ෂියක් වශයෙන් පාවිච්චි කිරීමට අදහස් කරනු ලැබූ හෝ පාවිච්චි කළ හැකි වූ කරුණ "ලේඛනය" යන වචනයෙන් දැක්වේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**පැහැදිලි කිරීම 1**.- අකුරු ඉලක්කම් හෝ ලකුණු කවර ලෙසකින් හෝ කවර ද්‍රව්‍යයක යොදනු ලැබේ ද යනු හෝ සාක්ෂි අධිකරණයක් සඳහා අදහස් කරනු ලැබේ ද යනු හෝ අධිකරණයක පාවිච්චි කළ හැකි වේ ද යනු නො වැදගත් ය.

**නිදර්ශන**

ගිවිසුමක සාක්ෂියක් වශයෙන් පාවිච්චි කළ හැකි එහි නියමයන් දක්වෙන ලියවිල්ලක් ලේඛනයකි.

බැංකුකාරයකු වෙත ලියනු ලැබූ චෙක් පත්‍රයක් ලේඛනයකි. පරකාර්ය සාධක බලපත්‍රයක් ලේඛනයකි.

සාක්ෂි වශයෙන් පාවිච්චි කිරීමට අදහස් කරනු ලැබූ නැතහොත් පාවිච්චි කල හැකි සිතියමක් හෝ සැලැස්මක් ලේඛනයකි.

නියමයන් හෝ උපදෙස් ඇතුළත් ලියවිල්ලක් ලේඛනයකි.

**පැහැදිලි කිරීම**.- වෙළෙඳ හෝ වෙනත් ව්‍යවහාරයකින් පැහැදිලි කරනු ලැබ, අකුරු, ඉලක්කම් හෝ ලකුණු මාර්ගයෙන් ප්‍රකාශ කැරුණු යමක් නියම ලෙස ප්‍රකාශ කොට නොමැති වුව ද, මේ වගන්තියේ අර්ථය ඇතුළත එකී අකුරු, ඉලක්කම් හෝ ලකුණු මාර්ගයෙන් ප්‍රකාශ කැරුණු ලෙසට සලකනු ලැබේ.

**නිදර්ශන**

තමාගේ නියමයට ගෙවිය යුතු ලෙස "ඒ" තම නම හුවමාරු පත්‍රයක පිටිපස ලියයි. වෙළෙඳ ව්‍යාහාරයෙන් පැහැදිලි කර දී තිබෙන පරිදි ඒ ලෙස පිට නම ලිවීමේ අදහස හුවමාරු පත්‍රය දරන්නාහට එය ගෙවිය යුතු බව ය. එම පිට නම ලිවීම ලේඛනයකි. තව ද, "දරන්නාහට ගෙවිය යුතු ය" යන වචන හෝ ඒ අදහස දෙන වචන අත්සනට උඩින් ලියා තිබෙන ආකාරයට එය වටහා ගත යුතු ය.

**28.** යම් නීත්‍යානුකූල අයිතිවාසිකමක් ඇති කරන, දීර්ඝ කරන, අනෙකකුට පවරන, සීමා කරන, නැති කරන හෝ අත්හරින, නැතහොත් තමා නීත්‍යානුකූල වගකීමකට යටත් බව හෝ එක්තරා නීත්‍යානුකූල අයිතිවාසිකමක් තමාට නැති බව පිළිගන්නා ලේඛනයක් හෝ එබඳු ලේඛනයක් ය යි සැලකෙන ලේඛනයක් "වටිනා ඇපය" යන වචනවලින් දැක්වෙයි. "වටිනා ඇපය."

**නිදර්ශන**

හුවමාරු පත්‍රයක පිටිපස "ඒ" සිය නම ලියයි. මෙම පිට නම ලිවීමේ ප්‍රතිඵලය එය නීත්‍යානුකූල ව හිමි වන කවරකුට වුව ද එහි අයිතිවාසිකම පැවරීම බැවින් එසේ පිට නම ලිවීම "වටිනා ඇපයක් වෙයි."

**29.** "අන්තිම කැමති පත්‍රයක්" යන වචනයන්ගෙන් යම් තෙස්තමේන්තු ලේඛනයක් දැක්වෙයි. "අන්තිම කැමැති පත්‍රයක්".

**30.** මේ සංග්‍රහයෙහි සෑම කොටසකම පද සංසන්දනයෙන් වෙනස් අදහසක් නොපෙනෙන විට, කරනු ලැබූ ක්‍රියා යයි සඳහන් කරන වචනවලට නීති විරෝධී නො කර හැරීම් ද ඇතුළත් වෙයි. ක්‍රියා ගැන සඳහන් වන වචන වලට නීති විරෝධී නොකර හැරීම ද ඇතුළත් වෙයි.



https://ezofz.web.lk/
Scanned with CamScanner

"ක්‍රියාව."

**31.** (1) "ක්‍රියාව" යන වචනයෙන් එක් ක්‍රියාවක් මෙන්ම ක්‍රියා පෙළක් ද දැක්වෙයි.

"නොකර හැරීම."

(2) "නොකර හැරීම" යන වචනයෙන් එක නො කර හැරීමක් මෙන් ම නොකර හැරීම් පෙළක් ද දැක්වෙයි.

පොදු අදහසක් ඉෂ්ට කර ගැනීම වශයෙන් කීප දෙනකු විසින් කරනු ලැබූ ක්‍රියාවකට යටත් වීම.

**32.** සියල්ලන්ගේ පොදු අදහස ඉෂ්ට කර ගැනීම් වශයෙන් කීප දෙනකු විසින් අපරාධයක් කළ කල් හි තමා විසින් එය තනිව ම කරන ලද්දක් සේ, එකී තැනැත්තන්ගෙන් එක් එක්කෙනා ම එකී ක්‍රියාව සඳහා යටත් විය යුතු ය.

සාපරාධී දැනුමක් හෝ අදහසක් ඇතිව කරනු ලැබූ නිසාම, එබඳු ක්‍රියාවක් සාපරාධී වූ අවස්ථාවක දී.

**33.** සාපරාධී දැනුමක් හෝ අදහසක් ඇති ව කළ නිසා ම පමණක් සාපරාධී වූ යම් ක්‍රියාවක්, කීප දෙනකු විසින් කරනු ලැබූ අවස්ථාවක දී එබඳු දැනුමක් හෝ අදහසක් ඇති ව එකී ක්‍රියාවට සම්බන්ධ වන එක් එක් තැනැත්තකුම එ බඳු දැනුමක් හෝ අදහසක් ඇති ව ඔහු විසින් තනි ව ම ඒ ක්‍රියාව කරනු ලැබූ ලෙස ඒ ක්‍රියාව ගැන යටත් විය යුතු ය.

කොටසක් ක්‍රියාවෙන් ද කොටසක් නොකර හැරීමෙන් ද සිදු කරන ලද්දකින් වූ ප්‍රතිඵල.

**34.** ක්‍රියාවකින් හෝ නො කර හැරීමකින් එක්තරා ප්‍රතිඵලයක් සිදු කළ විට, ඒ ප්‍රතිඵලය ඇති කිරීම හෝ එ බඳු ප්‍රතිඵලයක් ඇති කිරීමට තැත් කිරීම වරදක් වන අවස්ථාවක දී කොටසක් ක්‍රියාවකින් හා කොටසක් නො කර හැරීමකින් ඒ ප්‍රතිඵලය ඇති කිරීම එම වරද ම බව තේරුම් ගත යුතු ය.

**නිදර්ශන**

"ඒ" "ඉසෙඩ්" ට ආහාර දීම නීති විරෝධී ලෙස නො කර හැරීමෙන් හා "ඉසෙඩ්" ට ගැසීමෙන් ඕනෑකමින් ම "ඉසෙඩ්" ගේ මරණය සිදු කරයි. "ඒ" මිනීමැරුමක් සිදු කර ඇත.

වරදක් ගොඩ නැගෙන ක්‍රියා කීපයකින් එකක් කිරීමෙන් සහයෝගය දීම.

**35.** ක්‍රියා කීපයක මාර්ගයෙන් යම් වරදක් සිදු කළ අවස්ථාවක දී, තනි ව හෝ වෙනත් තැනැත්තකු සමග එක් වීමෙන් එකී ක්‍රියාවන් ගෙන් යමක් කිරීමෙන් එකී වරද සිදු කිරීමට ඕනෑකමින් ම සහයෝගය දෙන කවර තැනැත්තෙක් වුව ද, එකී වරද කරයි.

**නිදර්ශන**

(අ) ටික ටික වස දීමෙන් වෙන වෙන ම අවස්ථාවන් හි වෙන් වෙන් ව ම, "ඉසෙඩ්" මැරීමට "ඒ" සහ "බී" එකඟ වෙති. එකඟ වීම අනු ව "ඉසෙඩ්" මැරීමේ අදහස පිට, "ඒ" සහ "බී" වස දෙති. එසේ වෙන වෙන ම දෙනු ලැබූ වස කොටස් හි ප්‍රතිඵලයක් වශයෙන් "ඉසෙඩ්" මිය යයි. මෙහි "ඒ" සහ "බී" මිනී මැරුම සිදු කිරීමට ඕනෑකමින් ම සහයෝගය දෙති. ඔවුන්ගේ ක්‍රියා වෙන් වෙන් ව කරන ලද නමුදු, එක් එක් තැනැත්තා විසින් මරණයට හේතු වූ ක්‍රියාවක් කළ බැවින් ඔවුහු දෙදෙනා ම වරදට වැරදිකාරයෝ වෙති.

(ආ) "ඒ" සහ "බී" එක් ව කටයුතු කරන බන්ධනාගාර නිලධාරීහු ය. එසේ හෙයින් මේ එක් කෙනකු බාරයේ වරකට පැය හය බැගින් වාරයෙන් වාරයට "ඉසෙඩ්" නම් සිරකරුවා සිටී. "ඉසෙඩ්" ට දීම සඳහා "ඒ" සහ "බී" ට සැපයුන ආහාර "ඉසෙඩ්" ගේ මරණය සිදු කිරීමේ අදහසින් තමන් කටයුතු කරන කාලය තුළ නීති විරෝධී ලෙස නො දී සිටීමෙන් ඉහත කී ප්‍රතිඵලය ගෙන දීමට "ඒ" සහ "බී" දැනුවත් ව සහයෝගය දක්වති. මේ හෙයින් "ඉසෙඩ්" නිරාහාරයෙන් මිය යයි. "ඉසෙඩ්" ගේ මිනී මැරුම සිදු කිරීම ගැන "ඒ" සහ "බී" යන දෙදෙනා ම වැරදි කාරයෝ ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

(ඇ) බන්ධනාගාර නිලධාරියකු වූ "ඒ" භාරයෙහි "ඉසෙඩ්" නම් සිරකරුවා සිටී. "ඉසෙඩ්" ගේ මරණය සිදු කිරීමේ අදහසින් "ඒ" "ඉසෙඩ්" ට ආහාර දීම නීති විරෝධී ලෙස නො කර හරියි. එහි ප්‍රතිඵලයක් වශයෙන් "ඉසෙඩ්" බොහෝ සේ දුර්වල වෙයි. එහෙත් එ ලෙස නිරාහාර ව සිටුවීම "ඉසෙඩ්" ගේ මරණය සිදු කිරීමට ප්‍රමාණවත් නො වෙයි. "ඒ" නිලයෙන් පහ කරනු ලැබ, එකී නිලයට "බී" පත් වෙයි. "බී" "ඒ" සමග වංක සහභාගී වීමක් හෝ සහයෝගය දීමක් නැති ව, "ඉසෙඩ්" ගේ මරණය වීමට ඉඩ ඇති බව දැන දැන ම "ඉසෙඩ්" ට ආහාර දීම නීති විරෝධී ලෙස නො කර හරියි. "ඉසෙඩ්" නිරාහාරව මිය යයි. "බී" මිනීමැරුමට වරද කාරයා වන නමුත් "ඒ", "බී" සමග සහයෝගය නො වූ බැවින් මිනී මැරුම සිදු කිරීමට තැත් කිරීමට පමණක් වැරදිකාරයා වෙයි.

**36.** සාපරාධී ක්‍රියාවක් කිරීමෙහි කීප දෙනකු යෙදුණ විට හෝ සම්බන්ධ වූ විට, එකී ක්‍රියාව හේතු කොට ගෙන ඔවුන් වෙනස් වරදවලට වැරදිකාරයන් විය හැකි ය. සාපරාධී ක්‍රියාවක් කිරීමෙහි කීප දෙනකු යෙදුණ විට ඔවුන් වෙනස් වරදවලට වැරදිකාරයන් වියහැකි බව.

**නිදර්ශනය**

"ඉසෙඩ්" මැරීම මිනී මැරුමක් නොවන සාපරාධී මනුෂ්‍යඝාතනයක් විය හැකි වූ බලවත් ප්‍රකෝප කරවීමේ අවස්ථාවක් යටතේ "ඒ" "ඉසෙඩ්" ට පහර දෙයි. "ඉසෙඩ්" කෙරෙහි ද්වේශ සහිත වූ "බී" "ඉසෙඩ්" මැරීමේ අදහසින්, ප්‍රකෝප කරවීමකට යටත් නො වී "ඉසෙඩ්" මැරීමට "ඒ" ට සහාය වෙයි. මෙහි දී, "ඒ" සහ "බී" යන දෙ දෙනාම "ඉසෙඩ්" ගේ මරණය සිදු කිරීමෙහි යෙදෙන නමුදු "බී" මිනී මැරුම සඳහා වරදකරුවකු වන අතර, "ඒ" සාපරාධී මනුෂ්‍යඝාතනයට පමණක් වරදකරුවෙක් වෙයි.

**37.** යමක් සිදු කිරීමේ අදහසින් යම් මාර්ගයකින් යමක් සිදු කළ විට හෝ එකී මාර්ග යොදන අවස්ථාවෙහි දී එය සිදු වීමට ඉඩ ඇති බව දන්නා විට හෝ විශ්වාස කිරීමට කරුණු ඇති විට යම් තැනැත්තකු "කැමැත්තෙන් ම" යම් ප්‍රතිඵලයක් ඇති කළ ලෙස සලකනු ලැබේ. "කැමැත්තෙන්ම."

**නිදර්ශනය**

විශාල නගරයක ජනාවාස ගෙයකට, කොල්ල කෑම පහසු වන පරිද්දෙන් "ඒ" රාත්‍රියෙහි ගිනි තබයි. එසේ කිරීමෙන් ඔහු කිසිවකුගේ මරණය සිදු කරයි. මෙහි "ඒ" මරණය සිදු කිරීමට අදහස් නො කරන්නට ඇත. ඔහුගේ ක්‍රියාවෙන් මරණයක් සිදු වීම ගැන ඔහු කණගාටු ද විය හැකි ය. එහෙත් ඉන් මරණය සිදුවිය හැකි බව ඔහු දැන සිටියේ නම්, ඔහු කැමැත්තෙන් ම මරණය සිදු කර ඇත.

**38.** (1), (2) වෙනි හා (3) වෙනි වගන්තිවල සඳහන් පරිච්ඡේදයේ සහ වගන්තිවල හැර අන් අවස්ථාවල දී "වරද" යන්නෙන් මේ සංග්‍රහයෙන් දඬුවම් කිරීමට හැකි දෙයක් දැක්වෙයි. "වරද."

(2) 4 වෙනි පරිච්ඡේදයේ ද, පහත දැක්වෙන වගන්තිවල ද එනම්, 67, 100, 101, 101අ, 102, 103, 105, 107, 108, 109, 110, 111, 112, 113, 113අ, 113ආ, 184, 191, 192, 200, 208, 210, 211, 216, 217, 218, 219, 220, 318, 319, 320, 321, 322, 338, 339, 377, 378, සහ 431 යන වගන්තිවලට ද, "වරද" යන වචනයෙන් මේ සංග්‍රහය යටතේ හෝ මේ සංග්‍රහය නො වන වෙනත් නීතියක් යටතේ ලංකාවේ දී දඬුවම් කළ හැකි දෙයක් දැක්වෙයි.

(3) තව ද, මේ සංග්‍රහය නො වන වෙනත් නීතියක් යටතේ දඬුවම් කල හැකි වූ දෙයකට එකී නීතිය යටතේ දඩයක් සහිත ව හෝ රහිත ව හය මාසයක් හෝ ඊට වැඩි කාලයක් බන්ධනාගාරගත කිරීමෙන්



https://ezofz.web.lk/
Scanned with CamScanner

අඩුවම් කළ හැකි වූ අවස්ථාවක දී 138, 174, 175, 198, 199, 209, 213 හා 427 යන වගන්තිවල "වරද" යන්නට (2) වෙනි උප වගන්තියෙහි දී තිබෙන අර්ථය ම ඇත්තේ ය.

"විශේෂ නීතිය."

**39.** "විශේෂ නීතිය" යනු විශේෂ විෂයයකට අදාළ කළ හැකි නීතියකි.

"ප්‍රාදේශික නීතිය."

**40.** "ප්‍රාදේශික නීතිය" යනු ලංකාවෙහි විශේෂ කොටසකට පමණක් අදාළ කළ හැකි නීතියකි.

"නීති විරෝධි", "නීති විරෝධි ලෙස."

**41.** වරදක් වූ හෝ නීතියෙන් තහනම් කරනු ලැබූ හෝ සිවිල් නඩුවක් පැවරීමට හේතුවන්නා වූ සෑම දෙයකට "නීති විරෝධි" හා "නීති විරෝධි ලෙස" යන වචන අදාළ වේ.

"කිරීමට නීත්‍යානුකූලව බැඳී ඇති."

**42.** යමකු විසින් නො කර හැරීම නීති විරෝධි වන කවර දෙයක් හෝ ඔහු "කිරීමට නීත්‍යානුකූලව බැඳී ඇති" ලෙස සලකනු ලැබේ.

"පාඩුව".

**43.** කායික වශයෙන් හෝ මානසික වශයෙන් හෝ කීර්තියට හෝ දේපළවලට නීති විරෝධි ව සිදු කරනු ලැබූ යම් පීඩාවක් " පාඩුව" යන වචනයෙන් දැක්වෙයි.

"ජීවිතය."

**44.** පද සංසන්දනයෙන් විරුද්ධ අර්ථයක් නො පෙනෙන අවස්ථාවක දී, "ජීවිතය" යන වචනයෙන් මනුෂ්‍යයකුගේ ජීවිතය දැක්වෙයි.

"මරණය."

**45.** පද සංසන්දනයෙන් විරුද්ධ අර්ථයක් නො පෙනෙන අවස්ථාවක දී, "මරණය" යන වචනයෙන් මනුෂ්‍යයකුගේ මරණය දැක්වෙයි.

"සතා".

**46.** පද සංසන්දනයෙන් විරුද්ධ අර්ථයක් නො පෙනෙන අවස්ථාවක දී, "සතා" යන වචනයෙන් මනුෂ්‍යයකු නො වන වෙන යම් ජීවමාන සතකු දැක්වෙයි.

"යාත්‍රාව."

**47.** මනුෂ්‍යයන් හෝ දේපළ ජල මාර්ගයෙන් ගෙන යාම සඳහා සාදනු ලැබූ යමක් "යාත්‍රාව" යන වචනයෙන් දැක්වෙයි.

"වර්ෂය."
"මාසය."

**48.** "වර්ෂය" යන වචනය හෝ "මාසය" යන වචනය කොතනක හෝ යොදනු ලැබූ විටක එහි වර්ෂය හෝ මාසය බ්‍රිතාන්‍ය දින දර්ශනය අනුව ගණන් ගත යුතු බව තේරුම් ගත යුතු ය.

"වගන්තිය."

**49.** මේ සංග්‍රහයෙහි පරිච්ඡේදයක මුලට යෙදූ අංක වලින් වෙන් කරනු ලැබූ කොටස්වලින් එකක් "වගන්තිය" යන වචනයෙන් දැක්වෙයි.

"දිවුරුම."

**50.** දිවුරුමක් වෙනුවට නීතියෙන් යොදනු ලබන ගාම්භීර සහතික ප්‍රකාශයක් ද, රජයේ සේවකයකු ඉදිරිපිට කිරීමට හෝ අධිකරණයක හෝ වෙනත් ස්ථානයක ඔප්පු කිරීමේ කාර්ය සඳහා යෙදීමට නීතියෙන් වුවමනා වූ හෝ බලය දෙනු ලැබූ යම් ප්‍රකාශයක් ද "දිවුරුම්" යන වචනයට ඇතුළත් වෙයි.

"සද්භාවය."

**51.** නිසි සැලකිල්ල හෝ අවධානය නොමැති ව, කරනු ලැබූ හෝ විශ්වාස කරනු ලැබූ කිසිවක් සද්භාවයෙන් කරනු ලැබූ ලෙස හෝ විශ්වාස කරනු ලැබූ ලෙස නො සලකනු ලැබේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

## III වෙනි පරිච්ඡේදය

### දඬුවම්

**52.** මේ සංග්‍රහයෙහි විධිවිධාන යටතේ වැරදිකරුවන් යටත් වන දඬුවම් නම්– දඬුවම්.

**පළමු ව.**–මරණය.

**දෙවනු ව.**–දෙයාකාර බන්ධනාගාර ගත කිරීම, එනම් :–

(අ) තදබල, එනම් බරපතළ වැඩ ඇති ව ;
(ආ) ලිහිල්.

**තුන්වනු ව.**–කස පහර දීම.

**හතරවනු ව.**–දේපළ අහිමි කිරීම.

**පස්වනු ව.**– දඩ ගැසීම.

**53.** අධිකරණයේ මතය පරිදි වයස දහසයෙන් පහළ වූ කිසිවකු මත මරණීය දඬුවම නියම කිරීම හෝ එවැන්නකුට විරුද්ධව මරණීය දඬුවම සටහන් කිරීම නොකළ යුතු ය. එහෙත්, එකී දඬුවම වෙනුවට එකී තැනැත්තා අග්‍රාණ්ඩුකාරතුමාගේ කැමැත්ත ඇති තාක් හිර භාරයේ තැබීමට අධිකරණය විසින් නියම කළ යුතු ය. වයස දහසයෙන් පහළ තැනැත්තන් සඳහා වූ මරණීය දඬුවම වෙනුවට හිර භාරයේ තැබීමේ දඬුවම.

**54.** අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි 305ආ වෙනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර වරදකාරී කරනු ලබන වේලෙහි ගැබ්ගත් ස්ත්‍රියක බව දැනෙන ස්ත්‍රියක මත මරණීය දඬුවම නියම කිරීම හෝ, ඇයට විරුද්ධ ව මරණීය දඬුවම සටහන් කිරීම නො කළ යුතු ය. එහෙත්, එකී දඬුවම වෙනුවට ජීවිතාන්තය දක්වා හෝ වෙනත් කාල සීමාවකට ඒ ස්ත්‍රියට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමේ දඬුවම අධිකරණය විසින් නියම කළ යුතු ය. ගැබ්ගත් ස්ත්‍රීන් සඳහා මරණය වෙනුවට බන්ධනාගාර ගත කිරීමේ දඬුවම.

**55.** දෙයාකාර වූ බන්ධනාගාරගත කිරීමකින් වරදකරුවකුට දඬුවම් කළ හැකි වූ සෑම අවස්ථාවක දී ම, බන්ධනාගාරගත කිරීම සම්පූර්ණයෙන් බරපතළ වැඩ ඇතිව හෝ සම්පූර්ණයෙන් ලිහිල් ව හෝ බන්ධනාගාර ගත කිරීමේ කාල සීමාවෙන් කොටසක් බරපතල වැඩ ඇති ව ද ඉතිරි කොටස ලිහිල් ව ද වන ලෙස දඬුවමෙහි නියම කිරීමේ සුදුසුකම අධිකරණයට තිබිය යුතු ය. (සමහර බන්ධනාගාර ගත කිරීම්වල දී) දඬුවම සම්පූර්ණයෙන්ම හෝ කොටසක් බර පතල වැඩ ඇතිව හෝ ලිහිල් විය හැකි බව.

**56.** තමාගේ මුළු දේපළ ම අහිමි කිරීමකට යටත් වනු ලබන වරදකට යමකු වරදකාරයා වූ හැම අවස්ථාවක දී ම, දෙනු ලැබූ හෝ වෙනස් කරනු ලැබූ දඬුවම ද විඳ අවසන් කරන තෙක් හෝ, සමාව ලැබෙන තෙක් ආණ්ඩුවේ ප්‍රයෝජනය පිණිස හැර, කිසි දේපළක් ලබා ගැනීමට ඔහුට නොහැකි විය යුතු ය. දේපළ අහිමි කිරීමේ දඬුවම.

#### නිදර්ශනය

ආණ්ඩුවට විරුද්ධව යුද්ධ කිරීමේ වරදකට වරදකාරයා වූ "ඒ" ගේ සියලු දේපළ, අහිමි කිරීමකට යටත් වෙයි. එකී දණ්ඩන නියමයෙන් පසු, එය බලපවත්වන කාලය තුළ, එම අහිමි කිරීම නොමැති නම්, " ඒ " ගේ දේපළ වන්නා වූ මුදලයක් ඉතිරිකොට "ඒ" ගේ පියා මිය යයි. ඒ මුදලය ආණ්ඩුවේ දේපළ බවට පැමිණේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

මරණීය දඬුවමට හෝ අවුරුදු පහකට වැඩි කාලයක බන්ධනාගාර ගත කිරීමට නියම වෙන තැනැත්තකුට හෝ කිසි ස්ත්‍රියකට කස පහර දීම නියම නොකළ යුතු බව.

**57.** කිසිම අවස්ථාවක දී ස්ත්‍රියකට කස පහර දීමෙන් දඬුවම් නො කළ යුතු ය. තව ද මරණීය දඬුවමට නියම වෙන හෝ අවුරුදු පහකට වැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමකට නියම වෙන තැනැත්තකුට ද, කස පහර දීමෙන් දඬුවම් නො කළ යුතු ය.

**58.** 1939 අංක 50 දරන ආඥාපනතින් අවලංගු කරන ලදී.

**59.-66.** 1938 අංක 20 දරන ආඥාපනතින් අවලංගු කරන ලදී.

වරද කීපයක් එක් වීමෙන් සෑදුණු වරදකට දඬුවම් දීමේ සීමාව.

**67.** * † වරදක් වූ යමක් කොටස්වලින් සමන්විත වූ විට, එයින් යම් කොටසක් වරදක් නම්, එය පැහැදිළි ව සලස්වා නැති විට ඒ බඳු එක් වරක දඬුවමකට වඩා දඬුවම්වලින් ඒ වරදකරුට දඬුවම් නොකළ යුතු ය.

වරද විස්තර කරනු ලබන හෝ දඬුවම් කරනු ලබන තත් කාලයෙහි බල පවත්නා නීතියක වෙනස් විස්තර දෙකක් හෝ ඊට වැඩි ගණනක් ඇතුළත වැටෙන යමක් වරදක් වන අවස්ථාවක දී, හෝ

ක්‍රියා කීපයක එක ක්‍රියාවක් හෝ ඊට වැඩි ගණනක් එයින් ම හෝ ඒවායින් ම වරදක් ව, ඒ ක්‍රියා කීපයම එක් වුණ විට, වෙනස් වරදක් වන අවස්ථාවක දී ඒ වරදවලින් යම් වරදකට නඩුව විභාග කරන අධිකරණය විසින් දිය හැකි දඬුවමකට වඩා දරුණු දඬුවමකින් ඒ වරදකරුට දඬුවම් නොකළ යුතු ය.

තිදර්ශන

(අ) "ඒ" "ඉසෙඩ්" ට කෝටුවකින් පහර පනහක් දෙයි. සම්පූර්ණ පහර දීමෙන් මෙන් ම ඒ පහර දීම සම්පූර්ණ වූ එක් පහරෙන් "ඒ" "ඉසෙඩ්" ට කැමැත්තෙන් ම තුවාළ කිරීමේ වරද කරන්නට ඇත. සෑම පහරකට ම දඬුවම් ලැබීමට "ඒ" යටත් නම් එක් එක් පහරකට එක අවුරුද්ද බැගින් ඔහු පණස් අවුරුද්දක් බන්ධනාගාර ගත කළ හැකි ය. එහෙත්, සම්පූර්ණ පහරදීම සඳහා ඔහු එක් දඬුවමකට පමණක් යටත් වෙයි.

(ආ) එසේ වුව ද, "ඒ" "ඉසෙඩ්" ට පහර දෙන විට, "වයි" මැදහත් වීමෙන් "ඒ" ඕනැකමින් ම "වයි"ට ගසයි. මෙහි "වයි" ට දුන් පහර "ඉසෙඩ්" ට කැමැත්තෙන් ම තුවාළ කිරීමේ ක්‍රියාවෙහි කොටසක් නො වන බැවින් "ඉසෙඩ්" ට කැමැත්තෙන් ම තුවාළ කිරීම ගැන එක් දඬුවමකට ද, "වයි" ට දුන් පහර ගැන වෙනත් දඬුවමකට ද, "ඒ" යටත් වෙයි.

යමකු වරද කීපයකින් එකකට වරදකාරයාව, එලෙස වරද කාරයා වූයේ කවර වරදකටද යනු සැක සහිත වූ අවස්ථාවක දී ඔහුට දඬුවම් කිරීම.

**67අ.** නඩු තීන්දුවෙහි නියමිත වැරදි කීපයකින් එකකට යමකු වරදකරු බවට නඩු තීන්දුව දුන් නමුත්, ඔහු ඉන් කුමන වරදකට වරදකාරයා ද, යනු සැක සහිත වූ හැම අවස්ථාවල දී වරදවලට එකම දඬුවම නියම කොට නැත්නම්, අඩු ම දඬුවම නියම කරනු ලැබූ වරද සඳහා වරදකරුට දඬුවම් දිය යුතු ය.

---

* අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි 323 වෙනි වගන්තිය බලනු මැනවි.

† අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි 312 වෙනි වගන්තියේ ඒ හා සමාන විධිවිධාන ම යොදා ඇති බැවින් 59 වෙනි වගන්තියේ සිට 66 වෙනි වගන්තිය දක්වා ඇති වගන්ති අත් හරින ලදී.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**68.** අවුරුදු තුනකට හෝ ඊට වැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමෙන්, මේ සංග්‍රහයෙහි XII වෙනි පරිච්ඡේදය හෝ XVII වෙනි පරිච්ඡේදය යටතේ දඬුවම් කළ හැකි වරදකට වරදකාරයා කරනු ලැබූ යමකු අවුරුදු තුනකට හෝ ඊට වැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමෙන් යථෝක්ත පරිච්ඡේදයක් යටතේ, දඬුවම් කළ හැකි වරදකට වරදකාරයා වූ විට ඒ සඳහා ඔහු යටත් විය යුතු දඬුවම මෙන් දෙගුණයකට එබඳු සෑම, පසුව කරනු ලැබූ වරදකට යටත් විය යුතු ය.

අවුරුදු තුනකට බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදකට කලින් වරදකාරයා වී ඇති තැනැත්තන් වරදකාරයා කිරීමේ දී දිය යුතු දඬුවම.

එසේ ද වුවත්, අවුරුදු විස්සකට වැඩි කාලයකට හෝ කස පහරවල් හෝ තැලීම් විසි හතරකට වැඩි වන දඬුවමකට කිසිම අවස්ථාවක දී ඔහු යටත් නො විය යුතු ය.

## IV වෙනි පරිච්ඡේදය

### සාමාන්‍ය ව්‍යතිරේක

**69.** යම් ක්‍රියාවක් කිරීමට නීතියෙන් බැඳී සිටින්නා වූ හෝ නීතිය පිළිබඳ වැරදීමකින් නොව, සිද්ධිය පිළිබඳ වැරදීමකින් එසේ නීතියෙන් තමා බැඳී සිටින බව සද්භාවයෙන් විශ්වාස කරන තැනැත්තකු විසින් කරනු ලැබූ කිසිම ක්‍රියාවක් වරදක් නොවේ.

යම් ක්‍රියාවක් කිරීමට නීතියෙන් බැඳී ඇති නැත හොත් සිද්ධිය පිළිබඳ වැරදීමකින් එසේ බැඳී ඇති බව විශ්වාස කරන තැනැත්තකු විසින් කරනු ලැබූ ක්‍රියාව.

**නිදර්ශන**

(අ) නීතියේ විධාන පරිදි තම ඉහළ නිලධාරියාගේ ආඥාව අනුව "ඒ" නම් වූ යුද්ධ භටයා කලහකාරී පිරිසකට වෙඩි තබයි. "ඒ" කිසි වරදක් කර නැත.

(ආ) අධිකරණයක නිලධාරියකු වූ "ඒ", එම අධිකරණය මගින් "වයි" සිරභාරයට ගැනීමට නියම කරනු ලැබ, නිසි විභාගයකින් පසු, "වයි" ය යි විශ්වාස කරමින් "ඉසෙඩ්" සිරභාරයට ගනියි "ඒ" කිසි වරදක් කර නැත.

**70.** නීතියෙන් දෙනු ලැබූ හෝ දෙන ලදැයි තමා සද්භාවයෙන් විශ්වාස කරන යම් බලයක් පාවිච්චි කිරීමේ දී, අධිකරණාත්මක ව කටයුතු කරන විනිශ්චයකරුවකු විසින් කරනු ලැබූ කිසිවක් වරදක් නො වේ.

අධිකරණාත්මකව කටයුතු කරන විට විනිශ්චය කරුවකුගේ ක්‍රියාව.

**71.** අධිකරණයක නඩු තීන්දුවක හෝ ආඥාවක ප්‍රකාර වූ නැතහොත් එබඳු අධිකරණයක නඩු තීන්දුවකින් හෝ ආඥාවකින් බලය දෙනු ලැබූ ක්‍රියාවක් ඒ නඩු තීන්දුව හෝ ආඥාව බලපවත්නා කාලය තුළ ඒ නඩු තීන්දුව හෝ ආඥාව දීමට එම අධිකරණයට අධිකරණ බලය නැතිව ද, ඒ ක්‍රියාව කරන තැනැත්තා එම අධිකරණයට එබඳු අධිකරණ බලයක් ඇතැයි යනු සද්භාවයෙන් විශ්වාස කරන්නේ නම් වරදක් නොවේ.

අධිකරණයක නඩු තීන්දුවක හෝ ආඥාවක ප්‍රකාර කරනු ලැබූ ක්‍රියාවක්.



https://ezofz.web.lk/
Scanned with CamScanner

හේතු යුක්තියක් ඇත්තකු හෝ නීතියෙන් හේතු යුක්තියක් ඇතැයි සිද්ධිය නොදැනීමකින් විශ්වාස කරන්නකු විසින් කරනු ලබන ක්‍රියාව.

**72.** නීතියෙන් හේතු යුක්තියක් ඇත්තකු විසින් හෝ නීතිය නොදැනීමකින් නොව, සිද්ධිය නොදැනීමකින් යම් ක්‍රියාවක් කිරීමට නීතියෙන් බලය ඇතැයි යනු සද්භාවයෙන් විශ්වාස කරන්නකු විසින් කරනු ලබන කිසිවක් වරදක් නොවේ.

**නිදර්ශනය**

මිනීමැරුමක් ලෙස "ඒ" ට හැඟෙන දෙයක් "ඉසෙඩ්" කරනු "ඒ" දකියි. මිනීමරුවන් මිනීමැරීමේ දී ඔවුන් ඇල්ලීමට සියලු තැනැත්තන්හට නීතියෙන් දී තිබෙන බලය "ඒ" තමාගේ හොඳ ම විනිශ්චය අනුව සද්භාවයෙන් පාවිච්චි කිරීමෙන් නිසි බලධරයන් ඉදිරියට ගෙන ඒම සඳහා "ඉසෙඩ්" අල්ලා ගනියි. "ඉසෙඩ්" ආත්මාරක්ෂාව පිණිස ක්‍රියා කරන ලද බැව් පසු ව දැන ගන්නට ලැබුණත් "ඒ" විසින් වරදක් කර නැත.

නීත්‍යානුකූල ක්‍රියාවක් අහම්බෙන් කිරීමේ දී සිදුවූවක්.

**73.** නිසි ආරක්ෂාව හා ප්‍රවේසම ඇතිව, සාපරාධී අදහසක් හෝ දැනුමක් නොමැති ව, නීත්‍යානුකූල මාර්ගවලින් නීත්‍යානුකූල ලෙස නීත්‍යානුකූල ක්‍රියාවක් කිරීමේ දී අහම්බෙන් හෝ අවාසනාවෙන් සිදු වූ කිසිවක් වරදක් නො වේ.

**නිදර්ශනය**

"ඒ" අත් පොරවකින් වැඩ කරයි. තලය විසි වී ගොස් අසල සිටි මිනිසකුට වැදීමෙන් ඔහු මැරෙයි. "ඒ" ගේ නිසි ප්‍රවේසමෙහි අඩුවක් නොතිබුණි නම්, ඔහුගේ ක්‍රියාවට සමාව දිය හැකි ය. වරදක් ද නොවේ.

සාපරාධී චේතනාවක් නොමැතිව වෙනත් හානි වැළැක්වීම සඳහා කරන ලද මුත් පීඩා විය හැකි ක්‍රියා.

**74.** පීඩාවක් කිරීමේ සාපරාධී අදහසක් නොමැතිව, පුද්ගලයන්හට හෝ දේපළවලට විය හැකි වෙනත් පීඩා වැළැක්වීමේ හෝ මගහැර වීමේ කාර්යය සඳහා සද්භාවයෙන් යම් ක්‍රියාවක් කරන ලද නම්, එය කරනු ලැබුයේ ඉන් පීඩාවක් විය හැකි බව දත් පමණකින් වූ විට ඒ ක්‍රියාව වරදක් බවට පත් නො වේ.

*පැහැදිලි කිරීම.*– එබඳු අවස්ථාවක දී වැළැක්විය යුතු හෝ මග හැරවිය යුතු පීඩාව, ඉන් පීඩාවක් විය හැකි බව දැන ම ඒ ක්‍රියාව කිරීම යුක්ති සහගත හෝ සමාව දිය හැකි තත්ත්වයක වී ද නැතහොත් එ තරම් ම ඉක්මනට කල යුතු ද යනු සිද්ධිය පිළිබඳ ප්‍රශ්නයකි.

**නිදර්ශන**

(අ) තමාගේ යාත්‍රාව නැවැත්වීමට පෙර තම යාත්‍රාවේ මාර්ගය වෙනස් නොකළහොත්, මගීන් විස්සකින් හෝ තිහකින් යුක්ත "බී" නම් වූ බෝට්ටුවක් තමාගේ වරදක් හෝ නොසැලකිල්ලක් නැතිව ම, අවශ්‍යයෙන් ම පෙරළිය යුතු තත්ත්වයකට, දුම් යාත්‍රාවක නැවියා වූ "ඒ" හදිසියෙන් ම පැමිණ සිටියි. තම මාර්ගය වෙනස් කිරීමෙන් මගීන් දෙදෙනකුගෙන් හෝ තුන් දෙනකුගෙන් යුත් "සී" නම් වූ බෝට්ටුවක් පෙරළීමේ අන්තරාය ඔහුට පෙනෙයි. එකී මගීන් සමහර විට බේරා ගැනීමට පුළුවන් විය හැකි ය. මෙහි දී "සී" බෝට්ටුව පෙරළීමේ අදහසක් නොමැතිව සද්භාවයෙන් "බී" බෝට්ටුවෙහි මගීන්ට වන අන්තරාය වැළැක්වීමේ කාර්යය සඳහා "ඒ" තම මාර්ගය වෙනස් කළේ නම්, "සී" බෝට්ටුව පෙරළෙන බව දැන දැනම ඒ බෝට්ටුව පෙරළු නුමුදු ඔහු විසින් වැළැක්වීමට බලාපොරොත්තු වූ අන්තරාය ඇත්ත වශයෙන් ම එකී බෝට්ටු පෙරළීමේ ක්‍රියාවට සාමාව ලැබෙන ප්‍රමාණයක බව වැටහී ගියහොත්, ඉහත දැක්වුණු මාර්ගය වෙනස් කිරීම ගැන "ඒ" වරදකට වරදකරු නොවේ.

(ආ) විශාල ගින්නක දී ගින්න පැතිරී යාම වළක්වනු පිණිස "ඒ" ගෙවල් කඩා දමයි. මනුෂ්‍ය ජීවිත හා දේපළ බේරා ගැනීමේ අදහස ඇති ව ඔහු මෙය සද්භාවයෙන් කරයි. වැළැක්විය යුතු පීඩාව ද, එය වහාම කළ යුතු බව ද, "ඒ" ගේ ක්‍රියාවට සමාව දිය යුතු තරමේ ස්වභාවයක බව වැටහී ගියහොත් "ඒ" වරදකට වරදකරු නොවේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**75.** වයස අවුරුදු අටකට අඩු ළමයකු විසින් කරනු ලබන කිසිවක් වරදක් නො වේ.

*වයස අවුරුදු අටෙන් අඩු ළමයකුගේ ක්‍රියාව.*

**76.** යම් අවස්ථාවක දී තමාගේ හැසිරීමේ ස්වභාවය හා එහි ප්‍රතිඵලය නිශ්චය කිරීමට ප්‍රමාණවත් ලෙස පැසුණු බුද්ධියක් නො ලත්, වයස අවුරුදු අටකට වැඩි අවුරුදු දොළහකට අඩු ළමයකු විසින් කරනු ලබන කිසිවක් වරදක් නො වේ.

*ප්‍රමාණවත් ලෙස පැසුණු බුද්ධියක් නොමැති වයස අවුරුදු අටකට වැඩි දොලහකට අඩු ළමයකුගේ ක්‍රියාව.*

**77.** ක්‍රියාව කරන වේලෙහි එම ක්‍රියාවෙහි ස්වභාවය හෝ තමා වැරදි දෙයක් හෝ නීතියට පටහැනි ක්‍රියාවක් කරන බව සිහි විකලත්වය නිසා දැන ගැනීමට පුලුවන් කමක් නැති තැනැත්තකු විසින් කරනු ලබන කිසිවක් වරදක් නො වේ.

*සිහි විකල් තැනැත්තකුගේ ක්‍රියාව.*

**78.** ක්‍රියාවෙහි ස්වභාවය හෝ තමා වැරදි දෙයක් හෝ නීතියට පටහැනි ක්‍රියාවක් කරන බව, ක්‍රියාව කරන වේලෙහි මත්වීමේ හේතුවෙන් දැන ගැනීමට නො හැකි තැනැත්තකු විසින් කරනු ලැබූ කිසිවක් වරදක් නො වේ.

එය එසේ වරදක් නො වීමට, ඔහු මත් කරනු ලැබූ දෙය ඔහු නොදැනුවත් ව හෝ ඔහුගේ කැමැත්තට විරුද්ධව දෙනු ලැබුවක් විය යුතු ය.

*තම කැමැත්තට විරුද්ධව මත් කරවීමේ හේතුවෙන් යමක් නිශ්චය කිරීමට නොහැකි තැනැත්තකුගේ ක්‍රියාව.*

**79.** විශේෂ දැනුමක් හෝ අදහසක් නොමැතිව කරනු ලැබූ ක්‍රියාවක් වරදක් නොවන අවස්ථාවල දී යම් තැනැත්තකු විසින් මත්ව ඒ ක්‍රියාව කරන ලද නම්, ඔහු මත් කරනු ලැබූ දෙය ඔහු නො දැනුවත්ව හෝ ඔහුගේ කැමැත්තට විරුද්ධව ඔහුට දෙන ලද්දක් නොවී නම්, ඔහු මත් නොවී සිටි විට ඇති දැනුමෙන් යුතු වූ ලෙස දඬුවම් ලැබීමට ඔහු යටත් විය යුතු ය.

*මත් වූවකු විසින් සිදු කරනු ලැබූ විට විශේෂ අදහසක් හෝ දැනුමක් වූවමනා වරද.*

**80.** ක්‍රියාව කරන්නා මරණය සිදු කිරීම හෝ බරපතළ තුවාළ කිරීම අදහස් කරනු නො ලැබූද, සිදුවිය හැකි බව දැන නොසිටියා වූ ද, යම් ක්‍රියාවක්, ඒ පීඩාව දරා ගැනීම සඳහා සිය කැමැත්ත පැහැදිලිව හෝ ඇඟවෙන ලෙස දුන් වයස අවුරුදු දහ අටෙන් ඉහළ තැනැත්තකුට ඒ ක්‍රියාවෙන් සිදුවන හෝ, ක්‍රියාව කරන්නා විසින් කිරීමට අදහස් කරනු ලැබූ පීඩාව නිසා ම පමණක්, නැතහොත් පීඩාවේ විපාක දරා ගැනීමට කැමැත්ත දුන් තැනැත්තකුට සිදුවිය හැකි ලෙස ක්‍රියාව කරන්නා විසින් දැන ගත හැකි යම් පීඩාවක් නිසා පමණක් වරදක් නො වේ.

*මරණය සිදු කිරීම හෝ බරපතල තුවාල කිරීම අදහස් කරනු නොලැබූ ද, එසේ විය හැකි බව නොදන්නා වූ ද ක්‍රියාවක් කැමත්ත ඇතිව කිරීම.*

**නිදර්ශනය**

"ඒ" සහ "ඉසෙඩ්" විනෝදය සඳහා ඔවුනොවුන් හා කඩු හරඹ කිරීමට එකඟ වෙති. අනිසි ලෙස ක්‍රීඩාවෙහි නො යෙදී කඩු හරඹ කිරීමේ දී විය හැකි පීඩාවක් දරා ගැනීමේ එක් එක්කෙනාගේ කැමැත්ත "ඒ" එකඟවීමෙන් ඇඟවෙයි. නිසි ලෙස ක්‍රීඩා කිරීමෙහි දී, "ඒ" විසින් "ඉසෙඩ්" ට තුවාලයක් කරන ලද නම් එය "ඒ" විසින් කරන ලද වරදක් නොවේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

තැනැත්තකුගේ යහපත සඳහා ඔහුගේ කැමැත්ත ඇතිව මරණය සිදු කිරීමට අදහස් කරනු නොලැබූ සද්භාවයෙන් කළා වූ ක්‍රියාව.

81. මරණය සිදු කිරීම අදහස් කරනු නො ලැබූ කිසි ක්‍රියාවක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරනු ලබන්නේ යමකුගේ යහපතට නම්, ඒ තැනැත්තා විසින් පීඩාව දරා ගැනීමට හෝ පීඩාවේ විපාකය දරා ගැනීමට ප්‍රකාශිත ව හෝ ඇඟවෙන ලෙස කැමැත්ත දෙනු ලැබී නම්, ඒ ක්‍රියාවෙන් ඔහුට විය හැකි පීඩාවක් හෝ ක්‍රියාව කරන්නා විසින් විය හැකි ලෙස අදහස් කරනු ලැබූ හෝ දැන ගනු ලැබූ පීඩාවක් නිසා පමණක් වරදකරු නොවේ.

නිදර්ශනය

වේදනා ගෙන දෙන අසනීපයකින් දුක් විඳින "ඉසෙඩ්" ගේ මරණය එක්තරා ශල්‍ය කර්මයකින් විය හැකි බව දනිමින් ම එහි "ඉසෙඩ්" ගේ මරණය සිදු කිරීමේ චේතනාව නොමැතිව "ඉසෙඩ්"ගේ යහපත සද්භාවයෙන් අදහස් කොට ගෙන, "ඉසෙඩ්" ගේ කැමැත්ත ඇතිව ඔහුට ශල්‍ය වෛද්‍යවරයකු වූ "ඒ" ශල්‍ය කර්මය සිදු කරයි. "ඒ" කිසි වරදක් කර නැත.

ළමයකුගේ හෝ සිහිවිකල් වූවකුගේ යහපත සඳහා භාරකාරයාගේ කැමැත්ත ඇතිව සද්භාවයෙන් කරනු ලැබූ ක්‍රියාව .

82. වයස දොළහෙන් අඩු හෝ සිහි විකල් තැනැත්තකුගේ යහපත සඳහා භාරකාරයාගේ හෝ එකී තැනැත්තා නීත්‍යානුකූල ව භාර ව සිටින තැනැත්තාගේ ප්‍රකාශිත ලෙස හෝ ඇඟවෙන ලෙස ලැබූ කැමැත්ත ඇතිව සද්භාවයෙන් කරනු ලැබූ කිසි ක්‍රියාවක් ඒ ක්‍රියාවෙන් සිදුවිය හැකි හෝ, ක්‍රියාව කරන්නා විසින් සිදු කිරීමට අදහස් කරනු ලැබූ හෝ ක්‍රියාව කරන්නා විසින් විය හැකි යයි දැන ගනු ලැබූ පීඩාව නිසා පමණක් වරදක් නො වේ.

එසේ ද වුවත්,-

පළමු වනු ව.- ඕනෑකමින් ම මරණය සිදු කිරීමට හෝ මරණය සිදු කිරීමට තැත් කිරීමට මේ ව්‍යතිරේකය අදාළ නොවිය යුතු ය.

දෙවනු ව.-මරණය හෝ බරපතළ තුවාළ කිරීම වැළැක්වීමේ තැනහොත් බරපතළ අසනීපයක් හෝ දුර්වලතාවයක් සුව කිරීමේ කාර්යය සඳහා හැර අන් කිසිවක් සඳහා කරනු ලැබූ යම් ක්‍රියාවකින් මරණය සිදුවිය හැකි බව ක්‍රියාව කරන්නා දනී නම්, ඒ බඳු ක්‍රියාවකට මේ ව්‍යතිරේකය අදාළ නො විය යුතු ය.

තුන් වනු ව.-මරණය හෝ බරපතළ තුවාළ කිරීම වැළැක්වීමේ තැනහොත් බරපතළ අසනීපයක් හෝ දුර්වලතාවක් සුව කිරීමේ කාර්යය සඳහා හැර අන් කිසි කාර්යයක් සඳහා කැමැත්තෙන් ම කරනු ලැබූ බරපතල තුවාළ කිරීමකට හෝ බරපතළ තුවාළ කිරීමේ තැත් කිරීමකට මේ ව්‍යතිරේකය අදාළ නොවිය යුතු ය.

සතර වනු ව.- යම් වරදක් කිරීමට මේ ව්‍යතිරේකය අදාළ නොවේ නම්, ඒ වරද කිරීමට අනුබල දීම සඳහා ද, මේ ව්‍යතිරේකය අදාළ නො විය යුතු ය.

නිදර්ශනය

ශල්‍යකර්මයෙන් ළමයාගේ මරණය විය හැකි බව දනිමින් ම ළමයාගේ මරණය සිදු කිරීමේ අදහසක් නොමැතිව ළමයාගේ කැමැත්ත නොගෙන ඔහුගේ යහපත සඳහා අශ්මරිය ගලක් ඉවත් කිරීම පිණිස ශල්‍ය වෛද්‍යවරයකු ලවා "ඒ" සද්භාවයෙන් ම තම ළමයාට ශල්‍ය කර්මයක් කරවයි "ඒ" ගේ පරමාර්ථය ළමයා සුව කිරීම බැවින් "ඒ" ව්‍යතිරේකයට ඇතුළත් වේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**83.** පාඩුවක බියකින් හෝ කරුණ වරදවා තේරුම් ගැනීමකින් කැමැත්ත දෙන ලද නම් ද, එබඳු බියක් හෝ වරදවා තේරුම් ගැනීමක් නිසා කැමැත්ත දුන් බව ක්‍රියාව කරන්නා දන්නේ නම් හෝ එය එසේ බව විශ්වාස කිරීමට කරුණු තිබේ නම් ද, නැතහොත්

තමාගේ කැමැත්ත දෙනු ලබන කරුණෙහි ස්වභාවය හා විපාකය සිහි විකලවීම නිසා හෝ මත්කම නිසා තේරුම් ගැනීමට නො හැකි වූ තැනැත්තකු විසින් කැමැත්ත දෙනු ලැබී නම් හෝ, පද සංසන්දනයෙන් විරුද්ධ අර්ථයක් නොපෙනෙන අවස්ථාවක දී, වයස අවුරුදු දොළහකට අඩු තැනැත්තකු විසින් කැමැත්ත දෙනු ලැබී නම් ඒ බඳු කැමැත්තක් මේ සංග්‍රහයෙහි කිසි වගන්තියකින් අදහස් කරනු ලැබූ කැමැත්තක් නොවේ.

බියකින් හෝ වරදවා තේරුම් ගැනීමකින් කැමැත්ත දුන් බව දැන ගන්නට ලැබීම.

ළමයකුගේ හෝ සිහි විකල් වූවකුගේ කැමැත්ත.

**84.** කැමැත්ත දෙන තැනැත්තාට හෝ යමකු වෙනුවෙන් කැමැත්ත දේ නම්, ඒ තැනැත්තාට සිදු කළ හැකි හෝ සිදු කිරීමට අදහස් කරනු ලැබූ හෝ සිදුවිය හැකි බව දන්නා වූ යම් පීඩාවක් හැර වෙනම කෙරෙන්නා වූ වරදවලට 80 වෙනි, 81 වෙනි හා 82 වෙනි වගන්තිවල ව්‍යතිරේක අදාළ නොවේ.

කැමැත්ත දෙන තැනැත්තාට සිදු කරන පීඩාව ගැන සැලකීමක් නොමැතිව වැරදි වන ක්‍රියාවලට, 80 වෙනි 81 වෙනි හා 82 වෙනි වගන්තිවල ව්‍යතිරේක අදාළ නොවන බව.

**නිදර්ශනය**

ගබ්සා කිරීම (ස්ත්‍රියගේ ජීවිතය බේරා ගැනීමේ කාර්යය සඳහා සද්භාවයෙන් කරන ලද්දක් නොවේ නම්), ගබ්සා කිරීමෙන් ස්ත්‍රියට සිදු විය හැකි හෝ සිදු කිරීමට අදහස් කරනු ලැබූ යම් පීඩාවකින් තොරව ම වරදක් වේ. ඒ නිසා එය එබඳු පීඩාවක් නිසා ම වරදක් බවට නො පැමිණේ. එමෙන් ම, ඒ ගබ්සා කිරීම පිළිබඳ ව දෙනු ලැබූ ස්ත්‍රියගේ හෝ භාරකාරයාගේ කැමැත්ත නිසා ඒ ක්‍රියාව නිදොස් නොවේ.

**85.** යම් තැනැත්තකුගේ යහපත සඳහා ඔහුගේ කැමැත්ත නැති ව වුව ද, සද්භාවයෙන් කරනු ලැබූ යම් ක්‍රියාවකට, ඒ අවස්ථාවේ අන්දමට ඔහුට කැමැත්ත දීම කළ නො හැකි නම් හෝ කැමැත්ත දීමට පුළුවන් කමක් නැත්නම් හා එකී ක්‍රියාව ප්‍රයෝජනවත් ලෙස කිරීමට කල් වේලා ඇති ව කැමැත්ත ගත හැකි භාරකාරයෙක් හෝ නීත්‍යානුකූලව භාර සිටින තැනැත්තෙක් නැත්නම් ඔහුට ඉන් වූ පීඩාවක හේතුවෙන් පමණක් ඒ ක්‍රියාව වරදක් නො වේ.

කැමැත්ත නැතිවම යම් තැනැත්තකුගේ යහපත සඳහා සද්භාවයෙන් කරනු ලැබූ ක්‍රියාව.

එසේ ද වුවත්, -

**පළමු වනු ව.**-ඕනෑකමින් ම මරණය සිදු කිරීමට හෝ මරණය සිදු කිරීමට තැත් කිරීමට මේ ව්‍යතිරේකය අදාළ නො විය යුතු ය.

**දෙවනු ව.**-මරණය හෝ බරපතළ තුවාල කිරීම වැළැක්වීමේ නැතහොත් බරපතළ අසනීපයක් හෝ දුර්වලතාවක් සුව කිරීමේ කාර්යය සඳහා හැර, අන් කිසිවක් සඳහා කරනු ලැබූ යම් ක්‍රියාවකින් මරණය සිදුවිය හැකි බව ක්‍රියාව කරන්නා දනී නම් එබඳු කිසි ක්‍රියාවකට මේ ව්‍යතිරේකය අදාළ නො විය යුතු ය.

**තුන් වනු ව.**-මරණය හෝ තුවාල කිරීම වැළැක්වීමේ කාර්යය සඳහා හැර, අන් කිසි කාර්යයක දී ඕනෑකමින් ම තුවාල කිරීම හෝ තුවාල කිරීමට තැත් කිරීම පිළිබඳ ව මේ ව්‍යතිරේකය අදාළ නො විය යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**සතර වනු ව.**–යම් වරදක් කිරීමට මේ ව්‍යතිරේකය අදාළ නොවන්නේ නම්, එ බඳු වරදක් කිරීමට අනුබල දීමකට ද මේ ව්‍යතිරේකය අදාළ නො විය යුතු ය.

**නිදර්ශන**

(අ) "ඉසෙඩ්" අශ්වයා පිටින් වැටී සිහිසන් නැති ව සිටියි. "ඉසෙඩ්" ගේ හිස් කබල කපා ශල්‍ය කර්මයක් කළ යුතු බව ශල්‍ය වෛද්‍යවරයකු වූ "ඒ" ට වැටහෙයි. "ඉසෙඩ්" මැරීම අදහස් නොකර, "ඉසෙඩ්" ගේ යහපත සඳහා "ඉසෙඩ්" තමා විසින් ම යමක් නිශ්චය කර ගැනීමට පෙර, "ඒ" ශල්‍ය කර්මය කරයි. "ඒ" වරදක් කර නැත

(ආ) "ඉසෙඩ්" ට වලසකු විසින් පහර දෙනු ලබයි. "ඉසෙඩ්" මැරීමේ අදහසින් නොව, "ඉසෙඩ්" ගේ යහපත සද්භාවයෙන් අදහස් කරමින්, වෙඩිල්ලෙන් "ඉසෙඩ්" මරණයට පත්වීමට ඉඩ ඇති බව දැන දැන ම "ඒ" වලසාට වෙඩි තබයි. "ඒ" ගේ වෙඩිල්ලෙන් "ඉසෙඩ්" ට මාරක තුවාළයක් සිදු කෙරෙයි. "ඒ" වරදක් කර නැත.

(ඇ) වහාම ශල්‍ය කර්මයකින් නො කළහොත් මරණය සිදුවිය හැකි තරමේ හදිසි අනතුරකින් දුක් විඳින දරුවකු ශල්‍ය වෛද්‍යවරයකු වූ "ඒ" දකියි. දරුවාගේ භාරකාරයාගෙන් කැමැත්ත ගැනීමට කාලයක් නො තිබිණි. දරුවාගේ යහපත සද්භාවයෙන් අදහස් කොට ගෙන, ඔහුගේ ආයාචනාවලට ඇහුම්කන් නොදී "ඒ" ශල්‍ය කර්මය සිදු කරයි. "ඒ" වරදක් කර නැත.

(ඈ) "ඉසෙඩ්" නම් වූ දරුවකු සමග "ඒ" ගිනිගත්තා ගෙයක සිටියි. පහත සිටින ජනයා පොරෝණයක් අල්ලති. වැටීමෙන් දරුවා ගේ මරණය වීමට ඉඩ ඇති බව දැන දැන ම එහෙත් දරුවා මැරීමේ අදහසක් නො මැති ව ඔහුගේ යහපත් සද්භාවයෙන් අදහස් කොට ගෙන, "ඒ" ගෙයි මුදුන සිට දරුවා බිමට දමයි. එ ලෙස බිමට දැමීමෙන් දරුවා මළත් "ඒ" වරදක් කර නැත.

**පැහැදිලි කිරීම.**–මුදල් ලැබීමෙන් වන යහපත පමණක් 81 වෙනි, 82 වෙනි හා 85 වෙනි වගන්තිවල අර්ථය ඇතුළත යහපත නොවේ.

**සද්භාවයෙන් කරනු ලැබූ දැන්වීම.**

**86.** යමකුට සද්භාවයෙන් කරනු ලැබූ දැන්වීමකින් යම් පීඩාවක් වූ නමුදු, එය ඔහුගේ යහපත සඳහා කරන ලද්දක් නම්, ඒ පමණකින් එය වරදක් නොවේ.

**නිදර්ශනය**

ශල්‍ය වෛද්‍යවරයකු වූ "ඒ" රෝගියාට ජීවත්විය නො හැකිය යන සිය මතය රෝගියාට සද්භාවයෙන් දන්වයි. ඉන් වූ කම්පනයෙන් රෝගියා මිය යයි. එකී දැන්වීමෙන් රෝගියාගේ මරණය විය හැකි බව "ඒ" දත් නමුදු ඉන් ඔහු වරදක් කර නැත.

**යමෙකු විසින් කරන ලෙස තර්ජනවලින් බල කරනු ලබූ ක්‍රියාව.**

**87.** යම් ක්‍රියාවක් කරන වේලෙහි එසේ නො කළහොත්, එහි විපාකය වශයෙන් එ කෙණෙහිම එකී ක්‍රියාව කරන්නාට මරණය යුක්ති සහගත ව බලාපොරොත්තු විය හැකි ප්‍රමාණයක තර්ජනවලින් බල කරනු ලැබූ නිසා කරනු ලැබූ, මිනී මැරුම හා මරණීය දණ්ඩනයෙන් දඬුවම් කළ හැකි ආණ්ඩුවට විරුද්ධ වූ ක්‍රියා හැර, අන් කිසි ම ක්‍රියාවක් වරදක් නොවේ. මෙය වරදක් නොවීමට එකී ක්‍රියාව කරන්නා සිය කැමැත්තෙන්ම නැතහොත් ක්ෂණික මරණයට අඩු පීඩාවක යුක්ති සහගත අනුමානයකින් එසේ බල කිරීමකට යටත් වන තත්වයකට තමාගේ ම ඕනෑකමින් පත් නො වී සිටිය යුතු ය.

**පැහැදිලි කිරීම 1.**–ගෙවල් බිඳින්නන් රංචුවකට ඔවුන්ගේ හැසිරීම දනිමින් ම තමාගේ කැමැත්තෙන් හෝ පහර දෙනු ලැබීමේ තර්ජනයක හේතුවෙන් එකතු වන තැනැත්තකුට තම සහචරයන්ගේ බල කිරීමේ හේතුවෙන් නීති විරෝධි ක්‍රියාවක් කර මේ ව්‍යතිරේකයේ වාසිය ලබා ගැනීමට බලය නැත්තේ ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**පැහැදිලි කිරීම 2**.–ගෙවල් බිඳින්නන් රංචුවක් විසින් අල්වා ගන්නා ලදුව ක්ෂණික මරණයක තර්ජනයෙන් නීති විරෝධී ක්‍රියාවක් කිරීමට බල කරනු ලැබූ කෙනකුට; උදාහරණයක් වශයෙන් ගෙවල් බිඳින්නන් විසින් ඇතුළුව කොල්ලකෑම සඳහා, තම ආයුධ වලින් ගෙදරක දොරක් කඩා දීමට බල කරනු ලැබූ ලෝකුරුවකුට මේ ව්‍යතිරේකයේ වාසිය ලබා ගැනීමට බලය ඇත්තේ ය.

සුළු පීඩාවක් සිදු කරන ක්‍රියාව.

**88.** යමකින් වන පීඩාව, සාමාන්‍ය බුද්ධියෙන් හා ගතියෙන් යුත් තැනැත්තකු විසින් පැමිණිලි නො කරන තරමේ සුලු පීඩාවක් නම්, ඉන් යම් පීඩාවක් ඇති කර ලීමේ හෝ, ඇති කරලීමට අදහස් කිරීමේ හෝ, ඇති කරලීමට ඉඩ ඇති බව දැන ගැනීමේ හේතුවෙන් පමණක් වරදක් නොවේ.

### පුද්ගලික ආරක්ෂාවේ අයිතිය

පුද්ගලික ආරක්ෂාවෙහි දී කරන කිසිවක් වරදක් නොවන බව.

**89.** පුද්ගලික ආරක්ෂාවේ අයිතිය පාවිච්චි කිරීමෙහි දී කරන කිසිවක් වරදක් නො වේ.

ශරීරය හා දේපල පිළිබඳ පුද්ගලික ආරක්ෂාවේ අයිතිය.

**90.** 92 වෙනි වගන්තියේ ඇතුළත් සීමා කිරීම්වලට යටත් ව, පහත දැක්වෙන දේවල් ආරක්ෂා කර ගැනීමට සෑම තැනැත්තකුට ම අයිතිය ඇත්තේ ය.

පැහැදිලි කිරීම

**පළමු වනු ව**.–මනුෂ්‍ය ශරීරයට විරුද්ධව කෙරෙන යම් වරදක දී තමාගේ ශරීරය ද, වෙනත් තැනැත්තකුගේ ශරීරය ද,

**දෙවනු ව**.–සොරකම, කොල්ලකෑම, අනර්ථ කිරීම හෝ සාපරාධී අයුතු ඇතුළුවීම ; හෝ සොරකමට, කොල්ල කෑමට, අනර්ථ කිරීමට හෝ සාපරාධී අයුතු ඇතුළුවීමට තැත් කිරීම පිළිබඳව විස්තරය යටතේ වැටෙන වරදක් වූ ක්‍රියාවක දී, තමාගේ හෝ වෙනත් තැනැත්තකුගේ චංචල හෝ නිශ්චල දේපළ ද වේ.

සිහි විකල වූවකුගේ ක්‍රියාව ආදියට විරුද්ධව පුද්ගලික ආරක්ෂාවේ අයිතිය.

**91.** යම් ක්‍රියාවක් කරන තැනැත්තාගේ තරුණ භාවය, බුද්ධිය මේරීමේ අඩුකම, සිහි විකල බව හෝ මත්කම නිසා ; නැතහොත් එකී තැනැත්තා කරුණු වරදවා තේරුම් ගැනීම නිසා නොවේ නම් ඒ ක්‍රියාව නියතයෙන් ම වරදක් වන අවස්ථාවක දී, ඒ ක්‍රියාව වරදක් වූ විටක ඇති පුද්ගලික ආරක්ෂාවේ අයිතිය ම, එම ක්‍රියාවට විරුද්ධ ව සෑම තැනැත්තකුට ම ඇත්තේ ය.

**නිදර්ශන**

(අ) "ඉසෙඩ්" උමතුව නිසා "ඒ" මැරීමට තැත් කරයි. "ඉසෙඩ්" කිසි වරදකට වරදකරු නොවේ. එහෙත් "ඉසෙඩ්" හොඳ සිහිය ඇති ව ක්‍රියා කළ විටක "ඒ" ට ඇති පුද්ගලික ආරක්ෂාවේ අයිතිය ම මේ අවස්ථාවේ දී ත් "ඒ" ට ඇත්තේ ය.

(ආ) නීත්‍යානුකූලව තමාට ඇතුළු වීමට බලය ඇති ගෙයකට "ඒ" රාත්‍රියෙහි දී ඇතුළු වෙයි. "ඒ" ගෙවල් බිඳින්නකු ලෙස සද්භාවයෙන් සැලකීමෙන් "ඉසෙඩ්" "ඒ" ට පහර දෙයි. මෙහි දී එලෙස කරුණු වරදවා තේරුම් ගැනීමෙන් කරන ලද පහර දීමෙන් "ඉසෙඩ්" කිසි වරදක් නො කරන නමුත් "ඉසෙඩ්" එ ලෙස කරුණු වරදවා තේරුම් නො ගෙන ක්‍රියා කළ විටෙක ඔහුට විරුද්ධව "ඒ" ට ඇති පුද්ගලික ආරක්ෂාවේ අයිතිය ම මේ අවස්ථාවේදීත්, ඇත්තේ ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

පුද්ගලික ආරක්ෂාවේ අයිතිය නොමැති ක්‍රියා.

92. (1) තමාගේ නිලයෙහි නාමයෙන්, රජයේ සේවකයකු විසින් සද්භාවයෙන් කරනු ලැබූ හෝ කිරීමට තැත් කරනු ලැබූ මරණය හෝ බරපතළ තුවාළ කිරීමක් විය හැකි ය යි සාධාරණ ලෙස සිතිය හැකි ක්‍රියාවක් නියම ලෙස ම නීත්‍යානුකූල නො වන නමුදු ඊට විරුද්ධව පුද්ගලික ආරක්ෂාවේ අයිතිය නැත්තේ ය.

(2) තමාගේ නිලයෙහි නාමයෙන් සද්භාවයෙන් ක්‍රියා කරන රජයේ සේවකයකුගේ නියමය ලෙස කරනු ලැබූ හෝ කිරීමට තැත් කරනු ලැබූ මරණය හෝ බරපතල තුවාළ කිරීමක් විය හැකි ය යි සාධාරණ ලෙස සිතිය හැකි ක්‍රියාවක් නියම ලෙස ම නීත්‍යානුකූල නොවන නමුදු, ඊට විරුද්ධව පුද්ගලික ආරක්ෂාවේ අයිතිය නැත්තේ ය.

(3) ආණ්ඩුවේ බලධරයන්ගේ රැකවරණය ලබා ගැනීමට කාලය තිබේ නම්, එ බඳු අවස්ථාවල දී පුද්ගලික ආරක්ෂාවේ බලය නැත්තේ ය.

අයිතිය ක්‍රියා කර විය හැකි ප්‍රමාණය.

(4) ආරක්ෂාවේ කාර්‍ය්‍යය සඳහා අවශ්‍ය වන ප්‍රමාණයකට හැර, ඊට වඩා පීඩාවක් සිදු කිරීමට කවර අවස්ථාවක දී වුව ද, පුද්ගලික ආරක්ෂාවේ අයිතිය නො පැතිරේ.

පැහැදිලි කිරීම 1.–රජයේ සේවකයකු විසින් රජයේ සේවකයකු වශයෙන් කරන ලද හෝ කිරීමට තැත් කරන ලද ක්‍රියාවක දී, ඒ ක්‍රියාව කරන තැනැත්තා රජයේ සේවකයකු බව යම් කෙනෙක් නො දන්නේ නම් හෝ ඔහුට ඒ බව විශ්වාස කිරීමට හේතු නැත්නම්, ඒ ක්‍රියාවට විරුද්ධ ව, පුද්ගලික ආරක්ෂාවේ අයිතිය නැති නොවේ.

පැහැදිලි කිරීම 2.–රජයේ සේවකයකුගේ නියමයෙන් කරන ලද හෝ කිරීමට තැත් කරන ලද ක්‍රියාවක දී, ඒ ක්‍රියාව කරන තැනැත්තා රජයේ සේවකයකු ගේ නිගමනයෙන් ක්‍රියා කරන්නකු බව යම් කෙනකු නො දන්නේ නම් හෝ ඔහුට ඒ බව විශ්වාස කිරීමට හේතු නැත්නම් හෝ, ඒ ක්‍රියාව කරන තැනැත්තා තමා ක්‍රියා කරන්නේ කාගේ බලයක් අනුව ද යනු නො කියන්නේ නම් හෝ, ඒ ක්‍රියාව කරන තැනැත්තා වෙත ලිපියකින් දෙන ලද බලයක් ඇති විටෙක එය ඉල්වන ලද නමුදු, ඔහු එය ඉදිරිපත් නො කරන්නේ නම්, ඒ ක්‍රියාවට විරුද්ධව පුද්ගලික ආරක්ෂාවේ අයිතිය නැති නොවේ.

ශරීරය පිළිබඳ පුද්ගලික ආරක්ෂාවේ අයිතිය මරණය සිදු කිරීම දක්වා.

93. අයිතිය ක්‍රියාවේ යෙදවීමට හේතු වූ වරද පහත සඳහන් විස්තරවලින් යමකට වැටේ නම්, ඉහතින් වූ වගන්තියේ සඳහන් සීමා කිරීම්වලට යටත් ව, පහර දෙන්නාහට ඕනෑ කමින් ම මරණය හෝ වෙනත් පීඩාවක් සිදු කිරීම දක්වා ශරීරය පිළිබඳ පුද්ගලික ආරක්ෂාවේ අයිතිය පැතිරේ.

එනම් :–

**පළමු වනු ව**–එසේ නො කළහොත් ප්‍රතිඵලය මරණය සිදුවීම ය යි සාධාරණ ලෙස අනුමාන කළ හැකි යම් පහර දීමක් ;

**දෙ වනු ව.**–එසේ නො කළහොත්, ප්‍රතිඵලය බරපතළ තුවාළවීම ය යි සාධාරණ ලෙස අනුමාන කළ හැකි යම් පහර දීමක් ;

**තුන් වනු ව.**–ස්ත්‍රී දූෂණය කිරීමේ අදහසින් පහර දීමක් ;

**හතර වනු ව.**–අස්වාභාවික ලෙස කාමය සංසිඳවා ගැනීමේ අදහසින් පහර දීමක් ;



https://ezofz.web.lk/
Scanned with CamScanner

පස් වනු ව.–අපහරණය කිරීමේ හෝ පැහැරගෙන යාමේ අදහසින් පහර දීමක් ;

හය වනු ව.– තමා නිදහස් කර ගැනීම සඳහා ආණ්ඩුවේ බලධරයකු වෙත ඉදිරිපත් වීමට ඉඩ නැති වන බව සාධාරණ ලෙස අනුමාන කිරීමට හැකි වන අවස්ථා යටතේ යම් තැනැත්තකු අයුතු ලෙස සිරකර ගැනීමේ අදහසින් පහර දීමක්.

**94.** ඉහතින් වූ වගන්තියේ දැක්වුණු විස්තරයකට වරද නො වැටේ නම්, ශරීරය පිළිබඳ පුද්ගලික ආරක්ෂාවේ අයිතිය පහර දෙන්නා හට ඕනෑකමින් ම මරණය සිදු කිරීම දක්වා නො පැතිරේ. එහෙත් 92 වෙනි වගන්තියේ දැක්වුණු සීමා කිරීම්වලට යටත් ව, මරණය නො වන වෙනත් පීඩාවක් පහර දෙන්නා හට කැමැත්තෙන් ම සිදු කිරීම දක්වා ඒ අයිතිය පැතිරේ.

*මරණය නොවන වෙනත් හානියක් සිදු කිරීමට එබඳු බලයක් පැතිරෙන අවස්ථා.*

**95.** වරද කිරීමට තැත් කිරීමකින් හෝ තර්ජනයකින් අන්තරායක් ඇති වන බවට සාධාරණ ලෙස සැකයක් ඇති වූ වහා ම ඒ වරද නො කළ ද, ශරීරය පිළිබඳ පුද්ගලික ආරක්ෂාවේ අයිතිය ඇති වේ. ශරීරයට අන්තරාය වීමේ අනුමානය පවත්නා තෙක් එම අයිතිය පවත්නේ ය.

*ශරීරය පිළිබඳ පුද්ගලික ආරක්ෂාවේ අයිතිය ඇතිවීම හා පැවතීම.*

**96.** පුද්ගලික ආරක්ෂාවේ බලය පාවිච්චි කිරීමට හේතු වූ සිදු කරනු ලැබූ හෝ සිදු කිරීමට තැත් කරනු ලැබූ වරද මෙහි පහත සඳහන් වන විස්තරවලින් යමක් නම්, දේපල පිළිබඳ පුද්ගලික ආරක්ෂාවේ අයිතිය 92 වෙනි වගන්තියේ සීමා කිරීම්වලට යටත් ව, වරද කරන්නා කැමැත්තෙන් ම මරණය සිදු කිරීම හෝ වෙනත් පීඩාවක් සිදු කිරීම දක්වා පැතිරේ.

*දේපළ පිළිබඳ පුද්ගලික ආරක්ෂාවේ අයිතිය මරණය සිදු කිරීම දක්වා පැතිරීම.*

එකී වැරදි නම් :–

පළමු වනු ව.–කොල්ල කෑම ;

දෙ වනු ව.–රාත්‍රියෙහි දී ගෙවල් බිඳීම ;

තුන් වනු ව.–මනුෂ්‍ය වාසයක් වශයෙන් හෝ දේපළ තැබීමේ ස්ථානයක් වශයෙන් පාවිච්චි කරනු ලැබූ යම් ගොඩනැගිල්ලක, කූඩාරමක හෝ යාත්‍රාවක ගින්නෙන් හෝ පුපුරණ ද්‍රව්‍යකින් අනර්ථය කිරීම ;

හතර වනු ව.–පුද්ගලික ආරක්ෂාවේ අයිතිය පාවිච්චි නොකළහොත්, ප්‍රතිඵලය මරණය හෝ බරපතළ තුවාළ කිරීම වන බව සාධාරණ ලෙස අනුමාන කළ හැකි අවස්ථාවල දී, සොරකම, අනර්ථ කිරීම හෝ ගෙයකට අයුතු ලෙස ඇතුළුවීම.

**97.** පුද්ගලික ආරක්ෂාවේ අයිතිය පාවිච්චි කිරීමට හේතු වූ සිදුකරනු ලැබූ හෝ සිදු කිරීමට තැත් කරනු ලැබූ වරද ඉහතින් වූ වගන්තියේ සඳහන් විස්තරයකට නො වැටෙන, සොරකම, අනර්ථ කිරීම හෝ සාපරාධි අයුතු ඇතුළුවීමට නම්, එකී බලය ඕනෑකමින් ම මරණය සිදු කිරීම දක්වා නො පැතිරෙතත්, 92 වෙනි වගන්තියේ සඳහන් සීමා කිරීම්වලට යටත් ව, වරද කරන්නාට මරණය නොවන වෙනත් පීඩාවක් කැමැත්තෙන් ම සිදු කිරීම දක්වා පැතිරේ.

*මරණය නො වන වෙනත් පීඩාවක් සිදුකිරීම දක්වා එබඳු බලයක් පැතිරෙන අවස්ථා.*



https://ezofz.web.lk/
Scanned with CamScanner

දේපළ පිළිබඳ ව පුද්ගලික ආරක්ෂාවේ අයිතිය ඇතිවීම හා පැවතීම.

**98.**-**පළමු වන** ව.-දේපළවලට අන්තරායක සැකයක් සාධාරණ ලෙස ඇති වූ විට ම දේපළ පිළිබඳව පුද්ගලික ආරක්ෂාවේ අයිතිය ඇති වේ.

**දෙ වනු** ව.-කොල්ලකෑමට විරුද්ධ ව දේපළ පිළිබඳ ආරක්ෂාවේ අයිතිය දේපළත් සමග වරදකරු පැන යන තෙක් හෝ ආණ්ඩුවේ බලධරයකුගේ ආධාරය ලබා ගන්නා තෙක් හෝ දේපළ ආපසු සොයා ගන්නා තෙක් පවත්නේ ය.

**තුන් වනු** ව.-කොල්ලකෑමට විරුද්ධව දේපළ පිළිබඳව පුද්ගලික ආරක්ෂාවේ අයිතිය යම් තැනැත්තකුට වරදකරුවකු මරණය සිදු කිරීම හෝ තුවාළ කිරීම හෝ අයුතු අවහිරය කිරීම තෙක් හෝ කිරීමට තැත් කරන තෙක් හෝ ක්ෂණික මරණය හෝ ක්ෂණික තුවාළ කිරීම හෝ ක්ෂණික පුද්ගලික අයුතු අවහිරය පිළිබඳ බිය පවත්නා තෙක් පවත්නේ ය.

**හතර වනු** ව.-සාපරාධී අයුතු ඇතුළුවීමට හෝ අනර්ථ කිරීමට විරුද්ධ ව, දේපළ පිළිබඳ ව පුද්ගලික ආරක්ෂාවේ අයිතිය වරදකරු සාපරාධී අයුතු ඇතුළුවීම හෝ අනර්ථය කරන තෙක් පවතින්නේ ය.

**පස් වනු** ව.-රාත්‍රියෙහි දී ගෙවල් බිඳීමට විරුද්ධ ව දේපළ පිළිබඳ ව පුද්ගලික ආරක්ෂාවේ අයිතිය ඒ ගෙවල් බිඳීමෙන් හට ගැනුණු අයුතු ලෙස ගෙයට ඇතුළුවීම පවත්නා තෙක් පවත්නේ ය.

නිර්දෝෂ තැනැත්තකුට පීඩාවක් වීමේ අවදානමක් ඇති වූ විට මාරක පහර දීමකට විරුද්ධව පුද්ගලික ආරක්ෂාවේ අයිතිය.

**99.** මරණය සිදුවීම සාධාරණ ලෙස සැක කළ හැකි පහර දීමකට විරුද්ධ ව, පුද්ගලික ආරක්ෂාවේ අයිතිය පාවිච්චි කිරීමෙහි දී, නිර්දෝෂ තැනැත්තකුට පීඩාවක් වීමේ අවදානමක් ඇති ව මිස ආරක්ෂාව සොයන්නා සිටින ස්ථානයේ අන්දමට සාර්ථක ලෙස ඒ බලය පාවිච්චි කිරීමට නො හැකි නම්, ඔහුගේ පුද්ගලික ආරක්ෂාවේ අයිතිය අවදානමට මුහුණ පෑම දක්වා පැතිරේ.

**නිදර්ශනය**

"ඒ" මැරීමට තැත් කරන කලහකාරී පිරිසක් විසින් "ඒ" ට පහර දෙනු ලබයි. කලහකාරී පිරිසට වෙඩි නොතබා ඔහුට ඔහුගේ පුද්ගලික ආරක්ෂාවේ අයිතිය සාර්ථක ලෙස පාවිච්චි කිරීමට නුපුළුවන. එමෙන් ම, කලහකාරී පිරිස සමග මිශ්‍ර වී ඇති බාල දරුවන් හට පීඩා කිරීමේ අවදානමෙන් තොරව ඔහු විසින් වෙඩි තැබීමට ද නො හැකිය. එලෙස වෙඩි තැබීමෙන් යම් ළමයින් හට ඔහු පීඩාවක් කරතත්, "ඒ" වරදක් නො කරයි.

## V වෙනි පරිච්ඡේදය

### අනුබල දීම

යමක් කිරීමට අනුබලදීම.

**100. පළමු වනු** ව.-යම් දෙයක් කිරීමට යම් කෙනකු පොළඹවන්නෙක්, හෝ

**දෙ වනු** ව.-යම් දෙයක් කිරීමට කුමන්ත්‍රණයක යෙදෙන්නෙක්, හෝ

**තුන් වනු** ව.-යම් දෙයක් කිරීමට යම් ක්‍රියාවකින් හෝ නීති විරෝධී නොකර හැරීමකින් ඕනෑකමින් ම උපකාර කරන්නෙක්, එය කිරීමට අනුබල දෙන්නෙක් වේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**පැහැදිලි කිරීම 1.**–අනාවරණය කිරීමට බැඳී ඇති යම් අවශ්‍ය කරුණක් ඕනෑකමින් ම වරදවා ගෙන හැර පෑමෙන් හෝ ඕනෑකමින් ම සැහවීමෙන් යම් කිසි දෙයක් කැමැත්තෙන්ම කරවීම හෝ ලබාගැනීමට හෝ කරවීමට හෝ ලබා ගැනීමට තැත් කිරීම ඒ දෙය කිරීමට පෙළඹවීම යයි කියනු ලැබේ.

**නිදර්ශනය**

"ඉසෙඩ්" අත් අඩංගුවට ගැනීමට රජයේ නිලධාරියකු වූ "ඒ" ට අධිකරණයක වරෙන්තුවකින් බලය දෙයි. එකී කරුණ ද "සී" "ඉසෙඩ්" නොවන බවද, දනිමින්ම "සී" "ඉසෙඩ්" යයි "ඒ" ට ඕනෑකමින් "බී" කියා සිට, ඉන් "සී" "ඒ" ලවා අත් අඩංගුවට ගැනීම සිදු කරවයි. මෙහදී "සී" අත් අඩංගුවට ගැනීමට පෙළඹවීමෙන් "බී" අනුබල දෙයි.

**පැහැදිලි කිරීම.**–යම් දෙයක් කිරීමට හෝ කරවීමට හෝ කිරීම සැලැස්වීමට දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් එකඟවීම ඒ දෙය කිරීම සඳහා වූ කුමන්ත්‍රණය වේ. අධිකරණයේ අධිකරණ බලය ඇතුළත වූ තැනැත්තකු එකී අධිකරණයෙහි අධිකරණ බලයෙන් පිට තැනැත්තෙකු හෝ ඊට වැඩි ගණනක් සමග, ඔවුන් ලවා හෝ ඔවුන්ගෙන් කෙනකු ලවා හෝ වෙනත් තැනැත්තකු ලවා යම් දෙයක් කරවීම පිණිස කුමන්ත්‍රණයක යෙදීම ඒ වරදට අනුබල දීමකි.

**පැහැදිලි කිරීම 3.**–යම් ක්‍රියාවක් කිරීමට පෙර හෝ එය කරන වේලාවෙහි ඒ ක්‍රියාව කිරීම පහසුවන ලෙස යමක් යමකු විසින් කරන ලදුව ඉන්, එම ක්‍රියාව කිරීම පහසු වී නම්, ඒ ක්‍රියාව කිරීමට ඔහු ආධාර දුන් ලෙස සැලකේ.

**101.** වරදක් කිරීමට හෝ අනුබල දෙන්නාගේ අදහස හා දැනුම ඇති ව නීත්‍යානුකූලව වරද කිරීමට පුළුවන් කමක් ඇති තැනැත්තකු විසින් කරන ලද නම්, වරදක් වන ක්‍රියාවක් කිරීමට අනුබල දෙන තැනැත්තා වරදකට අනුබල දෙන්නේ ය. අනුබල දෙන්නා.

**පැහැදිලි කිරීම 1.**–අනුබල දෙන්නා යම් ක්‍රියාවක් කිරීමට බැඳී නැත ද, එහි නීති විරෝධී නො කර හැරීමකට අනුබල දී ම වරදක් වීමට ඉඩ තිබේ.

**පැහැදිලි කිරීම 2.**–අනුබල දී මේ වරද වශයෙන් සලකනු ලැබීමට, අනුබල දෙනු ලැබූ වරද සිදු කිරීම හෝ වරද වශයෙන් සලකනු ලැබීමට වුවමනා වූ ප්‍රතිඵලය ගැනීම අවශ්‍ය නොවේ.

**නිදර්ශනය**

(අ) "සී" මැරීමට "ඒ" "බී" පොලඹවයි. "බී" එසේ කිරීමට නො කැමති වෙයි. මිනීමැරීමට "බී" ට අනුබල දීම ගැන "ඒ" වරද කරුවෙක් වේ.

(ආ) "ඩී" මැරීමට "ඒ" "බී" පොලඹවයි. "බී" එකී පෙළඹවීම ප්‍රකාර "ඩී" ට පිහියෙන් අනියි. "ඩී" ගේ එම තුවාලය සුව වෙයි. "බී" මිනීමැරුමට පෙළඹවීම ගැන "ඒ" වරදකරුවෙක් වෙයි.

**පැහැදිලි කිරීම 3.**–අනුබල දෙනු ලැබූ තැනැත්තා විසින් වරදක් කිරීමට නීත්‍යානුකූලව පුළුවන් කමක් තිබීම හෝ අනුබල දෙන්නාට තිබිය යුතු වරදකාරී අදහස හෝ දැනුම හෝ යම් වරදකාරී අදහසක් හෝ දැනුමක් ඔහුට තිබීම අවශ්‍ය නො වේ.

**නිදර්ශන**

(අ) නීත්‍යානුකූලව වරදක් කිරීමට පුළුවන් කමක් ඇති "ඒ" ගේ අදහස ම ඇති තැනැත්තකු විසින් කරන ලද නම්, වරදක් වන ක්‍රියාවක් කිරීමට "ඒ" වරදකාරී අදහසකින් ළමයකුට හෝ උමතු වූවකුට අනුබල දෙයි. මෙහි දී, එම ක්‍රියාව කළ ද, නො කළ ද වරදකට අනුබල දීම ගැන "ඒ" වරද කාරයෙක් වේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

(ආ) "ඉසෙඩ්" මැරීමේ අදහසින්, "ඒ" "ඉසෙඩ්" ගේ මරණය සිදු කෙරෙන ක්‍රියාවක් කිරීමට, වයස අවුරුදු හතකට අඩු දරුවකු වූ "බී" පොළඹවයි. එකී අනුබල දීම අනුව "බී" එම ක්‍රියාව කොට ඉන් "ඉසෙඩ්" ගේ මරණය සිදු කරයි. මෙහි දී "බී" ට වරදක් කිරීමට නීතිය අනුව පුළුවන් කමක් නැතත්, "බී" ට වරදක් කිරීමට නීතිය අනුව පුළුවන් කමක් තිබී මිනී මැරුමක් සිදු කළ ආකාරයට ම "ඒ" දඬුවම් ලැබීමට යටත් විය යුතු ය. එම නිසා ඔහු මරණීය දඬුවමට යටත් වේ.

(ඇ) ජනාවාස ගෙයකට ගිනි තැබීමට "ඒ" විසින් "බී" පොළඹවනු ලැබී, එම ක්‍රියාවේ ස්වභාවය හෝ තමා කරනු ලබන්නේ වැරදි දෙයක් හෝ නීති විරෝධී ක්‍රියාවක් බව සිහි විකලවීම නිසා දැන නො ගැනීමෙන් "බී", "ඒ" ගේ පෙළඹවීම අනුව ගෙට ගිනි තබයි. "බී" කිසි වරදක් කොට නැත ද, ජනවාස ගෙයකට ගිනි තැබීමේ වරදට අනුබල දීම ගැන "ඒ" වරදකාරයා ව එම වරදට නියමිත දඬුවමට යටත් වේ.

(ඈ) සොරකමක් සිදු කරවීමේ අදහසින් "ඉසෙඩ්" ම අයිති දෙපළ "ඉසෙඩ්" ගේ ස්වාමිත්වයෙන් ඉවත් කිරීමට "ඒ" "බී" පොළඹවයි. එකී දෙපළ "ඒ" ට අයිති බව "බී" ට විශ්වාස කිරීමට "ඒ" සලස්වයි. "ඒ" ගේ දෙපළ ය යි සද්භාවයෙන් විශ්වාසකරමින් "බී" එහි දෙපළ "ඉසෙඩ්" ගේ ස්වාමිත්වයෙන් ඉවත් කරයි. මෙලෙස වරදවා තේරුම් ගෙන ක්‍රියා කිරීමෙන් "බී" වංක ලෙස එකී දෙපළ ගෙන නැත. එ බැවින් ඔහු සොරකමක් නොකරයි. එහෙත් "ඒ" සොරකමට අනුබල දීම ගැන වරදකාරයාව, "බී" සොරකම සිදු කළ විටෙක මෙන් ඒ දඬුවමට ම යටත් වේ.

පැහැදිලි කිරීම 4.–වරදකට අනුබල දීම වරදක් නිසා එ බඳු අනුබල දීමකට අනුබල දීම ද වරදක් වේ.

නිදර්ශනය

"ඉසෙඩ්" මැරීමට "සී" පෙළඹවීම සඳහා "ඒ" විසින් "බී" පොළඹවනු ලැබේ. ඒ අනුව "බී" "ඉසෙඩ්" මැරීමට "සී" පොළඹවයි. "බී" ගේ පෙළඹවීමේ ප්‍රතිඵලයක් වශයෙන් "සී" එකී වරද කරයි. මිනීමැරීමේ දඬුවමින් තම වරදට දඬුවම් කරනු ලැබීමට "බී" යටත් වේ. "ඒ" වරද කිරීමට "බී" පෙළඹ වූ බැවින් "ඒ" ද එම දඬුවමට ම යටත් වේ.

පැහැදිලි කිරීම 5.–අනුබල දෙන්නා වරද කරන්නා සමග වරද කිරීම සම්මත කර ගැනීම කුමන්ත්‍රණයෙන් අනුබල දීමේ වරදක් සිදු කිරීම සඳහා අවශ්‍ය නො වේ. වරද සිදු කරනු ලැබුයේ යම් කුමන්ත්‍රණයක් ප්‍රකාර නම්, එකී කුමන්ත්‍රණයෙහි යෙදී සිටීම ප්‍රමාණවත් නොවේ.

නිදර්ශනය

"ඉසෙඩ්" ට වස දීම සඳහා "ඒ" "බී" සමග ක්‍රමයක් සම්මත කර ගනියි. "ඒ" විසින් වස දිය යුතු බවට ඔවුහු එකඟ වෙති. "ඒ" ගේ නාම සඳහන් නොකොට තුන්වැන්නකු විසින් වස දෙනු ලබන බව සඳහන් කොට, "බී" එකී ක්‍රමය "සී" ට තේරුම් කර දෙයි. වස සපයා දීමට "සී" එකඟ ව, වස සපයා, තේරුම් කර දුන් ආකාරයට වස පාවිච්චි කිරීමේ කාර්යය සඳහා වස "බී" ට භාරදෙයි. "ඒ" වස දෙයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් "ඉසෙඩ්" මිය යයි. මෙහි දී "ඒ" සහ "සී" එක්ව කුමන්ත්‍රණය නොකළ ද, "ඉසෙඩ්" මැරීම සඳහා කැරුණු කුමන්ත්‍රණයෙහි "සී" යෙදී සිටියේ ය. එ නිසා මේ වගන්තියේ විස්තර කරනු ලැබූ වරද "සී" විසින් සිදු කරනු ලැබූ හෙයින් මිනීමැරීමේ වරදට ඔහු යටත් වේ.

ලංකාවෙන් පිට වැරදිවලට ලංකාවෙහි දී අනුබල දීම.

101අ. ලංකාවෙහි සිදු කළේ නම් වරදක් වන, යම් ක්‍රියාවක් ලංකාවෙන් පිට දී හා එපිට කිරීම සඳහා ලංකාවෙහි සිටින තැනැත්තකු විසින් අනුබල දෙනු ලැබීම, මේ සංග්‍රහයෙහි සඳහන් අර්ථය ඇතුළත, කෙනෙකු විසින් වරදකට අනුබල දීමක් වේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

102. අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් අනුබල දෙනු ලැබූ ක්‍රියාව සිදු කළ විට ද, එ බඳු අනුබල දීමක් සඳහා දඬුවමක් පිළිබඳ ව විධිවිධානයක් මේ සංග්‍රහයෙන් ප්‍රකාශිත ව සලස්වා නොමැති විට ද, එ බඳු වරදකට අනුබල දෙන්නාට ඒ වරද සඳහා නියමිත දඬුවමෙන් දඬුවම් කළ යුතු ය.

අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් වරද සිදුකළ විට හා එයට දඬුවම පිළිබඳ ව විධිවිධාන පැහැදිලිව සඳහන් කොට නොමැති විට එ බඳු අනුබල දීමකට දිය යුතු දඬුවම.

**පැහැදිලි කිරීම.**–පෙළඹවීමේ ප්‍රතිඵලයක් වශයෙන් හෝ කුමන්ත්‍රණය අනුව හෝ එකී අනුබල දීම ඇති කරවන ආධාර දීමෙන් එකී වරද හෝ ක්‍රියාව සිදු වූ විට අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් ක්‍රියාවක් හෝ වරදක් කෙරී ඇති බව කියනු ලැබේ.

**නිදර්ශන**

(අ) රජයේ සේවකයකු වූ "බී" ගේ නිලය පිළිබඳ කටයුතු කිරීමේ දී "ඒ" ට යම් සැලකිල්ලක් දැක්වීම සඳහා ත්‍යාගයක් වශයෙන් "ඒ" "බී" ට අල්ලසක් දෙයි. "බී" එම අල්ලස පිළිගනියි. 158 වෙනි වගන්තියේ විස්තර කරනු ලැබූ වරදට "ඒ" අනුබල දී ඇත.

(ආ) බොරු සාක්ෂි දීමට "ඒ" විසින් "බී" පොළඹවනු ලබයි. එකී පෙළඹවීමේ ප්‍රතිඵලයක් වශයෙන් "බී" එකී වරද කරයි. එම වරදට අනුබලදීම ගැන "ඒ" වරදකාරයකු ව, "බී" ට ලැබෙන දඬුවමට ඔහුද යටත් වේ.

(ඇ) "ඉසෙඩ්" ට වස දීමට "ඒ" සහ "බී" කුමන්ත්‍රණය කරති. "බී" විසින් "ඉසෙඩ්" ට වස දෙනු ලැබීම සඳහා, කුමන්ත්‍රණය ප්‍රකාර "ඒ" වස සපයා "බී" ට බාර දෙයි. "ඒ" නොපැමිණි විටක දී "බී" කුමන්ත්‍රණය ප්‍රකාර "ඉසෙඩ්" ට වස දීමෙන් "ඉසෙඩ්" ගේ මරණය සිදු කරයි. මෙහි දී "බී" මිනීමැරුමට වරදකාරයා වේ. කුමන්ත්‍රණය කිරීමෙන් එම වරදට අනුබල දීම ගැන "ඒ" වරදකාරයා ව මිනීමැරීමේ දඬුවමට යටත් වේ.

103. අනුබල දෙනු ලැබූ තැනැත්තා අනුබල දෙන්නාගේ අදහසට හෝ දැනුමට වෙනස් වූ අදහසකින් හෝ දැනුමකින් යම් වරදක් කොට ඇති අවස්ථාවක දී, එකී වරද කිරීමට අනුබල දෙනු ලබන තැනැත්තාට අනුබල දෙන්නාගේ අදහස හෝ දැනුම ඇති ව, අන් කිසි අදහසක් හෝ දැනුමක් නොමැති ව, එකී ක්‍රියාව කරනු ලැබූ විට එම වරදට නියමිත දඬුවමෙන් දඬුවම් කළ යුතු ය.

අනුබල දෙනු ලැබූ තැනැත්තා අනුබල දෙන්නාගේ අදහසට වෙනස් වූ අදහසකින් ක්‍රියාව කරනු ලැබූ විට, අනුබල දීම ගැන දඬුවම.

104. යම් ක්‍රියාවකට අනුබල දෙනු ලැබ, ඊට වෙනස් වූ ක්‍රියාවක් කරන ලද නම්, අනුබල දෙන්නා ඒ ලෙස කරනු ලැබූ ක්‍රියාවට කෙළින්ම අනුබල දුන් ආකාරයට හා ප්‍රමාණයට වග කිව යුතු ය.

ඔහු වගකිව යුතු වන්නේ කරනු ලැබූ ක්‍රියාව එකී අනුබල දීමෙන් විය හැකි ප්‍රතිඵලයක් ව, පෙළඹවීම නිසා හෝ අනුබල දීම ඇති කර වූ ආධාරය ඇති ව හෝ එබඳු ම වූ කුමන්ත්‍රණය ප්‍රකාර කරනු ලැබූවක් වුව හොත් ය.

එක් ක්‍රියාවකට අනුබල දෙනු ලැබ, වෙනස් ක්‍රියාවක් කරන ලද නම් අනුබල දෙන්නාගේ වගකීම.

**නිදර්ශන**

(අ) "ඉසෙඩ්" ගේ ආහාර වලට වස දැමීමට "ඒ" දරුවකු පොළඹවා, එම කාර්යය සඳහා වස ඔහුට බාර දෙයි. එකී පෙළඹවීමේ ප්‍රතිඵලයක් වශයෙන්, "ඉසෙඩ්" ගේ ආහාර ළඟ, පසෙක තිබුණු "වයි" ගේ ආහාරවලට දරුවා වැරදීමකින් එම වස දමයි. "ඒ" ගේ පෙළඹවීම අනුව දරුවා ක්‍රියා කළේ නම් හා අනුබල දීමේ ප්‍රතිඵලය විය හැකි කරුණු යටතේ එකී ක්‍රියාව කරන ලද්දේ නම් "ඒ" වස "වයි" ගේ ආහාරවලට දැමීමට දරුවා පොළඹවන ලද ආකාරයට හා ප්‍රමාණයටම "ඒ" වගකිව යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

(ආ) "ඉසෙඩ්" ගේ ගෙය ගිනි තැබීමට "ඒ" "බී" පොළඹවයි. "බී" ගෙට ගිනි තැබීම සමග ම එහි දේපළ සොරකම් කරයි. ගෙය ගිනි තැබීමට අනුබල දීම ගැන, "ඒ" වරදකාරයා වන නමුත්, හොරකමට අනුබල දීම ගැන ඔහු වරදකාරයා නොවන්නේ ය. සොරකම ගිනි තැබීම නිසා වීමට ඉඩ ඇති ප්‍රතිඵලයක් නොව, වෙනස් ම ක්‍රියාවක් හෙයිනි.

(ඇ) "ඒ" කොල්ලකෑම සඳහා මධ්‍යම රාත්‍රියෙහි දී ජනයා පදිංචි ගෙයක් බිඳීමට "බී" සහ "සී" පොළඹවා එකී කාර්ය සඳහා ආයුධ ද සපයයි. "බී" සහ "සී" ගෙය බිඳීමේ දී ගෙයි පදිංචි වූවන්ගෙන් කෙනකු වූ "ඉසෙඩ්" ඔවුන් හට විරුද්ධකම් පෑ බැවින් ඔවුහු "ඉසෙඩ්" මරති. මෙහි දී අනුබල දීම නිසා වීමට ඉඩ ඇති ප්‍රතිඵලය මිනීමැරුම නම්, මිනීමැරුම සඳහා නියමිත දඬුවමට "ඒ" යටත් වේ.

අනුබල දෙනු ලැබූ ක්‍රියාව හා කරනු ලැබූ ක්‍රියාව සඳහා එකතු වූ දඬුවමකට අනුබල දෙන්නා යටත් වන අවස්ථා.

**105.** අනුබල දෙනු ලැබූ ක්‍රියාවට අතිරේක ව, ඉහතින් වූ වගන්තිය යටතේ අනුබල දෙන්නා යටත් වනු ලබන ක්‍රියාව ද කරනු ලැබ, එකී ක්‍රියාව වෙනස් වූ වරදක් වශයෙන් සැලකේ නම්, අනුබල දෙන්නා එක් එක් වරද සඳහා දඬුවම්,

**නිදර්ශනය**

රජයේ සේවකයකු විසින් තිකුත් කරනු ලැබූ චංචල දේපළ තහනම් ආඥාවකට බලහත්කාර කමින් විරුද්ධකම් පාන ලෙස "ඒ" "බී" පොළඹවයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් "බී" එම ආඥාවට විරුද්ධකම් පායි. විරුද්ධකම් පෑමෙහි දී එම ආඥාව භාර දෙන නිලධාරියාට ඔහු කැමැත්තෙන්ම බරපතළ තුවාල සිදු කරයි. "බී" ආඥාවට විරුද්ධකම් පෑම හා කැමැත්තෙන් ම බරපතල තුවාල කිරීම යන වැරදි දෙකට ම දඬුවම් ලැබීමට යටත් වේ. තව ද ආඥාවට විරුද්ධකම් පෑමෙහි දී කැමැත්තෙන්ම බරපතල තුවාල "බී" විසින් සිදු කරනු ලැබිය හැකි බව "ඒ" දැන සිටියේ නම්, "ඒ" ද එකී එක් එක් වරද සම්බන්ධයෙන් දඬුවම් ලැබීමට යටත් වන්නේ ය.

අනුබල දෙන්නා විසින් අදහස් කරනු ලැබූ ප්‍රතිඵලයට වෙනස් ප්‍රතිඵලයක් අනුබල දෙනු ලැබූ ක්‍රියාවෙන් ඇති වූ විට අනුබල දෙන්නාගේ වගකීම.

**106.** අනුබල දෙන්නා යම් විශේෂ ප්‍රතිඵලයක් ලබා ගැනීමේ අදහසින් යම් ක්‍රියාවකට අනුබල දුන් විට, ඒ අනුබල දීම නිසා අනුබල දෙන්නා වගකිව යුතු ක්‍රියාවෙන් අනුබල දෙන්නා අදහස් කරනු ලැබූ ප්‍රතිඵලයට වෙනස් ප්‍රතිඵලයක් ඇති කළ අවස්ථාවක දී අනුබල දෙනු ලැබූ ක්‍රියාවෙන් ඒ ප්‍රතිඵලය ඇති විය හැකි බව ඔහු කලින් දැන සිටියේ නම්, ඒ ඒ ප්‍රතිඵලය ඇති කිරීමේ අදහසින් ඔහු ඒ ක්‍රියාවට අනුබල දුන් ආකාරයට හා ප්‍රමාණයට ම ඒ ප්‍රතිඵලය ඇති කිරීම ගැන ඔහු යටත් වේ.

**නිදර්ශනය**

"ඉසෙඩ්" ට බරපතළ තුවාල කිරීමට "ඒ" "බී" පොළඹවයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් "බී" "ඉසෙඩ්" ට බරපතළ තුවාල කරයි. ඒ හේතුවෙන් "ඉසෙඩ්" මිය යයි. මෙහි දී අනුබල දෙනු ලැබූ බරපතල තුවාල කිරීමෙන් මරණය සිදු විය හැකි බව "ඒ" දැන සිටියේ නම්, මිනීමැරුමට නියමිත දඬුවමෙන් දඬුවම් ලැබීමට "ඒ" යටත් වේ.

වරද සිදු කරන වේලෙහි අනුබල දෙන්නා පැමිණ සිටීම.

**107.** නො පැමිණ සිටිය දී අනුබල දෙන්නකු ලෙස දඬුවම් ලැබීමට යටත් යමෙක් යම් ක්‍රියාවකට හෝ වරදකට අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් දඬුවම් ලැබෙන ක්‍රියාව හෝ වරද සිදු කරන වේලෙහි පැමිණ සිටී නම්, ඒ ක්‍රියාව හෝ වරද ඔහු කළ ලෙස සැලකිය යුතු ය.

යම්කිසි පාරක් දිගේ "සී" වස්තුවක් රැගෙන යන බව "ඒ" "බී"ට ලියා දන්වන අතර ම එතැන නැවතී සිට "සී" ගෙන් එය කොල්ලකෑමට "බී" පොළඹවයි. එම පෙළඹවීම අනුව "බී" නැවතී සිට "සී" ගෙන් කොල්ල කයි. එකී ගමනේ දී ඒ ද "බී" කැටුව එයි. මේ වගන්තිය යටතේ "ඒ" වරදකාරයෙක් වේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**108.** මරණයෙන් දඬුවම් කළ හැකි යම් වරදක් සිදු කිරීමට අනුබල දෙන තැනැත්තකුගේ එකී අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් එය වරද සිදු කරනු නො ලැබී නම්, එබඳු අනුබල දීමකට දඬුවම් දීම සඳහා මේ සංග්‍රහයෙහි පැහැදිලි ව විධිවිධාන සලසා නොමැති නම් අනුබල දෙන තැනැත්තා අවුරුදු හත දක්වා කාල සීමාවක, දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාර ගත කිරීමකට හා දඩයකට යටත් විය යුතු ය.

අනුබලදීමේ ප්‍රතිඵලයක් වශයෙන් වරද සිදු කරනු නොලැබී නම් මරණයෙන් දඬුවම් කළ හැකි වූ වරදකට අනුබල දීම.

එසේ ම, අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් අනුබල දෙන්නා වග කිව යුතු වූ ද, යම් තැනැත්තකු ට තුවාළ සිදු කරන්නා වූ ද, ක්‍රියාවක් කරන ලද නම්, ඒ අනුබල දෙන්නා අවුරුදු දහ හතර දක්වා කාල සීමාවක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හා දඩයකට ද යටත් විය යුතු ය.

අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් පීඩාවක් ඇති කරවන යම් ක්‍රියාවක් කළ විටෙක.

### නිදර්ශනය

"ඉසෙඩ්" මැරීමට "ඒ" "බී" පෙළඹවයි. එකී වරද කරනු නොලැබී ය. "බී" "ඉසෙඩ්" මැරී නම්, ඔහු මරණීය දඬුවමට යටත් වන්නේ ය. එබැවින් අවුරුදු හත දක්වා කාල සීමාවක බන්ධනාගාරගත කිරීමකට හා දඩයකට "ඒ" යටත් වේ. අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් "ඉසෙඩ්" ට යම් තුවාලයක් කරන ලද නම්, අවුරුදු දහහතර දක්වා කාල සීමාවක බන්ධනාගාරගත කිරීමකට හා දඩයකට ඔහු යටත් වන්නේ ය.

**109.** බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි යම් වරදක් සිදු කිරීමට අනුබල දෙන තැනැත්තකුගේ එකී අනුබලදීමේ ප්‍රතිඵලයක් වශයෙන් එම වරද සිදු කරනු නො ලැබී නම් හා එ බඳු අනුබල දීමකට දඬුවම් දීම සඳහා මේ සංග්‍රහයෙහි පැහැදිලි ව විධිවිධාන සලසා නොමැති නම්, අනුබල දෙන තැනැත්තාට ඒ වරද, සඳහා නියමිත වැඩි ම කාල සීමාවේ හතරෙන් කොටස දක්වා කාලයක, එකී වරද සඳහා නියමිත පරිදි යම් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ ඒ වරදට නියමිත දඩයෙන් හෝ එකී දඬුවම් දෙකෙන් ම දඬුවම් කළ යුතු ය.

අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් වරද සිදු කරනු නො ලැබී නම්, බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වූ වරදකට අනුබල දීම.

එසේ ම, වරදට අනුබල දෙන්නා හෝ අනුබල දෙනු ලැබූ තැනැත්තා ඒ බඳු වරදක් සිදුවීම වැළැක්වීමේ කාර්යය නියමිත රජයේ සේවකයකු වුවහොත්, එ බඳු අනුබල දෙන්නකුට ඒ වරදට නියමිත වැඩි ම කාල සීමාවෙහි දෙකෙන් කොටසක් දක්වා කාලයක එකී වරදට නියමිත පරිදි, යම් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ ඒ වරදට නියමිත දඩයෙන් හෝ ඒ දඬුවම් දෙකෙන් ම දඬුවම් කළ යුතු ය.

වරදට අනුබල දෙන්නා හෝ අනුබල දෙනු ලැබූ තැනැත්තා එකී වරද වැළැක්වීමේ කාර්යයට අයත් රජයේ සේවකයකු වීම.

### නිදර්ශන

(අ) "බී" ගේ ධුරය පිළිබඳ කටයුතු ඉෂ්ඨ කිරීමෙහි දී "ඒ" ට යම් සැලකිල්ලක් පෙන්වීම සඳහා ත්‍යාගයක් වශයෙන් "ඒ" රජයේ සේවකයකු වූ "බී" ට අල්ලසක් දෙයි "බී" අල්ලස පිළිගැනීම ප්‍රතික්ෂේප කරයි. මේ වගන්තිය යටතේ "ඒ" දඬුවම් ලැබිය හැකි ය.

(ආ) "ඒ" බොරු සාක්ෂි දීමට "බී" පොළඹවයි. මෙහි දී බී බොරු සාක්ෂි නොදී සිටියත්, ඒ මේ වගන්තියේ විස්තර කරනු ලැබූ වරද කර තිබේ. "ඒ" අනුව ඔහු දඬුවම් ලැබිය හැකි ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

(ඇ) "ඒ" නම් වූ පොලිස් නිලධාරියෙක් කොල්ලකෑම වැළැක්වීම තම යුතුකම වූ "ඒ" නම් වූ පොලිස් නිලධාරියෙක් කොල්ලකෑම කිරීමට අනුබල දෙයි. මෙහි දී කොල්ලකෑම සිදු නොවුව ද, ඒ කොල්ලකෑම වරද සඳහා නියමිත බන්ධනාගාරගත කිරීමේ වැඩිම කාල සීමාවෙන් දෙකෙන් කොටසක කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හා දඩයකට ද "ඒ" යටත් වේ.

(ඈ) "බී" කොල්ලකෑම නැවැත්වීම තම යුතුකම වූ "ඒ" නම් වූ පොලිස් නිලධාරියකුට "බී" කොල්ලකෑම කිරීමට අනුබල දෙයි. මෙහි දී කොල්ලකෑම සිදු නො වුව ද, කොල්ලකෑම වරදට නියමිත බන්ධනාගාරගත කිරීමේ වැඩි ම කාල සීමාවෙන් දෙකෙන් කොටසක කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හා දඩයකට ද "බී" යටත් වේ.

මහජනයා විසින් හෝ දහ දෙනකුට වැඩි ගණනක් විසින් යම් වරදක් කරනු ලැබීමට අනුබල දීම.

**110.** සාමාන්‍යයෙන් මහජනයා විසින් හෝ දහයකට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් විසින් හෝ පංක්තියක් විසින් යම් වරදක් කරනු ලැබීමට අනුබල දෙන්නකුට අවුරුදු තුන දක්වා කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමෙන් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකෙන් ම දඬුවම් කළ යුතු ය.

**නිදර්ශනය**

පෙරහරක යෙදී සිටින විරුද්ධ කාණ්ඩයක සාමාජිකයන් හට පහර දීමේ කාර්යය සඳහා එක්තරා වේලාවක එක්තරා ස්ථානයක හමුවීමට දහ දෙනකුට වැඩි සාමාජිකයන්ගෙන් සමන්විත කණ්ඩායමක් පෙළඹවීමේ ලොකු දැන්වීමක් ප්‍රසිද්ධ ස්ථානයක "ඒ" සවි කරයි. මේ වගන්තියෙන් විස්තර කරනු ලැබූ වරද "ඒ" කර ඇත.

මරණයෙන් හෝ අවුරුදු විස්සක කාලයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් සිදු කිරීමේ උපක්‍රමයක් වසන් කිරීම. වරද කරන ලද නම්, වරද නොකරනලද නම්.

**111.** මරණයෙන් හෝ අවුරුදු විස්සක කාලයක බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදක් සිදු කිරීම පහසු කිරීම අදහස් කොට ගෙන හෝ ඉන් පහසු වන බව දැන දැන ම එ බඳු වරදක් සිදු කිරීමේ උපක්‍රමයක් යම් කිසි ක්‍රියාවකින් හෝ නීති විරෝධී නො කර හැරීමකින් කැමැත්තෙන් ම යමෙක් වසන් කරයි නම්, හෝ එ බඳු උපක්‍රමයක් සම්බන්ධයෙන් සත්‍ය නො වන බව දැන දැන ම යම් නිවේදනයක් කරයි නම්, එකී වරද කරන් ලද නම් අවුරුදු හත දක්වා කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ එකී වරද නො කරන ලද නම්, අවුරුදු තුන දක්වා කාලයකට, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් ඔහුට දඬුවම් කළ යුතු ය. තව ද මේ අවස්ථා දෙකෙහි දී ම ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

**නිදර්ශනය**

"බී" නම් වූ ස්ථානයෙහි මිනීමැරුමක් සිදු කිරීමට ආසන්න බව දැන දැනම ඊට විරුද්ධ දිසාවක පිහිටි "සී" නම් වූ ස්ථානයෙහි මිනීමරුමක් සිදු කිරීමට ආසන්න බව "ඒ" සුලු අපරාධ විනිශ්වයකරුට අසත්‍ය ලෙස දන්වයි. එකී වරද සිදු කිරීම පහසු කිරීමේ අදහසින් "ඒ" ඉන් සුලු අපරාධ විනිශ්වයකරු නොමග යවයි. එකී උපක්‍රමය අනුව, "බී" නම් වූ ස්ථානයෙහි මිනීමැරුම සිදු වෙයි. මේ වගන්තිය යටතේ "ඒ" ට දඬුවම් දිය හැකි ය.

වැළැක්වීම තම යුතුකම වන්නා වූ වරදක් සිදු කිරීමේ උපක්‍රමයක් රජයේ සේවකයකු විසින් වසන් කරනු ලැබීම වරද කරන ලද නම්.

**112.** යම් කිසි වරදක් සිදු කිරීම වැළැක්වීම තම යුතුකම වූ රජයේ සේවකයෙක් ඒ වරද සිදු කිරීම පහසු කිරීමේ අදහසින් හෝ ඒ වරද සිදු කිරීම පහසුවිය හැකි බව දැන දැන ම ඒ වරද සිදු කිරීමේ උපක්‍රමයක් යම් කිසි ක්‍රියාවකින් හෝ නීති විරෝධී නො කර හැරීමකින් කැමැත්තෙන් ම වසන් කරයි නම්, හෝ එකී උපක්‍රමය සම්බන්ධයෙන් අසත්‍ය බව දැන දැන ම යම් නිවේදනයක් කරයි නම්, ඒ වරද කරන ලද නම් ඒ වරද සඳහා නියමිත වැඩි ම කාල සීමාවෙන් දෙකෙන් කොටස දක්වා



https://ezofz.web.lk/
Scanned with CamScanner

කාලයකට නියමිත පරිදි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ ඒ වරද සඳහා නියමිත දඩයෙන් හෝ ඒ දඬුවම් දෙකෙන් ම ඔහුට දඬුවම් කළ යුතු ය. ඉහත සඳහන් වරද මරණීය දඬුවමෙන් දඬුවම් කළ හැකි නම්, අවුරුදු දහය දක්වා කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් ඔහුට දඬුවම කළ යුතුවත් හැර ඒ වරද නො කරන ලද නම්, ඒ වරද සඳහා නියමිත වැඩිම කාලසීමාවේ හතරෙන් කොටසක කාලය දක්වා නියමිත පරිදි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ වරද සඳහා නියමිත දඩයෙන් හෝ එකී දඬුවම් දෙකෙන් ම දඬුවම් කළ යුතු ය.

වරදට මරණීය දඬුවමින් දඬුවම් කළ හැකි නම්.

වරද නොකරන ලද නම්.

නිදර්ශනය

තමාට දැනගන්නට ලැබෙන මිනීමැරුම සිදු කිරීමේ සියලු උපක්‍රමවල තොරතුරු දැනුම් දීමට නීත්‍යානුකූලව බැඳී ඇති පොලිස් නිලධරයකු වූ "ඒ" මිනීමැරුමක් සිදු කිරීමට "බී" උපක්‍රම යොදන බව දැන දැනම "ඒ" වරද සිදුකිරීම පහසු කිරීමේ අදහසින් එම තොරතුරු දැනුම් දීම පැහැර හරියි. මෙහි දී "ඒ" නීති විරෝධී නොකර හැරීමකින් "බී" ගේ උපක්‍රමය වසන් කරයි. එනිසා මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාර "ඒ" දඬුවම් ලැබීමට යටත් වේ.

113. බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදක් සිදු කිරීමේ අදහසින් හෝ එසේ පහසු විය හැකි බව දැන දැන ම එබඳු වරදක් සිදු කිරීමේ උපක්‍රමයක් යම් ක්‍රියාවකින් හෝ නීති විරෝධී නො කර හැරීමකින් කැමැත්තෙන් ම වසන් කරන හෝ එබඳු උපක්‍රමයක් සම්බන්ධයෙන් අසත්‍ය බව තමා දැන දැනම යම් නිවේදනයක් කරන කෙනකුට, වරද කරන ලද නම්, ඒ වරදට නියමිත බන්ධනාගාරගත කිරීමේ වැඩි ම කාල සීමාවෙන් හතරෙන් කොටස දක්වා කාලයකට හෝ වරද නො කරන ලද නම්, ඒ කාල සීමාවෙන් අටෙන් කොටසක කාලයකට වරදට නියමිත ආකාරයට බන්ධනාගාරගත කිරීමෙන් හෝ වරදට නියමිත දඩයෙන් හෝ එකී දඬුවම් දෙකෙන් ම දඬුවම් කළ යුතු ය.

බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදක් සිදු කිරීමේ උපක්‍රමයක් වසන්කිරීම. වරද කරන ලද නම්, වරද නොකරන ලද නම්,

## Vඅ වෙනි පරිච්ඡේදය

### කුමන්ත්‍රණය

113අ. (1) යම් වරදක් සිදු කිරීමේ දී හෝ සිදු කිරීම සඳහා පොදු නැතහොත් වරදකට අනුබල දීමෙහි දී හෝ අනුබල දීම සඳහා පොදු අරමුණක් සහිත ව කලින් සම්මතයක් හෝ පිළියෙලවීමක් ඇති ව හෝ නැති ව දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් එක්ව යම් වරදක් සිදු කිරීමට හෝ ඊට අනුබල දීමට හෝ ක්‍රියා කිරීමට එකඟ වුවහොත්, ඒ වරද කිරීමට හෝ ඊට අනුබල දීමට කුමන්ත්‍රණය සිදුකිරීමේ වරද සඳහා අවස්ථාව පරිදි ඔවුන්ගෙන් එක් එක් කෙනෙක් වැරදිකාරයෙක් වෙයි.

කුමන්ත්‍රණය විස්තර කිරීම.

(2) ලංකාව තුළ සිටින තැනැත්තකු ලංකාවෙන් පිටත සිටින තැනැත්තකු සමග ඒ දෙදෙනා විසින් හෝ ඉන් එක් කෙනකු විසින් හෝ වෙනයම් තැනැත්තකු විසින් ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී



https://ezofz.web.lk/
Scanned with CamScanner

කළ යුතු පරිදි යම් වරදක් කිරීම සඳහා හෝ ඊට අනුබල දීම සඳහා එකඟ වීමෙන් කුමන්ත්‍රණය කිරීමේ වරදට වැරදිකාරයකු විය හැකි ය. තවද මේ වගන්තියේ කාර්ය සඳහා ලංකාවෙන් පිටත සිදු කළ යුතු වරදක් සම්බන්ධයෙන් "වරද" යන්නෙන්, මේ සංග්‍රහය යටතේ හෝ වෙනත් නීතියක් යටතේ ලංකාව තුළ දී සිදු කළහොත්, වරදක් වන යම් ක්‍රියාවක් අදහස් කෙරෙයි.

**ව්‍යතිරේකය.**-ස්වාමිපුරුෂයකු හා භාර්යාවක අතර ඇති වන කුමන්ත්‍රණයක් සම්බන්ධයෙන් මේ වගන්තිය අදාල නොවිය යුතු ය.

කුමන්ත්‍රණය කිරීම ගැන දඬුවම.

**113ආ.** යම් වරදක් සිදුකිරීමට හෝ ඊට අනුබල දීමට කුමන්ත්‍රණය කිරීම ගැන දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් වරදකාරයන් වීමෙහි දී, ඔවුන් එක් එක් කෙනකු එකී "වරද" අනුබල දුන්විටෙක මෙන් ඔවුන් එක් එක් කෙනකුට දඬුවම් කළ යුතු ය.

## VI වෙනි පරිච්ඡේදය

### රාජ්‍ය විරෝධී වැරදි

රජතුමාට විරුද්ධව යුද්ධ කිරීම හෝ යුද්ධ කිරීමට තැත්කිරීම හෝ යුද්ධ කිරීමට අනුබල දීම.

**114.** රජතුමාට විරුද්ධව යුද්ධ කරන හෝ යුද්ධ කිරීමකට තැත් කරන හෝ යුද්ධ කිරීමට අනුබල දෙන යමකුට මරණීය දඬුවමින් හෝ අවුරුදු විස්ස දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහුගේ සියලු දේපළට ද ඔහු අහිමි කළ යුතු ය.

**නිදර්ශන**

(අ) රජතුමාට විරුද්ධව කැරලි ගැසීමකට "ඒ" එකතු වෙයි. මේ වගන්තියෙන් විස්තර කරනු ලැබූ වරද "ඒ" විසින් කර ඇත.

(ආ) රජතුමාගේ ඉන්දියානු ආණ්ඩුවට විරුද්ධව කැරලි ගැසීමකට ලංකාවෙහි සිටින "ඒ" කැරලිකරුවන්ට ආයුධ යැවීමෙන් අනුබල දෙයි. රජතුමාට විරුද්ධව යුද්ධ කිරීමට අනුබල දීම ගැන "ඒ" වරදකාරයෙක් වේ.

ඉහත වගන්තියෙන් දඬුවම් කළ හැකි වරද සිදුකිරීම සඳහා කුමන්ත්‍රණය.

**115.** ඉහතින් වූ වගන්තියෙන් දඬුවම් කළ හැකි යම් වරදක් සිදු කිරීමට හෝ, ලංකාවේ හෝ එහි කොටසක හෝ මහරජතුමාගේ ඩොමීනියන් රාජ්‍යයක රාජත්වය රජතුමාගෙන් පැහැර ගැනීමට කුමන්ත්‍රණය කරන නැතහොත් සාපරාධී බලහත්කාරයෙන් හෝ සාපරාධී බලහත්කාරය පෙන්වීමකින් ලංකාණ්ඩුව බිය පත් කිරීමට කුමන්ත්‍රණය කරන යමෙකුට අවුරුදු විස්සක දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

**පැහැදිලි කිරීම.**-මේ වගන්තිය යටතේ කුමන්ත්‍රණයක් වීම සඳහා එකී කුමන්ත්‍රණය ප්‍රකාර, යම් ක්‍රියාවක් හෝ නීති විරෝධී නො කර හැරීමක් සිදු වීම අවශ්‍ය නොවේ.

https://ezofz.web.lk/
Scanned with CamScanner

**116.** රජතුමාට විරුද්ධ ව යුද්ධ කිරීමේ හෝ යුද්ධ කිරීමට සූදානම් වීමේ අදහසින් මිනිසුන් හෝ ආයුධ හෝ වෙඩි බෙහෙත් ද්‍රව්‍ය එකතු කරන්නා වූ නැතහොත් වෙන ක්‍රමයකින් යුද්ධ කිරීමට සූදානම් වන්නා වූ යමකුට අවුරුදු විස්සකට වැඩි නොවන කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහුගේ සියලු දේපලට ද ඔහු අහිමි කළ යුතු ය.

රජතුමාට විරුද්ධව යුද්ධ කිරීමේ අදහසින් ආයුධ ආදිය එකතු කිරීම.

**117.** රජතුමාට විරුද්ධව යුද්ධ කිරීමේ උපක්‍රමයක් වසන් කිරීමෙන් එකී යුද්ධ කිරීම පහසු කිරීමේ අදහසින් හෝ පහසු විය හැකි බව දනිමින් යමකු එබඳු උපක්‍රමයක් යම් ක්‍රියාවකින් හෝ යම් නීති විරෝධී නොකර හැරීමකින් වසන් කරනු ලැබුවහොත් ඔහුට අවුරුදු දහය දක්වා කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

යුද්ධ කිරීමේ උපක්‍රමයක් පහසු කිරීමේ අදහසින් එය වසන් කිරීම.

**118.** කථා කරනු ලැබූ හෝ කියවීමට අදහස් කරනු ලැබූ යම් අවිනීත හෝ නින්ද සහගත හෝ අවඥ සහිත වචනයෙන් හෝ සංඥවෙන් හෝ දැකිය හැකි නිරූපනයෙන් රජතුමා හෝ එතුමාගේ රාජකීය මහිමය කෙළෙසීමට තැත් කරන යමකුට, අවුරුදු දෙක දක්වා කාලයක ලිහිල් බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

අවිනීත හෝ නින්ද සහගත වචනවලින් හෝ සංඥවලින් රජතුමාගේ ගෞරවය කෙළසීමට තැත් කිරීම.

**119.** අග්‍රාණ්ඩුකාරතුමාගේ හෝ උත්තර මන්ත්‍රීවරයකුගේ හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ නීත්‍යානුකූල බලයක් යම් ආකාරයක පාවිච්චි කිරීම සඳහා හෝ පාවිච්චි කිරීම වැළැක්වීම සඳහා පෙළඹවීමේ හෝ බල කිරීමේ අදහසින් එකී අග්‍රාණ්ඩුකාරතුමාට හෝ උත්තර මන්ත්‍රීවරයාට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට යමකු පහර දෙතොත් හෝ අයුතු ලෙස අවහිර කරතොත් හෝ සාපරාධී බලහත්කාරයෙන් හෝ සාපරාධී බලහත්කාරකම් පෙන්වීමෙන් අයුතු ලෙස අවහිර කරතොත් හෝ බිය ගන්වතොත් හෝ එසේ බිය ගැන්වීමට තැත් කරතොත් අවුරුදු හත දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් ඔහුට දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

යම් නීත්‍යානුකූල බලයක් පාවිච්චි කිරීම බල කිරීමේ හෝ වැළැක්වීමේ අදහසින් අග්‍රාණ්ඩුකාරතුමා ආදීන්හට පහර දීම.

**120.** කථා කරනු ලැබූ හෝ කියවීමට අදහස් කරනු ලැබූ වචනයෙන් හෝ සංඥාවලින් හෝ දැකිය හැකි නිරූපනවලින් පිහිටුවනු ලැබූ ලංකාණ්ඩුවට විරුද්ධත්වය දැක්වීමේ හැඟීම් අවුස්වතොත් හෝ ඇවිස්වීමට තැත් කරතොත් හෝ නීතිය ක්‍රියාවෙහි යෙදවීමෙහි දී වෛරයක් හෝ අගෞරවයක් ඇති කරවතොත් හෝ ඇති කරවීමට තැත් කරතොත් හෝ නීත්‍යානුකූල මාර්ගවලින් නොව අන් ලෙසකින් නීතියෙන් පිහිටුවනු ලැබූ යමක් වෙනස් කරවීමට රජතුමාගේ වැසියන් උනන්දු කරවතොත් හෝ රජතුමාගේ වැසියන් අතර අසන්තෝෂය හෝ විරුද්ධත්වය ඇති කරවීමට හෝ එබඳු වැසියන්ගේ වෙනස් පංති අතර සතුරු වූ ද, අසමගි වූ ද, හැඟීම් වැඩි දියුණු කිරීමට තැත් කරතොත් ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක ලිහිල් බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය.

විරුද්ධත්වය ඇවිස්සීම හෝ ඇවිස්සීමට තැත් කිරීම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

පැහැදිලි කිරීම.–රජතුමා හෝ ප්‍රදේශාණ්ඩුව හෝ පළාත් පාලනය යම් ක්‍රම පිළිබඳ ව නො මග ගොස් තිබෙන බව හෝ වරදවා තේරුම් ගෙන තිබෙන බව පෙන්වීමට හෝ ආණ්ඩුවේ හෝ එහි කොටසක යුක්තිය විසඳීමේ හෝ වැරදි හෝ දෝෂ නිවැරදි කර ගැනීමේ අදහසින් පෙන්වා දීමට නීතියෙන් සම්මත කරනු ලැබූ යම් කරුණක් නීත්‍යනුකූල මාර්ගවලින් වෙනස් කරවා ගැනීම සඳහා රජතුමාගේ වැසියන් පෙළඹවීමට හෝ මහරජතුමාගේ වැසියන්ගේ වෙනස් පංති අතර වෛරී හෝ සතුරු හැඟීම් ඇති කරන නැතහොත් ඇති කළ හැකි යම් කරුණු ඉවත් කරවා ගැනීම සඳහා එකී කරුණු පෙන්වීමට අදහස් කිරීම මේ වගන්තිය යටතේ වරදක් නොවේ.

රජතුමා සමග ගිවිසුමක් ඇති කොට ගත් හෝ සමාදානයෙන් වෙසෙන යම් රාජ්‍යයකට විරුද්ධව යුද්ධ කිරීම.

**121.** රජතුමා සමග ගිවිසුමක් ඇති කොට ගත් හෝ සමාදානයෙන් වෙසෙන රාජ්‍යයක ආණ්ඩුවක් සමග යුද්ධ කරන හෝ එබඳු යුද්ධ කිරීමකට තැත් කරන හෝ එබඳු යුද්ධ කිරීමකට අනුබල දෙන යමකුට අවුරුදු දහය දක්වා කාලයක, දඩයකුත් එකතු කළ හැකි හෝ දඩයකුත් සමග දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය.

රජතුමා සමග ගිවිසුමක් ඇති කොට ගත් හෝ සමාදානයෙන් වෙසෙන රාජ්‍යයකට අයත් ප්‍රදේශවල පැහැර ගැනීම.

**122.** රජතුමා සමග ගිවිසුමක් ඇති කොට ගත් හෝ සමාදානයෙන් වෙසෙන රාජ්‍යයකට අයත් ප්‍රදේශවල පැහැර ගන්නා හෝ පැහැර ගැන්මට සූදානම් වන යමකුට, අවුරුදු හත දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද එකී පැහැර ගැන්ම සඳහා පාවිච්චි කරනු ලැබ හෝ පාවිච්චි කිරීමට අදහස් කරනු ලැබූ හෝ පැහැරගැන්මෙන් අත්කරගනු ලැබූ දේපළක් අහිමි කිරීමකට ද යටත් විය යුතු ය.

121 වෙනි හා 122 වෙනි වගන්තිවල සඳහන් යුද්ධයකින් හෝ පැහැර ගැනීමකින් ගත් දේපල බාර ගැනීම.

**123.** 121 වෙනි හා 122 වෙනි වගන්තිවල සඳහන් වැරදි සිදු කිරීමෙන් ගනු ලැබූ දේපළක් බව දැන දැන ම එකී දේපළ යමකු විසින් පිළිගනු ලැබුවහොත්, ඔහුට අවුරුදු හත දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද, එසේ පිළිගනු ලැබූ දේපළ අහිමි කිරීමකට ද යටත් විය යුතු ය.

තම අත්අඩංගුවේ සිටින රාජ්‍ය සිරකරුවකුට හෝ යුධ සිරකරුවකුට රජයේ සේවකයකු විසින් පැනයාමට කැමැත්තෙන්ම ඉඩදෙනු ලැබීම.

**124.** තම අත් අඩංගුවේ සිටන යම් රාජ්‍ය සිරකරුවකුට හෝ යුද්ධ සිරකරුවකුට සිරකරුවා සිරකොට ඇති ස්ථානයෙන් පැන යාමට රජයේ සේවකයකු විසින් කැමැත්තෙන් ඉඩ දෙනු ලැබී නම්, ඔහුට අවුරුදු විස්ස දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

තම අත්අඩංගුවේ සිටින රාජ්‍ය සිරකරුවකුට හෝ යුද්ධ සිරකරුවකුට රජයේ සේවකයකු විසින් තමාගේ අපරීක්ෂාකාරීකම නිසා පැන යාමට ඉඩ හරිනු ලැබීම.

**125.** තම අත් අඩංගුවේ සිටින රාජ්‍ය සිරකරුවකුට හෝ යුධ සිරකරුවකුට සිරකරුවා සිර කොට තිබූ ස්ථානයෙන්, රජයේ සේවකයකු විසින් තමාගේ අපරීක්ෂාකාරීකම නිසා පැනයාමට ඉඩ හරිනු ලැබුවහොත් ඔහුට අවුරුදු තුන දක්වා කාලයක ලිහිල් බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

126. නීත්‍යානුකූල අත් අඩංගුවෙන් පැන යාම සඳහා රාජ්‍ය සිරකරුවකුට හෝ යුද්ධ සිරකරුවකුට දැන දැනම ආධාර දෙන හෝ උපකාර කරන හෝ එබඳු සිරකරුවකු ගලවන හෝ ගලවා ගැනීමට තැත් කරන හෝ නීත්‍යානුකූල අත් අඩංගුවෙන් පැන යන එබඳු සිරකරුවකුට නවාතැන් දෙන හෝ එබන්දකු සඟවන හෝ එබඳු සිරකරුවකු නැවත අල්ලා ගැනීමේ දී විරුද්ධකම් දක්වන හෝ විරුද්ධකම් දැක්වීමට තැත් කරන යමකුට අවුරුදු විස්ස දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

එබඳු සිරකරුවකුට පැන යාමට උදව් දීම එබන්දකු ගලවා ගැනීම හා එබන්දකුට නවාතැන් දීම.

පැහැදිලි කිරීම.–ලංකාවේ එක්තරා සීමාවක් ඇතුළත නිදහස් ලෙස හැසිරීමට පොරොන්දුවක් පිට ඉඩ දෙනු ලැබූ රාජ්‍ය සිරකරුවකු හෝ යුද්ධ සිරකරුවකු තමාට නිදහස් ලෙස හැසිරීමට ඉඩ දෙනු ලැබූ සීමාවෙන් පිට ගියහොත්, ඔහු නීත්‍යානුකූල අත් අඩංගුවෙන් පැන ගිය ලෙස සලකනු ලැබේ.

127. මේ පරිච්ඡේදය යටතේ කිසි ම නඩුවක්, නීතිපති විසින් හෝ ඔහුගේ ලිපිගත බලය ඇති ව විනා, නො පැවරිය යුතු ය.

මේ පරිච්ඡේදය යටතේ නඩු පැවරීමට නීතිපතිගේ බලය වුවමනා බව.

## VII වෙනි පරිච්ඡේදය

### නාවික හමුදාව, යුධ හමුදාව හා ගගන හමුදාව පිළිබඳ වැරදි

128. රජතුමාගේ නාවික හමුදාවේ හෝ යුද්ධ හමුදාවේ හෝ ගගන හමුදාවේ නිලධාරියකුට හෝ නැවියකුට හෝ හේවායකුට හෝ ගුවන් නැවියකුට කැරලි ගැසීමට අනුබල දෙන්නා වූ හෝ එබන්දකු තම රාජපාක්ෂික භාවයෙන් හෝ කාර්‍ය්‍යයෙන් ඉවත් කරවා ගැනීමට තැත්කරන්නා වූ තැනැත්තකුට අවුරුදු විස්ස දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

නැවියකුට, හේවායකුට හෝ ගුවන් නැවියකුට කැරලි ගැසීමට අනුබල දීම හෝ තම කාර්යය පැහැර හැරවීමට තැත් කිරීම.

129. රජතුමාගේ නාවික හමුදාවෙහි හෝ යුද්ධ හමුදාවෙහි හෝ ගගන හමුදාවෙහි නිලධාරියකුට, නැවියකුට, හේවායකුට හෝ ගුවන් නැවියකුට කැරලි ගැසීමකට යම් තැනැත්තකු අනුබල දෙනු ලැබීමෙන් පසු, එකී අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් කැරලි ගැසීම සිදු වුවහොත්, එකී තැනැත්තාට මරණීය දඬුවමෙන් හෝ අවුරුදු විස්ස දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

කැරලි ගැසීමට අනුබල දීම, එහි ප්‍රතිඵලයක් වශයෙන් කැරලි ගැසීම සිදුවී නම්.

130. නාවික හමුදාවේ හෝ යුද්ධ හමුදාවේ හෝ ගගන හමුදාවේ නිලධාරියකු හෝ නැවියකු හෝ හේවායකු හෝ ගුවන් නැවියකු විසින් තම නිලයේ කටයුතු කරමින් සිටිය දී තම උසස් නිලධාරියකුට කරනු ලබන පහරදීමකට අනුබල දෙන තැනැත්තකුට, අවුරුදු තුන දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

තම නිලයේ කටයුතු කරමින් සිටිය දී නැවියකු, හේවායකු හෝ ගුවන් නැවියකු විසින් තම උසස් නිලධාරියකුට කරනු ලබන පහර දීමකට අනුබල දීම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

එබඳු පහරදීමකට අනුබල දීම එකී පහරදීම කළ විට.

**131.** රජතුමාගේ නාවික හමුදාවේ හෝ යුද්ධ හමුදාවේ හෝ ගගන හමුදාවේ නිලධාරියකු හෝ නැවියකු හෝ භේවායකු හෝ ගුවන් නැවියකු විසින් තම නිලයේ කටයුතු කරමින් සිටිය දී තම උසස් නිලධාරියකුට පහර දීමකට අනුබල දෙන තැනැත්තකුට එකී අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් පහර දීම සිදුවුවහොත්, අවුරුදු හත දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

නැවියකුගේ හෝ භේවායකුගේ හෝ ගුවන් නැවියකුගේ අත්හැර යාමට අනුබලදීම.

**132.** රජතුමාගේ නාවික හමුදාවේ, යුද්ධ හමුදාවේ හෝ ගගන හමුදාවේ යම් නිලධාරියකුගේ හෝ නැවියකුගේ හෝ භේවායකුගේ හෝ ගුවන් නැවියකුගේ අත් හැර යාමකට අනුබල දෙන තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

අත්හැර යන්නකුට නවාතැන් දීම.

**133.** රජතුමාගේ නාවික හමුදාවේ හෝ යුද්ධ හමුදාවෙහි හෝ ගගන හමුදාවෙහි නිලධාරියකු හෝ නැවියකු හෝ භේවායකු හෝ ගුවන් නැවියකු එකී හමුදාව අත්හැර ගොස් තිබෙන බව දැන දැන ම හෝ එසේ බව විශ්වාස කිරීමට කරුණු තිබිය දී එබන්දකුට, මෙහි පහත දැක්වෙන අවස්ථාවක දී හැර, අන්කිසි අවස්ථාවක දී යම් තැනැත්තකු විසින් නවාතැන් දෙනු ලැබුවහොත්, එකී තැනැත්තාට අවුරුදු දෙක දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

**ව්‍යතිරේකය.**–භාර්යාව විසින් තම ස්වාමිපුරුෂයාට නවාතැන් දුන් අවස්ථාවකට මේ විධිවිධානය අදාළ නොවේ.

අත්හැර යන්නා නැව් නියමුවාගේ නොසැලකිල්ල නිසා වෙළෙඳ නැවක සැඟවී සිටීම.

**134.** රජතුමාගේ නාවික හමුදාව හෝ යුද්ධ හමුදාව හෝ ගගන හමුදාව අත්හැර යන්නකු යම් වෙළෙඳ නැවක සැඟවී සිටියහොත් එලෙස සැඟවී සිටින බව එකී වෙළෙඳ නැව් නියමුවා හෝ එය භාරව සිටින තැනැත්තා නොදත් නමුදු, එකී නැව් නියමුවාගේ හෝ භාරව සිටින තැනැත්තාගේ යම් යුතුකමක් පැහැර හැරීමක් නිසා හෝ එකී නැවෙහි විනයෙහි ලිහිල් බවක් නිසා නොවේ නම් එසේ සැඟවී සිටින බව දැනගන්නට හැකිව තිබුණ අවස්ථාවක දී ඒ තැනැත්තා රුපියල් පන්සියයක වැඩි නොවන දඬුවම් මුදලක් ගෙවීමට යටත් විය යුතු ය.

නැවියකුගේ හෝ භේවායකුගේ හෝ ගුවන් නැවියකුගේ අකීකරු ක්‍රියාවකට අනුබල දීම.

**135.** රජතුමාගේ නාවුක හමුදාවෙහි හෝ යුද්ධ හමුදාවෙහි හෝ ගගන හමුදාවෙහි නිලධාරියකුගේ හෝ නැවියකුගේ හෝ භේවායකුගේ අකීකරු ක්‍රියාවක් බව දන්නා යම් ක්‍රියාවකට අනුබල දෙන යම් තැනැත්තකුට, එකී අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් එම අකීකරු ක්‍රියාව සිදු කරනු ලැබුවහොත්, හය මාසය දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකකින් ම දඬුවම් කළ යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**136.** නාවික විනය පනතෙහි හෝ යුද්ධ හමුදා පනතෙහි හෝ ගගන හමුදා පනතෙහි හෝ තත්කාලයෙහි බල පවත්වන එයට සමාන වෙනත් නීතියක විධානවලට හෝ එකී පනත යටතේ පනවනු ලැබූ නියෝගවලට යටත් කිසිවෙක් මේ පරිච්ඡේදයෙහි විස්තර කරනු ලැබූ යම් වරදකට මේ සංග්‍රහය යටතේ දඬුවමකට යටත් නොවේ.

නාවික විනය පනතට හෝ යුද්ධ හමුදා පනතට හෝ ගගන හමුදා පනතට යටත් තැනැත්තන් හට මේ පරිච්ඡේදයේ වැරදි ගැන දඬුවම් කළ නොහැකි බව.

**137.** රජතුමාගේ නාවික හෝ යුද්ධ හෝ ගගන සේවයෙහි යෙදී සිටින නැවියකු හෝ භේවායකු හෝ ගුවන් නැවියකු නොවන යම් තැනැත්තකු තම එබඳු නැවියකු හෝ භේවායකු හෝ ගුවන් නැවියකු බව විශ්වාස කරවීමේ අදහසින්, එබන්දකු විසින් පාවිච්චි කරනු ලබන යම් ඇඳුමක් අඳිතහොත් හෝ යම් සලකුණක් ගෙන යතහොත්, ඔහුට තුන් මාසය දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

නැවියකුගේ හෝ භේවායකුගේ හෝ ගුවන් නැවියකුගේ ඇඳුම ඇඳීම.

## VIII වෙනි පරිච්ඡේදය

### මහජන සාමයට විරුද්ධ වැරදි

**138.** රැස්වීමේ යෙදුණ පස් දෙනකුගේ හෝ ඊට වැඩි ගණනකගේ පොදු පරමාර්ථය පහත දැක්වෙන කරුණුවලින් යමක් නම් එකී රැස්වීම "නීති විරෝධී රැස්වීම ය" යි හැඳින් වේ.

නීති විරෝධී රැස්වීම.

එකී කරුණු නම් :-

**පළමුවනු ව.**-සාපරාධී බලහත්කාරයෙන් හෝ සාපරාධී බලහත්කාරකම පෙන්වීමෙන් රජතුමාගේ ලංකාණ්ඩුව හෝ උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හෝ තම නීත්‍යානුකූල බලය පාවිච්චි කිරීමේ දී යම් රජයේ සේවකයකු බියපත් කිරීම ; හෝ

**දෙවනු ව.**-යම් නීතියක් හෝ යම් නීත්‍යානුකූල කැඳවීම් නියෝගයක් ක්‍රියාවේ යෙදවීමට විරුද්ධකම් පෑම ; හෝ

**තුන්වනු ව.**-යම් අනර්ථයක් හෝ සාපරාධී අයුතු ඇතුළුවීමක් හෝ වෙනත් වරදක් සිදු කිරීම ; හෝ

**හතර වනු ව.**-සාපරාධී බලහත්කාරයෙන් හෝ යම් තැනැත්තකුහට බලහත්කාරකම් පෙන්වීමෙන් යම් දේපලක ස්වාමිත්වය ගැනීම හෝ ලබා ගැනීම හෝ යම් තැනැත්තකු හට හෝ මහජනයාට අයිති වූ නැතහොත් ඔවුන් විසින් භුක්ති විඳිනු ලැබූ මාර්ග අයිතියක් හෝ ජලය පාවිච්චි කිරීමේ බලයක් හෝ වෙනත් නිරූපමය බලයක් එකී තැනැත්තාගෙන් හෝ මහජනයාගෙන් පැහැර ගැනීම හෝ යම් අයිතිවාසිකමක් හෝ ඇතැයි සැලකෙන අයිතිවාසිකමක් බලෙන් ක්‍රියාවෙහි යෙදවීම ; හෝ



https://ezofz.web.lk/
Scanned with CamScanner

**පස්වනු ව.**-සාපරාධී බලහත්කාරයෙන් හෝ සාපරාධී බලහත්කාරකම් පෙන්වීමෙන් තමා කිරීමට නීත්‍යානුකූලව බැඳී නැති ක්‍රියාවක් කිරීමට හෝ නීත්‍යානුකූලව බැඳී ඇති ක්‍රියාවක් නොකර හැරීමට යම් තැනැත්තකුට බල කිරීම ; හෝ

**හයවනු ව.**- දිවයිනෙහි අග්‍රාණ්ඩුකාරතුමාගේ කැමැත්ත නැතිව රැස්වුණු තැනැත්තන් සියල්ලන් හෝ ඉන් යමකු ආයුධ පාවිච්චිය හෝ යුද්ධ පෙළපාලි තම තමන්ම පුහුණුවීම හෝ පුහුණුකරවා ගනු ලැබීම.

පැහැදිලි කිරීම.-රැස්වුනු වේලෙහි නීති විරෝධී නොවූ රැස්වීමක් පසු ව නීති විරෝධී රැස්වීමක් විය හැකි ය.

නීති විරෝධී රැස්වීමක සාමාජිකයකු වීම.

**139.** යම් රැස්වීමක් නීති විරෝධී රැස්වීමක් බව දක්වන කරුණු දනිමින් ඕනෑකමින් ම යමකු එකී රැස්වීමට එකතු වෙතොත් හෝ එහි නතරව සිටියොත්, ඔහු නීති විරෝධී රැස්වීමක සමාජිකයකු ලෙස සලකනු ලැබේ.

දඩුවම.

**140.** නීති විරෝධී රැස්වීමක් සාමාජිකයකු වූ තැනැත්තකුට හයමාසයක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඩුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

යම් මාරක ආයුධයක් ඇතිව නීති විරෝධී රැස්වීමකට එකතු වීම.

**141.** යම් මාරක ආයුධයක් හෝ පහර දීමේ ආයුධයක් වශයෙන් පාවිච්චි කරනු ලැබුවහොත් මරණය සිදු කළ හැකි යම් දෙයක් ඇති තැනැත්තකු නීති විරෝධී රැස්වීමක සාමාජිකයකු වුවහොත්, ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

යම් නීති විරෝධී රැස්වීමකට විසිර යාමට අණ කරනු ලැබූ බව දැන දැනම එබඳු නීති විරෝධී රැස්වීමකට එකතු වීම හෝ එහි රැඳී සිටීම.

**142.** නීත්‍යානුකූල බලධරයකු විසින් යම් නීති විරෝධී රැස්වීමකට විසිර යාමට අණ කරනු ලැබූ බව දැන දැනම ඒ රැස්වීමට එකතු වන හෝ එහි රැඳී සිටින තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක්. ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

පොදු පරමාර්ථය ඉෂ්ට කිරීම සඳහා එක් සාමාජිකයකු විසින් බලහත් කාරකම් පානු ලැබීම.

**143.** නීති විරෝධී රැස්වීමක් විසින් හෝ එහි යම් සාමාජිකයකු විසින් ඒ රැස්වීමේ පොදු පරමාර්ථය ක්‍රියාත්මක කරවීම සඳහා බලහත්කාරකම් හෝ ප්‍රචණ්ඩ භාවය යොදනු ලැබූ විට ඒ රැස්වීමේ සෑම සාමාජිකයෙක් ම කැරලි ගැසීමේ වරදට වරදකාරයෙක් වේ.

කැරලි ගැසීමට දඩුවම.

**144.** කැරලි ගැසීම ගැන වරදකාරයකු වූ තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලය, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

මාරක ආයුධයක් ඇතිව කැරලි ගැසීම.

**145.** මාරක ආයුධයක් හෝ පහර දීමේ ආයුධයක් වශයෙන් පාවිච්චි කළහොත් මරණය සිදු කළ හැකි යමක් ඇතිව කැරලි ගැසීම ගැන වරදකාරයා වන තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**146.** යම් රැස්වීමක පොදු පරමාර්ථය ඉෂ්ට කර ගැනීම සඳහා යම් වරදක් එකී නීති විරෝධී රැස්වීමේ සාමාජිකයකු විසින් කරනු ලැබූ අවස්ථාවක දී හෝ එකී පරමාර්ථය ඉෂ්ට කර ගැනීම සඳහා එකී වරද සිදු කළ හැකි බව එකී රැස්වීමෙහි සාමාජිකයන් දැන සිටි අවස්ථාවක දී වරද සිදු කරන වේලාවෙහි සාමාජිකයකු ව සිටි හැම කෙනෙක්ම එකී වරදට වරද කාරයෙක් වේ.

පොදු පරමාර්ථය ඉෂ්ට කිරීමේ දී සිදු කරනු ලැබූ වරදක් සම්බන්ධයෙන් නීති විරෝධී රැස්වීමක සෑම සාමාජිකයකු ම වරදකාරයකු වන බව.

**147.** යම් නීති විරෝධී රැස්වීමකට එකතු වීමට හෝ එහි සාමාජිකයකු වීමට යමකු කුලියට ගනු ලබන, යොදනු ලබන හෝ සේවයට ගනු ලබන, නැතහොත් එබඳු කාර්‍යයකට යමකු කුලියට ගැනීමට, යෙදීමට හෝ සේවයට ගැනීමට ධෛර්‍ය දෙනු ලබන හෝ අනුදන්වනු ලබන තැනැත්තකුට එකී නීති විරෝධී රැස්වීමෙහි සාමාජිකයකු වශයෙන් දඬුවම් කළ යුතු ය. තව ද එකී කුලියට ගැනීමේ හෝ යෙදීමේ හෝ සේවයට ගැනීමේ ප්‍රකාර එබඳු තැනැත්තකු විසින් කරනු ලැබූ යම් වරදකට ඒ නීති විරෝධී රැස්වීමෙහි තම සාමාජිකයකුව සිටි ලෙසම හෝ තමා එම වරද කළ ලෙසම ඒ නීති විරෝධී රැස්වීමෙහි සාමාජිකයකු ලෙස දඬුවම් ලැබීමට ඔහු යටත් විය යුතු ය.

නීති විරෝධී රැස්වීමකට සම්බන්ධ කර ගැනීම සඳහා පුද්ගලයන් කුලියට ගැනීම හෝ කුලියට ගැනීම අනුදැනුම.

**148.** මහජන සාමය කඩ කිරීමක් සිදු කළ හැකි පස් දෙනකුගෙන් හෝ ඊට වැඩි ගණනකින් යුක්ත රැස්වීමකට විසිර යාමට නීත්‍යානුකූලව අණ කරනු ලැබීමෙන් පසු ද දැන දැනම එබන්දකට එකතු වන තැනැත්තකුට හෝ එහි නතර ව සිටින තැනැත්තකුට හය මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

පැහැදිලි කිරීම–රැස්වීම 138 වෙනි වගන්තියේ අර්ථය ඇතුලත නීති විරෝධී රැස්වීමක් නම්, වරදකරුට 142 වෙනි වගන්තිය යටතේ දඬුවම් කළ හැකි ය.

පස් දෙනකු ගෙන් හෝ ඊට වැඩි ගණනකින් යුක්ත රැස්වීමකට විසිර යාමට අණ කරනු ලැබීමෙන් පසු ද දැන දැන ම එබන්දකට එකතුවීම හෝ එහි රැඳී සිටීම.

**149.** නීති විරෝධී රැස්වීමක් විසිරවීමට හෝ කැරැල්ලක් හෝ කලහයක් මැඩ පැවැත්වීමට වෙහෙස දැරීමෙන් රජයේ සේවකයකු වශයෙන් තම යුතුකම ඉෂ්ට කිරීමේ දී, රජයේ සේවකයකුට පහර දෙන හෝ පහර දෙන බවට තර්ජනය කරන හෝ බාධා කරන හෝ බාධා කිරීමට තැත් කරන හෝ සාපරාධී බලහත්කාරකම් යොදන හෝ යොදන බවට තර්ජනය කරන හෝ යෙදීමට තැත් කරන තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

කැරැල්ලක් ආදිය මැඩ පැවැත්වීමේ දී රජයේ සේවකයකුට පහර දීම හෝ බාධා කිරීම.

**150.** ප්‍රකෝප කරවීමෙන් කැරලි ගැසීමේ වරද සිදුවිය හැකි බව අදහස් කිරීමෙන් හෝ දැනම ද්වේෂ සහගතව හෝ නිකරුණේ නීති විරෝධී ක්‍රියාවක් කිරීමෙන් යම් තැනැත්තකු විසින් යමකු ප්‍රකෝප කරනු ලැබූ අවස්ථාවක දී, ඒ ප්‍රකෝප කරවීමේ ප්‍රතිඵලයක් වශයෙන් කැරලි ගැසීමේ වරද කළහොත්, ප්‍රකෝප කළ තැනැත්තාට අවුරුද්ද දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය. කැරලි ගැසීමේ වරද නොකළ හොත්, ඔහුට හය මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

කැරැල්ලක් ඇතිකරවීමේ අදහසින් නිකරුණේ ප්‍රකෝප කරවීම.

කැරලි ගැසීම කළහොත්.

කැරලි ගැසීම නොකළහොත්.



https://ezofz.web.lk/
Scanned with CamScanner

නීති විරෝධි රැස්වීමක් පවත්වනු ලැබූ ඉඩමෙහි අයිතිකරු හෝ පදිංචිකරු.

**151.** යම් නීති විරෝධි රැස්වීමක් හෝ කැරැල්ලක් ඇති වූ විට, එකී රැස්වීම පැවැත්වුණු හෝ කැරැල්ල සිදු වූ ඉඩමෙහි අයිතිකාරයා හෝ පදිංචිකාරයා ද එකී ඉඩමට අයිතිවාසිකමක් ඇති හෝ අයිතිවාසිකමක් කියන තැනැත්තා ද එබඳු වරදක් සිදුවන බව හෝ සිදුවන බව දැන දැනම හෝ සිදුවිය හැකි බව විශ්වාස කිරීමට කරුණු ඇතිව ලඟම පොලිස් නිලධාරියාට තමාට පුළුවන් ඉක්මණින් ඒ බව දැනුම් දෙනු නොලැබී නම් ද එය සිදු කිරීමට ආසන්න බව විශ්වාස කිරීමට කරුණු තිබෙන අවස්ථාවක දී, එය වැළැක්වීමට තම ශක්තිය අනුව සියළුම නීත්‍යානුකූල උපක්‍රම යොදනු නො ලැබී නම් ද, එය සිදුවූ අවස්ථාවක දී නීති විරෝධි රැස්වීම විසුරුවා හැරීමට හෝ කැරැල්ල මැඩ පැවැත්වීමට තම ශක්තිය අනුව සියලුම උපක්‍රම යොදනු නොලැබී නම් ද, එබන්දකු රුපියල් දාහකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු ය.

කැරැල්ලක් ඇති කරනු ලැබුයේ යම් තැනැත්තකුගේ යහපතට නම්, ඒ තැනැත්තාගේ වගකීම.

**152.** යම් ඉඩමක් සම්බන්ධයෙන් ඒ ඉඩම් අයත් වූ හෝ එහි පදිංචි වූ හෝ ඒ ඉඩමෙහි සම්බන්ධතාවක් ඉල්වන්නා වූ හෝ කැරැල්ල හටගැනීමට හේතු වූ ආරවුලට මුල් වූ දෙයෙහි සම්බන්ධතාවක් ඉල්වන්නා වූ හෝ ඉන් වාසියක් ලබාගත්තා වූ හෝ පිළිගත්තා වූ තැනැත්තකුගේ යහපත සඳහා හෝ ඔහු වෙනුවෙන් කැරැල්ලක් සිදු කළ විට, එකී තැනැත්තා එබඳු කැරැල්ලක් සිදු කිරීමට හැකි බව හෝ ඒ කැරැල්ල සිදු කරනු ලබන නීති විරෝධි රැස්වීම හෝ කැරැල්ල සිදුවීම වැලැක්වීමට ද, එබන්දක් මැඩ පැවැත්වීමට හා විසුරුවා හැරීමට ද, තම ශක්තිය අනුව සියලුම නීත්‍යානුකූල උපක්‍රම නොයෙදීම නම්, ඔහු දඩයකින් දඬුවම් ලැබීමට යටත් විය යුතු ය.

කැරැල්ලක් ඇති කරනු ලැබුයේ යම් අයිතිකරුවකුගේ හෝ පදිංචි කරුවකුගේ යහපත සඳහා නම් ඒ අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ නියෝජිතයාගේ වගකීම.

**153.** යම් ඉඩමක් සම්බන්ධයෙන් එකී ඉඩම අයත් වූ හෝ එහි පදිංචි වූ හෝ එකී ඉඩමෙහි හෝ එකී කැරැල්ලට හේතු වූ යම් ආරවුලකට මුල් වූ දෙයක සම්බන්ධතාවක් ඉල්ලා සිටින්නා වූ හෝ ඉන් යම් වාසියක් පිළිගත් හෝ ලබාගත් තැනැත්තාගේ යහපත සඳහා ඔහු වෙනුවෙන් යම් කැරැල්ලක් හටගත් විට, එකී තැනැත්තාගේ නියෝජිතයා හෝ කළමනාකාර තැන කැරැල්ලක් හට ගන්නට පුළුවන් බව හෝ එකී කැරැල්ල සිදු කරනු ලබන නීති විරෝධි රැස්වීම පැවැත්විය හැකි බව විශ්වාස කිරීමට කරුණු තිබිය දී, එබන්දක් වැළක්වීමට හා එය මැඩ පවත්වා විසුරුවා හැරීමට තම ශක්තිය ප්‍රමාණයට සියලුම නීත්‍යානුකූල උපක්‍රම පාවිච්චි කරනු නො ලැබී නම්, ඔහු දඩයකින් දඬුවම් ලැබීමට යටත් විය යුතු ය.

නීති විරෝධි රැස්වීමකට කුලියට ගනු ලැබූ තැනැත්තන් හට නවාතැන් දීම.

**154.** යම් තැනැත්තන් නීති විරෝධි රැස්වීමකට එකතුවීම සඳහා හෝ එබන්දකට සහාය වීම සඳහා යොදවනු ලැබූ හෝ යොදනු ලැබූ හෝ සේවයට ගනු ලැබූ හෝ කුලියට ගැනීමට හෝ යෙදවීමට හෝ සේවයට ගැනීමට අදහස් කරනු ලැබූ තැනැත්තන් බව දැන දැන ම ඔවුන්හට තමා පදිංචිව සිටින හෝ තමාගේ භාරයේ ඇති හෝ තමාගේ පාලනයට යටත් ගෙයක හෝ ස්ථානයක නවාතැන් දෙන, පිළිගන්නා හෝ රැස්කරවන තැනැත්තකුට හයමාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**155.** 138 වෙනි වගන්තියේ නියමිත යම් ක්‍රියාවක් කිරීම සඳහා හෝ එබන්දකට සහාය වීම සඳහා යොදවනු ලැබූ හෝ කුලියට ගනු ලැබූ හෝ කුලියට ගැනීම සඳහා හෝ යෙදවීම සඳහා ඉදිරිපත් වනු ලැබ හෝ තැත් කරනු ලැබූ යම් තැනැත්තකුට හය මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය. තව ද ඉහත කී ලෙස යොදනු ලැබ හෝ කුලියට ගනු ලැබ, යමකු මාරක ආයුධයක් ඇතිව හෝ පහරදීමේ ආයුධයක් වශයෙන් පාවිච්චි කරනු ලැබුවහොත් මරණය සිදු කළ හැකි යමක් ඇතිව යතහොත් හෝ යෙදෙත හොත් හෝ යාමට ඉදිරිපත් වෙතහොත් ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

නීති විරෝධී රැස්වීමකට හෝ කැරැල්ලට සහභාගිවීමට කුලියට ගනු ලැබීම.

නැතහොත් ආයුධ සහිතව යාම.

**156.** දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් ප්‍රසිද්ධ ස්ථානයක දබර කිරීමෙන් මහජන සාමය කඩ කරනු ලැබූ අවස්ථාවක දී, ඔවුන් "කලහයක් ඇති කළ ලෙස" සලකනු ලැබේ.

කලහය.

**157.** කලහයක් ඇති කරන තැනැත්තකුට මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ද දඬුවම් කළ යුතු ය.

කලහයක් ඇති කිරීම ගැන දඬුවම.

## IX වෙනි පරිච්ඡේදය

### රජයේ සේවකයන් විසින් කරනු ලබන වැරදි හෝ රජයේ සේවකයන් සම්බන්ධ වැරදි

**158.** යම් නිල කාර්‍යයක් කිරීම හෝ නොකර සිටීම හෝ තම නිල කටයුතු කිරීමේ දී යම් තැනැත්තකුට උපකාරයක් හෝ අපකාරයක් කිරීම හෝ නොකර සිටීම හෝ ව්‍යවස්ථාදායක හෝ විධායක ලංකාණ්ඩුවෙන් හෝ වෙනත් රජයේ සේවකයකුගේ යම් වාසියක් හෝ අවාසියක් යම් තැනැත්තකුට ලබාදීම හෝ ලබාදීමට තැත් කිරීම සඳහා පෙළඹීමේ හේතුවක් වශයෙන් හෝ ත්‍යාගයක් වශයෙන්, නීත්‍යානුකූල ගෙවීම හැර, අන්කිසි ආකාරයක තුටු පඬුරක් තමා රජයේ සේවකයකු ව සිටිමින් හෝ රජයේ සේවකයකු වීමට බලාපොරොත්තු වෙමින් හෝ තමා වෙනුවෙන් හෝ වෙනත් කෙනකු සඳහා යමකු යමකුගෙන් පිළිගතහොත් හෝ ලබාගතහොත් හෝ පිළිගැනීමට එකඟවුවහොත් හෝ ලබාගැනීමට තැත් කරතොත් ඔහුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

රජයේ සේවකයකු නිල ක්‍රියාවක් සම්බන්ධයෙන් නීත්‍යානුකූල ගෙවීම හැර තුටු පඬුරක් ගැනීම.

**පැහැදිලි කිරීම.**- "රජයේ සේවකයකු වීමට බලාපොරොත්තු වෙමින්." නිලයක් බලාපොරොත්තු නො වන යම් තැනැත්තෙක් තමා නිලයකට පත් වීමට ආසන්න බව හා එවිට යම් තැනැත්තන්හට සේවය කරන බව හඟවන විශ්වාසයක් ඇතිකරවා යම් තැනැත්තන් රැවටීමෙන් තුටු පඬුරක් ලබා ගත්තේ නම් ඔහු එංවා කිරීමේ වරදට වැරදිකාරයකු විය හැකි නමුත්, මේ වගන්තියේ විස්තර කරනු ලැබූ වරදට ඔහු වැරදි කරුවෙක් නොවේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**"තුටු පඩුර".**– "තුටු පඩුර" යන වචනය මුදල්වලින් දෙන තුටු පඩුරට හෝ මුදල්වලින් අගය කළ හැකි තුටු පඩුරට සීමා වී නැත.

**"නීත්‍යානුකූල ගෙවීම."**– "නීත්‍යානුකූල ගෙවීම" යන වචන රජයේ සේවකයකු විසින් නීත්‍යානුකූලව ඉල්ලා සිටිය හැකි ගෙවීමට පමණක් සීමා නොවන අතරම ඔහු සේවය කරනු ලබන ආණ්ඩුවෙන් පිළිගැනීමට දී තිබෙන සියලුම ගෙවීම් එයට ඇතුළත් වේ.

**"කිරීම සඳහා පෙළඹීමේ හේතුවක් හෝ ත්‍යාගයක්".**– "කිරීම සඳහා පෙළඹීමේ හේතුවක් හෝ ත්‍යාගයක්" යන වචන තමා කිරීමට අදහස් කරනු නො ලැබූ දෙයක් කිරීමට පෙළඹීමේ හේතුවක් වශයෙන් හෝ තමා කරනු නොලැබූ දෙයක් කිරීම සඳහා ත්‍යාගයක් වශයෙන් තුටු පඩුරක් පිළිගන්නා තැනැත්තා මේ වචන තුළ ඇතුළත් වේ.

**නිදර්ශන**

(අ) ජූරි සභිකයකු ලෙස කැඳවනු ලැබීමට බලාපොරොත්තුවන "ඒ" බැන්කුකරුවකු වූ "ඉසෙඩ්" ගේ වාසියට තීරණයක් දීම සඳහා ත්‍යාගයක් වශයෙන් "ඒ" ගේ සහෝදරයාට "ඉසෙඩ්" ගේ බැන්කුවෙහි රක්ෂාවක් "ඉසෙඩ්" ගෙන් ලබා ගනියි. මේ වගන්තියෙහි විස්තර කරනු ලැබූ වරද "ඒ" කර ඇත.

(ආ) රජයේ සේවකයකු වූ "ඒ" ට ආණ්ඩුව සමග ඇති බලය නිසා "ඉසෙඩ්" ට නම්බු නාමයක් ලැබුණේ යයි වැරදි ලෙස විශ්වාස කිරීමට "ඒ" "ඉසෙඩ්" පොළඹවයි. ඒ අනුව මේ සේවය සඳහා ත්‍යාගයක් වශයෙන් "ඒ" ට මුදල් දීමට ද "ඒ" "ඉසෙඩ්" පොළඹවයි. මේ වගන්තියේ විස්තර කරනු ලැබූ වරද "ඒ" කර ඇත.

**දූෂිත හෝ නීති විරෝධි මාර්ග වලින් රජයේ සේවකයකුට බලපෑම සඳහා තුටු පඩුරක් ගැනීම.**

**159.** යම් නිලකාර්‍යයක් කිරීම හෝ නොකර සිටීම හෝ තම නිල කටයුතු කිරීමේ දී යම් තැනැත්තකුට උපකාරයක් හෝ අපකාරයක් කිරීම හෝ ලංකාවේ උත්තර මන්ත්‍රී මණ්ඩලය හෝ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හෝ විධායක ආණ්ඩුවේ හෝ රජයේ සේවකයකු සමග යම් තැනැත්තකුට යම් වාසියක් හෝ අවාසියක් කිරීම හෝ කිරීමට තැත් කිරීම සඳහා යම් රජයේ සේවකයකු දූෂිත වූ හෝ නීති විරෝධි මාර්ගවලින් පෙළඹවීමේ හේතුවක් වශයෙන් හෝ තෑග්ගක් වශයෙන් තමා සඳහා හෝ අන් තැනැත්තකු සඳහා යමකුගෙන් යම් තුටු පඩුරක් පිළිගන්නා වූ හෝ ලබාගන්නා වූ හෝ පිළිගැනීමට එකඟ වන්නා වූ හෝ ලබාගැනීමට තැත් කරන්නා වූ තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

**රජයේ සේවකයකු කෙරෙහි පෞද්ගලික බලය පාවිච්චි කිරීම සඳහා තුටු පඩුරක් ගැනීම.**

**160.** යම් නිල කාර්‍යයක් කිරීම හෝ නොකර සිටීම හෝ තමාගේ නිල කටයුතු කිරීමේ දී යම් තැනැත්තකුට උපකාරයක් හෝ අපකාරයක් කිරීම හෝ ලංකාවේ උත්තර මන්ත්‍රී මණ්ඩලය හෝ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හෝ විධායක ආණ්ඩුව හෝ රජයේ සේවකයකු සමග යම් තැනැත්තකුට යම් වාසියක් හෝ අවාසියක් කිරීම හෝ කිරීමට තැත්කිරීම සඳහා යම් රජයේ සේවකයකු, තම පුද්ගලික බල පෑමෙන් පෙළඹවීමේ හේතුවක් වශයෙන් හෝ තෑග්ගක් වශයෙන් හෝ තමා සඳහා හෝ අන් තැනැත්තකු සඳහා යමකුගෙන් යම් තුටු පඩුරක් ගන්නා වූ හෝ ලබාගන්නා වූ හෝ පිළිගැනීමට එකඟ වන්නා වූ හෝ ලබාගැනීමට



https://ezofz.web.lk/
Scanned with CamScanner

තැත් කරන්නා වූ තැනැත්තකුට අවුරුද්දක් දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ද දඬුවම් කළ යුතු ය.

**නිදර්ශනය**

විනිශ්චයකාරයකු ඉදිරියේ නඩුවක් තර්ක කිරීම සඳහා ගාස්තුවක් ලබාගන්නා අධිනීතිඥවරයෙක් ද, සන්දේශකරුගේ සේවයන් හා අයිතිවාසිකම් දක්වමින් ආණ්ඩුව වෙත ඉදිරිපත් කෙරෙන සන්දේශයක් පිළියෙළ කිරීම හා නිවැරදි කිරීම සඳහා ගාස්තුවක් ලබාගන්නා තැනැත්තෙක් ද, වරදකාරයා කරනු ලැබූ අපරාධකාරයකු වරදකාරයා කරනු ලැබීම අසාධාරණ බව දැක්වීමට ඔහු වෙනුවෙන් ආණ්ඩුව ඉදිරිපිට ප්‍රකාශ ඉදිරිපත් කරන ගෙවා පත් කරනු ලැබූ නියෝජිතයෙක් ද පුද්ගලික බලය පාවිච්චි නොකරන නිසා හෝ පාවිච්චි කරන බව කියා නො සිටින නිසා මේ වගන්තිය ඇතුළතට නොවැටෙති.

**161.** ඉහතින් සඳහන් වගන්ති දෙකෙහි විස්තර කරනු ලැබූ වැරදි දෙකෙන් යමක් යම් රජයේ සේවකයකු සම්බන්ධයෙන් කරන ලද්දේ නම්, ඔහු එකී වරදට අනුබල දුන් විට, ඔහුට අවුරුදු තුන දක්වා කාලයක දෙයාකාරයෙන්, එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

ඉහතින් විස්තර කරනු ලැබූ වැරදිවලට රජයේ සේවකයකු විසින් අනුබල දීම ගැන දඬුවම.

**නිදර්ශනය**

"ඒ" රජයේ සේවකයෙකි. එක්තරා තැනැත්තකුට තිලයක් දීමට "ඒ" ගෙන් ඉල්ලා සිටීම සඳහා පෙළඹවීමේ හේතුවක් වශයෙන් "ඒ" ගේ භාර්යාව වූ "බී" තෑග්ගක් ලබයි. "ඒ" ඇයට එසේ කිරීම සඳහා අනුබල දෙයි. අවුරුද්දකට වැඩි නොවන කාලයක බන්ධනාගාරගත කිරීමෙන් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම "බී" දඬුවම් ලැබිය හැකි ය. අවුරුදු තුන දක්වා කාලය බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම "ඒ" දඬුවම් ලැබිය හැකි ය.

**162.** රජයේ සේවකයකු වශයෙන් තමා හැසිරිය යුතු අන්දම පිළිබඳව දී ඇති නීතියේ නියමයකට අකීකරු වීමෙන් යම් තැනැත්තකුට හෝ ආණ්ඩුවට පාඩුවක් සිදු කිරීමට අදහස් කරමින් හෝ එබඳු පාඩුවක් විය හැකි බව දැන දැනම තමා රජයේ සේවකයකු ව සිටිය දී ම එබඳු නියමයකට දැන දැනම අකීකරු වන තැනැත්තකුට අවුරුද්ද දක්වා කාලයක ලිහිල් බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

යම් තැනත්තකුට හෝ ආණ්ඩුවට පාඩුවක් කිරීමේ චේතනාවෙන් නීතියේ නියමය කට රජයේ සේවකයකු අකීකරුවීම.

**නිදර්ශනය**

අධිකරණයක් "ඉසෙඩ්" ගේ වාසියට ප්‍රකාශ වූ තීන්දු ප්‍රකාශයක් ඉෂ්ට කිරීම සඳහා දේපළක් නීතියෙන් ඇල්ලීමට නියම කරනු ලැබූ නිලධාරියකු වූ "ඒ" "ඉසෙඩ්" ට එයින් තමාගෙන් පාඩුවක් විය හැකි ය, යන දැනුම ඇති ව එකී නියමයට අකීකරු වෙයි. මේ වගන්තියේ විස්තර කරනු ලැබූ වරද "ඒ" කරයි.

**163.** යමකු රජයේ සේවකයකු ව සිටිමින් යම් ලේඛනයක් පිළියෙල කිරීම හෝ පරිවර්තනය කිරීම තමාට භාර වූ අවස්ථාවක දී ඒ ලේඛනය සාවද්‍ය ලෙස සකස් කිරීමෙන් හෝ පරිවර්තනය කිරීමෙන් යම් තැනැත්තකුට පාඩුවක් කිරීමේ අදහසින් හෝ පාඩුවක් විය හැකි බව දනිමින් ම එය සාවද්‍ය බව තමා දන්නා හෝ තමා විශ්වාස කරන ආකාරයට එකී ලේඛනය සකස් කළහොත් හෝ පරිවර්තනය කළහොත් ඔහුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක

පාඩු කිරීමේ අදහසින්ම සාවද්‍ය ලේඛනයක් රජයේ සේවකයකු විසින් සකස්කරනු ලැබීම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

බන්ධනාගාර ගතකිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුවේ සේවය කරන රජයේ සේවකයකු විසින් වංචා සහගතව හෝ ද්වේෂ සහගතව යුතුකම් ඉටු නොකිරීම.

**164.** ආණ්ඩුවේ විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුවේ සේවය කරන රජයේ සේවකයකු විසින් යවන ලෙස ඔහුට නීත්‍යානුකූලව බාර කරනු ලැබූ යම් පණිවිඩයක් වංචක ලෙස හෝ ද්වේශ සහගතව ඔහු විසින් සඟවනු ලැබුවහොත් හෝ විනාශ කරනු ලැබුවහොත් හෝ වෙනස් කරනු ලැබුවහොත් හෝ නො යැවුවහොත් හෝ ඉහත කී පරිදි සේවයෙහි යෙදී සිටින අතර, ඔහුට ලැබුණ යම් පණිවිඩයක් පිළිගැනීමට බලය නැත්තකුට වංචක ලෙස ද්වේශ සහගතව අනාවරණය කරනු ලැබුව හොත් ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුවේ හෝ තැපැල් දෙපාර්තමේන්තුවේ සේවයෙහි යෙදී සිටින රජයේ සේවකයකුගේ විෂමාචාරය.

**165.** ආණ්ඩුවේ විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුවේ හෝ තැපැල් දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින රජයේ සේවකයකු වූ තැනැත්තකුගේ බීමත්කම, නො සැලකිල්ල හෝ වෙනත් විෂමාචාරයක් නිසා ඔහු විසින් යම් පණිවිඩයක්, ලියුමක් හෝ තැපැල් පොදියක් යැවීම බාධා කරනු ලැබුවහොත් හෝ ප්‍රමාද කරනු ලැබුවහොත් ඔහුට තුන් මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ රුපියල් පනහ දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුවේ සේවයෙහි යෙදී සිටින රජයේ සේවකයකුගේ වංචාව.

**166.** ආණ්ඩුවේ විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුවේ සේවයෙහි යෙදී ඇති රජයේ සේවකයකු වූ යම් තැනැත්තකු නියමිත ගාස්තුව නොගෙවන ලද යම් පණිවිඩයක්, වංචා කිරීමේ අදහසින් විදුලි මාර්ගයෙන් යවතහොත් ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

තැපැල් දෙපාර්තමේන්තුවේ හෝ විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුවේ සේවයෙහි යෙදී ඇති රජයේ සේවකයන් විසින් පණිවිඩ ආදියට හානි කරනු ලැබීම.

**167.** ආණ්ඩුවේ විදුලි පණිවිඩ දෙපාර්තමේන්තුවේ හෝ තැපැල් දෙපාර්තමේන්තුවේ සේවයෙහි යෙදී ඇති රජයේ සේවකයකු වූ තැනැත්තකු තම යුතුකමට ප්‍රතිවිරුද්ධව, විදුලි පණිවිඩයක්, ලියුමක් හෝ තැපැල් පොදියක් සැඟවුවහොත් හෝ විනාශ කළහොත් හෝ ඉරුවහොත් හෝ කඩා විවෘත කළහොත් ඔහුට අවුරුදු හත දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

රජයේ සේවකයකු ලෙස පෙනී සිටීම.

**168.** එක්තරා තිලයක් තමා නොදරන බව දැන දැනම රජයේ සේවකයකු වශයෙන් ඒ තිලය දරන බව බොරුවට හඟවන්නාවූ හෝ ඒ තිලය දරන්නකු ලෙස අසත්‍ය ලෙස පෙනී සිටිමින් එකී ආරූඪ කරගත් වේශයෙන් ඒ තිලයේ නාමයෙන් යම් ක්‍රියාවක් කරන්නා වූ හෝ කිරීමට තැත් කරන්නා වූ යම් තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

**169.** එක්තරා රජයේ සේවක පන්තියකට අයත් නොවූ තැනැත්තකු



https://ezofz.web.lk/
Scanned with CamScanner

තමා ඒ රජයේ සේවක පංතියට අයත් කෙනකු ලෙස විශ්වාස කරනු ලැබීමේ අදහස පිට නැතහොත් ඒ ලෙස විශ්වාස කිරීමට ඉඩ ඇත යන දැනුම පිට, ඒ රජයේ සේවක පංතිය විසින් පාවිච්චි කරනු ලබන යම් ඇඳුමකට සමාන ඇඳුමක් අඳිතහොත් හෝ එකී පංතිය විසින් පාවිච්චි කරනු ලබන සළකුණකට සමාන සළකුණක් ගෙන යතහොත් ඔහුට මාස තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

වංචක අදහසින් රජයේ සේවකයන් විසින් පාවිච්චි කරනු ලබන ඇඳුම් ඇඳීම හෝ සළකුණ ගෙනයාම.

# IXඅ වෙනි පරිච්ඡේදය

## ඡන්ද විමසීම් සම්බන්ධ වැරදි

**169අ.** මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා –

"මන්ත්‍රී ධූරාපේක්ෂකයා" හා "ඡන්ද බලය".

(අ) "මන්ත්‍රී ධූරාපේක්ෂකයා" යන්නෙන්, යම් ඡන්ද විමසීමක දී, මන්ත්‍රී ධූරාපේක්ෂකයකු වශයෙන් නාම යෝජනා කරනු ලැබූ තැනැත්තකු අදහස් කෙරෙයි. තව ද ඡන්ද විමසීමක් බලාපොරොත්තුව තිබිය දී, එවිට ඉදිරිපත් විය හැකි මන්ත්‍රී ධූරාපේක්ෂකයා වශයෙන් සිටින තැනැත්තකු පසුව එකී ඡන්ද විමසීමෙහි දී, මන්ත්‍රී ධූරාපේක්ෂකයකු වශයෙන් නාම යෝජනා කරනු ලැබුවහොත්, ඔහු ද ඊට ඇතුළත් වෙයි.

(ආ) "ඡන්ද බලය" යන්නෙන් මන්ත්‍රී ධූරාපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් වීමේ හෝ ඉදිරිපත් නොවීමේ හෝ ඉදිරිපත් ව අස්කර ගැනීමේ බලයක් හෝ ; ඡන්ද විමසීමක දී ඡන්දය දීමේ හෝ ඡන්දය නොදී සිටීමේ යම් තැනැත්තකුට ඇති බලයක් අදහස් කෙරෙයි.

**169ආ.** (1) (අ) යම් තැනැත්තකුට ඔහුගේ හෝ වෙනත් අයකුගේ ඡන්ද බලයක් පාවිච්චි කිරීමට පෙළඹීමේ කාර්යය සඳහා හෝ ඡන්ද බලයක් පාවිච්චි කළ නිසා තෑගිදීම සඳහා යම් තුටු පඬුරක් දෙන්නා වූ හෝ

ඡන්දය විමසීමක් සම්බන්ධයෙන් අල්ලස් දීම.

(ආ) එ බඳු බලයක් පාවිච්චි කිරීම ගැන හෝ එ බඳු බලයක් පාවිච්චි කිරීමට වෙනත් තැනැත්තකු පෙළඹවීමට තැත් කිරීම ගැන තෑග්ගක් වශයෙන් තමා වෙනුවෙන් හෝ වෙනත් තැනැත්තකු වෙනුවෙන් තුටු පඬුරක් පිළිගන්නා වූ තැනැත්තෙක් අල්ලස්දීමේ වරද කරන්නේ ය.

එසේ ද වුවත් මහජන ප්‍රතිපත්ති ප්‍රකාශයක් හෝ මහජන ක්‍රියා මාර්ගයක පොරොන්දුවක් මේ වගන්තිය යටතේ වරදක් නො විය යුතු ය.

(2) තුටු පඬුරක් දෙන, දීමට එකඟවන හෝ ලබා ගැනීමට ඉදිරිපත් වන හෝ ලබා දීමට තැත් කරන තැනැත්තකුට තුටු පඬුරක් දෙන්නකු ලෙස සැලකිය යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

(3) තුටු පඬුරක් ලබා ගන්නා වූ හෝ පිළිගැනීමට එකඟ වන්නා වූ ලබා ගැනීමට තැත් කරන්නා වූ තැනැත්තකු තුටු පඬුරක් පිළිගන්නකු ලෙස සැලකිය යුතු ය.

තව ද කිරීමට අදහස් කරනු නො ලැබූ ක්‍රියාවක් කිරීමට පෙළඹවීමේ හේතුවක් වශයෙන් හෝ කරනු නො ලැබූ ක්‍රියාවක් කිරීමට තෑග්ගක් වශයෙන් තුටු පඬුරක් පිළිගන්නා තැනැත්තකු ද, තෑග්ගක් වශයෙන් තුටු පඬුරක් පිළිගන්නකු ලෙස සැලකිය යුතු ය.

ඡන්ද විමසීම් වල අයථා බලය යෙදීම.

**169ඇ.** (1) යම් ඡන්ද බලයක් නිදහස් ලෙස පාවිච්චි කිරීමට කැමැත්තෙන් ම බාධා කරන හෝ බාධා කිරීමට තැත් කරන තැනැත්තෙක් ඡන්ද විමසීමක දී අයථා බලය යෙදීමේ වරද කරයි.

(2) පළමුවෙනි උප වගන්තියේ විධිවිධානවල සාමාන්‍ය ජනතාවට හානියක් නොමැති ව,

(අ) යම් මන්ත්‍රී ධූරාපේක්ෂකයකුට හෝ ඡන්දදායකයකුට හෝ මන්ත්‍රී ධූරාපේක්ෂකයකු හෝ ඡන්දදායකයකු සැලකිල්ල දක්වන තැනැත්තකුට යම් අන්දමක පාඩුවක් කිරීමට තර්ජනය කරන, හෝ

(ආ) තමා හෝ තමා සැලකිල්ල දක්වන තැනැත්තකු දේවකෝපයට හෝ ආගමික දොස් පැවරීමකට භාජනවිය හැකි බව විශ්වාස කරනු ලැබීමට මන්ත්‍රී ධූරාපේක්ෂකයකු හෝ ඡන්දදායකයකු පොළඹවන හෝ පෙළඹවීමට තැත් කරන තැනැත්තකු,

(1) වෙනි උප වගන්තියෙහි අර්ථය ඇතුළත එකී මන්ත්‍රී ධූරාපේක්ෂකයාගේ හෝ ඡන්දදායකයාගේ ඡන්ද බලය පාවිච්චි කිරීමට බාධා කළ ලෙස සැලකිය යුතු ය.

(3) මහජන ප්‍රතිපත්ති ප්‍රකාශයක් හෝ මහජන ක්‍රියා මාර්ගයක පොරොන්දුවක් හෝ ඡන්ද බලයකට බාධා නොවන අදහසින් නීත්‍යානුකූල බලයක් පාවිච්චි කිරීම මේ වගන්තියේ අර්ථය ඇතුළත ඡන්ද බලයකට බාධා කිරීමක් ලෙස නොසැලකිය යුතු ය.

ඡන්ද විමසීම් වලදී අන්‍යයකු නාමයෙන් පෙනී සිටීම.

**169ඇ.** (1) ඡන්ද විමසීමක දී, ජීවත් වූ සිටින හෝ මියගිය තැනැත්තකුගේ නාමයෙන් හෝ ව්‍යාජ නාමයකින් ඡන්ද පත්‍රිකාවක ඉල්වන්නා වූ හෝ ඡන්දය දෙන්නා වූ හෝ එකී ඡන්ද විමසීමෙහි දී වරක් ඡන්දය දීමෙන් පසු, ඒ ඡන්ද විමසීමෙහි දී ම තම නාමයෙන් ඡන්ද පත්‍රිකාවක් ඉල්වන්නා වූ තැනැත්තෙක් ද, එ බඳු ඡන්ද දීමකට යම් තැනැත්තකුට අනුබල දෙන්නා වූ හෝ එබන්දකු ලවා ඒ ලෙස කරවන්නා වූ හෝ එසේ කරවීමට තැත් කරන්නා වූ තැනැත්තෙක් ද, අන්‍යයකු නාමයෙන් පෙනී සිටීමේ වරද කරති.

https://ezofz.web.lk/
Scanned with CamScanner

(2) මේ වගන්තියේ කාර්‍යය සඳහා "ඡන්ද විමසීම" යන වචනයට යම් ආඥාපනතක හෝ එය යටතේ පනවනු ලැබූ නියෝගවල හෝ ව්‍යවස්ථාවල බලය අනුව හෝ යටතේ යම් ප්‍රශ්නයක් පිළිබඳ ව නියමිත තැනැත්තන් පංතියක වැඩි දෙනාගේ කැමැත්ත විමසීමේ කාර්‍යය සඳහා ඡන්ද විමසීමකින් හෝ රහස් ඡන්දයෙන් පවත්වනු ලැබූ කාර්යයක ඇතුළත් වෙයි.

**169ඉ.** අල්ලස් දීමේ වරද කරන තැනැත්තකු ලඝු නඩු විසඳීමෙන් වැරදිකාරයා වීමේ දී, රුපියල් පන්සියයකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු ය. — අල්ලස් දීම ගැන දඬුවම.

එසේ වුව ද, සංග්‍රහ කිරීමෙන් අල්ලස් දීම රුපියල් දෙසීයකට වැඩි නොවන දඩයකින් දඬුවම් කළ යුතු ය.

**පැහැදිලි කිරීම.**– සංග්‍රහ කිරීම යන්නෙන්, කෑම බීම, සත්කාර හෝ බඩු බාහිරාදියෙන් තුටු පඩුර යුක්ත වන අල්ලස් ක්‍රමය අදහස් කෙරෙයි.

**169ඊ.** ඡන්ද විමසීමක දී අයථා බලය පාවිච්චි කරන තැනැත්තකු ලඝු නඩු විසඳීමකින් වැරදිකාරයා වීමේ දී, රුපියල් පන්සියයකට වැඩි නො වන දඩයකට යටත් විය යුතු ය. තවද ඡන්ද විමසීමක දී අන්‍යයකුගේ නාමයෙන් පෙනී සිටීමේ වරද කරන තැනැත්තකු ලඝු නඩු විසඳීමකින් වැරදිකාරයා වීමේ දී, රුපියල් තුන් සියයකට වැඩි නො වන දඩයකට යටත් විය යුතු ය. — ඡන්දය විමසීමක දී අයථා බලය යෙදීම හෝ අන්‍යයකුගේ නාමයෙන් පෙනී සිටීම ගැන දඬුවම.

**169උ.** යම් මන්ත්‍රී ධූරාපේක්ෂකයකුගේ පුද්ගලික චරිතය හෝ හැසිරීම සම්බන්ධයෙන් අසත්‍ය වූ ද, අසත්‍ය බව තමා දන්නා වූ හෝ විශ්වාස කරන්නා වූ හෝ සත්‍ය බව විශ්වාස නො කරන්නා වූ කරුණු ප්‍රකාශයක් ලෙස ඇඟවෙන යම් ප්‍රකාශයක් ඡන්ද විමසීමක ප්‍රතිඵලය පිළිබඳව බලපෑමේ අදහසින් යමකු කළහොත්, හෝ ප්‍රසිද්ධ කළහොත් ඔහු වරදකට වරදකාරයකු ව, දඩයකින් දඬුවම් ලැබිය යුතු ය. — ඡන්දය විමසීමක් සම්බන්ධයෙන් කරනු ලැබූ අසත්‍යය ප්‍රකාශය.

**169ඌ.** ඡන්ද විමසීමක දී හෝ ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් දරන්නට වූ වියදම්වල ගනන් හිලව් තැබීමට, තත් කාලයෙහි බල පවත්වන්නා වූ නීතියකින් හෝ නීතියක බලය ඇති යම් ව්‍යවස්ථාවකින් අවශ්‍ය වූ තැනැත්තකු විසින් එකී ගණන් හිලව් නො තැබුවහොත් ඔහු වරදකරයා වීමේ දී, රුපියල් තුන් සියය දක්වා දඩයකින් ඔහුට දඬුවම් කළ යුතු ය. — ඡන්ද විමසීම ගණන් හිලව් නොතැබීම.

## X වෙනි පරිච්ඡේදය

### රජයේ සේවකයන්ගේ නීත්‍යනුකූල බලයට ආඥා කිරීම

**170.** රජයේ සේවකයකු වශයෙන් යම් සිතාසියක්, දැන්වීමක් හෝ ආඥාවක් නිකුත් කිරීමට නීත්‍යනුකූල ව බලය ඇත්තා වූ රජයේ සේවකයකු විසින් නිකුත් කරනු ලබන සිතාසියක්, දැන්වීමක් හෝ ආඥාවක් බාර දෙනු ලැබීමෙන් වැළකීම පිණිස පැන යන යම් තැනැත්තකුට මාසය දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාර ගත කිරීමකින් හෝ රුපියල් පනහ දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් — රජයේ සේවකයකු විසින් නිකුත් කරනු ලබන සිතාසියක් හෝ වෙනත් එබඳු දෙයක් බාර කරවනු ලැබීම වැළැක්වීම සඳහා පැන ගොස් සිටීම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

කළ යුතු ය. නැතහොත් එකී සිතාසිය, දැන්වීම හෝ ආඥාව තමා ම හෝ නියෝජිතයකු අධිකරණයක පැමිණ සිටීමට හෝ ලේඛනයක් ඉදිරිපත් කිරීමට නම්, ඔහුට හය මාසය දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාර ගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

සිතාසි හෝ වෙනත් නිකුත් කරනු ලැබූවක් බාර කරවීම වැළැක්වීම හෝ එය ප්‍රසිද්ධ කිරීම වැළැක්වීම.

**171.** රජයේ සේවකයකු වශයෙන් යම් සිතාසියක්, දැන්වීමක් හෝ ආඥාවක් නිකුත් කිරීමට නීත්‍යානුකූල ව බලය ඇත්තා වූ රජයේ සේවකයකු විසින් නිකුත් කරනු ලබන සිතාසියක්, දැන්වීමක් හෝ ආඥාවක් තමා වෙත හෝ අන් තැනැත්තකු වෙත බාර කරවීම ඕනෑකමින් ම වළක්වන්නා වූ හෝ

එකී සිතාසිය, දැන්වීම හෝ ආඥාව යම් ස්ථානයක නීත්‍යානුකූල ව සවි කරනු ලැබීම ඕනෑකමින් ම වළක්වන්නා වූ හෝ

එකී සිතාසිය, දැන්වීම හෝ ආඥාව නීත්‍යානුකූල ව යම් ස්ථානයක සවි කරනු ලැබීමෙන් පසු එය ඕනෑකමින් ම එතැනින් ඉවත් කරන්නා වූ, හෝ

රජයේ සේවකයකු වශයෙන් තම බලය යටතේ ප්‍රකාශනයක් නියම කිරීමට නීත්‍යානුකූල ව බලය ඇත්තා වූ රජයේ සේවකයකු විසින් එසේ ප්‍රකාශනයක් නීත්‍යානුකූල ව කරනු ලැබීම ඕනෑකමින් ම වළක්වන්නා වූ,

තැනැත්තකුට මාසය දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාර ගත කිරීමකින් හෝ රුපියල් පනහ දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

නැතහොත් එකී සිතාසිය, දැන්වීම, ආඥාව හෝ ප්‍රකාශනය තමාම හෝ නියෝජිතයකු අධිකරණයක පැමිණ සිටීමට හෝ ලේඛනයක් ඉදිරිපත් කිරීමට නම්, ඔහුට හය මාසය දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

රජයේ සේවකයකුගේ ආඥාවකට කීකරු වීමක් වශයෙන් පැමිණ සිටීම නොකළ විටෙක.

**172.** රජයේ සේවකයකු වශයෙන් යම් සිතාසියක්, දැන්වීමක්, ආඥාවක් හෝ ප්‍රකාශනයක් නිකුත් කිරීමට නීත්‍යානුකූලව බලය ඇත්තා වූ රජයේ සේවකයකු විසින් නිකුත් කරනු ලැබූ සිතාසියකට, දැන්වීමකට, ආඥාවකට හෝ ප්‍රකාශනයකට කීකරු වීම් වශයෙන් එක්තරා ස්ථානයකට එක්තරා වේලාවකට තමා ම හෝ නියෝජිතයකුගේ මාර්ගයෙන් පැමිණ සිටීමට නීත්‍යානුකූල ව බැඳී ඇති තැනැත්තකු,

එකී ස්ථානයට හෝ එකී වේලාවට පැමිණ සිටීම ඕනෑකමින් ම පැහැර හැරි විටක, හෝ

තමාට වෙන් ව යාමට නීත්‍යානුකූල ව ඉඩ හරිනු ලැබූ වේලාවට පෙර, තමා පැමිණ සිටීමට බැඳී ඇති ස්ථානයෙන් වෙන්ව ගිය විටක,

ඔහුට මාසය දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාර ගත කිරීමකින් හෝ රුපියල් පනහ දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

https://ezofz.web.lk/
Scanned with CamScanner

නැතහොත් සිතාසිය, දැන්වීම, ආඥාව හෝ ප්‍රකාශනය තමා හෝ නියෝජිතයකු අධිකරණයක පැමිණ සිටීමට නම්, හය මාසය දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාර ගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම ඔහුට දඬුවම් කළ යුතු ය.

**නිදර්ශන**

(අ) සිතාසියකට කීකරුවීමක් වශයෙන් කොළඹ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිපිට පැමිණ සිටීමට නීත්‍යානුකූලව බැඳී ඇති "ඒ" එසේ පැමිණ සිටීම ඕනෑකමින් ම පැහැර හරියි. මේ වගන්තියේ විස්තර කරනු ලැබූ වරද "ඒ" කර ඇත.

(ආ) ප්‍රදේශ විනිශ්චයකරුවකු විසින් නිකුත් කරනු ලැබූ සිතාසියකට කීකරුවීම් වශයෙන් සාක්ෂිකරුවකු ලෙස ප්‍රදේශ විනිශ්චයකරු ඉදිරිපිට පැමිණ සිටීමට නීත්‍යානුකූල ව බැඳී ඇති "ඒ" එසේ පැමිණ සිටීම ඕනෑකමින් ම පැහැර හරියි. මේ වගන්තියේ විස්තර කරනු ලැබූ වරද "ඒ" කර ඇත.

ලේඛනයක් ඉදිරිපත් කිරීමට නීත්‍යානුකූලව බැඳී ඇති තැනැත්තකු විසින් රජයේ සේවකයකු වෙත එකී ලේඛනය ඉදිරිපත් කරනු නොලැබීම.

**173.** රජයේ සේවකයකු වශයෙන්, යම් රජයේ සේවකයකු වෙත යම් ලේඛනයක් ඉදිරිපත් කිරීමට හෝ බාර දීමට නීත්‍යානුකූල ව බැඳී ඇති තැනැත්තකු විසින් එසේ එය ඉදිරිපත් කිරීම හෝ බාරදීම පැහැර හරිනු ලැබුවහොත්, ඔහුට මාසය දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් පනහ දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය. නැතහොත්, එකී ලේඛනය ඉදිරිපත් කළ යුත්තේ හෝ බාරදිය යුත්තේ අධිකරණයකට නම්, ඔහුට හය මාසය දක්වා කාලයක ලිහිල් බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

**නිදර්ශනය**

ප්‍රදේශ අධිකරණයකට ලේඛනයක් ඉදිරිපත් කිරීමට නීත්‍යානුකූල ව බැඳී ඇති "ඒ" එය ඉදිරිපත් කිරීම ඕනෑකමින් ම පැහැර හරියි. මේ වගන්තියේ විස්තර කරනු ලැබූ වරද "ඒ" කර ඇත.

දැනුම් දීමට හෝ තොරතුරු සැපයුමට නීත්‍යානුකූලව බැඳී ඇති තැනැත්තකු විසින් රජයේ සේවකයකුට දැනුම් දෙනු නොලැබීම හෝ තොරතුරු සපයනු නො ලැබීම.

**174.** රජයේ සේවකයකු වශයෙන්, යම් රජයේ සේවකයකුට දැනුම්දීමට හෝ යම් කරුණක් ගැන තොරතුරු සැපයීමට නීත්‍යානුකූලව බැඳී ඇති තැනැත්තකු විසින් නීතියෙන් අවශ්‍ය ආකාරයට හා වේලාවට ඒ බඳු දැනුම් දීමක් හෝ තොරතුරු සැපයීමක් පැහැර හරිනු ලැබුවහොත්, ඔහුට මාසය දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාර ගත කිරීමකින් හෝ රුපියල් පනහ දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

නැතහොත් එකී දැන්වීම හෝ තොරතුරු සැපයිය යුතු වන්නේ වරදක් සිදු කිරීම පිළිබඳ ව හෝ වරදක් සිදු කිරීම වැළැක්වීමේ කාර්යය සඳහා හෝ වරදකරුවකු අත් අඩංගුවට ගැනීම පිණිස නම්, ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

අසත්‍ය තොරතුරු සැපයුම.

**175.** රජයේ සේවකයකු වශයෙන්, යම් රජයේ සේවකයකු වෙත යම් කරුණක් පිළිබඳ ව තොරතුරු සැපයීමට නීත්‍යානුකූල ව බැඳී ඇති තැනැත්තකු විසින් ඒ කරුණ පිළිබඳ ව තමා අසත්‍ය බව දන්නා වූ හෝ අසත්‍ය බව විශ්වාස කිරීමට හේතු ඇත්තා වූ යම් තොරතුරුත්



https://ezofz.web.lk/
Scanned with CamScanner

සත්‍ය තොරතුරක් ලෙස සපයනු ලැබුවහොත් ඔහුට හය මාසය දක්වා කාලයක ලිහිල් බන්ධනාගාර ගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

නැතහොත් ඔහු නීතියෙන් සැපයීමට බැඳී ඇති තොරතුරු වරදක් සිදු කිරීම පිළිබඳව හෝ වරදක් සිදු කිරීම වැළැක්වීමේ කාර්යය සඳහා හෝ වරදකරුවකු අත් අඩංගුවට ගැනීම පිණිස නම්, ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

නිදර්ශනය

තම වත්තෙහි සීමා ඇතුළත මිනීමැරුමක් සිදු වූ බව දැන දැන ම, එකී මරණය සිදුවූයේ සර්පයකු දෂ්ට කිරීමේ ප්‍රතිඵලයක් නිසා අහම්බෙන් යයි ප්‍රදේශයේ සුළු අපරාධ විනිශ්චයකරුට වතු හිමියකු වූ "ඒ" ඕනෑවට ම වැරදි ලෙස දන්වයි. මේ වගන්තියේ විස්තර කරනු ලැබූ වරදට "ඒ" වරදකාරයෙක් වේ.

රජයේ සේවකයකු විසින් දිවුරුම් දීමට යථා පරිදි නියම කරනු ලැබූ විට දිවුරුම් දීම ප්‍රතික්ෂේප කිරීම.

**176.** සත්‍යය ප්‍රකාශ කිරීම සඳහා දිවුරුමකින් හෝ සහතික ප්‍රකාශයකින් බැඳී සිටීමට නියම කිරීමට නීත්‍යානුකූල ව බලය ඇති රජයේ සේවකයකු විසින් එසේ බැඳී සිටීමට නියම කරනු ලැබූ අවස්ථාවක දී, ප්‍රතික්ෂේප කරන තැනැත්තකුට හය මාසය දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

ප්‍රශ්න කිරීමට බලය ඇති රජයේ සේවකයකුට උත්තර දීම ප්‍රතික්ෂේප කිරීම.

**177.** යම් රජයේ සේවකයකුට යම් කරුණක් පිළිබඳ ව ඇත්ත කීමට බැඳී ඇති තැනැත්තකුගෙන්, එකී රජයේ සේවකයා විසින් තමාගේ නීත්‍යානුකූල බලතල පාවිච්චි කිරීමේ දී ඒ කරුණ පිළිබඳ ව ප්‍රශ්න කරනු ලැබූ විට, ඔහු එම ප්‍රශ්නයට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කළහොත්, ඔහුට හය මාසය දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

ප්‍රකාශයට අත්සන් තැබීම ප්‍රතික්ෂේප කිරීම.

**178.** යමකු විසින් කරනු ලැබූ ප්‍රකාශයකට ඔහු ලවා අත්සන් තැබවීමට නියම කිරීමට නීත්‍යානුකූල ව බලය ඇති රජයේ සේවකයකු විසින් ඒ තැනැත්තාට ඒ ප්‍රකාශයෙහි අත්සන් තැබීමට නියම කරනු ලැබූ අවස්ථාවක දී අත්සන් තැබීම ප්‍රතික්ෂේප කළහොත්, ඔහුට තුන් මාසය දක්වා කාලයක ලිහිල් බන්ධනාගාර ගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

රජයේ සේවකයකුට හෝ දිවුරුම් දෙවීමට බලය ලත් තැනැත්තකුට දිවුරුම් පිට අසත්‍ය ප්‍රකාශයක් කිරීම.

**179.** යම් රජයේ සේවකයකුට හෝ දිවුරුමක් දිවුරවීමට හෝ සත්‍ය ප්‍රකාශයක් කරවීමට නීතියෙන් බලයලත් වෙනත් තැනැත්තකුට ඉහත සඳහන් පරිදි යම් කරුණක් පිළිබඳ ව ඇත්ත කීමට දිවුරුමකින් හෝ සත්‍ය ප්‍රකාශයකින් නීත්‍යානුකූලව බැඳී ඇති තැනැත්තකු විසින්, ඒ රජයේ සේවකයාට හෝ වෙනත් තැනැත්තාට ඒ කරුණ පිළිබඳව අසත්‍ය වූවක් මෙන් ම අසත්‍ය බව දන්නා වූ හෝ අසත්‍ය බව විශ්වාස කරන්නා වූ හෝ සත්‍ය බව විශ්වාස නොකරන්නා වූ යම් ප්‍රකාශයක් කරනු ලැබුවහොත්, ඔහුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**180.** රජයේ සේවකයකුගේ නීත්‍යානුකූල බලය යම් තැනැත්තකුට පාඩුවක් හෝ අප්‍රසන්නතාවයක් වන ලෙසට යෙදවීමේ අදහසින් හෝ එසේ විය හැකි බව දැන දැනම හෝ අසත්‍ය බව දන්නා වූ හෝ අසත්‍ය බව විශ්වාස කරන්නා වූ යම් තොරතුරක් හෝ යම් කරුණක් ගැන තොරතුරක් යම් කරුණක සත්‍ය තත්ත්වය කලින් දැන සිටින ලද විට ඒ රජයේ සේවකයා විසින් නොකළ යුතු හෝ අත් නොහල යුතු යමක් කිරීමට හෝ අත්හැරීමට හේතු වන පරිදි සපයන යම් තැනැත්තකුට හය මාසය දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ රුපියල් දහස දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

රජයේ සේවකයකු ලවා මහුගේ නීත්‍යානුකූල බලය වෙනත් තැනැත්තකුගේ පාඩුවට හේතුවන පරිද්දෙන් යෙදවීමේ අදහසින් අසත්‍ය තොරතුරු සැපයුම.

**නිදර්ශය**

(අ) තමා දෙන තොරතුරු අසත්‍ය බව හා එකී තොරතුරු දැන්වීම නිසා පොලිස් නිලධාරියකු වූ "ඉසෙඩ්" අස් කිරීමට පොලිස්පතිට සිදුවන බව දැනම "ඒ" එකී "ඉසෙඩ්" රාජකාරිය අතපසු කිරීම හා විෂමාචාරය පිළිබඳ වරදකරුවකු බව පොලිස්පතිට දන්වයි. මේ වගන්තියේ විස්තර කරනු ලැබූ වරද "ඒ" කර ඇත.

(ආ) තමා විසින් දන්වනු ලබන තොරතුරු අසත්‍ය බවද, එකී දැන්වීමෙහි ප්‍රතිඵලය වීමට ඉඩ ඇත්තේ "ඉසෙඩ්" අප්‍රසන්නතාවය දෙමින් ඔහුගේ ස්ථානය සොයා බැලීම බවද, දනිමින් ද තහනමකට යටත් වුණු ලුණු "ඉසෙඩ්" ළඟ රහසිගත ස්ථානයක ඇති බව "ඒ" රජයේ සේවකයකුට අසත්‍ය ලෙස දන්වයි. මේ වගන්තියේ විස්තර කරනු ලැබූ වරද "ඒ" කර ඇත.

**181.** යම් තැනැත්තකු රජයේ සේවකයකු බව දැන දැනම හෝ විශ්වාස කිරීමට කරුණු තිබිය දී ඔහුගේ නීත්‍යානුකූල බලය පිට ඔහු විසින් යම් දේපළක් ගනු ලබන අවස්ථාවක දී, විරුද්ධ වන තැනැත්තකුට හය මාසය දක්වා කාලයක, දෙයාකාරයයන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

රජයේ සේවකයකුගේ නීත්‍යානුකූල බලය පිට දේපල ගැනීමට විරුද්ධ වීම.

**182.** රජයේ සේවකයකු වශයෙන් තමාට අයත් නීත්‍යානුකූල බලය ප්‍රකාර ඔහු විසින් විකිණීමට ඉදිරිපත් කරනු ලැබූ දේපළ විකිණීමක දී, ඕනෑකමින් ම එයට බාධා කරන තැනැත්තකුට මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

රජයේ සේවකයකුගේ බලය පිට විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ දේපල විකිණීමට බාධා කිරීම.

**183.** රජයේ සේවකයකුට හෝ ඔහුගේ නීත්‍යානුකූල නියම අනුව ක්‍රියා කරන වෙනත් තැනැත්තකුට නිල කටයුතු ඉටු කිරීමේ දී කැමැත්තෙන් ම බාධා කරන තැනැත්තකුට තුන් මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

නිල කටයුතු ඉටු කිරීමේ දී රජයේ සේවකයකුට බාධා කිරීම.

**184.** නිල කටයුතු ඉටු කිරීමේ දී, රජයේ සේවකයකුට සහාය දීමට හෝ සහාය වීමට නීතියෙන් බැඳී ඇති තැනැත්තකු විසින් එලෙස සහාය වීම ඕනෑකමින් ම පැහැර හරිනු ලැබූ විටක, ඔහුට මාසය දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාර ගත කිරීමකින් හෝ රුපියල් පනහ දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

සහාය වීමට නීතියෙන් බැඳී ඇතිවිට රජයේ සේවකයකුට සහාය නොවීම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

තව ද අධිකරණයකින් නීත්‍යානුකූලව නිකුත් කරනු ලැබූ කැඳවීම් නියෝගයක් ඉටු කිරීමේ කාර්යය සඳහා හෝ වරදක් කිරීම වැළැක්වීම හෝ කැරැල්ලක්, නීති විරෝධී රැස්වීමක් හෝ කලහයක් මර්දනය කිරීම සඳහා හෝ වරදකට චෝදනා කරනු ලැබූ හෝ වරදකට වරදකාරයා වූ හෝ නීත්‍යානුකූල අත් අඩංගුවෙන් පැන ගියා වූ තැනැත්තකු අත් අඩංගුවට ගැනීමේ කාර්ය සඳහා ඉල්ලීමක් කිරීමට නීත්‍යානුකූලව සුදුසුකම් ඇති රජයේ සේවකයකු විසින් ඔහුගෙන් උපකාර ඉල්වා සිටි අවස්ථාවක දී නම්, ඔහුට හය මාසය දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

රජයේ සේවකයකු නිසි පරිදි ප්‍රකාශ කරනු ලැබූ ආඥාවකට අකීකරු වීම.

**185.** යම් ක්‍රියාවක් නොකරන ලෙසට හෝ තම ස්වාමිත්වයේ හෝ පාලනයේ තිබෙන එක්තරා දේපළක් සම්බන්ධයෙන් එක්තරා ආඥාවක් පිළිපැදීමට එ බඳු ආඥාවක් ප්‍රකාශ කිරීමට නීත්‍යානුකූලව බලය ලත් තැනැත්තකු විසින් ප්‍රකාශ කරනු ලැබූ ආඥාවකින් නියම කරනු ලැබූ බව දැන දැනම, එබඳු නියමයකට අකීකරු වන තැනැත්තකුගේ අකීකරු වීම නිසා නීත්‍යානුකූලව සේවයෙහි යෙදී සිටින තැනැත්තන්හට බාධාවක්, අප්‍රසන්නතාවයක් හෝ පාඩුවක් හෝ බාධා වීමේ, අප්‍රසන්නත්වයක් ඇතිවීමේ හෝ පාඩුවීමේ අවදානමක් සිදු වුවහොත් හෝ, සිදුවිය හැකි වුවහොත් එලෙස අකීකරු වන තැනැත්තාට මාසය දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාර ගත කිරීමකින් හෝ රුපියල් පනහ දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

තවද එකී අකීකරුකම නිසා මනුෂ්‍ය ජීවිතයට හෝ සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට අන්තරායක් සිදු වුවහොත් හෝ සිදුවිය හැකි වුවහොත් හෝ කැරැල්ලක් හෝ කලහයක් සිදු වුවහොත් හෝ සිදුවිය හැකි වුවහොත් එලෙස අකීකරු වන තැනැත්තාට හය මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

**පැහැදිලි කිරීම.**-වරදකරු පීඩාවක් සිදු කිරීමට අදහස් කරනු ලැබීම හෝ පීඩාවක් සිදුවන ලෙස අකීකරු වීම ගැන සිතා බලනු ලැබීම අවශ්‍ය නොවේ. ඔහු විසින් අකීකරු වනු ලබන ආඥාව කුමක් ද යනු දැන සිටීමත් ඔහුගේ අකීකරුවීම නිසා පීඩාවක් සිදුවීම හෝ සිදු විය හැකි වීමත් ප්‍රමාණවත් වේ.

**නිදර්ශනය**

එක්තරා වීදියක් ඔස්සේ ආගමික පෙරහැරක් ගමන් නොකළ යුතුබව නියම කරන ආඥාවක, එබඳු ආඥාවක් ප්‍රකාශ කිරීමට බලය ලත් රජයේ සේවකයකු විසින් ප්‍රකාශ කරනු ලැබේ. "ඒ" දැන දැනම ඒ ආඥාවට අකීකරු වීමෙන් කැරැල්ලක් ඇතිවීමේ අන්තරාය සිදු කෙරෙයි. මේ වගන්තියේ විස්තර කරනු ලැබූ වරද "ඒ" කර ඇත.

රජයේ සේවකයකුට පාඩු කිරීමේ තර්ජනය.

**186.** රජයේ සේවකයකුගේ නිල කටයුතු ඉටු කිරීම හා සම්බන්ධ වූ යම් ක්‍රියාවක් කිරීමට හෝ නො කර සිටීමට හෝ එකී ක්‍රියාව කිරීම ප්‍රමාද කිරීමට හෝ ඒ රජයේ සේවකයා පෙළඹවීමේ කාර්ය සඳහා ඒ රජයේ සේවකයාට හෝ ඔහු විසින් සැලකිල්ල දක්වනු ලබතැ යි තමා



https://ezofz.web.lk/
Scanned with CamScanner

විශ්වාස කරන තැනැත්තකුට පාඩු කිරීමේ තර්ජනයක් කරන තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

**187.** යම් පාඩුවකින් ආරක්ෂා වීම සඳහා එ බඳු ආරක්ෂාවක් දීමට හෝ දෙවීමට නීත්‍යනුකූල ව බලය ලත් රජයේ සේවකයකු වෙත නීත්‍යනුකූල ඉල්ලීමක් කිරීමෙන් යම් තැනැත්තකු වැළැක්වීමට හෝ නැවැත්වීමට පෙළඹවීමේ කාර්යය සඳහා ඒ තැනැත්තාට පාඩු කිරීමේ තර්ජනයක් කරන යමකුට අවුරුද්දක් දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය. රජයේ සේවකයකුගෙන් ආරක්ෂාව ඉල්ලා සිටීමෙන් වැළැක්වීමට යම් තැනැත්තකු පෙළඹවීම සඳහා පාඩු කිරීමේ තර්ජනය.

## XI වෙනි පරිච්ඡේදය

### බොරු සාක්ෂි දීම හා මහජන යුක්ති ධර්මයට විරුද්ධ වැරදි

**188.** ඇත්ත කීමට දිවුරුමකින් හෝ සහතික ප්‍රකාශයකින් හෝ නීතියේ යම් කිසි ප්‍රකාශිත විධිවිධානයකින් නීත්‍යනුකූල ව බැඳුණු නැතහොත් යම් කරුණක් ගැන ප්‍රකාශයක් කිරීමට නීතියෙන් බැඳුණු යමකු අසත්‍ය වූ හා අසත්‍ය බව දන්නා වූ හෝ අසත්‍ය බව විශ්වාස කරන්නා වූ හෝ සත්‍ය බව විශ්වාස නො කරන්නා වූ යම් ප්‍රකාශයක් කළහොත්, ඔහු බොරු සාක්ෂි දුන් ලෙස සලකනු ලැබේ. බොරු සාක්ෂි දීම.

යම් ආඥාපනතක "දිවුරුම් පිට බොරු සාක්ෂි දීම" යන වචන ඇතුළත් වූ සෑම විටක දීම, "දිවුරුම් පිට බොරු සාක්ෂි දීම" යන වචන වෙනුවට එහි "බොරු සාක්ෂි දීම" යන වචන ඇතුළත් වූ ආකාරයට කියවිය යුතු ය.

**පැහැදිලි කිරීම 1.** – ප්‍රකාශයක් කට වචනයෙන් කළ ද, වෙනත් ආකාරයට කළ ද, එය මේ වගන්තියේ අර්ථය ඇතුළත වේ.

**පැහැදිලි කිරීම 2.**– සහතික කරන තැනැත්තාගේ විශ්වාසය පිළිබඳ අසත්‍ය ප්‍රකාශයක් මේ වගන්තියේ අර්ථය ඇතුළත වේ. තමා විශ්වාශ නොකරන දෙයක් විශ්වාශ බව කියා සිටින විට මෙන් ම, තමා නො දන්නා දෙයක් දන්නා බව කියා සිටින විට ද, යම් තැනැත්තෙකු බොරු සාක්ෂිදීමේ වරදට වැරදිකාරයෙකු විය හැකි ය.

**නිදර්ශන**

(අ) "ඉසෙඩ්" ට විරුද්ධව "බී" ට රුපියල් එක්දාහකට ඇති සාධාරන ඉල්ලීම් ස්ථිර කිරීම් වශයෙන්, "බී" ගේ ඉල්ලීමේ සාධාරණත්වය "ඉසෙඩ්" පිළිගත් සැටි තමාට ඇසුණු බව "ඒ" නඩු විභාගයේ දී දිවුරා කියයි. "ඒ" බොරු සාක්ෂි දී ඇත.

(ආ) ඇත්ත කීමට දිවුරුමකින් බැඳුණු "ඒ" යම් අත්සනක් "ඉසෙඩ්" ගේ අත් අකුරින් බව විශ්වාස නො කරමින් ම එය "ඉසෙඩ්" ගේ අත් අකුරින් බව තමා විශ්වාස කරන බව කියා සිටී. මෙහි දි අසත්‍ය බව තමා දන්නා දෙයක් "ඒ" කියා සිටී. එ හෙයින් ඔහු බොරු සාක්ෂි දෙයි.



https://ezofz.web.lk/
Scanned with CamScanner

(ඈ) "ඉසෙඩ්" ගේ අත් අකුරුවල සාමාන්‍ය ස්වභාවය දන්නා "ඒ" එක්තරා අත්සනක් "ඉසෙඩ්" ගේ අත් අකුරින් යයි සද්භාවයෙන් විශ්වාස කරමින් ම, එය "ඉසෙඩ්" ගේ ය යි තමා විශ්වාස කරන බව කියා සිටියි. මෙහිදී "ඒ" ගේ ප්‍රකාශය ඔහුගේ විශ්වාසය පරිදි සත්‍යයකි. ඒ නිසා අත්සන "ඉසෙඩ්" ගේ අත් අකුරින් නුවුව ද, "ඒ" බොරු සාක්ෂි දී නැත.

(ඇ) ඇත්ත කීමට දිවුරුමකින් බැඳුණු "ඒ", "ඉසෙඩ්" එක්තරා දිනයක, එක්තරා ස්ථානයක සිටි බව තමා දන්නේ යයි ඒ පිළිබඳව කිසිවක් නො දැන කියා සිටී. එම දිනයෙහි එම ස්ථානයෙහි "ඉසෙඩ්" සිටි හෝ නො සිටි නමුදු, "ඒ" බොරු සාක්ෂි කියයි.

(ඉ) යම්කිසි ප්‍රකාශයක් හෝ ලේඛනයක් සත්‍ය ලෙස තේරුම් කරදීමට තෝල්කයා හෝ පරිවර්තකයා, තමා සත්‍ය තේරුම් කිරීමකැයි හෝ සත්‍ය පරිවර්තනයකැයි විශ්වාස නොකරන හා සත්‍ය නොවන යම් ප්‍රකාශයක හෝ ලේඛනයක තේරුම් කිරීමක් හෝ පරිවර්තනයක් සත්‍ය වූවක් ලෙස දෙයි. නැතහොත් ඒ ලෙස සහතික කරයි. "ඒ" බොරු සාක්ෂි දී ඇත.

බොරු සාක්ෂි සෑදීම.

**189.** යම් කරුණක් හෝ අසත්‍ය සටහනක් හෝ අසත්‍ය ප්‍රකාශයක් අධිකරණමය නීති කාර්යයක හෝ රජයේ සේවකයකු ඉදිරිපිට හෝ සමථකරුවකු ඉදිරිපිට පවත්වන නීති කාර්යයක සාක්ෂියක් වශයෙන් ඉදිරිපත් කරවීමේ අදහසින්, ඒ ලෙස සාක්ෂියක් වශයෙන් ඉදිරිපත් කරනු ලබන එකී කරුණ, අසත්‍ය සටහන හෝ අසත්‍ය ප්‍රකාශය එබඳු කාර්යයක දී සාක්ෂි අනුව අදහසක් ඇති කර ගත යුතු තැනැත්තාට ඒ කාර්යයේ ප්‍රතිඵලයට අවශ්‍ය වූ කරුණක් පිළිබඳ ව වැරදි අදහසක් ඇති කරවාලිය හැකියම් කරුණක් පැවැත්වීම සිදු කරන හෝ යම් පොතක හෝ වාර්තාවක අසත්‍ය සටහන් කරන අසත්‍ය ප්‍රකාශයක් ඇතුළත් වූ ලේඛනයක් සාදන තැනැත්තා බොරු සාක්ෂි සාදන ලෙස සලකනු ලැබේ.

**නිදර්ශන**

(අ) "ඉසෙඩ්" ට අයත් පෙට්ටියක මැණික් තිබී සම්භවීමේ අදහසින් හා ඒ කරුණින් "ඉසෙඩ්" සොරකම් ගැන වරදකාරයා වීමට හේතු විය හැකි ය යන අදහසින් "ඒ", "ඉසෙඩ්" ට අයත් පෙට්ටියක මැණික් දමයි. "ඒ" බොරු සාක්ෂි සාදා ඇත.

(ආ) අධිකරණයක තහවුරු කිරීමේ සාක්ෂි ලෙස ප්‍රයෝජන ගැනීමේ කාර්යය සඳහා තමාගේ වෙළඳ ගණන් පොතක අසත්‍ය සටහනක් "ඒ" කරයි. "ඒ" බොරු සාක්ෂි සාදා ඇත.

(ඇ) සාපරාදි කුමන්ත්‍රණයක් ගැන "ඉසෙඩ්" වරදකාරයා කරවීමේ අදහසින් "ඉසෙඩ්" ගේ අත් අකුරු අනුකරණය කිරීමෙන්, එම කුමන්ත්‍රණයට සහභාගි වන්නකුට යවන ආකාරයට "ඒ" ලියුමක් ලියා පොලිස් නිලධාරීන් විසින් සොයා බලනු ඇතැ යි තමා දන්නා ස්ථානයක එය දමයි. "ඒ" බොරු සාක්ෂි සාදා ඇත.

බොරු සාක්ෂි ගැන දඬුවම.

**190.** අධිකරණමය නීති කාර්යයක යම් අවස්ථාවක දී ඕනෑකමින් ම බොරු සාක්ෂි දෙන හෝ අධිකරණමය නීති කාර්යයක යම් අවස්ථාවක දී පාවිච්චි කරනු ලැබීමේ කාර්යය සඳහා බොරු සාක්ෂි සාදන තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

එසේ ම, වෙනත් අවස්ථාවක දී බොරු සාක්ෂි දෙන හෝ බොරු සාක්ෂි සාදන තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයේන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**පැහැදිලි කිරීම 1**.–යුද්ධාධිකරණයක් හෝ යුද්ධ රික්වෙස්ට් අධිකරණයක් ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයක් අධිකරණමය නීති කාර්යයකි.

**පැහැදිලි කිරීම 2**.–අධිකරණයක් ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයකට පළමු ව, නීතියෙන් නියම කරනු ලැබ, ඒ අනුව පැවැත්වෙන පරීක්ෂණයක් අධිකරණයක් ඉදිරිපිට නො පැවැත්වුව ද, එය අධිකරණමය නීති කාර්යයක එක් අවස්ථාවක් වේ.

**නිදර්ශනය**

"ඉසෙඩ්" නඩු විභාගයකට ඉදිරිපත් කළ යුතු ද යන්න දැන ගැනීමේ කාර්යය සඳහා සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරියේ පැවැත්වුණු විභාගයකදී "ඒ" දිවුරුම පිට තමා අසත්‍ය බව දන්නා වූ ප්‍රකාශයක් කරයි. මේ පරීක්ෂණය අධිකරණමය නීති කාර්යයක අවස්ථාවක් බැවින් "ඒ" බොරු සාක්ෂි දී ඇත.

**පැහැදිලි කිරීම 3**.–නීතිය අනුව අධිකරණයක් විසින් පැවැත්වීමට නියම කරනු ලැබ, අධිකරණයක බලය ප්‍රකාර පවත්වනු ලැබූ පරීක්ෂණයක්, අධිකරණයේ ඉදිරිපිට නොපැවැත්වූ නමුදු එය අධිකරණමය නීති කාර්යයක අවස්ථාවක් වේ.

**නිදර්ශනය**

යම් ඉඩමක මායිම් එතැනදී ම සොයා දැන ගැනීම පිණිස, අධිකරණයක් විසින් පත් කරනු ලැබූ නිලධාරියකු ඉදිරියේ පැවැත්වූ පරීක්ෂණයක දී "ඒ" දිවුරුම් පිට හෝ සහතික ප්‍රකාශයක් පිට තමා අසත්‍ය බව දන්නා ප්‍රකාශයක් කරයි. මේ පරීක්ෂණය අධිකරණමය නීති කාර්යයක අවස්ථාවක් බැවින් "ඒ" බොරු සාක්ෂි දී ඇත.

**191.** මේ සංග්‍රහය අනුව හෝ එංගලන්තයේ නීතිය අනුව මරණයෙන් දඬුවම් කළ හැකි වරදකට යමකු වරදකාරයා කරවීමේ අදහසින් හෝ වරදකාරයා විය හැකි බව දැන දැන ම බොරු සාක්ෂි දෙන හෝ බොරු සාක්ෂි සාදන තැනැත්තකුට අවුරුදු දහය දක්වා කාලයක බරපතළ වැඩ ඇති ව බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

මරණීය වරදකට වරදකාරයා කරවීමේ අදහසින් බොරු සාක්ෂි දීම හෝ සෑදීම.

එකී බොරු සාක්ෂිවල ප්‍රතිඵලයක් වශයෙන් නිර්දෝෂී තැනැත්තකු වරද කාරයා වී මරණයට පත් කරනු ලැබුවහොත් බොරු සාක්ෂි දුන් තැනැත්තාට මරණීය දඬුවමින් දඬුවම් කළ යුතු ය.

ඉන් නිර්දෝෂී තැනැත්තකු වරදකාරයා වී ඔහුට මරණීය දඬුවම දෙන ලද නම්.

**192.** මේ සංග්‍රහය අනුව හෝ එංගලන්තයේ නීතිය අනුව මරණීය දඬුවමින් නොව, අවුරුදු හතක හෝ ඊට වැඩි කාලයක බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදකට යමකු වරදකාරයා කරවීමේ අදහසින් හෝ ඒ ලෙස වරදකාරයා විය හැකි බව දැන දැන ම බොරු සාක්ෂි දෙන හෝ සාදන යම් තැනැත්තකුට එකී වරදට වැරදිකාරයකු වූවකු යටත්වන දඬුවමින් ම දඬුවම් කළ යුතු ය.

අවුරුදු හතකට හෝ ඊට වැඩි කාලයකට බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදකට වරදකාරයා කරවීමේ අදහසින් බොරු සාක්ෂිදීම හෝ සෑදීම.

**නිදර්ශනය**

කොල්ලකෑමේ වරදට "ඉසෙඩ්" වරදකාරයකු කරවීමේ අදහසින් අධිකරණයක් ඉදිරිපිට "ඒ" බොරු සාක්ෂි දෙයි. කොල්ල කෑම ගැන දඬුවම දඩයක් ඇතිව හෝ නැතිව අවුරුදු දහය දක්වා කාලයක බරපතළ වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීමය. එම නිසා "ඒ" දඩයක් ඇති ව හෝ නැතිව එකී බන්ධනාගාර ගත කිරීමේ දඬුවමට යටත් වේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

අසත්‍ය බව දන්නා වූ සාක්ෂියකින් ප්‍රයෝජන ගැනීම.

**193.** අසත්‍ය බව හෝ සාදනු ලැබූ බව දන්නා යම් සාක්ෂියක් සැබෑ හෝ නිර්ව්‍යාජ සාක්ෂියක් වශයෙන් දූෂිත ව ප්‍රයෝජනයට ගන්නා වූ හෝ ප්‍රයෝජන ගැනීමට තැත් කරන්නා වූ තැනැත්තකු ඔහු බොරු සාක්ෂි දුන් ලෙස හෝ බොරු සාක්ෂි සෑදූ ලෙස දඬුවම් කළ යුතු ය.

අසත්‍ය සහතිකයක් නිකුත් කිරීම හෝ අත්සන් කිරීම.

**194.** යම් අවශ්‍ය කරුණක් පිළිබඳ ව සහතිකය අසත්‍ය බව දනිමින් ම හෝ විශ්වාස කරමින් ම දීමට හෝ අත්සන් කිරීමට නීතියෙන් නියමිත සහතිකයක් නැතහොත් සහතිකයෙහි යම් කරුණක් සාක්ෂියක් වශයෙන් නීතිය අනුව පිළිගත හැකි වූ යම් සහතිකයක් නිකුත් කරන හෝ අත්සන් කරන තැනැත්තකුට ඔහු බොරු සාක්ෂි දුන් පරිදි දඬුවම් කළ යුතු ය.

අවශ්‍ය කරුණක අසත්‍ය බව දන්නා වූ සහතිකයක් සැබෑ සහතිකයක් ලෙස පාවිච්චි කිරීම.

**195.** අවශ්‍ය කරුණක අසත්‍ය බව දන්නා වූ යම් සහතිකයක් සැබෑ සහතිකයක් ලෙස දූෂිත ව ප්‍රයෝජන ගන්නා වූ හෝ ප්‍රයෝජන ගැනීමට තැත් කරන්නා වූ තැනැත්තකුට ඔහු බොරු සාක්ෂි දුන් පරිදි දඬුවම් කළ යුතු ය.

සාක්ෂි වශයෙන් නීතිය අනුව පිළිගත හැකි යම් නිවේදනයක කරනු ලැබූ අසත්‍ය ප්‍රකාශය.

**196.** යම් අධිකරණයක් හෝ රජයේ සේවකයකු හෝ වෙනත් තැනැත්තකු විසින් පිළිගනු ලැබීමට නීතියෙන් බැඳී ඇත්තා වූ හෝ බලය ලද්දා වූ තමා විසින් කරනු ලැබූ හෝ අත්සන් කරනු ලැබූ යම් නිවේදනයක ඒ නිවේදනය කරන ලද්දේ හෝ පාවිච්චි කරන ලද්දේ යම් පරමාර්ථයක් උදෙසා නම් ඒ පරමාර්ථයට අවශ්‍ය වූ යම් කරුණක් පිළිබඳ ව අසත්‍ය වූ හා එ ලෙස අසත්‍ය බව තමා දන්නා වූ හෝ විශ්වාස කරන්නා වූ හෝ සත්‍ය බව තමා විශ්වාස නො කරන්නා වූ ප්‍රකාශයක් යම් තැනැත්තෙක් ප්‍රකාශ කළේ නම්, ඔහු බොරු සාක්ෂි දුන් පරිදි ඔහුට දඬුවම් කළ යුතු ය.

අසත්‍ය බව දන්නා වූ එබඳු නිවේදනයක් පාවිච්චි කිරීම.

**197.** යම් අවශ්‍ය කරුණක අසත්‍ය බව දන්නා වූ නිවේදනයක් සත්‍ය නිවේදනයක් ලෙස දූෂිත ව පාවිච්චි කරන හෝ පාවිච්චි කිරීමට තැත්කරන තැනැත්තකුට, ඔහු බොරු සාක්ෂි දුන් පරිදි ඔහුට දඬුවම් කළ යුතු ය.

**පැහැදිලි කිරීම.**-යම් අනියම් භාවයක් නිසා පමණින් නො පිළිගත හැකි නිවේදනයක් 196 වෙනි හා 197 වෙනි වගන්තිවල සඳහන් අර්ථය ඇතුළත නිවේදනයක් වේ.

කරනු ලැබූ වරදක් පිළිබඳව සාක්ෂි අතුරුදහන් කරවීම හෝ වරදකරු ආවරණය කිරීම සඳහා එය පිළිබඳ අසත්‍ය තොරතුරු සැපයීම.

**198.** වරදක් සිදුකොට ඇති බව දැන දැන ම හෝ එසේ වූ බව විශ්වාස කිරීමට කරුණු තිබිය දී වරදකරු නීත්‍යානුකූල දඬුවමෙන් ආවරණය කිරීමේ අදහසින් යමකු විසින් ඒ වරද කිරීම පිළිබඳ යම් සාක්ෂි අතුරුදහන් කරවනු ලැබුවහොත් හෝ එබඳු අදහසින් තමා අසත්‍ය බව දන්නා වූ හෝ අසත්‍ය යයි විශ්වාස කරන්නා වූ යම් තොරතුරක් ඒ වරද සම්බන්ධයෙන් සපයනු ලැබුවහොත්,

එය මරණීය දඬුවමට යටත් වරදක් නම්.

තමා සිදු කොට ඇති බව දන්නා වූ හෝ විශ්වාස කරන්නා වූ වරද මරණීය දඬුවමින් දඬුවම් කළ හැකි වරදක් නම් ඔහුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

එය අවුරුදු දහයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් නම්.

ඒ වරද අවුරුදු දහය දක්වා කාලයක බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදක් නම්, අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් ඔහුට දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

ඒ වරද අවුරුදු දහයකට අඩු කාලයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් නම් ඒ වරද සඳහා නියමිත බන්ධනාගාර ගත කිරීමේ වැඩි ම කාලසීමාවෙන් හතරෙන් එක් කොටසකට සමාන වූ කාලසීමාව දක්වා කාලයක, ඒ වරදට නියමිත පරිදි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

එය අවුරුදු දහයකට අඩු කාලයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් නම්.

**නිදර්ශනය**

"බී", "ඉසෙඩ්" මරණයට පත් කළ බව දැන දැන ම, දඬුවමෙන් "බී" ආවරණය කිරීමේ අදහසින් මළකඳ සඟවා තැබීමට "බී" ට "ඒ" සහාය වෙයි. අවුරුදු හතක කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හා දඩයකට "ඒ" යටත් වේ.

**199.** වරදක් කර ඇති බව දැන දැන ම හෝ ඒ බව විශ්වාස කිරීමට කරුණු තිබිය දී එකී වරද පිළිබඳ ව දැනුම් දීමට නීතියෙන් බැඳී ඇති තැනැත්තකු විසින් එකී වරද ගැන තොරතුරක් දැන්වීම පැහැර හරිනු ලැබුවහොත් ඔහුට හය මාසය දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

දැනුම් දීමට බැඳී ඇති තැනැත්තකු වරදක තොරතුරක් ඕනෑකමින්ම දැනුම් නොදී සිටීම.

**200.** වරදක් කර ඇති බව දැන දැන ම හෝ ඒ බව විශ්වාස කිරීමට කරුණු තිබිය දී යමකු විසින් තමා අසත්‍ය බව දන්නා වූ හෝ අසත්‍ය බව විශ්වාස කරන්නා වූ තොරතුරක් එකී වරද සම්බන්ධයෙන් සපයනු ලැබුවහොත් අවුරුදු දෙක දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

කර ඇති වරදක් සම්බන්ධයෙන් අසත්‍ය තොරතුරු සැපයීම.

**201.** අධිකරණයක හෝ රජයේ සේවකයකු වශයෙන් ඔහු ඉදිරිපිට නීත්‍යනුකූල ව පැවැත් වූ යම් නීති කාර්යයක දී සාක්ෂි ලෙස ඉදිරිපත් කරවීමට නීත්‍යනුකූලව බල කළ හැකි යම් ලේඛනයක් යමකු සැඟවුවහොත් හෝ විනාශ කළහොත් හෝ එකී ලේඛනය එම අධිකරණය හෝ රජයේ සේවකයා ඉදිරිපිට ඉදිරිපත් කරනු ලැබීමෙන් හෝ සාක්ෂි වශයෙන් පාවිච්චි කරනු ලැබීමෙන් වැළැක්වීමේ අදහසින් එකී කාර්යය සඳහා එම ලේඛනය ඉදිරිපත් කිරීමට කැඳවනු ලැබීමෙන් හෝ නියම කරනු ලැබීමෙන් පසු, ඒ ලේඛනය සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් මැකුවහොත් හෝ කියවීම අපහසු කළහොත් ඒ තැනැත්තාට අවුරුදු දෙක දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීම වැළැක්වීම සඳහා ලේඛනයක් විනාශ කිරීම.

**202.** අන් කෙනෙකුගේ නාමයක් අසත්‍ය ලෙස ගෙන, එකී ආරූඪ නාමයෙන් යම් ඈත්තු ගැනීමක් හෝ ප්‍රකාශයක් කරන හෝ නඩු තීන්දුවකට තම කැමැත්ත දෙන හෝ යම් කැඳවීම් නියෝග නිකුත් කරවන හෝ ඇපකරු වන හෝ යම් සිවිල් නඩුවක හෝ අපරාධ නඩු පැවරුමක හෝ වෙනත් ක්‍රියාවක යෙදෙන තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

නඩුවක යම්ක්‍රියාවක් හෝ කාර්යයක් සඳහා ව්‍යාජ ලෙස අන්‍යයකුගේ නාමයෙන් සිටීම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

අභිමි කිරීමක් වශයෙන් හෝ නඩු තීන්දුවක් ක්‍රියාවේ යෙදවීමක් වශයෙන් ගනු ලැබීම වැළැක්වීම සඳහා යම් දේපළක් වංචක ලෙස ඉවත් කිරීම හෝ සැඟවීම.

**203.** අභිමි කිරීමක් ලෙස හෝ අධිකරණයක් විසින් හෝ වෙනත් සුදුසු බල මණ්ඩලයක් විසින් ප්‍රකාශ කරනු ලැබූ හෝ ප්‍රකාශ කරනු ලැබිය හැකි බව තමා දන්නා නඩු තීන්දුවක් යටතේ දඩයක් ලබා ගැනීම් වශයෙන් හෝ අධිකරණයක් විසින් සිවිල් නඩුවක දී කරනු ලැබූ හෝ කරනු ලැබිය හැකි බව තමා දන්නා වූ තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් ඉෂ්ට කිරීම් වශයෙන් හෝ යම් දේපළක් හෝ දේපළක සම්බන්ධතාවක් ගැනීම වැළැක්වීමේ අදහසින් ඒ දේපළ හෝ දේපළක සම්බන්ධතාව වංචක ලෙස ඉවත් කරන, සඟවන, පවරන හෝ අන් කෙනකුට බාර දෙන තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

අභිමි කිරීමක් ලෙස හෝ තීන්දුවක් ඉෂ්ට කිරීමක් ලෙස යම් දේපළක් ගනු ලැබීම වලක්වනු සඳහා වංචක ලෙස අයිතිවාසිකමක් ඉදිරිපත් කිරීම.

**204.** යම්කිසි දේපළකට හෝ දේපළක සම්බන්ධතාවකට යම් අයිතිවාසිකමක් හෝ නියම ලෙස අයිතිවාසිකම් ඉල්ලීමට බලයක් නැති බව දැන දැන ම යමකු යම් දේපළක් හෝ දේපළක සම්බන්ධතාවක් වංචක ලෙස පිළිගනිතොත් හෝ බාර ගතහොත් හෝ එබන්දකට අයිතිවාසිකම් කියතහොත් හෝ අභිමි කිරීමක් ලෙස අධිකරණයක් විසින් හෝ සුදුසු බල මණ්ඩලයක් විසින් ප්‍රකාශ කරනු ලැබූ හෝ ප්‍රකාශ කරන ලැබිය හැකි බව තමා දන්නා වූ දණ්ඩන නියමයක් යටතේ නියම කරනු ලැබූ දඩයක් ඉෂ්ට කිරීමක් ලෙස හෝ සිවිල් නඩුවක දී අධිකරණයක් විසින් කරනු ලැබූ හෝ කරනු ලැබිය හැකි බව තමා දන්නා වූ තීන්දු ප්‍රකාශයක් හෝ ආඥවක් ඉෂ්ට කිරීමක් ලෙස ගැනීම වැළැක්වීමේ අදහසින් යමකු යම් දේපළක හෝ සම්බන්ධතාවක අයිතිවාසිකමක් පිළිබඳව යම් රැවටීමක් කරතහොත් ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

අය නොවිය යුතු මුදලක් පිළිබඳ තීන්දු ප්‍රකාශයක් වංචක ලෙස දරා ගැනීම.

**205.** යම් තැනැත්තකුගේ නඩුවක දී අය නො විය යුතු මුදලක් සඳහා හෝ එකී තැනැත්තාට අය විය යුතු මුදලට වඩා වැඩි මුදලක් සඳහා හෝ එකී තැනැත්තාට අයිතිකමක් නැති දේපළක් හෝ දේපළක සම්බන්ධතාවක් සඳහා යම් තීන්දු ප්‍රකාශයක් හෝ ආඥවක් තමාට විරුද්ධ ව වංචක ලෙස නියම කර ගනු ලබතහොත් හෝ එබන්දක් දරා ගත හොත් හෝ යම් තීන්දු ප්‍රකාශයක් හෝ ආඥවක් ඉෂ්ට කිරීමෙන් පසු හෝ ඉන් යමක් ඉෂ්ට කරනු ලැබ, ඊට පසු ව එබඳු තීන්දු ප්‍රකාශයක් හෝ ආඥවක් තමාට විරුද්ධව ඉෂ්ට කරවා ගනු ලබතහොත් හෝ එබන්දක් දරා ගතහොත් ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

නිදර්ශනය

'ඉසෙඩ්' ට විරුද්ධව 'ඒ' නඩුවක් පවරයි. තමාට විරුද්ධව 'ඒ' ට තීන්දු ප්‍රකාශයක් ලබා ගත හැකි බව දන්නා 'ඉසෙඩ්' තමාගෙන් සාධාරණ අයිතිවාසිකමක් ඉල්ලීමට බලයක් නැති 'බී'ට 'ඒ' ගේ තීන්දුව යටතේ 'ඉසෙඩ්' ගේ දේපළ විකිණීමෙන් ලැබෙන මුදලින් 'බී' වෙනුවෙන් හෝ තමාගේ යහපත සඳහා කොටසක් ගැනීමට හැකි වන පරිදි තමාට විරුද්ධව වැඩි මුදලකට නඩු පවරා නඩු තීන්දුවක් ලබා ගැනීමට ඉඩ දෙයි. 'ඉසෙඩ්' මේ වගන්තිය යටතේ වරදක් කර ඇත.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**206.** වංචක ලෙස හෝ වංකව හෝ යම් තැනැත්තකුට පාඩු කිරීමේ හෝ අප්‍රසන්නතාවය ඇති කිරීමේ අදහසින් අධිකරණයක දී තමා බොරු බව දන්නා අයිතිවාසිකමක් ඉදිරිපත් කරන තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙය කාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

වංචක ලෙස හෝ වංකව බොරු අයිතිවාසිකමක් අධිකරණයකදී ඉදිරිපත් කිරීම.

**207.** අය නොවිය යුතු මුදලක් සඳහා හෝ අය විය යුතු මුදලකට වැඩි මුදලක් සඳහා හෝ තමාට අයිතිවාසිකමක් නැති දේපළක් හෝ දේපළක සම්බන්ධතාවක් සඳහා යම් තැනැත්තකුට විරුද්ධව වංචක ලෙස තීන්දු ප්‍රකාශයක් හෝ ආඥවක් ලබා ගන්නා වූ හෝ යම් තීන්දු ප්‍රකාශයක් හෝ ආඥවක් ඉෂ්ට කිරීමෙන් පසු හෝ ඉන් යමක් ඉෂ්ට කරනු ලැබ, ඉන්පසුව යම් තැනැත්තකුට විරුද්ධව තීන්දු ප්‍රකාශයක් හෝ ආඥවක් වංචක ලෙස ඉෂ්ට කරවන්නා වූ හෝ තමාගේ නමින් එබඳු ක්‍රියාවක් කිරීම දරාගන්නා වූ හෝ එබන්දකට ඉඩ දෙන්නා වූ තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

අය නොවිය යුතු මුදලක් සඳහා තීන්දු ප්‍රකාශයක් වංචක් ලෙස ලබා ගැනීම.

**208.** යම් තැනැත්තකුට විරුද්ධව අපරාධ නඩුවක් පැවරීමට හෝ වරදක් සිදු කළයි යන චෝදනාවක් නැඟීමට සාධාරණ වූ හෝ නීත්‍යානුකූල වූ කරුණු නොමැති බව දැන දැනම, එකී තැනැත්තාට පාඩු කිරීමේ අදහසින් ඔහුට විරුද්ධව එබඳු අපරාධ නඩුවක් පවරන හෝ වරදක් සිදු කළැයි යන බොරු චෝදනාවක් නගන තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

පාඩු කිරීමේ අදහසින් වරදක් ගැන අසත්‍ය චෝදනාවක් නැඟීම.

මරණීය දඬුවමින් දඬුවම් කළ හැකි හෝ අවුරුදු හතක හෝ ඊට වැඩි කාලයක බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදක චෝදනාවක් ගැන ඒ අපරාධ නඩුව පවරන ලද්දේ නම්, ඒ තැනැත්තාට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

**209.** යම් වරදක් කරනු ලැබූ විට, වරදකරු යයි තමා දන්නා වූ හෝ වරදකරු යයි විශ්වාස කිරීමට කරුණු ඇත්තා වූ තැනැත්තකු නීත්‍යානුකූල දඬුවමෙන් ආවරණය කර ගැනීමේ අදහසින් ඔහුට නවාතැන් දෙන හෝ ඔහු සඟවන හෝ ඔහුට උපකාර කරන හෝ ඔහු නඩත්තු කරන තැනැත්තකුට,

වරදකරුවකුට නවාතැන් දීම.

වරද, මරණීය දඬුවමින් කළ හැකි වරදක් නම්, අවුරුදු පහ දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

මරණීය දඬුවම දිය හැකි වරදක් නම්.

වරද, අවුරුදු දහය දක්වා කාලයක, බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් නම්, අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

අවුරුදු දහයක කාලයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් නම්.



https://ezofz.web.lk/
Scanned with CamScanner

අවුරුදු දහයකට අඩු කාලයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් නම්.

වරද, අවුරුදු දහයකට නොවඩ අවුරුද්ද දක්වා කාලයක බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදක් නම් එකී වරදට නියමිත බන්ධනාගාරගත කිරීමේ වැඩිම කාලයෙන් හතරෙන් කොටස දක්වා කාලයක, ඒ සඳහා නියමිත ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

ව්‍යතිරේකය.—නවාතැන් දීම හෝ සඟවා ගැනීම වරදකරු ගේ ස්වාමි පුරුෂයා හෝ භාර්යාව විසින් කරනු ලැබූ අවස්ථාවක දී මේ විධිවිධාන එයට අදාළ නොවිය යුතු ය.

නිදර්ශනය

'බී' කොල්ලකෑමේ වරද කළ බව දනිමින් ඔහුට ලැබිය හැකි නීත්‍යානුකූල දඬුවමෙන් ආවරණය කර ගනු පිණිස දැන දැනම 'ඒ', 'බී' සඟවයි. මෙහිදී අවුරුදු දහය දක්වා කාලයක බන්ධනාගාරගත කිරීමකට 'බී' යටත් බැවින් අවුරුදු තුනකට වැඩි නොවිය හැකි කාලයක, දෙයකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට 'ඒ' යටත් වේ. ඔහු දඩයකට ද යටත් වේ.

දඬුවම් කරනු ලැබීමෙන් වරද කරුවකු ආවරණය කර ගැනීම සඳහා තුටු පඬුරු ආදිය ගැනීම.

**210.** යම් වරදක් සැඟවීම නිසා හෝ යම් වරදකට ලැබිය යුතු දඬුවමෙන් යමකු ආවරණය කර ගැනීම නිසා හෝ නීත්‍යානුකූලව දඬුවම් ලබා දීමේ කාර්යය සඳහා යමකුට විරුද්ධව කටයුතු නොකිරීම නිසා හෝ තමාට හෝ වෙනත් කෙනකු සඳහා යම් තුටු පඬුරක් හෝ යම් දේපළක් නැවත ලබා ගැනීමක් යම් තැනැත්තකු පිළිගතහොත් හෝ පිළිගැනීමට තැත් කළහොත් හෝ පිළිගැනීමට එකඟ වුවහොත් ඔහුට,

මරණීය දඬුවම දිය හැකි වරදක් නම්.

ඒ වරද මරණීය දඬුවමින් දඬුවම් කළ හැකි වරදක් නම් හත් අවුරුද්ද දක්වා කාලය දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

අවුරුදු දහයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ හැකි නම්.

වරද, අවුරුදු දහය දක්වා කාලයක බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදක් නම් අවුරුදු තුන දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

අවුරුදු දහයකට අඩු කාලයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ හැකි නම්.

වරද, අවුරුදු දහය දක්වා නොවන කාලයක බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදක් නම් එකී වරදට නියමිත බන්ධනාගාරගත කිරීමේ වැඩිම කාලසීමාවෙන් හතරෙන් එක් කොටස දක්වා කාලයක එකී වරදට නියමිත ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

දඩයකින් දඬුවම් කළ හැකි නම්.

වරද, දඩයකින් දඬුවම් කළ හැකි වරදක් නම් දඩයකින් දඬුවම් කළ යුතු ය.

වරදකරුවකු සඟවා ගැනීමේ හේතුවෙන් තුටු පඬුරක් පිරිනැමීම හෝ දේපළක් නැවත භාර දීම.

**211.** යම් තැනැත්තකු විසින් වරදට සඟවනු ලැබීමේ හෝ යම් වරදක් සඳහා වූ නීත්‍යානුකූල දඬුවමෙන් යමකු සඟවා ගැනීමේ හෝ යමකු නීත්‍යානුකූල දඬුවම සඳහා ඉදිරිපත් කරවීමේ කාර්යය පිණිස ඔහුට විරුද්ධව ක්‍රියා නොකිරීමේ හේතුවෙන් එබන්දකුට තුටු පඬුරක් දෙන හෝ දෙවන ; නැතහොත් පිරිනමන හෝ දීමට හෝ දෙවීමට



https://ezofz.web.lk/
Scanned with CamScanner

එකඟ වන ; එසේත් නැතිනම් යම් දේපළක් එබන්දකුට නැවත ලබා දීමට ඉදිරිපත්වන හෝ නැවත ලබා දීම සිදු කරවන හෝ එබඳු ක්‍රියාවකට එකඟවන තැනැත්තකුට,

වරද, මරණීය දඬුවමින් දඬුවම් කළ හැකි වරදක් නම්, හත් අවුරුද්ද දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

මරණීය දඬුවම දිය හැකි වරදක් නම්.

වරද, අවුරුදු දහය දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් නම්, තුන් අවුරුද්ද දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් ඔහුට දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

අවුරුදු දහයක බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි නම්.

වරද, අවුරුදු දහය දක්වා නොවන කාලයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් නම්, එකී වරද සඳහා නියමිත වැඩිම බන්ධනාගාරගත කිරීමේ කාලයෙන් හතරෙන් එක් කොටස දක්වා කාලයක, එකී වරදට නියමිත අකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම ඔහුට දඬුවම් කළ යුතු ය.

අවුරුදු දහයකට අඩු කාලයක බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ හැකි නම්.

වරද, දඩයකින් දඬුවම් කළ හැකි වරදක් නම්, දඩයකින් ඔහුට දඬුවම් කළ යුතු ය.

දඩයකින් දඬුවම් කළ හැකි නම්.

**ව්‍යතිරේකය.**—නීත්‍යනුකූලව සමථයකට පැමිණිය හැකි වරදක් පිළිබඳ 210 හා 211 වෙනි වගන්තිවල විධි විධාන අදාළ නොවේ.

**212.** මේ සංග්‍රහය යටතේ දඬුවම් කළ හැකි වූ යම් වරදක් හේතු කොටගෙන යම් තැනැත්තකුගේ නැති වූ යම් චංචල දේපළක් ඔහුට ලබා දීමට උපකාර කිරීමේ ව්‍යාජයෙන් හෝ උපකාර කිරීම නිසා යම් තුටු පඬුරක් ගන්නා වූ හෝ ගැනීමට එකඟ වන්නා වූ හෝ කැමති වන්නා වූ තැනැත්තකු එකී වරදකරු අල්වා එම වරදට වැරදිකාරයා කරවීම සඳහා තම සම්පූර්ණ ශක්තිය නොයෙදවතොත්, ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

සොරකම් කරනු ලැබූ දේපළක් ආදිය නැවත ලබා ගැනීම සඳහා උප කාරවීමට තුටු පඬුරක් ගැනීම.

**213.** යම් වරදකට වරදකාරයා කරනු ලැබූ හෝ චෝදනා කරනු ලැබූ තැනැත්තකු ඒ වරද සඳහා නීත්‍යනුකූල සිරභාරයේ සිටිය දී ඔහු පැන ගිය විට හෝ තම නීත්‍යනුකූල බලතල පාවිච්චි කිරීමේදී එක්තරා තැනැත්තකු වරදකට අල්වා ගත යුතු යයි රජයේ සේවකයකු විසින් නියම කරනු ලැබූ විට හෝ එකී පැන යාම හෝ ඇල්වීමේ ආඥාව දැන

සිරභාරයෙන් පැන ගිය හෝ අල්වා ගැනීම නියම කරනු ලැබූ වරදකරුවෙකුට නවාතැන්දීම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

දැනම එකී තැනැත්තා අල්වා ගනු ලැබීමෙන් වැළක්වීමේ අදහසින් යමකු නවාතැන් දෙතහොත් හෝ සඟවා තබතහොත් ඔහුට පහත දැක්වෙන පරිදි දඬුවම් කළ යුතු ය. එනම් :-

මරණීය දඬුවම දිය හැකි වරදක් නම්.

සිරභාරේ තබනු ලැබුයේ නැතහොත් ඇල්වීමට නියම කරනු ලැබුයේ මරණීය දඬුවම දිය හැකි වරදක් නිසා නම්, අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් ඔහුට දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

අවුරුදු දහයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි නම්.

අවුරුදු දහය දක්වා කාලයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් නම්, දෙයාකාරයෙන් එක් ආකාරයක් අවුරුදු තුන දක්වා කාලයක බන්ධනාගාරගත කිරීමකින් දඩයක් සහිතව හෝ රහිතව ඔහුට දඬුවම් කළ යුතු ය.

අවුරුදු දහයට අඩු කාලයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි නම්.

අවුරුදු දහයකට නොව, එක් අවුරුද්ද දක්වා කාලයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් නම්, එකී වරද සඳහා නියමිත බන්ධනාගාරගත කිරීමේ වැඩිම කාල සීමාවෙන් හතරෙන් එක් කොටසක් දක්වා කාලයක එකී වරදට නියමිත ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම ඔහුට දඬුවම් කළ යුතු ය.

**ව්‍යතිරේකය**.- ඇල්විය යුතු තැනැත්තාගේ ස්වාමිපුරුෂයා හෝ භාර්යාව විසින් නවාතැන් දීමක් හෝ සඟවා තැබීමක් සම්බන්ධයෙන් මේ විධි විධානය අදාළ නොවේ.

දඬුවමකින් හෝ දේපළක් අහිමි කිරීමෙන් කෙනකු බේරා ගැනීමේ අදහසින් රජයේ සේවකයකු නීතියේ නියමයක් නොපිළිපැදීම.

**214.** යම් තැනැත්තෙකු නීත්‍යානුකූල දඬුවමෙන් බේරා ගැනීමේ හෝ ඔහු යටත් විය යුතු දඬුවමට අඩු දඬුවමකට යටත් කිරීමේ අදහසින් හෝ එසේ විය හැකි බව දනිමින්ම, හෝ අහිමි කිරීමකින් හෝ නීතිය අනුව යටත් විය යුතු ගාස්තුවකින් යම් දේපළක් බේරා ගැනීමේ අදහසින් හො එසේ විය හැකි බව දනිමින්ම යමකු රජයේ සේවකයකුව, තමා හැසිරිය යුතු පිළිවෙල පිළිබඳව නීතියෙන් කරනු ලැබූ යම් නියමයක් දැනුවත්ව නොපිළිපදිතහොත්, ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

දඬුවමකින් හෝ දේපළක් අහිමි කරනු ලැබීමෙන් යම් තැනැත්තකු බේරාගැනීමේ අදහසින් රජයේ සේවකයකු විසින් වැරදි වාර්තාවක් හෝ ලේඛනයක් පිළියෙල කිරීම.

**215.** මහජනයාට හෝ යම් තැනැත්තකුට අලාභයක් හෝ පාඩුවක් කිරීමේ අදහසින් හෝ එසේ වන බව දනිමින්ම යම් තැනැත්තකු නීත්‍යානුකූල දඬුවමෙන් බේරා ගැනීමේ අදහසින් හෝ එසේ වන බව දනිමින්ම යම් දේපළක් අහිමි කිරීමකින් හෝ නීතිය අනුව ගෙවීමට යටත් වූ වෙනත් ගාස්තුවකින් බේරා ගැනීමේ අදහසින් හෝ එසේ වන බව දනිමින්ම යමකු රජයේ සේවකයකුව, රජයේ සේවකයකු වශයෙන් යම් වාර්තාවක් හෝ ලේඛනයක් පිළියෙල කිරීමට භාරවී සිටිය දී, ඒ වාර්තාව හෝ ලේඛනය තමා වැරදි බව දන්නා වූ ආකාරයකට පිළියෙල කළහොත් ඔහුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**216.** යමකු රජයේ සේවකයකුව, රජයේ සේවකයකු වශයෙන්, යම් වරදක් සඳහා චෝදනා කරනු ලැබූ හෝ එබන්දක් සඳහා අත්අඩංගුවට ගැනීමට යටත් වූ යම් තැනැත්තකු අත්අඩංගුවට ගැනීමට හෝ සිරභාරයේ තැබීමට නීතියෙන් බැඳී ඇති විටෙක, ඒ තැනැත්තා අත්අඩංගුවට ගැනීම ඕනෑකමින්ම පැහැර හැරියහොත් හෝ සිරභාරයෙන් ඔහු පැන යාම ඕනෑකමින්ම දරා සිටියහොත් හෝ එසේ පැනයාමෙහි දී හෝ පැන යාමට තැත් කිරීමේ දී ඔහුට ඕනෑකමින්ම ආධාර කළහොත් ඒ රජයේ සේවකයකු වූ තැනැත්තාට පහත දැක්වෙන පරිදි දඬුවම් කළ යුතු ය :—

නීතියෙන් සිරභාරයට ගැනීමට බැඳී ඇති රජයේ සේවකයකු විසින් එලෙස අත් අඩංගුවට ගැනීම ඕනෑකමින්ම පැහැර හරිනු ලැබීම.

(අ) සිරභාරයේ සිටි හෝ අත්අඩංගුවට ගත යුතු තැනැත්තා චෝදනා කරනු ලැබූ හෝ අත්අඩංගුවට ගනු ලැබීමට යටත් වූ වරද මරණීය දඬුවමින් දඬුවම් කළ හැකි වරදක් නම්, ඒ තැනැත්තා, දඩයක් සහිතව හෝ රහිතව දෙයාකාරයෙන් එක් ආකාරයක අවුරුදු හත දක්වා කාලයක බන්ධනාගාර ගත කිරීම ; හෝ

දඬුවම.

(ආ) සිරභාරයේ සිටි හෝ අත්අඩංගුවට ගත යුතු තැනැත්තා චෝදනා කරනු ලැබූ හෝ අත්අඩංගුවට ගනු ලැබීමට යටත් වූ වරද අවුරුදු දහය දක්වා කාලයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් නම්, එකී තැනැත්තා දඩයක් සහිතව හෝ රහිතව දෙයාකාරයෙන් එක් ආකාරයක අවුරුදු තුන දක්වා කාලයක බන්ධනාගාරගත කිරීම ; හෝ

(ඇ) සිරභාරයේ සිටි හෝ අත්අඩංගුවට ගත යුතු තැනැත්තා චෝදනා කරනු ලැබූ හෝ අත්අඩංගුවට ගනු ලැබීමට යටත් වූ වරද අවුරුදු දහයකට අඩුකාලයක බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදක් නම්, ඒ තැනැත්තා දඩයක් සහිතව හෝ රහිතව අවුරුදු දෙක දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම.

**217.** යමකු රජයේ සේවකයකුව, රජයේ සේවකයකු වශයෙන් යම් වරදක් සඳහා අධිකරණයක දණ්ඩන නියමයකට යටත් තැනැත්තකු අත්අඩංගුවට ගැනීමට හෝ සිරභාරයේ තබා ගැනීමට නීත්‍යානුකූලව බැඳී ඇති විටෙක, එකී තැනැත්තා නීත්‍යානුකූලව සිරභාරයට නියම කරනු ලැබූ විටෙක එකී තැනැත්තා අත්අඩංගුවට ගැනීම ඕනෑකමින් පැහැර හැරියහොත් හෝ සිරභාරයෙන් ඔහු පැනයාම ඕනෑකමින්ම දරා සිටියහොත් හෝ එබඳු පැන යාමකට හෝ පැනයාමට තැත් කිරීමකට ඕනෑකමින්ම ඔහුට ආධාර කළහොත් එබඳු රජයේ සේවකයකුට පහත දැක්වෙන පරිදි දඬුවම් කළ යුතු ය :-

දණ්ඩන නියමයකට යටත් වූ හෝ නීත්‍යානුකූලව අත්අඩංගුවට නියම කරනු ලැබූ තැනැත්තකු අත්අඩංගුවට ගැනීමට බැඳී ඇති රජයේ සේවකයකු විසින් එසේ සිරභාරයට ගැනීම ඕනෑකමින්ම පැහැර හරිනු ලැබීම.

දඬුවම.

(අ) සිරභාරයේ සිටි හෝ අත්අඩංගුවට ගත යුතු තැනැත්තා මරණීය දඬුවම් නියමයට යටත් නම්, දඩයක් සහිතව හෝ රහිතව දෙයාකාරයෙන් එක් ආකාරයක අවුරුදු දහ හතර දක්වා කාලයක බන්ධනාගාරගත කිරීම ; හෝ



https://ezofz.web.lk/
Scanned with CamScanner

(ආ) සිරභාරයේ සිටි හෝ අත්අඩංගුවට ගත යුතු තැනැත්තා අධිකරණයක දණ්ඩන නියමයකින් හෝ එබඳු දණ්ඩන නියමය වෙනස් කිරීමකින් අවුරුදු දහයක හෝ ඊට වැඩි කාලයක බන්ධනාගාරගත කිරීමකට යටත් නම්, දඩයක් සහිතව හෝ රහිතව දෙයාකාරයෙන් එක් ආකාරයක අවුරුදු හත දක්වා කාලයක බන්ධනාගාර ගත කිරීම ; හෝ

(ඇ) සිරභාරයේ සිටි හෝ අත්අඩංගුවට ගත යුතු තැනැත්තා අධිකරණයක දණ්ඩන නියමයකින් අවුරුදු දහය දක්වා නොවන කාලයක බන්ධනාගාරගත කිරීමකට යටත් නම්, හෝ එකී තැනැත්තා නීති ප්‍රකාර සිරභාරයට නියම කරනු ලැබී නම්, අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩ ගැසීම හෝ දඬුවම් දෙකම වේ.

සිරභාරයෙන් හෝ අත් අඩංගුවෙන් පැනයාමට රජයේ සේවකයකු විසින් නොසැලකිලිමත් ලෙස ඉඩ හරිනු ලැබීම.

**218.** යමකු රජයේ සේවකයකුව, රජයේ සේවකයකු වශයෙන් යම් වරදක් පිළිබඳව චෝදනා කරනු ලැබූ හෝ වරදකාරයා කරනු ලැබූ හෝ නීති ප්‍රකාර සිරභාරයට නියම කරනු ලැබූ තැනැත්තකු සිරභාරයේ තබා ගැනීමට නීත්‍යානුකූලව බැඳී ඇති විටෙක, එබඳු තැනැත්තකුට සිරභාරයෙන් පැන යාමට නොසැළකිලිමත් ලෙස ඉඩ හැරියොත්, ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

නීති ප්‍රකාර සිරභාරයට ගනු ලැබීමේදී යමෙකු විරුද්ධකම් පෑම හෝ ඊට බාධා කිරීම.

**219.** චෝදනා කරනු ලැබූ හෝ වරදකාරයා කරනු ලැබූ වරදක් සඳහා තමා නීති ප්‍රකාර අත් අඩංගුවට ගැනීමේ දී ඕනෑකමින්ම විරුද්ධකම් පාන හෝ නීති විරෝධිව බාධා කරන හෝ එබඳු වරදකට නීති ප්‍රකාර නතර කරනු ලැබූ සිරභාරයකින් පැන යන හෝ පැන යාමට තැත්කරන තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

**පැහැදිලි කිරීම**.- මේ වගන්තියෙහි සඳහන් දඬුවම් අත්අඩංගුවට ගත යුතු හෝ සිරභාරයේ තබා ගතයුතු තැනැත්තාට විරුද්ධව චෝදනා කරනු ලැබූ හෝ ඔහු වරදකාරයා කරනු ලැබූ වරදට විය යුතු දඬුවමට අතිරේකව ය.

සිවිල් කැඳවීම් නියෝගයක් යටතේ කරනු ලැබූ නීත්‍යානුකූල අත්අඩංගුවට ගැනීමට විරුද්ධ කම් පෑම හෝ බාධා කිරීම.

**219අ.** බලය ඇති අධිකරණයක් විසින් නිකුත් කරනු ලැබූ යම් සිවිල් නියෝගයක් අනුව තමා හෝ වෙනත් තැනැත්තකු නීත්‍යානුකූලව සිරභාරයට ගැනීම ගැන ඕනෑකමින් විරුද්ධ කම් පාන හෝ නීති විරෝධි ලෙස එබන්දකට බාධා කරන හෝ එබඳු නියෝගයක් අනුව නීති ප්‍රකාර නතර කරනු ලැබ සිටි සිරභාරයකින් පැන යන හෝ පැන යාමට තැත්කරන හෝ එබඳු නියෝගයක් අනුව නීති ප්‍රකාර නතර කරනු ලැබූ යමකු සිරභාරයෙන් බේරන හෝ බේරාගැනීමට තැත් කරන තැනැත්තකු වරදකට වරදකාරයා වේ. එසේ වරදකාරයා කරනු ලැබීමෙහි දී, ඔහු රුපියල් සියයකට වැඩි නොවන දඩයකට හෝ හය මාසයකට වැඩි නොවන කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

දඬුවම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**220.** යම් වරදක් සඳහා වෙනත් තැනැත්තකු නීති ප්‍රකාර අත්අඩංගුවට ගැනීමේ දී, ඕනෑකමින්ම විරුද්ධකම් පාන හෝ නීති විරෝධී ලෙස බාධා කරන හෝ යම් වරදකට වෙනත් තැනැත්තකු නීති ප්‍රකාර නතර කරනු ලැබූ විට, එබඳු සිරභාරයකින් ඒ තැනැත්තා බේරන හෝ බේරා ගැනීමට තැත් කරන තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

වෙනත් තැනැත්තකු නීති ප්‍රකාර අත්අඩංගුවට ගැනීමේ දී, විරුද්ධකම් පෑම හෝ බාධා කිරීම.

නැතහොත් ;

අත්අඩංගුවට ගත යුතු හෝ බේරා ගැනීමට බලාපොරොත්තුවන හෝ බේරාගැනීමට තැත්කිරීමට බලාපොරොත්තුවන හෝ තැනැත්තා චෝදනා කරනු ලැබූ හෝ අත්අඩංගුවට ගනු ලැබීමට යටත් වූ වරද අවුරුදු දහය දක්වා කාලයක, බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් නම්, ඒ තැනැත්තාට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකටද යටත් විය යුතු ය. එසේත් නැතහොත් ;

අත්අඩංගුවට ගත යුතු හෝ බේරා ගැනීමට බලාපොරොත්තුවන හෝ බේරාගැනීමට තැත්කිරීමට බලාපොරොත්තුවන තැනැත්තා චෝදනා කරනු ලැබූ හෝ අත්අඩංගුවට ගනු ලැබීමට යටත් වූ වරද මරණීය දඬුවමින් දඬුවම් කළ හැකි නම්, ඒ තැනැත්තාට අවුරුදු හත දක්වා කාලයක, ·දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. එසේත් නැතහොත් ;

අත්අඩංගුවට ගත යුතු හෝ බේරා ගැනීමට බලාපොරොත්තුවන හෝ බේරාගැනීමට බලාපොරොත්තු වන තැනැත්තා අධිකරණයක දණ්ඩන නියමයක් යටතේ හෝ එබඳු දණ්ඩන නියමයක වෙනස් කිරීමක් ප්‍රකාර අවුරුදු දහයක හෝ ඊට වැඩි කාලයක බන්ධනාගාරගත කිරීමකට යටත් නම්, ඒ තැනැත්තාට අවුරුදු හත දක්ව කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. එසේත් නැතහොත් ;

අත්අඩංගුවට ගත යුතු හෝ බේරා ගැනීමට බලාපොරොත්තුවන හෝ බේරාගැනීමට තැත්කිරීමට බලාපොරොත්තු වන තැනැත්තා මරණීය දඬුවම යටතේ නම්, ඒ තැනැත්තාට අවුරුදු දහයකට වැඩි නොවන කාලයක දෙයාකාරයයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

**220අ.** 219 වෙනි, 219අ වෙනි හා 220 වෙනි වගන්තිවල හෝ තත් කාලයෙහි බල පවත්වන වෙනත් නීතියක සලස්වා නැති අවස්ථාවක තමා හෝ වෙනත් තැනැත්තකු නීත්‍යානුකූලව අත්අඩංගුවට ගැනීමේ දී ඕනෑකමින්ම විරුද්ධකම් පාන හෝ නීති විරෝධී ලෙස බාධා කරන හෝ නීති ප්‍රකාර නතරකොට තැබූ යම් සිරභාරයකින් පැන යන හෝ පැන යාමට තැත් කරන වෙනත් තැනැත්තකු නීත්‍යානුකූලව නතර කොට තැබූ යම් සිරභාරයකින් බේරන හෝ බේරා ගැනීමට තැත්කරන

වෙනත් ලෙසක සලස්වා නොමැති විරුද්ධකම් පෑමේ, බාධාකිරීමේ පැන යෑමේ හෝ බේරා ගැනීමේ අවස්ථා.



https://ezofz.web.lk/
Scanned with CamScanner

තැනැත්තකුට හය මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

නීත්‍යානුකූල සිරභාරයෙන් පැනයාම.

**221.** සාමය රැකීම හෝ යහපත් හැසිරීම සඳහා වටිනා ඇපයක් තැබීම පැහැර හැරීම ගැන නීත්‍යානුකූලව නතරකොට තැබූ සිරභාරයකින් පැන යන හෝ පැන යාමට තැත් කරන තැනැත්තකුට අවුරුද්ද දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

දඬුවම අත් හැරීමේ කොන්දේසියක් කඩකිරීම.

**222.** කොන්දේසිවලට යටත් වූ සමාවක් හෝ දඬුවම නැති කිරීමක් පිළිගත් යම් තැනැත්තකු එකී දඬුවම නැතිකිරීම ප්‍රදානය කරනු ලැබූයේ යම් කොන්දේසිවලට යටත් ව ද, ඉන් කොන්දේසියක් දැනුවත්ව කඩ කළහොත්, ඔහුට ඔහුගේ මුල් දඬුවම මරණීය දඬුවම නම්, අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහුගේ මුල් දඬුවම මරණීය දඬුවම නොවී නම්, මුලින් නියම වූ දඬුවමෙන් කොටසක් විඳ නොමැති විටක එකී මුල් දඬුවමින් ද, එකී දඬුවමින් කොටසක් විඳනොමැති විටක එකී මුල් දඬුවමින් ද, එකී දඬුවමින් කොටසක් විඳ තිබී එසේ එවකට නොවිඳ ඉතිරිව ඇති දඬුවම් ප්‍රමාණයෙන් ද දඬුවම් කළ යුතු ය.

අධිකරණමය කාර්යයක යම් අවස්ථාවක රජයේ සේවකයකු හිඳිද්දී ඕනෑකමින්ම ඔහුට නින්දා කිරීම හෝ බාධා කිරීම.

**223.** අධිකරණමය කාර්යයක යම් අවස්ථාවක රජයේ සේවකයකුව හිඳිද්දී, ඔහුට ඕනෑකමින් නින්ද කරන හෝ බාධාවක් ඇති කරවන තැනැත්තකුට හය මාසය දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් දහස දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

ජූරි සභිකයෙකුගේ හෝ විනිශ්චය සහායයකුගේ නමින් පෙනීසිටීම.

**224.** තමා ජූරි සභිකයකු ලෙස හෝ විනිශ්චය සහායකයෙකු ලෙස පත් කරනු ලැබීමට හෝ ලැයිස්තුවේ නම ඇතුළත් කරනු ලැබීමට හෝ දිවුරුම් දෙනු ලැබීමට නීතිය අනුව බලයක් නැති බව දැන දැනම එබඳු නමක් ගැනීමෙන් හෝ වෙනත් ආකාරයකින් ඕනෑකමින්ම එලෙස පවත්වන ලැයිස්තුවට නම ඇතුළත් කරවන හෝ දිවුරුම් දෙන හෝ එබඳු, පත්වීමක්, නම ඇතුළත් කිරීමක් හෝ දිවුරුම් දීමක් දරා සිටින හෝ නීතියට විරුද්ධව එලෙස පත් වූ බව, නම ඇතුළත් වූ බව, හෝ දිවුරුම් දී ඇති බව දැන දැනම කැමැත්තෙන්ම එබඳු ජූරි සභිකයකු හෝ විනිශ්චය සහායකයකු වශයෙන් සේවය කරන තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

## XII වෙනි පරිච්ඡේදය

### කාසි හා ආණ්ඩුවේ මුද්දර පිළිබඳ වැරදි

කාසි හා වලංගු කාසි යන්නෙහි තේරුම.

**225.** "කාසි" යන්න මුදල් වශයෙන් පාවිච්චි කරන මහ රජ තුමාණන්ගේ ඩොමිනියන් රාජ්‍යයක යම් කොටසක ආණ්ඩුවක බල ප්‍රකාර හෝ යම් විදේශීය රටක ආණ්ඩුවක බලය ප්‍රකාර එසේ පාවිච්චි කරනු ලැබීම සඳහා මුද්‍රා තබා නිකුත් කරනු ලැබූ යම් ලෝහයක් වන්නේ ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

"වලංගු කාසි" යන්නෙන් මහ රජතුමාණන්ගේ ඩොමිනියන් රාජ්‍යවල යම් කොටසක හෝ යම් විදේශීය රටක නීත්‍යානුකූලව වලංගු වන "කාසි" අදහස් කෙරෙයි.

**නිදර්ශනය**

(අ) කවඩි කාසි නොවේ.

(ආ) මුද්‍රා නොතැබූ ලෝහ කුට්ටි හෝ පෝදු, මුදල් වශයෙන් පාවිච්චි කළ කාසි නොවේ.

(ඇ) මුදල් වශයෙන් පාවිච්චි කරනු ලැබීමට අදහස් නොකරන ලද විට, පදක්කම් කාසි නොවේ.

**226.** කාසි කූට ලෙස තනන හෝ දැනුවත්ව කාසි කූට ලෙස තැනීමේ ක්‍රමයක යමක් කරනු තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

කාසි කූට ලෙස තැනීම.

**පහැදිලි කිරීම.**-රැවටීමක් කිරීමේ අදහසින් හෝ රැවටීමක් සිදුවිය හැකි බව දන දනම යමකු සැබෑ කාසියක් ඊට වෙනස් කාසියක් ලෙස පෙනෙන පරිදි වෙනස් කළහොත් ඔහු මේ වරද කර ඇත.

**227.** වලංගු කාසි කූට ලෙස තනන හෝ දැනුවත් ව එබඳු කූට ලෙස තැනීමේ ක්‍රමයක යමක් කරන තැනැත්තකුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. එහු දඩයකට ද යටත් විය යුතු ය.

වලංගු කාසි කූට ලෙස තැනීම.

**228.** කාසි කූට ලෙස තැනීමේ කාර්යය සඳහා පාවිච්චි කිරීම පිණිස හෝ එසේ පාවිච්චි කිරීමට අදහස් කරනු ලැබූ බව දන දනම හෝ එසේ බව විශ්වාස කිරීමට කරුණු තිබිය දී යම් අච්චුවක් හෝ උපකරණයක් තනන, අළුත් වැඩියා කරන හෝ එසේ තැනීමේ හෝ අළුත්වැඩියා කිරීමේ ක්‍රමයක යමක් කරන නැතහොත් එබඳු කාර්යයක් සඳහා පාවිච්චි කිරීම පිණිස එබන්දක් මිලයට ගන්නා වූ හෝ විකුණන්නා වූ හෝ සිතුවක් කරන්නා වූ තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

කාසි කූට ලෙස තැනීමේ උපකරණයක් සෑදීම හෝ විකිණීම.

**229.** වලංගු කාසි කූට ලෙස තැනීමේ කාර්යය සඳහා පාවිච්චි කිරීම පිණිස හෝ එසේ පාවිච්චි කිරීමට අදහස් කරනු ලැබූ බැව් දන දනම හෝ එසේ බව විශ්වාස කිරීමට කරුණු තිබිය දී යම් අච්චුවක් හෝ උපකරණයක් තනන, අළුත්වැඩියා කරන හෝ එසේ තැනීමේ හෝ අළුත්වැඩියා කිරීමේ ක්‍රමයක යමක් කරන, නැතහොත් එබඳු කාර්යයක් සඳහා පාවිච්චි කිරීම පිණිස එබන්දක මිලයට ගන්නා වූ හෝ විකුණන්නාවූ හෝ සිතුවක් කරන්නාවූ තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කල යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

වලංගු කාසි කූට ලෙස තැනීමේ උපකරනයක් සෑදීම හෝ විකිණීම.

**230.** කාසි කූට ලෙස තැනීමට ප්‍රයෝජන ගැනීම සඳහා හෝ එකී කාර්යය සඳහා ප්‍රයෝජන ගැනීමේ අදහසින් බව දන දනම හෝ එසේ බව විශ්වාස කිරීමට කරුණු තිබිය දී යම් තැනැත්තකු යම් උපකරණයක් හෝ ද්‍රව්‍යයක් ස්වාමිත්වයෙහි තබා ගතහොත්, ඔහුට අවුරුදු තුන දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කල යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

කාසි කූට ලෙස තැනීමට ප්‍රයෝජන ගැනීම සඳහා උපකරණ හෝ ද්‍රව්‍ය ස්වාමිත්වයෙහි තබා ගැනීම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

කූට ලෙස තනනු ලබන්නේ වලංගු කාසි නම්, ඔහුට අවුරුදු දහය දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කල යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

ලංකාවෙන් පිට කාසි කූට ලෙස තැනීමකට ලංකාවේ දී අනුබල දීම.

**231.** මේ දිවයිනේ සිටිමින්ම යමකු දිවයිනෙන් පිට කාසි කූට ලෙස තැනීමකට අනුබල දෙතොත්, ඔහු දිවයිනෙහි කාසි කූට ලෙස තැනීමකට අනුබල දුන් ආකාරයටම ඔහුට දඬුවම් කළ යුතු ය.

කූට කාසි මෙරටට ගෙන්වීම හෝ පිටරට යැවීම.

**232.** කූට කාසි බව දන දනම හෝ එසේ බව විශ්වාස කිරීමට කරුණු තිබිය දී යමකු කූට කාසි මේ දිවයිනට ගෙන්වතොත් හෝ මේ දිවයිනෙන් පිට යවතහොත් ඔහුට අවුරුදු තුන දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

කූට වලංගු කාසි මෙරටට ගෙන්වීම හෝ පිටරට යැවීම.

**233.** කූට වලංගු කාසි බව දන දනම හෝ එසේ බව විශ්වාස කිරීමට කරුණු තිබිය දී යම් කූට වලංගු කාසි මේ දිවයිනට යමකු ගෙන්වතොත් හෝ මේ දිවයිනෙන් පිට යවතහොත් ඔහුට අවුරුදු දහය දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

තම ස්වාමිත්වයේ ඇති කූට කාසි එසේ බව දනිමින්ම වෙනත් තැනැත්තෙකුට බාර දීම.

**234.** තමාගේ ස්වාමිත්වයට පත්වූ වේලෙහි කූට කාසියක් බව දන දනම වංචක ලෙස හෝ වංචාවක් කිරීමේ අදහසින් එකී කූට කාසි යම් තැනැත්තකුට බාර දෙන, නැතහොත් එය බාර ගැනීම සඳහා යමකු පෙළඹවීමට තැත් කරන තැනැත්තකුට අවුරුදු පහ දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

තම ස්වාමිත්වයට පත් වලංගු කාසියක් කූට කාසියක් බව දනිමින්ම ඒවා බාර දීම.

**235.** තම ස්වාමිත්වයට පත් වේලෙහි කූට කාසියක් බව දත් යම් කූට වලංගු කාසියක් ඇතිව සිටින යමකු, වංචක ලෙස හෝ වංචාවක් කිරීමේ අදහසින් ඒ කූට වලංගු කාසිය යම් තැනැත්තකුට බාර දෙතොත් හෝ එය බාර ගැනීමට යම් තැනැත්තකු පෙළඹුවහොත් ඔහුට අවුරුදු දහය දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

පළමුවෙන් භාර දෙන්නාගේ ස්වාමිත්වයට පත් වූ වේලෙහි කූට කාසියක් බව නොදන්නා වූ යම් කාසියක් සැබෑ කාසියක් ලෙස අන් තැනැත්තකුට භාර දීම.

**236.** යම් කාසියක් කූට කාසියක් බව තමා දන්නා නමුදු, එය තම ස්වාමිත්වයට පත් වේලෙහි ඒ බව නොදන්නා වූ කාසියක් සැබෑ කාසියක් ලෙස අන් තැනැත්තකුට බාරදෙන නැතහොත් එය සැබෑ කාසියක් ලෙස පිළිගැනීමට අන් තැනැත්තකු පෙළඹවීමට තැත් කරන තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ කූට ලෙස තැනුණු කාසියෙහි වටිනාකම මෙන් දස ගුණයක් දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කල යුතු ය.

තම ස්වාමිත්වයට පත්වූ වේලෙහි කූට කාසියක් බව දනගත් තැනැත්තකු විසින් ඒ කූට කාසිය ස්වාමිත්වයෙහි තබා ගැනීම.

**237.** කාසියක් තම ස්වාමිත්වට පත්වුණු වේලෙහි ම එය කූට කාසියක් බව දනගෙන තිබිය දී ම, වංචක ලෙස හෝ වංචාවක් කිරීමේ අදහසින් එකී කූට කාසිය තම ස්වාමිත්වයෙහි තබා ගන්නා තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක දෙයාකාරයෙන් එක ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කල යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**238.** වලංගු කූට කාසියක් තම ස්වාමිත්වයට පත් වූ වේලෙහි ම එය කූට කාසියක් බව දනිමින් ම වංචක ලෙස හෝ වංචාවක් සිදු කිරීමේ අදහසින් එකී කූට වලංගු කාසිය තම ස්වාමිත්වයෙහි තබා ගන්නා තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

තම ස්වාමිත්වයට පත් වේලෙහි කූට වලංගු කාසියක් බව දනගත් තැනැත්තකු විසින් එකී කූට කාසිය තම ස්වාමිත්වයෙහි තබාගෙන සිටීම.

**239.** යම් කාසියක බර අඩු කරන හෝ එහි තැනීම වෙනස් කරන අන්දමේ යම් ක්‍රියාවක් වංචක ලෙස හෝ වංක ලෙස කරන තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

වංචක ලෙස හෝ වංක ලෙස කාසියක බර අඩු කිරීම හෝ එහි තැනීම වෙනස් කිරීම.

**පැහැදිලි කිරීම**. - කාසියේ කොටසක් සිදුරු කොට එම කුහරයේ වෙනත් දෙයක් දමන තැනැත්තා එකී කාසියේ තැනීම වෙනස් කරයි.

**240.** යම් වලංගු කාසියක බර අඩු කරන හෝ එහි තැනීම වෙනස් කරන අන්දමේ යම් ක්‍රියාවක්, වංචක ලෙස හෝ වංක ලෙස කරන තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට යටත් විය යුතු ය.

වංචක ලෙස හෝ වංක ලෙස වලංගු කාසියක බර අඩු කිරීම හෝ එහි තැනීම වෙනස් කිරීම.

**241.** යම් කාසියක් වෙනත් විස්තරයක කාසියක් යයි ගණන් ගන්වන අදහසින් එකී කාසියෙහි පෙනීම වෙනස් වන අන්දමේ ක්‍රියාවක් යමකු කළහොත්, ඔහුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

වෙනස් විස්තරයක කාසියක් යයි ගණන් ගන්වන අදහසින් යම් කාසියක පෙනීම වෙනස් කිරීම.

**242.** යම් වලංගු කාසියක් වෙනස් විස්තරයක කාසියක් යයි ගණන් ගන්වන අදහසින් එකී වලංගු කාසියෙහි පෙනීම වෙනස් වන අන්දමේ ක්‍රියාවක් යමකු කළහොත්, ඔහුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කල යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

වෙනස් විස්තරයක කාසියක් යයි ගණන් ගන්වන අදහසින් වලංගු කාසියක පෙනීම වෙනස් කිරීම.

**243.** 239 වෙනි හෝ 241 වෙනි වගන්තියෙහි විස්තර කරනු ලැබූ වරද යම් කාසියක් සම්බන්ධයෙන් සිදු කරනු ලැබී ද, එබඳු කාසියක් තම ස්වාමිත්වයෙහි තිබී එය තම ස්වාමිත්වයට පත් වේලෙහි එය සම්බන්ධයෙන් එබඳු වරදක් කර ඇති බැව් දන දනම, වංචක ලෙස හෝ වංචාවක් කිරීමේ අදහසින් එකී කාසිය වෙනත් තැනැත්තකුට යමකු බාර දුනහොත් හෝ එය පිළිගැනීමට වෙනත් තැනැත්තකු පෙළඹවීමට තැත් කරතොත් ඔහුට අවුරුදු පහ දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කල යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

තම ස්වාමිත්වයට පත් වූ කාසියක් වෙනස් කරනු ලැබූ බව දන දනම එය අන් තැනැත්තකුට බාර දීම.

**244.** 240 වෙනි හෝ 242 වෙනි වගන්තියෙහි විස්තර කරනු ලැබූ වරද යම් කාසියක් සම්බන්ධයෙන් සිදු කරනු ලැබී ද, එබඳු කාසියක් තම ස්වාමිත්වයට පත්වී තිබී එය තම ස්වාමිත්වයට පත් වේලෙහි, එය සම්බන්ධයෙන් එබඳු වරදක් කර ඇති බැව් දන දනම, වංචක ලෙස හෝ වංචාවක් කිරීමේ අදහසින් එකී කාසිය වෙනත් තැනැත්තකුට යමකු බාර දුනහොත් හෝ එය පිළිගැනීමට වෙනත් තැනැත්තකු

යම් කාසියක් වෙනස් කරනු ලැබූ බව දන දනම එය බාර දීම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

පෙළඹවීමට තැත් කරතොත් ඔහුට අවුරුදු දහය දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කල යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

තම ස්වාමිත්වයට පත් වූ වේලෙහි කාසියක් වෙනස් කරනු ලැබූ බව දන්නා තැනැත්තකු එකී කාසිය ළඟ තබා ගැනීම.

**245.** 239 වෙනි හෝ 241 වෙනි වගන්තියෙහි විස්තර කරනු ලැබූ වරද යම් කාසියක් සම්බන්ධයෙන් කරනු ලැබී ද, එබඳු කාසියක් තම ස්වාමිතවයට පත්වූ වේලෙහි එකී කාසිය සම්බන්ධයෙන් එබඳු වරදක් කර ඇති බැව් දන දනම වංචක ලෙස හෝ වංචාවක් කිරීමේ අදහසින් එකී කාසිය තමා ළඟ තබා ගන්නා යමකුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කල යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

වලංගු කාසියක් තම ස්වාමිත්වයට පත් වූ වේලෙහි එය වෙනස් කරනු ලැබූ බව දන්නා තැනැත්තකු එය ළඟ තබා ගැනීම.

**246.** 240 වෙනි හෝ 242 වෙනි වගන්තියෙහි විස්තර කරනු ලැබූ වරද යම් වලංගු කාසියක් සම්බන්ධයෙන් කරනු ලැබී ද, එබඳු කාසියක් තම ස්වාමිත්වයට පත් වූ වේලෙහි එකී වලංගු කාසිය සම්බන්ධයෙන් එබඳු වරදක් කර ඇති බැව් දන දනම වංචක ලෙස හෝ වංචාවක් කිරීමේ අදහසින් එකී වලංගු කාසිය තමා ළඟ තබා ගන්නා යමකුට අවුරුදු පහ දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකටද යටත් විය යුතු ය.

බාර දෙන්නා ගේ ස්වාමිත්වයට පළමුවෙන් පත් වුණු වේලෙහි වෙනස් කරනු ලැබූ බව නොදත් කාසියක් ඔහු සැබෑ කාසියක් ලෙස වෙනත් තැනැත්තකුට බාර දීම.

**247.** 239 වෙනි හෝ 240 වෙනි හෝ 241 වෙනි හෝ 242 වෙනි වගන්තිවල සඳහන් යම් ක්‍රියාවක් යම් කාසියක් සම්බන්ධයෙන් කරන ලද නම්, එබඳු කාසියක් තම ස්වාමිත්වයට පත්වුණු වේලෙහි එබඳු ක්‍රියාවක් ඒ සම්බන්ධයෙන් කරනු ලැබූ බව නොදන, එකී කාසිය සබෑ කාසියක් ලෙස හෝ එයට වෙනස් විස්තරයක කාසියක් ලෙස වෙනත් තැනැත්තකුට බාර දෙන හෝ සැබෑ කාසියක් ලෙස හෝ වෙනස් විස්තරයක කාසියක් ලෙස පිළිගැනීමට වෙනත් තැනැත්තකු පෙළඹවීමට තැත් කරන යමකුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් අකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ වෙනස් කරනු ලැබූ කාසිය ගණින් ගනු ලැබූ හෝ ගනත් ගැන්වීමට තැත් කරනු ලැබූ වටිනාකම මෙන් දස ගුණයක් දක්වා විය හැකි දඩයකින් දඬුවම් කළ යුතු ය.

ආණ්ඩුවේ මුද්දරයක් කූට ලෙස තැනීම.

**248.** ආදායම සඳහා ආණ්ඩුව මගින් නිකුත් කරනු ලැබූ මුද්දරයක් කූට ලෙස තනන හෝ කූට ලෙස තැනීමේ ක්‍රමයක යම් ක්‍රියාවක් දැනුවත්ව කරන තැනැත්තකුට අවුරුදු පහළොව දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකටද යටත් විය යුතු ය.

**පැහැදිලි කිරීම.**– එක් වර්ගයක මුද්දරයක් වෙනස් වර්ගයක මුද්දරයක් ලෙස පෙනෙන පරිදි කූට ලෙස තනන තැනැත්තා මේ වරද කර ඇත.

ආණ්ඩුවේ මුද්දරයක් කූට ලෙස තැනීමේ කාර්‍ය්‍ය සඳහා යම් උපකරණයක් හෝ ද්‍රව්‍යයක් තමා ස්වාමිත්වයෙහි තබා ගැනීම.

**249.** ආදායම සඳහා ආණ්ඩුව මගින් නිකුත් කරනු ලැබූ යම් මුද්දරයක් කූට ලෙස තැනීම පිණිස පාවිච්චි කිරීමේ කාර්යය සඳහා හෝ එසේ පාවිච්චි කිරීමට අදහස් කරන බව දන දනම හෝ එසේ පාවිච්චි කිරීමට අදහස් කරන බව විශ්වාස කිරීමට කරුණු තිබිය දී යම් උපකරණයක් හෝ ද්‍රව්‍යයක් යමක් තම ස්වාමිත්වයෙහි තබා ගතහොත්, ඔහුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**250.** ආදායම සඳහා ආණ්ඩුව මගින් නිකුත් කරනු ලැබූ යම් මුද්දරයක් කූට ලෙස තැනීමේ කාර්යය සඳහා පාවිච්චි කිරීමක් පිණිස හෝ එසේ පාවිච්චි කිරීමට අදහස් කරන බව දන දනම හෝ එසේ පාවිච්චි කිරීමට අදහස් කරන බව විශ්වාස කිරීමට කරුණු තිබිය දී යමකු යම් උපකරණයක් සදනහොත් හෝ එසේ සෑදීමේ ක්‍රමයක යම් ක්‍රියාවක් කරනහොත් හෝ එබන්දක් මිලටය ගනහොත් හෝ විකුණනොත් හෝ එබන්දකට වෙන යමක් කරනහොත් ඔහුට අවුරුදු හත දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කල යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

ආණ්ඩුවේ මුද්දරයක් කූට ලෙස තැනීමේ කාර්යය සඳහා උපකරණයක් සෑදීම හෝ විකිණීම.

**251.** ආදායම සඳහා ආණ්ඩුව මගින් නිකුත් කරනු ලැබූ යම් මුද්දරයක් මෙන් කූට ලෙස තැනුණු මුද්දරයක් බව දනිමින් ම හෝ ඒ බව විශ්වාස කිරීමට කරනු තිබිය දී යමකු එබඳු මුද්දරයක් විකුණනොත් හෝ විකිණීමට ඉදිරිපත් කරනහොත් ඔහුට හත් අවුරුද්ද දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකටද යටත් විය යුතු ය.

ආණ්ඩුවේ කූට මුද්දර විකිණීම.

**252.** ආදායම සඳහා ආණ්ඩුව මගින් නිකුත් කරනු ලැබූ යම් මුද්දරයක් මෙන් කූට ලෙස තැනුණ මුද්දරයක් බව දනිමින් සැබෑ මුද්දරයක් ලෙස පාවිච්චි කිරීමේ හෝ අලෙවි කිරීමේ අදහසින් නැතහොත් එය සැබෑ මුද්දරයක් ලෙස පාවිච්චි කිරීම පිණිස තම ස්වාමිත්වයෙහි තබා ගන්නා තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයකට, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

කූට ලෙස තැනුණු ආණ්ඩුවේ මුද්දරයක් ස්වාමිත්වයෙහි තබා ගැනීම.

**253.** ආදායම සඳහා ආණ්ඩුව මගින් නිකුත් කරනු ලැබූ යම් මුද්දරයක් මෙන් කූට ලෙස තැනුණු මුද්දරයක් බව දනිමින් ම එබඳු මුද්දරයක් සැබෑ මුද්දරයක් ලෙස පාවිච්චි කරන තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

කූට මුද්දරයක් බව දනිමින්ම කූට ආණ්ඩුවේ මුද්දරයක් සැබෑ මුද්දරයක් ලෙස පාවිච්චි කිරීම.

**254.** ආදායම සඳහා ආණ්ඩුව මගින් නිකුත් කරනු ලැබූ මුද්දරයක් දරන යම් ද්‍රව්‍යයකින්, එකී මුද්දරය පාවිච්චි කරනු ලැබුයේ යම් ලිවීමක් හෝ ලේඛනයක් සඳහා නම්, එකී ලිවීම හෝ ලේඛනය වංචක ලෙස හෝ ආණ්ඩුවට අලාභයක් කිරීමේ අදහසින් ඉවත් කරන හෝ මකන නැතහොත් යම් ලිවීමක් හෝ ලේඛනයක් සඳහා පාවිච්චි කරනු ලැබූ මුද්දරයක් වෙනත් ලිවීමක් හෝ ලේඛනයක් සඳහා පාවිච්චි කිරීම පිණිස එකී ලිවීමෙන් හෝ ලේඛනයෙන් ඉවත් කරන තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

ආණ්ඩුවේ මුද්දරයක් දරන ද්‍රව්‍යයකින් යම් ලිවීමක් මකා දැමීම හෝ ලේඛනයක් සඳහා පාවිච්චි කරනු ලැබූ මුද්දරයක් ආණ්ඩුවට අලාභයක් කිරීමේ අදහසින් එකී ලේඛනයෙන් ඉවත් කිරීම.

**255.** ආදායම් සඳහා ආණ්ඩුව මගින් නිකුත් කරනු ලැබූ යම් මුද්දරයක් කලින් පාවිච්චි කරන ලද බව දනිමින්ම යමකු වංචක ලෙස හෝ ආණ්ඩුවට අලාභයක් කිරීමේ අදහසින් පාවිච්චි කලහොත් ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

කලින් පාවිච්චි කරනු ලැබූ බව දන්න ආණ්ඩුවේ මුද්දරයක් පාවිච්චි කිරීම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

මුද්දර පාවිච්චි කළ බව දක්වන ලකුණු මැකීම.

**256.** ආදායම සඳහා ආණ්ඩුව මගින් නිකුත් කරනු ලැබූ යම් මුද්දරයක් පාවිච්චි කළ බැව් දැක්වීම සඳහා දමනු ලැබූ හෝ ඔබවනු ලැබූ යම් ලකුණක් එබඳු මුද්දරයකින් වංචක ලෙස හෝ ආණ්ඩුවට අලාභ කිරීමේ අදහසින් මකන්නා වූ හෝ ඉවත් කරන්නා වූ හෝ වංචක ලෙස හෝ එබඳු අදහසකින් එබඳු ලකුණක් වෙනස් කරන හෝ එබඳු ලකුණක් මකනු ලැබූ හෝ ඉවත් කරනු ලැබූ හෝ වෙනස් කරනු ලැබූ මුද්දරයක් දැනුවත්ව තමා ළඟ තබා ගන්නා වූ හෝ විකුණන්නා වූ හෝ අලෙවි කරන්නා වූ හෝ පාවිච්චි කරනු ලැබූ බව තමා දන්නා වූ එබඳු මුද්දරයක් විකුණන්නා වූ හෝ අලෙවි කරන්නා වූ තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

248 වෙනි වගන්තියේ සිට 256 වෙනි වගන්තිය දක්වා ඇති වගන්තිවල "ආණ්ඩුවේ" යන පාඨයෙහි විෂයය.

**256අ.** තැපැල් ගාස්තුවක් දැක්වීමේ කාර්‍ය්‍ය සඳහා නිකුත් කරනු ලැබූ මුද්දරයක් සම්බන්ධයෙන් හෝ එය පිළිබඳව 248 වෙනි වගන්තියේ සිට 256 වෙනි වගන්තිය දක්වා (එකී වගන්ති දෙක ද ඇතුළුව) ඇති වගන්තිවල "ආණ්ඩුවේ" යන වචනය යොදනු ලැබූ අවස්ථාවක දී, 14 වෙනි වගන්තියේ කුමක් සඳහන් වුව ද, එකී වචනයට මහරජතුමාණන්ගේ ලංකාණ්ඩුව ද, මහරජතුමාණන්ගේ විජිතවල හෝ විදේශීය රටවල යම් කොටසක ආණ්ඩුව ද ඇතුළත් වන බව සැලකිය යුතු ය.

**පැහැදිලි කිරීම.**–මේ පරිච්ඡේදයේ යොදන "මුද්දරය" යන වචනයට තැපැල් මුද්දර ඇතුළත් වේ.

## XIII වෙනි පරිච්ඡේදය

### කිරුම් සහ මිනුම් පිළිබඳ වැරදි

කිරීම සඳහා ව්‍යාජ උපකරණයක් වංචක ලෙස පාවිච්චි කිරීම.

**257.** ව්‍යාජ බව තමා දන්නා වූ යම් කිරන හෝ මනින උපකරණයක් වංචක ලෙස පාවිච්චි කරන තැනැත්තකුට අවුරුද්ද දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

ව්‍යාජ පඩියක් හෝ මිම්මක් වංචක ලෙස පාවිච්චි කිරීම.

**258.** යම් ව්‍යාජ කිරුම් පඩියක් හෝ දිගෙහි හෝ විශාලත්වයෙහි ව්‍යාජ මිම්මක් වංචක ලෙස පාවිච්චි කරන නැතහොත් යම් කිරුම් පඩියක් හෝ දිගෙහි හෝ විශාලත්වයෙහි මිම්මක් එබන්දකට වෙනස් වූ බරක් හෝ මිම්මක් ලෙස වංචක ලෙස පාවිච්චි කරන තැනැත්තකුට අවුරුද්ද දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

ව්‍යාජ පඩියක් හෝ මිම්මක් ස්වාමිත්වයෙහි තබා ගැනීම.

**259.** යම් ව්‍යාජ කිරුම් හෝ මැනුම් උපකරණයක් හෝ ව්‍යාජ කිරුම් පඩියක් හෝ දිගෙහි හෝ විශාලත්වයෙහි ව්‍යාජ මිම්මක් වංචක ලෙස පාවිච්චි කිරීම සඳහා තම ස්වාමිත්වයෙහි තබා ගන්නා තැනැත්තකුට අවුරුද්ද දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**260.** ව්‍යාජ බව තමා දන්නා වූ යම් කිරුම් හෝ මැනුම් උපකරණයක් හෝ යම් කිරුම් පඩියක් හෝ දිගෙහි හෝ විශාලත්වයෙහි මිම්මක් සත්‍ය වූවක් ලෙස පාවිච්චි කිරීම සඳහා හෝ එලෙස පාවිච්චි කරනු ලැබිය හැකි බව දනිමින්ම යමකු එබන්දක් සාදතොත් හෝ විකුණතොත් හෝ අලෙවිය කරතොත් ඔහුට අවුරුදු තුන දක්වා කාලයක, බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

ව්‍යාජ කිරුම් පඩි හෝ මිමි සෑදීම හෝ විකිණීම.

## XIV වෙනි පරිච්ඡේදය

### මහජන සෞඛ්‍ය ආරක්ෂාව, පහසුව, සභ්‍යතාව හා සදචාරය පිළිබඳ වැරදි

**261.** මහජනයාට හෝ සාමාන්‍යයෙන් අසල පදිංචිව සිටින හෝ දේපල භුක්ති විඳින ජනයාට පොදු පාඩුවක්, අන්තරායක් හෝ අප්‍රසන්නතාවයක් ඇති කරන නැතහොත් යම් පොදු අයිති වාසිකමක් භුක්ති විඳීමේ අවස්ථාවකින් ප්‍රයෝජනයක් ගැනීමට සිදුවිය හැකි ජනයාට අවශ්‍යයෙන් ම පාඩුවක්, බාධාවක්, අන්තරායක් හෝ අප්‍රසන්නතාවයක් ඇති වන යම් ක්‍රියාවකට හෝ එබඳු නීති විරෝධී නොකර හැරීමකට වරදකරු වන තැනැත්තෙක් මහජන කරදරය කිරීමේ වරදට වැරදිකාරයෙක් වේ.

මහජන කරදරය.

යම් පහසුවක් හෝ ලාභයක් සැලසීමේ කරුණ උඩ මහජන කරදරයකට සමාව නො ලැබේ.

**262.** ජීවිතයට අන්තරාදයක වූ යම් රෝගයක් පැතිරවිය හැකි වූ ද, එලෙස පැතිරවිය හැකි බව තමා දන්නා වූ හෝ එලෙස විශ්වාස කිරීමට කරුණු තිබෙන්නා වූ ද යම් ක්‍රියාවක් නීති විරෝධීව හෝ නොසැලකිලිමත්ව කරන තැනැත්තකුට හය මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

ජීවිතයට අන්තරාදයක වූ රෝගයක බෝවීම පැතිර විය හැකි නොසැලකිලිමත් ක්‍රියාව.

**263.** ජීවිතයට අන්තරාදයක වූ යම් රෝගයක් පැතිර විය හැකි වූ ද, එසේ පැතිර විය හැකි බව තමා දන්නා වූ හෝ එලෙස බව විශ්වාස කිරීමට කරුණු තිබෙන්නා වූ ද, යම් ක්‍රියාවක් ද්වේෂ සහගත ව කරන තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක, බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

ජීවිතයට අන්තරාදයක වූ රෝගයක බෝවීම පැතිර විය හැකි ද්වේෂ සහගත ක්‍රියාව.

**264.** යම් යාත්‍රාවක් නිරෝධායන තත්ත්වයක තැබීම සඳහා හෝ නිරෝධායන තත්ත්වයක තිබිය දී යාත්‍රාවල වෙරළ සමග හෝ වෙනත් යාත්‍රා සමග අන්‍යෝන්‍ය සම්බන්ධත්වය ක්‍රමවත් කිරීම සඳහා හෝ බෝවෙන රෝගයක් ඇති ස්ථානයක් වෙනත් ස්ථාන සමග ඇති අන්‍යෝන්‍ය සම්බන්ධත්වය පාලනය කිරීම සඳහා ආණ්ඩුව විසින් පනවා ප්‍රසිද්ධ කරනු ලැබූ යම් ව්‍යවස්ථාවකට දැනුවත්ව අකීකරු වෙන තැනැත්තකුට මාස හය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

නිරෝධායන ව්‍යවස්ථාවකට අකීකරු වීම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

විකිණීමට අදහස් කරනු ලැබූ ආහාරයක් හෝ පානයක් බාල කිරීම.

**265.** යම් දෙයක් ආහාරයක් වශයෙන් හෝ පානයක් වශයෙන් විකිණීමට අදහස් කරමින් හෝ එය ආහාරයක් වශයෙන් හෝ විකිණීමට ඉඩ ඇති බව දනිමින් ම ඒ ආහාර පානයක් වශයෙන් විකිණීමට ඉඩ ඇති බව දනිමින් ම ඒ ආහාර ද්‍රව්‍යය හෝ පානය ආහාරයක් වශයෙන් හෝ පානයක් වශයෙන් අන්තරාදයක වන පරිදි බාල කරන යමකුට, හය මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

අන්තරාදයක ආහාරයක් හෝ පානයක් විකිණීම.

**266.** අන්තරාදයක කරනු ලැබූ හෝ අන්තරාදයක වූ ආහාරයක් හෝ පානයක් වශයෙන් නුසුදුසු යම් ආහාරයක් හෝ පානයක්, ආහාරයක් වශයෙන් හෝ පානයක් වශයෙන් අන්තරාදයක බව දනිමින් ම හෝ එසේ බව විශ්වාස කිරීමට කරුණු තිබිය දී යමකු ආහාරයක් වශයෙන් හෝ පානයක් වශයෙන් විකුණනොත් හෝ විකිණීමට ඉදිරිපත් කරතොත් හෝ විකිණීමට අනාවරණය කොට තබතොත් ඔහුට හය මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

බෙහෙත් වර්ග බාල කිරීම.

**267.** බාල නො .කරන ලද්දක් මෙන් යම් වෛද්‍ය කාර්යයක් සඳහා විකිණීමේ හෝ පාවිච්චි කිරීමේ අදහසින් හෝ ඒ සඳහා විකුණන බව හෝ පාවිච්චි කරන බව දන දන ම, එබඳු බෙහෙතක හෝ ඖෂධ සංයෝගයක සඵලත්වය අඩු වන පරිදි හෝ එහි ක්‍රියාකාරිත්වය වෙනස් වන පරිදි හෝ එය අන්තරාදයක වන පරිදි යම් බෙහෙතක් හෝ ඖෂධ සංයෝගයක්, යමකු බාල කළහොත් ඔහුට හය මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

බාල කරනු ලැබූ බෙහෙත් විකිණීම.

**268.** යම් බෙහෙත් හෝ ඖෂධ සංයෝගයක සඵලත්වය අඩුවන පරිදි හෝ එහි ක්‍රියාකාරිත්වය වෙනස් වන පරිදි හෝ එය අන්තරාදයක වන පරිදි හෝ එබන්දක් බාල කරනු ලැබූ බව දනිමින් ම යමකු එය විකුණතොත් හෝ විකිණීමට ඉදිරිපත් කරතොත් හෝ විකිණීමට අනාවරණය කොට තබතොත් හෝ එය බාල කරනු නොලැබූවක් ලෙස වෛද්‍ය කාර්‍ය්‍ය සඳහා බෙහෙත් ශාලාවකින් එය නිකුත් කලහොත් හෝ, එය බාල කරනු ලැබූවක් බව නොදන්නා යම් තැනැත්තකු ලවා වෛද්‍ය කාර්යයකට එය පාවිච්චි කරවුවහොත්, ඔහුට මාස හය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

බෙහෙතක් වෙනත් බෙහෙතක් ලෙස හෝ සංයෝගයක් ලෙස විකිණීම.

**269.** යම් බෙහෙතක් හෝ ඖෂධ සංයෝගයක් වෙනත් බෙහෙතක් හෝ වෙනත් ඖෂධ සංයෝගයක් ලෙස දැනුවත් ව විකුණන හෝ විකිණීමට ඉදිරිපත් කරන හෝ විකිණීමට අනාවරනය කොට තබන හෝ ඖෂධ කාර්යයන් සඳහා බෙහෙත් ශාලාවකින් නිකුත් කරන තැනැත්තකුට හය මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**270.** යම් පොදු උල්පතක් හෝ ජලාශයක් සාමාන්‍යයෙන් පාවිච්චි කරනු ලබන කාර්යය සඳහා එහි සුදුසුකම අඩු වන පරිදි එහි ජලය කැමැත්තෙන් ම කිලුටු කරන හෝ අපවිත්‍ර කරන තැනැත්තකුට මාස තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් පනහ දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

පොදු උල්පතක හෝ ජලාශයක ජලය අපවිත්‍ර කිරීම.

**271.** අසල සාමාන්‍යයෙන් පදිංචි ව සිටින්නා වූ හෝ වෙළෙඳ ව්‍යාපාර ගෙන යන්නා වූ හෝ ප්‍රසිද්ධ මාර්ගයක ගමන් කරන්නා වූ තැනැත්තන්ගේ සනීපයට අන්තරායදායක වන පරිදි යම් ස්ථානයක වාතාවරණය කැමැත්තෙන් ම දූෂණය කරන තැනැත්තකුට රුපියල් සියය දක්වා දඩයකින් දඬුවම් කළ යුතු ය.

වාතාවරණය සනීපයට අන්තරාදායක කිරීම.

**272.** මනුෂ්‍ය ජීවිතයකට අන්තරාදායක වන පරිදි හෝ වෙනත් තැනැත්තකුට තුවාළයක් හෝ පාඩුවක් විය හැකි පරිදි අපරික්ෂාකාරී ආකාරයකට හෝ නොසැලකිලිමත් ආකාරයකට යමකු යම් ප්‍රසිද්ධ මාර්ගයක රථයක් පදවතොත් හෝ සතකු පිට නැගී යතොත් ඔහුට මාස හය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

ප්‍රසිද්ධ මාර්ගයක අපරික්ෂාකාරීව රථ පැදවීම හෝ සතකු පිට යාම.

**273.** මනුෂ්‍ය ජීවිතයට අන්තරාදායක වන පරිදි හෝ වෙනත් තැනැත්තකුට තුවාලයක් හෝ පාඩුවක් විය හැකි පරිදි අපරික්ෂාකාරී ආකාරයට හෝ නො සැලකිලිමත් ආකාරයට යාත්‍රාවක් යාත්‍රා කරවන තැනැත්තකුට හය මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

යාත්‍රාවල් අපරික්ෂාකාරීව යාත්‍රා කිරීම.

**274.** යම් ව්‍යාජ එළියක්, ලකුණක් හෝ මහ පෙන්වන ඉපියාවක් ප්‍රදර්ශනය කරවීමෙන් යම් යාත්‍රාකරුවකු නොමග යැවීමේ අදහසින් හෝ නො මහ යැවිය හැකි බව දනිමින් ම යමකු එබන්දක් ප්‍රදර්ශනය කරතහොත් ඔහුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

ව්‍යාජ එළියක්, ලකුණක් හෝ මහ පෙන්වන ඉපියාවක් ප්‍රදර්ශනය කරවීම.

**275.** යම් යාත්‍රාවක් එහි ගෙන යනු ලබන්නකුගේ ජීවිතයට අන්තරායදායක වන තත්ත්වයක තිබිය දී හෝ එකී යාත්‍රාවෙහි එවැන්නක් වන ලෙස අධික බර පටවා ඇති අවස්ථාවක දී යම් තැනැත්තකු විසින් එකී යාත්‍රාවෙහි දැනුවත් ව හෝ නො සැලකිලිමත්ව යමකු කුලියට ජලයෙන් ගෙන යතහොත් හෝ ගෙනයාම සිදු කළහොත් ඔහුට හය මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

අධික බර පටවනු ලැබු හෝ ආරක්ෂා විරහිත වූ යාත්‍රාවක කුලියට ජනයා ජලයෙන් ගෙන යාම.

**276.** යම් ක්‍රියාවක් කිරීමෙන් හෝ තම ස්වාමිත්වයේ හෝ තම භාරයේ තිබෙන යම් දේපළක් පිළිබඳව නියමයක් අත පසු කිරීමෙන් යම් ප්‍රසිද්ධ මාර්ගයක හෝ යාත්‍රා මාර්ගයක යම් තැනැත්තකුට අන්තරායක්, බාධාවක් හෝ පාඩුවක් යමකු සිදු කළහොත්, ඔහුට රුපියල් සියය දක්වා දඩයකින් දඬුවම් කළ යුතු ය.

ප්‍රසිද්ධ මාර්ගයකට හෝ යාත්‍රා මාර්ගයකට අන්තරාය සිදු කිරීම හෝ බාධා ඇති කිරීම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

විෂ ද්‍රව්‍යයක් පිළිබඳව නොසැලකිලිමත්ව කටයුතු කිරීම.

**277.** මනුෂ්‍ය ජීවිතයට අන්තරායක් වන පරිදි හෝ වෙනත් තැනැත්තකුට තුවාලයක් හෝ පාඩුවක් විය හැකි පරිදි යම් විෂ ද්‍රව්‍යයකට අපරික්ෂාකාරී ලෙස හෝ නො සැලකිලිමත් ලෙස යම් ක්‍රියාවක් යමකු කරතහොත්, හෝ

එබඳු විෂ ද්‍රව්‍යයකින් මනුෂ්‍ය ජීවිතයට විය හැකි අන්තරායකින් ආරක්ෂා කර ගැනීමට ප්‍රමාණවත් වන, තම ස්වාමිත්වයේ ඇති එබඳු විෂ ද්‍රව්‍යයක් පිළිබඳව, යම් නියමයක් ඉෂ්ට කිරීම දැනුවත් ව හෝ නො සැලකිලිමත් ව පැහැර හරිතොත්, ඔහුට හය මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

ගින්නක් හෝ ඇවිලෙන සුලු ද්‍රව්‍යයක් පිළිබඳව නොසැලකිලිමත්ව කටයුතු කිරීම.

**278.** මනුෂ්‍ය ජීවිතයට අන්තරායක් වන පරිදි හෝ වෙනත් තැනැත්තකුට තුවාලයක් හෝ පාඩුවක් විය හැකි පරිදි යම් ගින්නකට හෝ ඇවිලෙන සුලු ද්‍රව්‍යයකට අපරික්ෂාකාරී ලෙස හෝ නො සැලකිලිමත් ලෙස යමකු යම් ක්‍රියාවක් කරතහොත්, හෝ

එබඳු ගින්නකින් හෝ දැවෙන සුලු ද්‍රව්‍යයකින් මනුෂ්‍යය ජීවිතයකට විය හැකි අන්තරායකින් ආරක්ෂා කර ගැනීමට ප්‍රමාණවත් වන, තම ස්වාමිත්වයේ ඇති යම් ගින්නක් හෝ යම් ඇවිලෙන සුලු ද්‍රව්‍යයක් පිළිබඳ ව යම් නියමයක් ඉෂ්ට කිරීම දැනුවත්ව හෝ නො සැලකිලිමත් ව යමකු පැහැර හරිතොත්,

ඔහුට හය මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

පිපිරෙන ද්‍රව්‍යයන් පිළිබඳව නොසැලකිලිමත්ව කටයුතු කිරීම.

**279.** මනුෂ්‍ය ජීවිතයට අන්තරායක් වන පරිදි හෝ වෙනත් තැනැත්තකුට තුවාළයක් හෝ පාඩුවක් විය හැකි පරිදි යම් පිපිරෙන ද්‍රව්‍යයකට අපරික්ෂාකාරී ලෙස හෝ නො සැලකිලිමත් ලෙස යමකු යම් ක්‍රියාවක් කරතහොත්, හෝ

එබඳු ද්‍රව්‍යයකින් මනුෂ්‍ය ජීවිතයට විය හැකි අන්තරායකින් ආරක්ෂා කර ගැනීමට ප්‍රමාණවත් වන, තම ස්වාමිත්වයේ ඇති යම් පුපුරන ද්‍රව්‍යයක් පිළිබඳ ව යම් නියමයක් ඉෂ්ට කිරීම දැනුවත් ව හෝ නො සැලකිලිමත් ව යමකු පැහැර හරිතොත්,

ඔහුට හය මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

වරදකරුගේ ස්වාමිත්වයේ හෝ භාරයේ තිබෙන යම් යන්ත්‍රෝපකරණ සම්බන්ධයෙන් නොසැලකිලිමත් වීම.

**280.** මනුෂ්‍ය ජීවිතයට අන්තරායක් වන පරිදි හෝ වෙනත් තැනැත්තකුට තුවාළයක් හෝ පාඩුවක් විය හැකි පරිදි යන්ත්‍රෝපකරණවලට අපරික්ෂාකාරී ලෙස හෝ නො සැලකිලිමත් ලෙස යමකු යම් ක්‍රියාවක් කරතහොත්, හෝ

එබඳු යන්ත්‍රෝපකරණවලින් මනුෂ්‍ය ජීවිතයට විය හැකි අන්තරායකින් ආරක්ෂා කර ගැනීමට ප්‍රමාණවත් වන, තම ස්වාමිත්වයේ ඇති හෝ තම භාරයේ ඇති යන්ත්‍රෝපකරණ පිළිබඳ ව යම් නියමයක් ඉෂ්ට කිරීම දැනුවත් ව හෝ නො සැලකිලිමත් ව යමකු පැහැර හරිතොත්,



https://ezofz.web.lk/
Scanned with CamScanner

ඔහුට හය මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

**281.** යම් ගොඩනැගිල්ලක් හෝ ඉන් කොටසක් කඩා වැටීමෙන්, මනුෂ්‍ය ජීවිතයට විය හැකි අන්තරායයෙන් ආරක්ෂාවීමට ප්‍රමාණවත් වූ නියමයක් ඉෂ්ට කිරීම ට එබඳු ගොඩනැගිල්ලක් කැඩීමේ දී හෝ අළුත් වැඩියා කිරීමේ දී යමකු දැනුවත් ව හෝ නො සැලකිලිමත් ව පැහැර හරිතොත්, ඔහුට හය මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

ගොඩනැගිලි කඩාදැමීම හෝ අළුත්වැඩියා කිරීම පිළිබඳව නොසැලකිලිමත් වීම.

**282.** තම ස්වාමිත්වයෙහි ඇති යම් සතකුගෙන් මනුෂ්‍ය ජීවිතයට විය හැකි යම් අන්තරායකින් හෝ විය හැකි බරපතළ තුවාළවීමේ අන්තරායකින් ආරක්ෂාවීමට ප්‍රමාණවත් වූ එබඳු සතකු පිළිබඳ යම් නියමයක් ඉෂ්ට කිරීම දැනුවත්ව හෝ නො සැලකිලිමත් ව යමකු පැහැර හරිතොත්, ඔහුට හය මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම හෝ දඬුවම් කළ යුතු ය.

යම් සතෙකු පිළිබඳව නොසැලකිලිමත් වීම.

**283.** මේ සංග්‍රහයෙන් වෙනත් ආකාරයට දඬුවම් කළ නො හැකි වූ යම් මහජන කරදරයක් කරන තැනැත්තකුට රුපියල් පනහ දක්වා වූ දඩයකින් හෝ තුන් මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

මහජන කරදරය ගැන දඬුවම.

**284.** තහනමක් නිකුත් කිරීමට නීත්‍යානුකූල බලය ඇති රජයේ සේවකයකු විසින් යම් මහජන කරදරයක් නැවත කිරීම හෝ දිගටම ගෙන යාම, නො කරන ලෙස නියම කරනු ලැබීමෙන් පසුත් එය නැවත කරන හෝ දිගට ම ගෙන යන තැනැත්තකුට හය මාසය දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

නතර කිරීමට තහනමක් කිරීමෙන් පසු කරදරය දිගටම ගෙන යාම.

**285.** අසභ්‍ය පොතක්, පත්‍රිකාවක්, පත්‍රයක්, ඇඳීමක්, චිත්‍රයක්, ඡායාරූපයක්, නිරූපණයක් හෝ රූපයක් විකුණන, බෙදා හරින, පිට රටින් ගෙන්වන හෝ විකිණීම හෝ කුලියට දීම සඳහා මුද්‍රණය කරන හෝ ඕනෑවට ම මහජන දර්ශනයට තබන හෝ එලෙසක් කිරීමට තැත් කරන හෝ ඉදිරිපත් වන තැනැත්තකුට තුන් මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

අසභ්‍ය පොත් විකිණීම ආදිය.

**286.** විකිණීම, බෙදා හැරීම හෝ මහජන ප්‍රදර්ශනය සඳහා ඉහතින් වූ වගන්තියෙහි සඳහන් අන්දමේ අසභ්‍ය පොතක් හෝ වෙනත් දෙයක් තම ස්වාමිත්වයෙහි තබා ගන්නා තැනැත්තකුට මාස තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

විකිණීම හෝ මහජන ප්‍රදර්ශනය සඳහා අසභ්‍ය පොත් ආදිය ස්වාමිත්වයෙහි තබා ගැනීම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

අසභ්‍ය ගීත.

**287.** යම් ප්‍රසිද්ධ ස්ථානයක දී හෝ එබඳු ස්ථානයක් අසළ දී අන් තැනැත්තන්හට අප්‍රසන්නතාවයක් වන සේ යම් අසභ්‍ය ගීයක් හෝ ගීතිකාවක් හෝ වචන ගයන හෝ තාලයට කියන හෝ ප්‍රකාශ කරන තැනැත්තකුට මාස තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

**288.** (1), (2) 1944 අංක 6 දරන ආඥාපනතින් අවලංගු කරන ලදී.

ව්‍යවස්ථාපිත යුතුකමක් ඕනෑවටම නොකර හැරීම.

**289.** මෙතෙක් හෝ මීට පසු පනවනු ලැබූ යම් ආඥාපනතකින් හෝ නීතියකින් තමා වෙත පැවරුණු යම් යුතුකමක් ඕනෑවට ම නො සලකා හරින හෝ නොකර හරින නැතහොත් එබඳු ආඥාපනතක හෝ නීතියක විධිවිධාන ඕනෑවට ම නො පිළිපදින හෝ කඩ කරන තැනැත්තකුට, එ බඳු නොසළකා හැරීමකට නොකර හැරීමකට නො පිළිපැදීමකට හෝ කඩ කිරීමකට මේ සංග්‍රහයෙන් හෝ වෙනත් ආඥාපනතකින් හෝ නීතියකින් දඬුවමක් විශේෂයෙන් ම සඳහන් කොට නො මැති විටක දී, දඩයකින් දඬුවම් කළ යුතු ය.

## XV වෙනි පරිච්ඡේදය

### ආගම පිළිබඳ වූ වැරදි

යම් පංතියක ආගමට නින්දාවක් කරන අදහසින් පූජනීය ස්ථානයක් අශුද්ධ කිරීම හෝ එයට පාඩුවක් කිරීම.

**290.** යම් පංතියක තැනැත්තන්ගේ ආගමට නින්දවක් කරන අදහසින් හෝ විනාශ කිරීම, හානි කිරීම හෝ අශුද්ධ කිරීම යම් පංතියක තැනැත්තන් විසින් තමන්ගේ ආගමට කරන ලද නින්දාවක් ලෙස සලකනු ලැබිය හැකි බව දනිමින් ම, යම් පංතියක තැනැත්තන් විසින් ශුද්ධ ලෙස සලකනු ලබන පූජනීය ස්ථානයක් හෝ ද්‍රව්‍යයක් යමකු විනාශ කරතහොත් හෝ එබන්දකට හානි කරතහොත් හෝ අශුද්ධ කරතහොත් ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

යම් පංතියක ආගමට නින්ද කිරීමේ අදහසින් පූජනීය ස්ථාන ආදිය සම්බන්ධයෙන් වන ක්‍රියා.

**290අ.** යම් පංතියක තැනැත්තන්ගේ ආගමික හැඟීම්වලට රිදවීමේ අදහසින් හෝ තම ආගමට නින්දාවක් ලෙස යම් ක්‍රියාවක් යම් පංතියක තැනැත්තන් විසින් සලකනු ලැබිය හැකි බව දනිමින් ම, යම් පංතියක තැනැත්තන් විසින් ශුද්ධ ලෙස හෝ ගෞරවනීය ලෙස සලකන යම් පූජනීය ස්ථානයකට හෝ ද්‍රව්‍යයකට එය තුළ හෝ එය මත හෝ එය අසළ යම් ක්‍රියාවක් කරන තැනැත්තකුට අවුරුද්දක් දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

ආගමික රැස්වීමකට බාධා කිරීම.

**291.** ආගමික වැඳුම් පිදුම් කිරීමක හෝ ආගමික පූජාවන්හි නීති ප්‍රකාර යෙදී සිටින යම් රැස්වීමකට කැමැත්තෙන් ම බාධා කරන තැනැත්තකුට අවුරුද්ද දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**291අ.** යම් තැනැත්තකුගේ ආගමික හැඟීම්වලට රිදවීමේ ඒකාන්ත අදහසින් එකී තැනැත්තාට ඇසෙන ලෙස යමකු යම් වචනයක් කියතොත් හෝ ශබ්දයක් කළහොත් හෝ එකී තැනැත්තාට පෙනෙන පරිදි යම් සංඥාවක් කරතොත් හෝ එකී තැනැත්තා අභිමුඛයෙහි යම් ද්‍රව්‍යයක් තබතොත් ඔහුට අවුරුද්ද දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

ආගමික හැඟීම්වලට රිදවීමේ ඒකාන්ත අදහසින් වචන ආදිය කීම.

**291ආ.** මහ රජතුමාණන්ගේ යටත් වැසියන් පංතියක ආගමික හැඟීම් කෙලෙසීම සඳහා ඒකාන්ත හා ද්වේෂ සහගත අදහසින් භාෂිත හෝ ලිඛිත වචනයෙන් හෝ දැකිය හැකි නිරූපණවලින් එකී පංතියේ ආගමට හෝ ආගමික විශ්වාසවලට නින්ද කරන හෝ නින්ද කිරීමට තැත් කරන තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

යම් පංතියක ආගමට හෝ ආගමික විශ්වාසවලට නින්ද කිරීමෙන් එකී පංතියේ ආගමික හැඟීම් කෙලසීම අදහස් කොට ඒකාන්තයෙන් කරනු ලැබූ ද්වේශ සහගත ක්‍රියා.

**292.** යම් තැනැත්තකුගේ හැඟීම්වලට රිදවනු පිණිස හෝ යම් තැනැත්තකුගේ ආගමට නින්ද කිරීම පිණිස හෝ යම් තැනැත්තකුගේ හැඟීම්වලට රිදවිය හැකි බව හෝ යම් තැනැත්තකුගේ ආගමට නින්ද විය හැකි බව දනිමින් ම යම් වැඳුම් පිදුම් කරන ස්ථානයකට හෝ සොහොන් භූමියකට හෝ අවමංගල චාරිත්‍ර පැවැත්වීම සඳහා හෝ මිය ගිය තැනැත්තන් තැන්පත් කිරීම සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයකට බලෙන් යමකු ඇතුළු වෙතොත් හෝ මළකඳට අගෞරවයක් කරතොත්, හෝ අවමංගල චාරිත්‍ර ඉෂ්ට කිරීම සඳහා රැස් වී සිටින තැනැත්තන් හට බාධා කරතොත්, ඔහුට අවුරුද්ද දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

සොහොන් භූමි ආදියට බලෙන් ඇතුළු වීම.

## XVI වෙනි පරිච්ඡේදය

### මනුෂ්‍ය ශරීරය සම්බන්ධ වැරදි හා ජීවිතය සම්බන්ධ වැරදි

**293.** මරණය සිදු කිරීමේ අදහසින් හෝ මරණය සිදුවිය හැකි අන්දමේ ශාරීරික පාඩුවක් සිදු කිරීමේ අදහසින්, හෝ තමා කරන යම් ක්‍රියාවකින් මරණයවීමට ඉඩ ඇති බව දනිමින් ම යම් ක්‍රියාවක් කිරීමෙන් මරණය සිදු කරන තැනැත්තෙක් සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය කිරීමේ වරද සිදු කරයි.

සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය.

**නිදර්ශන**

(අ) මරණය සිදු කිරීමේ අදහසින් හෝ මරණය සිදුවීමට ඉඩ ඇති බව දනිමින් ම "ඒ" කෝටු සහ තණ පිඩැලි වළක් මත දමයි. බිම ස්ථිරය යන විශ්වාසයෙන් "ඉසෙඩ්" එය පාගා යාමෙන් වැටී මිය යයි. "ඒ" සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය කිරීමේ වරද කර ඇත්තේ ය.

(ආ) "ඉසෙඩ්" පඳුරක් පිටිපස සිටින බව "ඒ" දනියි "බී" එය නො දනියි "ඉසෙඩ්" ගේ මරණය සිදු කිරීමේ අදහසින් හෝ "ඉසෙඩ්" ගේ මරණය සිදුවීමට ඉඩ ඇති බව දනිමින් ම "ඒ" පඳුරට වෙඩි තබන ලෙස "බී" පොළඹවයි. "බී" වෙඩි තබා "ඉසෙඩ්" මරයි මෙහි දී "බී" කිසි වරදකට වරදකාරයා විය නොහැකි නමුත්, "ඒ" සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය කිරීමේ වරද කර ඇත්තේ ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

(ඇ) කුකුළකු මරා සොරකම් කිරීමේ අදහසින්, කුකුළාට වෙඩි තබන "ඒ" පඳුරක් පිටිපස "බී" සිටින බව නො දැන, ඉන් "බී" මරයි. "බී" මැරීමට හෝ මරණය සිදුවීමට ඉඩ ඇති ක්‍රියාවක් යි තමා දන්නා වූ ක්‍රියාවක් කොට මරණය සිදු කිරීමට "ඒ" අදහස් නො කළ බැවින්, ඔහු කළ ක්‍රියාව නීති විරෝධී ක්‍රියාවක් වුව ද, මෙහි දී ඔහු සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය කිරීමේ වරදට වරදකාරයා නොවේ.

**පැහැදිලි කිරීම 1.**-ආබාධයකින් හෝ රෝගයකින් හෝ කායික දුර්වලතාවයකින් පෙළෙන තැනැත්තකුට ශාරීරික පාඩුවක් කිරීමෙන් එකී තැනැත්තාගේ මරණය ඉක්මන් කරන තැනැත්තකු ඔහුගේ මරණය සිදු කළ ලෙස සැලකිය යුතු ය.

**පැහැදිලි කිරීම 2**-ශාරීරික පාඩුවකින් මරණය සිදු කළ අවස්ථාවක දී, නිසි ඖෂධ හා දක්ෂ ප්‍රතිකාර කිරීමෙන් ඒ මරණය වැළැක්විය හැකිව තිබුණේ වී නමුත්, එකී ශාරීරික පාඩුව කළ තැනැත්තා මරණය සිදු කළ ලෙස සැලකිය යුතු ය.

**පැහැදිලි කිරීම 3.**-මවගේ ගර්භයෙහි දී, දරුවකුගේ මරණය සිදු කිරීම මනුෂ්‍ය ඝාතනයක් නො වේ. එහෙත්, දරුවා හුස්ම නො ගෙන ඇතත් හෝ සම්පූර්ණයෙන් ම නො ඉපදුනත් එකී දරුවාගේ යම් කොටසක් පිටතට ගෙන තිබුණු විටෙක පණ ඇති දරුවකුගේ මරණය සිදු කිරීම සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් බවට පත් විය හැකි ය.

මිනී මැරුම.

**294.** මෙහි දී මින්මතු බැහැර කරනු ලැබූ අවස්ථාවල දී හැර පහත දැක්වෙන පරිදි වුවහොත්, සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය මිනී මැරුමක් වේ. එනම් :-

**පළමු වනු ව.**-මරණය සිදු කළ ක්‍රියාව මරණය සිදු කිරීමේ අදහසින් කරනු ලැබුවක් වීම; හෝ

**දෙ වනු ව.**-පීඩාව සිදු කරනු ලැබූ තැනැත්තාගේ මරණය සිදුවිය හැකි අන්දමේ ශාරීරික පාඩුවක් බව වරදකරු දන්නා වූ පාඩුවක් කිරීමේ අදහසින් එය කරනු ලැබීම; හෝ

**තෙ වනු ව.**-ශාරීරික පාඩුව යම් තැනැත්තකුට කිරීමේ අදහසින් එය කරනු ලැබ, එසේ කිරීමට අදහස් කරනු ලැබූ ශාරීරික පාඩුව ස්වභාවික කටයුතු අතර දී මරණය සිදු කිරීමට ප්‍රමාණවත් වීම ; හෝ

**හතර වනු ව.**-අන්තරාය කොපමණ ආසන්න ද කිවහොත් සෑම අතින් ම මරණය සිදුවිය හැකි බව හෝ මරණය සිදුවිය හැකි ශාරීරික පාඩුව විය හැකි බව ක්‍රියාව කරන්නා දැන ගෙන සිටිමින් ම මරණය සිදු කිරීමේ හෝ ඉහත කී ලෙස පාඩුවක් සිදු කිරීමේ අවදානමට මුහුණපෑමට සමාව දිය හැකි හේතුවක් නොමැති ව ම, එකී ක්‍රියාව කිරීම.

**නිදර්ශනය**

(අ) "ඉසෙඩ්" මැරීමේ අදහසින් "ඒ" ඔහුට වෙඩි තබයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් "ඉසෙඩ්" මිය යයි. "ඒ" මිනීමැරුමක් සිදු කරයි.

(ආ) පහරකින් මරණය සිදුවීමට ඉඩ ඇති රෝගයකින් "ඉසෙඩ්" පෙළෙන බව "ඒ" දනිමින් ම ඔහුට ශාරීරික පාඩුවක් කිරීමේ අදහසින් "ඒ" "ඉසෙඩ්" ට පහර දෙයි. එම පහරෙහි ප්‍රතිඵලයක් වශයෙන් "ඉසෙඩ්" මිය යයි. යහපත් සෞඛ්‍ය තත්ත්වයක සිටින තැනැත්තකුගේ මරණය ස්වභාවික තත්ත්වයක දී සිදු කිරීමට එකී පහර ප්‍රමාණවත් නො වන නමුදු "ඒ" මිනීමැරුම ගැන වරදකාරයෙක් වේ. එහෙත්, එබඳු රෝගයකින් "ඉසෙඩ්" පෙළෙන බව "ඒ" නො දැන යහපත් සෞඛ්‍ය තත්ත්වයක සිටින තැනැත්තකු ස්වභාවික තත්ත්වයක දී මැරීමට



https://ezofz.web.lk/
Scanned with CamScanner

ප්‍රමාණවත් නොවූ පහරක් දුන් විටෙක දී, "ඒ" ශාරීරික පාඩුවක් සිදු කිරීමට අදහස් කළ නමුදු මරණය හෝ ස්වාභාවික තත්ත්වයක දී මරණය සිදු කරන ශාරීරික පාඩුවක් කිරීමට අදහස් නො කළේ නම්, "ඒ" මිනීමැරුම ගැන වරදකාරයෙක් නොවේ.

(ඈ) ස්වාභාවික තත්ත්වයක දී මිනිසකුගේ මරණය සිදු කිරීමට ප්‍රමාණවත් වූ කඩුවකින් කැපීමක් හෝ පොල්ලකින් තුවාලයක් "ඒ" ඕනෑකමින් ම "ඉසෙඩ්" ට කරයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් "ඉසෙඩ්" මිය යයි. "ඒ" "ඉසෙඩ්" ගේ මරණය සිදු කිරීමට අදහස් නොකළ නමුදු මෙහි දී "ඒ" මිනීමැරුම ගැන වරදකාරයෙක් වේ.

(ඇ) "ඒ" කිසි සමාවේ හේතුවක් නොමැති ව වෙඩි බෙහෙත් යොදනු ලැබූ තුවක්කුවකින් මිනිසුන් සමූහයකට වෙඩි තබා ඉන් එකකු මරයි. යම් විශේෂ තැනැත්තකු මැරීමට "ඒ" විසින් කල් තබා කල්පනා කරනු ලැබූ අරමුණක් ඔහුට නැතත් "ඒ" මිනීමැරුම ගැන වරදකාරයෙක් වේ.

**ව්‍යතිරේකය 1.**–බරපතළ වූත්, හදිසි වූත්, ප්‍රකෝප කිරීමක් නිසා ආත්ම දමනය කිරීමේ බලය නොමැති ව සිටින විට, තමා ප්‍රකෝප කර වූ තැනැත්තාගේ මරණය හෝ වැරදීමකින් හෝ අහම්බෙන් වෙන තැනැත්තකුගෙ මරණය වරදකරු විසින් සිදු කරනු ලැබුවහොත් සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය මිනීමැරුමක් නො වේ.

මනුෂ්‍ය ඝාතනයක් මිනීමැරුමක් නො වන අවස්ථා.

ඉහත කී ව්‍යාතිරේකය පහත දැක්වෙන අතුරු විධානවලට යටත් වේ.

**පළමු වනු ව.**–ප්‍රකෝප කරවීම කෙනකුගේ මරණය සිදු කිරීම සඳහා හෝ කෙනකුට පීඩාවක් කිරීම සඳහා සමාවේ හේතුවක් වශයෙන් සොයා ගිය දෙයක් හෝ කැමැත්තෙන් ම ප්‍රකෝප කරනු ලැබුවක් නො විය යුතු ය.

**දෙ වනු ව.**–ප්‍රකෝප කරවීම නීතිය පිළිපැදීමක් වශයෙන් කරනු ලැබුවකින් හෝ රජයේ සේවකයකුගේ බලතල නීත්‍යනුකූලව පාවිච්චි කිරීමේ දී, රජයේ සේවකයකු විසින් කරනු ලැබූ යමකින් වූවක් නො විය යුතු ය.

**තුන් වනු ව.**–ප්‍රකෝප කරවීම ආත්මාරක්ෂාවේ බලය නීත්‍යනුකූලව පාවිච්චි කිරීමේ දී, කරනු ලැබූ යමකින් වූවක් නො විය යුතු ය.

**පැහැදිලි කිරීම.**–වරද මිනීමැරුමක් නො වීමට තරම් එම ප්‍රකෝප කරවීම බරපතළ ද, හදිසි ද, යන්න සිද්ධිය පිළිබඳ ප්‍රශ්නයකි.

**නිදර්ශන**

(අ) "ඉසෙඩ්" විසින් කරනු ලැබූ ප්‍රකෝප කිරීමකින් කෝපය ඇවිස්සුණු "ඒ" ඕනෑකමින් ම "ඉසෙඩ්" ගේ දරුවකු වූ "වයි" මරයි. ප්‍රකෝප කරවීම ළමයා විසින් කරනු නො ලැබූ නිසා ද එකී ප්‍රකෝප කරවීමෙන් සිදු කරනු ලැබූ ක්‍රියාව කිරීමේ දී අහම්බෙන් හෝ අවාසනාවෙන් ළමයාගේ මරණය සිදු නො වූ නිසා ද මෙය මිනී මැරුමක් වේ.

(ආ) "වයි" "ඒ" ට බරපතළ වූත්, හදිසි වූත් ප්‍රකෝප කරවීමක් කරයි. මේ ප්‍රකෝප කරවීම නිසා තමාට නො පෙනෙන නමුදු තමා ළඟ සිටි "ඉසෙඩ්" මැරීමට අදහස් නොකර හෝ ඉන් "ඉසෙඩ්" මැරෙන්නට ඉඩ ඇති බව නො දැන ම "ඒ" "වයි" ට පිස්තෝලයකින් වෙඩි තබයි. "ඒ" "ඉසෙඩ්" මරයි. මෙහිදී "ඒ" මිනීමැරුමක් සිදුකොට නැත. සිදු කොට ඇත්තේ සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් පමණකි.



https://ezofz.web.lk/
Scanned with CamScanner

(ඇ) පිස්කල් නිලධාරියකු වූ "ඉසෙඩ්" විසින් නීත්‍යානුකූලව "ඒ" සිරභාරයට ගනු ලැබේ. සිරභාරයට ගැනීම නිසා හදිසි වූත්, බලවත් වූත්, කෝපයකින් ඇවිස්සුණු "ඒ" "ඉසෙඩ්" මරයි. රජයේ සේවකයකු විසින් තමාගේ බලතල පාවිච්චි කිරීමේ දී කරනු ලැබූ යමකින් වූ ප්‍රකෝප කරවීමක් නිසා මෙය මිනීමැරුමක් වේ.

(ඈ) සුලු අපරාධ විනිශ්චයකරුවකු වූ "ඉසෙඩ්" ඉදිරිපිට සාක්ෂිකරුවකු වශයෙන් "ඒ" පෙනී සිටියි. "ඒ" ගේ සාක්ෂිය වචනයකුදු විශ්වාස නො කරන බව ද, "ඒ" බොරු සාක්ෂි දී තිබෙන බව ද, "ඉසෙඩ්" කියයි. මේ වචනවලින් "ඒ" ට ක්ෂණික කෝපයක් හට ගැනීමෙන් ඔහු "ඉසෙඩ්" මරයි. මෙය මිනීමැරුමක් වේ.

(ඉ) "ඒ" "ඉසෙඩ්" ගේ නාසය ඇදීමට තැත් කරයි "ඉසෙඩ්" ආත්මාරක්ෂාවේ බලය පාවිච්චි කිරීමේ දී, එසේ නාසය ඇදීම වලක්වනු පිණිස "ඒ" අල්ලා ගනියි. මෙයින් හදිසි දරුණු කෝපයට පත් "ඒ" "ඉසෙඩ්" මරයි. ආත්මාරක්ෂාවේ බලය පාවිච්චි කිරීමේ දී කරනු ලැබූ යමක් නිසා වූ මෙය ප්‍රකෝප කිරීමක් බැවින් මෙය මිනීමැරුමක් වේ.

(ඊ) "ඉසෙඩ්" "බී" ට ගසයි. මේ ප්‍රකෝප කිරීමෙන් "බී" ට දරුණු කෝපයක් හට ගනියි. අසල සිටි "ඒ" "බී" ගේ කෝපයෙන් ප්‍රයෝජනය ගෙන ඔහු ලවා "ඉසෙඩ්" මැරවීමේ අදහසින් එම කාර්යය සඳහා "බී" ගේ අතට පිහියක් දෙයි. "බී" පිහියෙන් "ඉසෙඩ්" මරයි. මෙහි දී "බී" සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය සිදු කරන්නට ඇති නමුදු ඒ මිනීමැරුම ගැන වරදකාරයෙක් වේ.

**ව්‍යතිරේකය 2.**–තම ශරීරය හෝ දේපළ ආරක්ෂා කිරීමේ පුද්ගලික අයිතිය සද්භාවයෙන් පාවිච්චි කිරීමේ දී, වරදකරුවෙක් කල් තබා කල්පනා කිරීමක් හා එලෙස ආරක්ෂා කිරීමේ කාර්යයට අවශ්‍ය ප්‍රමාණයට වැඩි හානියක් කිරීමේ අදහසක් නොමැති ව යමකු ට විරුද්ධව තමාට නීතියෙන් දී තිබෙන බලයට වැඩි වන ලෙස ආරක්ෂා කිරීමේ බලය පාවිච්චි කළේ නම්, එකී තැනැත්තාගේ මරණය සිදු කරනු ලැබූ අවස්ථාවක දී වූ සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය මිනීමැරුමක් නො වේ.

**නිදර්ශනය**

"ඒ" ට බරපතළ තුවාළ සිදු නො වන ආකාරයකට ඔහුට කසයකින් තැළීමට "ඉසෙඩ්" තැත් කරයි. "ඒ" පිස්තෝලයක් අදියි. "ඉසෙඩ්" පහර දීම නො නවත්වා ම ගෙන යයි. තමාට කසයකින් තලනු ලැබීම වැලැක්වීම සඳහා අන්කිසි මාර්ගයක් නොමැති බව සද්භාවයෙන් "ඒ" විශ්වාස කරමින් "ඉසෙඩ්" ට මැරෙන්නට වෙඩි තබයි. "ඒ" මිනීමැරුමක් සිදු කොට නැත්තේ ය. සිදු කොට ඇත්තේ සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් පමණකි.

**ව්‍යතිරේකය 3.**–වරදකරු රජයේ සේවකයෙකු ව, නැතහොත් මහජන යුක්තිය ඉෂ්ට කිරීමේ යෙදී සිටින රජයේ සේවකයකුට ආධාර වන තැනැත්තකු ට තමාට නීත්‍යානුකූලව දී තිබෙන බලතලවලට අතිරේකව ක්‍රියාකිරීමෙන් හා මරණය සිදු කරන ලැබූ තැනැත්තා කෙරෙහි ද්වේශයක් නොමැති ව තමාගේ යුතුකම හරියාකාර ඉෂ්ට කිරීම සඳහා නීත්‍යානුකූල වූත්, අවශ්‍ය වූත්, ක්‍රියාවක් යයි සද්භාවයෙන් තමා විශ්වාස කරනු ලබන ක්‍රියාවක් කිරීමෙන් මරණය සිදු කළහොත්, ඒ සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය මිනීමැරුමක් නො වේ.

**ව්‍යතිරේකය 4.**–හදිසි සටනක හදිසි දබරයක දී කෝපය ඇවිස්සුණු අවස්ථාවක දී කල් තබා කල්පනා කිරීමක් නො කර වරදකරු අනිසි වාසියක් නො ලබා හෝ කෲර ලෙස හෝ අස්වාභාවික ලෙස ක්‍රියා නො කොට මරණය සිදු කරනු ලැබුවේ නම්, ඒ සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය මිනීමැරුමක් නො වේ.

**පැහැදිලි කිරීම.**–ප්‍රකෝප කිරීම සිදු කරනු ලබන්නේ හෝ ප්‍රථම පහරදීම කරනු ලබන්නේ කිනම් පාර්ශ්වය විසින් ද යන්න එබඳු අවස්ථාවල දී සැලකිය යුතු නො වේ.

**ව්‍යතිරේකය 5.**–වරදකරු මාස දොළහට අඩු දරුවකුගේ මවක ව, දරු ප්‍රසූතියේ වෙහෙසින් සම්පූර්ණ සුවය නො ලැබීම නිසා හෝ දරු ප්‍රසූතියේ ප්‍රතිඵලය වශයෙන් ඇති වූ කිරි දීමේ වෙහෙස නිසා ඇගේ මානසික තත්ත්වය චංචල වීමෙන් ඇය දරුවා මරණයට පත් කරන ලද නම් ඒ සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය මිනීමැරුමක් නො වේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**295.** මරණය සිදු කිරීමට අදහස් කරනු නො ලැබූ හෝ මරණය සිදු කරනු ලබතැයි තමා නොදන්නා වූ යම් තැනැත්තකුගේ මරණය සිදු කිරීමට අදහස් කරනු ලැබූ හෝ මරණය සිදු වෙතැ යි තමා දන්නා වූ යමක් කිරීමෙන් යම් තැනැත්තකු සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් සිදු කළහොත්, එකී වරදකරු විසින් කරනු ලැබූ සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය තමා අදහස් කරනු නො ලැබූ හෝ තමා මරණය සිදු කිරීමට වෙතැ යි දන්නා වූ තැනැත්තකුගේ මරණය සිදු කළ අන්දමේ විස්තරයකට අයත් වේ.

මරණය සිදු කිරීමට අදහස් කරනු ලැබූ තැනැත්තාගේ නොව අන් තැනැත්තකුගේ මරණය සිදු කිරීමෙන් වන සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය.

**296.** මිනීමැරුම සිදු කරන තැනැත්තකුට මරණීය දඬුවමින් දඬුවම් කළ යුතු ය.

මිනී මැරුම ගැන දඬුවම.

**297.** මරණය සිදු කළ ක්‍රියාව මරණය සිදු කිරීමේ අදහසින් හෝ මරණය සිදු විය හැකි ශාරීරික පාඩුවක් සිදු කිරීමේ අදහසින් කරන ලද්දක් වූ අවස්ථාවක දී, මිනීමැරුමක් නොවන සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් කරන තැනැත්තකුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

මිනී මැරුමක් නොවන සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය ගැන දඬුවම.

එකී ක්‍රියාව මරණය සිදු කිරීමේ හෝ මරණය සිදු විය හැකි ශාරීරික පාඩුවක් කිරීමේ අදහසක් නොමැතිව, මරණය සිදුවිය හැකි ය යන දැනුමෙන් කරන ලද්දක් වූ අවස්ථාවක දී අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම එම තැනැත්තාට දඬුවම් කළ යුතු ය.

**298.** සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් නොවන අපරික්ෂාකාරී හෝ නො සැලකිලිමත් ක්‍රියාවක් කිරීමෙන් යමකුගේ මරණය සිදු කරන තැනැත්තකුට අවුරුදු පහ දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

නො සැලකිලිමත්කමින් මරණය සිදු කිරීම.

**299.** යම් තැනැත්තකු සිය පණ හානි කර ගනු ලැබුවහොත්, එකී සිය පණ හානි කර ගැනීමේ ක්‍රියාවට අනුබල දෙන තැනැත්තකුට මරණීය දඬුවමින් දඬුවම් කළ යුතු ය.

සිය පණ හානි කර ගැනීමට අනුබල දීම.

**300.** යම් අදහසකින් හෝ දැනුමකින් හා යම් අවස්ථා යටතේ යම් ක්‍රියාවකින් මරණය සිදු කරන ලද නම් යම් තැනැත්තකු මිනීමැරුමට වරදකාරයකු වෙතොත්, එබඳු ක්‍රියාවක් කරන තැනැත්තකුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. එබඳු ක්‍රියාවකින් යම් තැනැත්තකුට තුවාල වී නම්, වරදකරුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

මිනී මැරුමට තැත් කිරීම.

**නිදර්ශනය**

(අ) මරණය සිදු වුවහොත් "ඒ" මිනීමැරුමට වරදකාරයකු වන අන්දමේ අවස්ථාවක දී "ඉසෙඩ්" මැරීමේ අදහසින් "ඒ" "ඉසෙඩ්" ට වෙඩි තබයි. "ඒ" මේ වගන්තිය යටතේ දඬුවමකට යටත් වේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

(ආ) බාල වයස් වූ දරුවකුගේ මරණය සිදු කිරීමේ අදහසින් "ඒ" ඔහු පාලු පෙදෙසක දමයි. දරුවාගේ මරණය සිදු නො වුව ද, මේ වගන්තියෙන් විස්තර කරනු ලැබූ වරද "ඒ" කර ඇත.

(ඇ) "ඒ" "ඉසෙඩ්" මැරීමේ අදහසින් තුවක්කුවක් මිලයට ගෙන වෙඩි බෙහෙත් පුරවයි. "ඒ" මෙතෙක් වරද කර නැත. "ඒ" "ඉසෙඩ්" ට තුවක්කුවෙන් වෙඩි තබයි. ඔහු මේ වගන්තියෙහි විස්තර කරනු ලැබූ වරද කර ඇත. තව ද එලෙස වෙඩි තැබීමෙන් "ඉසෙඩ්" ට තුවාළ වුවහොත්, මේ වගන්තියෙහි අග කොටසෙහි සඳහන් දඬුවමට ඔහු යටත් වේ.

(ඈ) "ඉසෙඩ්" වස දී මැරීමේ අදහසින් "ඒ" වස මිලයට ගෙන "ඒ" භාරයේ තිබෙන ආහාර සමග මිශ්‍ර කරයි. මේ වගන්තියෙන් විස්තර කරනු ලැබූ වරද මෙතෙක් "ඒ" කර නැත. "ඒ" එකී ආහාර "ඉසෙඩ්" ගේ මේසය මත තබයි. නැතහොත් එය "ඉසෙඩ්" ගේ මේසය මත තැබීමට ඔහුගේ සේවකයන්හට බාර දෙයි. මේ වගන්තියෙහි විස්තර කරනු ලැබූ වරද "ඒ" කර ඇත.

සාපරාධී මනුෂ්‍ය ඝාතනය කිරීමට තැත් කිරීම.

**301.** යම් අදහසකින් හෝ දැනුමකින් හා යම් අවස්ථා යටතේ යම් ක්‍රියාවකින් මරණය සිදු කරන ලද නම් යම් තැනැත්තකු මිනීමැරුමක් නොවන සාපරාධී මනුෂ්‍ය ඝාතනය ගැන වරද කාරයකු වෙතොත් එබඳු ක්‍රියාවක් කරන තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය. එබඳු ක්‍රියාවකින් යම් තැනැත්තකුට තුවාළ වුවහොත්, ඔහුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

### නිදර්ශනය

මරණය සිදු කළහොත්, මිනීමැරුමක් නො ව සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් ගැන වරදකාරයකු වන අන්දමේ අවස්ථාවක දී, බරපතළ වූත්, හදිසි වූත්, ප්‍රකෝප කිරීමක් නිසා "ඒ" "ඉසෙඩ්" ට පිස්තෝලයකින් වෙඩි තබයි. මේ වගන්තියේ විස්තර කරනු ලැබූ වරද "ඒ" කර ඇත.

සිය පණ හානිකර ගැනීමට තැත් කිරීම.

**302.** යම් තැනැත්තකු සිය පණ හානි කර ගැනීමට තැත් කරතොත් හා ඒ වරද සිදුකිරීම සඳහා යම් ක්‍රියාවක් කරතොත්, ඔහුට අවුරුද්ද දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

## ගබ්සා කිරීම හෝ නූපන් දරුවන්ට පාඩුකිරීම, ළදරුවන් අත්හැරයාම හා දරු උපත් සැඟවීම

ගබ්සා කිරීම.

**303.** ස්ත්‍රීන්ගේ ජීවිතය බේරීමේ කාර්යය සඳහා සද්භාවයෙන් කරනු ලබන ගබ්සා කිරීමක් නො වන ගබ්සා කිරීමක්, ගැබ් ගත් ස්ත්‍රියකට, කැමැත්තෙන් ම සිදු කරන තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය. තව ද එකී ස්ත්‍රිය දරු ප්‍රසූතියට ආසන්නව සිටිය දී නම් ඔහුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

පැහැදිලි කිරීම.-තමාම ගබ්සා කර ගනු ලබන ස්ත්‍රියක් මේ වගන්තියේ අර්ථයට ඇතුළත් වේ.

**304.** ස්ත්‍රියක දරු ප්‍රසූතියට ආසන්නව සිටිය දී හෝ නො සිටිය දී ඇයගේ කැමැත්ත නොමැතිව ඉහත කී වගන්තියේ විස්තර කරනු ලැබූ වරද කරන තැනැත්තකුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

ස්ත්‍රියකගේ කැමැත්ත නො මැතිව ගබ්සා කිරීම.

**305.** ගැබ් ගත් ස්ත්‍රියකට ගබ්සා කිරීමේ අදහසින් එකී ස්ත්‍රියගේ මරණය සිදු කරන යම් ක්‍රියාවක් කරන තැනැත්තකුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

ගබ්සා කිරීමේ අදහසකින් කරනු ලැබූ ක්‍රියාවකින් සිදු වූ මරණය.

පැහැදිලි කිරීම.-වරදකරු විසින් එකී ක්‍රියාවෙන් මරණය සිදුවීමට ඉඩ ඇති බව දැන ගනු ලැබීම මේ වරද සඳහා අත්‍යාවශ්‍ය නොවේ.

**306.** දරුවකු ඉපදීමට පෙර ඒ දරුවා පණ ඇතිව ඉපදීම වැළැක්වීමේ හෝ එම දරුවා ඉපදීමෙන් පසු, ඔහුගේ මරණය සිදු කිරීමේ අදහසින් යමකු යම් ක්‍රියාවක් කරනු ලැබ, එකී ක්‍රියාව පණ ඇතිව දරුවාගේ ඉපදීම වළක්වතොත් හෝ දරුවා ඉපදීමෙන් පසු ඔහුගේ මරණය සිදුකරතොත්, ඔහු විසින් එකී ක්‍රියාව මවගේ ජීවිතය ගැලවීමේ කාර්යය සඳහා සද්භාවයෙන් කරන ලද්දක් නොවේ නම්, ඔහුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

දරුවකු පණ ඇතිව ඉපදීම වැළැක්වීමේ හෝ ඉපදීමෙන් පසු මරණය සිදු කිරීමේ අදහසින් කරනු ලැබූ ක්‍රියාව.

**307.** යම් ක්‍රියාවකින් මරණය සිදු කළහොත්, සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් ගැන වරදකාරයකු වන අන්දමේ අවස්ථාවක දී, යමකු එබඳු ක්‍රියාවක් කොට, ගැබ මේරූ නමුත් නො ඉපදුණු ළදරුවකුගේ මරණය එකී ක්‍රියාවෙන් සිදු කළහොත් ඔහුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් වන ක්‍රියාවකින් ගැබ මේරූ නමුත් නො ඉපදුණු දරුවකුගේ මරණය සිදු කිරීම.

**නිදර්ශනය**

යම් ක්‍රියාවකින් ගැබ් ගත් ස්ත්‍රියකගේ මරණය සිදු වුවහොත් එය සාපරාධී මනුෂ්‍ය ඝාතනයක් වන්නා වූ අන්දමේ ක්‍රියාවක් එම ස්ත්‍රියගේ මරණය සිදුවිය හැකි බව දනිමින් ම "ඒ" කරයි. ස්ත්‍රියට පීඩා වූ නමුත් ඇ නො මැරෙයි. එහෙත් ඇය ගැබ් ගෙන සිටි නො ඉපදුණු දරුවාගේ මරණය ඉන් සිදු විය. මේ වගන්තියෙහි විස්තර කරනු ලැබූ වරදට "ඒ" වරදකාරයෙක් වේ.

**308.** යමකු වයස අවුරුදු දොළහට අඩු දරුවකුගේ පියකු ව, හෝ මවක ව, හෝ භාරකාරයකුව ඒ දරුවා සම්පූර්ණයෙන් ම අතහැර දැමීමේ අදහසින් යම් ස්ථානයක බැහැරලූවොත්, හෝ අතහැර දමා ගියහොත් ඔහුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

වයස අවුරුදු දොළහට අඩු දරුවකු මව්පියකු හෝ භාරව සිටින තැනැත්තකු විසින් බැහැරලීම හා අතහැර දැමීම.

පැහැදිලි කිරීම.-දරුවා එසේ බැහැරලීමේ ප්‍රතිඵලයක් වශයෙන් මිය ගියහොත්, මිනීමැරුම සඳහා හෝ සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය සඳහා අවස්ථානුකූලව වරදකරුට විරුද්ධව නඩු විභාගයක් පැවැත්වීම වැළැක්වීමට මේ වගන්තියෙන් අදහස් කරනු නො ලැබේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

මළකුණ රහසේ ඉවත් කිරීමෙන් උපත සැඟවීම.

**309.** ඉපදීමට පෙර හෝ උපන් පසු හෝ උපදින වේලෙහි මැරුණු යම් දරුවකුගේ මළකුණ රහසේ වැළලීමෙන් හෝ ඉවත් කිරීමෙන් ඒ දරුවාගේ උපත ඕනෑකමින් ම සඟවන හෝ සැඟවීමට වෙහෙස දරණ තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

### තුවාල කිරීම

තුවාල කිරීම.

**310.** යම් තැනැත්තකුට කායික වේදනාවක්, රෝගයක් හෝ දුර්වලතාවයක් සිදු කරන තැනැත්තා "තුවාල සිදු කළ ලෙස" සලකනු ලැබේ.

බරපතල තුවාල සිදු කිරීම.

**311.** මෙහි පහත දැක්වෙන අන්දමේ තුවාල පමණක් "බරපතල තුවාල ලෙස" හැඳින් වේ :-

**පළමු වනු ව.**–පුරුෂ ශක්තිය නැති කිරීම.

**දෙ වනු ව.**–එක් ඇසක පෙනීම නිත්‍ය ලෙස නැති කිරීම.

**තුන් වනු ව.**–එක් කනක ඇසීම නිත්‍ය ලෙස නැති කිරීම.

**හතර වනු ව.**–යම් අවයවයක් හෝ ග්‍රන්ථියක්, විනාශ කිරීම.

**පස් වනු ව.**–යම් අවයවයක හෝ ග්‍රන්ථියක බලය විනාශ කිරීම හෝ නිත්‍ය ලෙස දුර්වල කිරීම.

**හය වනු ව.**–හිස හෝ මුහුණ නිත්‍ය ලෙස විරූප කිරීම.

**හත් වනු ව.**–ඇටයක් හෝ දතක් බිඳීම හෝ ගැලවීම.

**අට වනු ව.**–ජීවිතය අන්තරාදායක තත්ත්වයකට පමුණුවන්නා වූ හෝ වේදනා විඳින්නා දවස් විස්සක කාලයක් තුළ බරපතළ කායික වේදනාව සිටීමට හේතු වන අන්දමේ හෝ තමාගේ පුරුදු රැකීරක්ෂාවකට යාමට නො හැකි වන අන්දමේ යම් තුවාල සිදු කිරීම.

කැමැත්තෙන්ම තුවාල සිදු කිරීම.

**312.** යම් තැනැත්තකුට තුවාල සිදුකිරීමේ අදහසින් හෝ යම් තැනැත්තෙකුට තුවාල සිදුවිය හැකි ය යන දැනුමෙන් යම් ක්‍රියාවක් කොට ඉන් යම් තැනැත්තකුට තුවාළ සිදු කරන තැනැත්තා "කැමැත්තෙන් ම තුවාල සිදු කළ ලෙස" සලකනු ලැබේ.

කැමැත්තෙන් ම බරපතළ තුවාළ සිදු කිරීම.

**313.** සිදු කිරීමට අදහස් කරනු ලැබුයේ නැතහොත් සිදුවිය හැකි බව දැන සිටියේ බරපතළ තුවාල වූ විට, හා තමා විසින් සිදු කරනු ලැබූ තුවාල බරපතල වූ විට එ ලෙස කැමැත්තෙන් ම තුවාල සිදු කරන තැනැත්තා "කැමැත්තෙන් ම බරපතළ තුවාල සිදු කළ ලෙස" සලකනු ලැබේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**පැහැදිලි කිරීම**.–බරපතල තුවාල සිදු කළ හා බරපතල තුවාල සිදු කිරීමට අදහස් කරනු ලැබූ හෝ බරපතළ තුවාල සිදුවිය හැකි බව දන්නා වූ අවස්ථාවක දී හැර, අන්කිසි අවස්ථාවක දී යම් තැනැත්තකු කැමැත්තෙන්ම බරපතල තුවාළ සිදු කරනු ලැබූ ලෙස සැලකිය යුතු නො වේ. එහෙත්, යම් වර්ගයක බරපතළ තුවාල සිදු කිරීමට යමකු අදහස් කරමින් හෝ එබඳු බරපතළ තුවාල සිදුවිය හැකි බව දනිමින් ඇත්ත වශයෙන් ම වෙනස් වර්ගයක බරපතළ තුවාල සිදු කරනු ලැබූ අවස්ථාවක දී, ඔහු කැමැත්තෙන් ම බරපතළ තුවාළ සිදු කළ ලෙස සලකනු ලැබේ.

**නිදර්ශනය**

"ඉසෙඩ්" ගේ මුහුණ නිත්‍ය ලෙස විරූප කිරීමේ අදහසින් හෝ එ ලෙස ඔහුගේ මුහුණ විරූප විය හැකි බව දනිමින් ම "ඉසෙඩ්" ගේ මුහුණ නිත්‍ය ලෙස විරූප නො වුව ද, විසි දවසක කාලය තුළ බරපතළ කායික වේදනාවෙන් දුක් විඳීමට සිදුවන පහරක් "ඒ" "ඉසෙඩ්"ට ගසයි. "ඒ" කැමැත්තෙන් ම බරපතළ තුවාළ සිදු කර ඇත.

*කැමැත්තෙන් ම තුවාල සිදු කිරීම ගැන දඬුවම.*

**314.** 325 වෙනි වගන්තියෙහි සලස්වා ඇති අවස්ථාවේ දී හැර, අන් සෑම අවස්ථාවක දී කැමැත්තෙන් ම තුවාල සිදු කරන තැනැත්තකු අවුරුද්ද දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් එක් දහස දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

*අන්තරාදායක ආයුධවලින්, ක්‍රමවලින් හෝ කැමැත්තෙන් ම තුවාල සිදු කිරීම.*

**315.** 325 වෙනි වගන්තියේ සලස්වා ඇති අවස්ථාවේ දී හැර, වෙඩි තැබීම, පිහියෙන් ඇනීම හෝ කැපීම සඳහා වූ උපකරණයක මාර්ගයෙන් හෝ පහරදීමේ ආයුධයක් වශයෙන්, පාවිච්චි කළහොත් මරණය සිදු කිරීමට ඉඩ ඇති උපකරණයක මාර්ගයෙන් හෝ ගින්නෙන් හෝ රත් කරනු ලැබූ ද්‍රව්‍යයකින් හෝ විෂ වර්ගයකින් හෝ කා දමන ද්‍රව්‍යයකින් හෝ පුපුරණ ද්‍රව්‍යයකින් හෝ මනුෂ්‍ය ශරීරයට ආශ්වාස කිරීමට, ගිලීමට හෝ ලේ සමග මිශ්‍රවීමට අන්තරාදායක වූ ද්‍රව්‍යයකින් හෝ යම් සතකුගේ මාර්ගයෙන් කැමැත්තෙන්ම තුවාල සිදු කරන යම් තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

*කැමැත්තෙන් ම බරපතල තුවාල සිදු කිරීම ගැන දඬුවම.*

**316.** 326 වෙනි වගන්තියේ සලස්වා ඇති අවස්ථාවේ දී හැර බරපතළ තුවාළ සිදු කරන තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. බරපතළ තුවාල සිදු කරනු ලැබීමට යටත් වූ තැනැත්තා ස්ත්‍රියක් හෝ දරුවෙක් වී නම්, ඔහුට අතිරේකව කස පහර දීමකින් ද දඬුවම් කළ හැකි ය.

*අන්තරාදායක ආයුධවලින් හෝ ක්‍රමවලින් කැමැත්තෙන් ම බරපතළ තුවාල සිදු කිරීම.*

**317.** 326 වෙනි වගන්තියේ සලස්වා ඇති අවස්ථාවේ දී හැර, වෙඩි තැබීම, පිහියෙන් ඇනීම හෝ කැපීම සඳහා වූ උපකරණයක මාර්ගයෙන් හෝ පහරදීමේ ආයුධයක් වශයෙන් පාවිච්චි කළහොත් මරණය සිදු කළ හැකි උපකරණයක මාර්ගයෙන් හෝ ගින්නෙන් හෝ රත් කරනු ලැබූ ද්‍රව්‍යයකින්, විෂ වර්ගයකින් හෝ කා දමන ද්‍රව්‍යයකින් හෝ පුපුරණ ද්‍රව්‍යයකින් හෝ මනුෂ්‍ය ශරීරයට ආශ්වාස කිරීමට, ගිලීමට හෝ ලේ සමග මිශ්‍රවීමට අන්තරාදායක වූ ද්‍රව්‍යයකින් හෝ යම් සතකුගේ මාර්ගයෙන් කැමැත්තෙන්ම බරපතළ තුවාළ සිදු කරන තැනැත්තකුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක



https://ezofz.web.lk/
Scanned with CamScanner

බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. බරපතළ තුවාල සිදු කරනු ලැබීමට යටත් වූ තැනැත්තා ස්ත්‍රියක් හෝ දරුවෙක් වී නම්, ඔහුට අතිරේකව කස පහර දීමකින් ද දඬුවම් කළ හැකි ය.

දේපළ බලෙන් පැහැර ගැනීම සඳහා හෝ නීති විරෝධී ක්‍රියාවක් බලෙන් කරවීම සඳහා කැමැත්තෙන්ම තුවාල සිදු කිරීම

**318.** වේදනා විඳින්නාගෙන් හෝ වේදනා විඳින්නා පිළිබඳ ව සැළකිල්ලක් දක්වන්නකුගෙන් යම් දේපළක් හෝ වටිනා ඇපයක් බලහත්කාරයෙන් පැහැර ගැනීමේ කාර්යය සඳහා හෝ නීති විරෝධී යමක් සිදු කිරීම සඳහා හෝ වරදක් කිරීම පහසු විය හැකි අන්දමේ යම් ක්‍රියාවක් වේදනා විඳින්නා ලවා හෝ වේදනා විඳින්නා කෙරෙහි සැළකිල්ලක් දක්වන්නකු ලවා බලෙන් කරවීමේ කාර්යය සඳහා කැමැත්තෙන් ම තුවාල සිදු කරන තැනැත්තකුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

වරදක් සිදු කිරීමේ අදහසින් වස දීම ආදියෙන් තුවාල සිදු කිරීම.

**319.** යම් තැනැත්තකුට තුවාල සිදු කිරීමේ අදහසින් හෝ වරදක් කිරීමේ අදහසින් හෝ වරදක් කිරීම පහසු කිරීමේ අදහසින් හෝ එයින් තුවාල සිදු විය හැකි බව දනිමින් ම යමකු එකී තැනැත්තාට යම් වසක් හෝ සිහි මුලා කරවන හෝ මත් කරවන හෝ සනීපයට බාධක වූ බෙහෙතක් හෝ වෙනත් දෙයක් දුන හොත්, හෝ ගැන්වුවහොත්, ඔහුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

දේපළක් බලෙන් පැහැර ගැනීම සඳහා හෝ නීති විරෝධී ක්‍රියාවක් බලෙන් කරවීම සඳහා කැමැත්තෙන් ම බරපතල තුවාල සිදු කිරීම.

**320.** වේදනා විඳින්නාගෙන් හෝ වේදනා විඳින්නා පිළිබඳ ව සැළකිල්ලක් දක්වන්නකුගෙන් යම් දේපළක් හෝ වටිනා ඇපයක් බලහත්කාරයෙන් පැහැර ගැනීමේ කාර්යය සඳහා හෝ නීති විරෝධී යමක් හෝ වරදක් කිරීම පහසු විය හැකි අන්දමේ යම් ක්‍රියාවක් වේදනා විඳින්නා ලවා හෝ වේදනා විඳින්නා කෙරෙහි සැළකිල්ලක් දක්වන්නකු ලවා බලෙන් කරවීමේ කාර්යය සඳහා කැමැත්තෙන් ම බරපතළ තුවාල සිදු කරන තැනැත්තකුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට හෝ කසයෙන් තැළීමකට ද යටත් විය යුතු ය.

වරද කියාපෑමක් බලෙන් කරවීමට හෝ දේපළක් නැවත ගැනීම බලකරවීමට කැමැත්තෙන්ම තුවාල සිදු කිරීම.

**321.** වේදනා විඳින්නාගෙන් හෝ වේදනා විඳින්නා කෙරෙහි සැළකිල්ලක් දක්වන්නකුගෙන් යම් වරද කියා පෑමක් හෝ වරදක් හෝ විෂමාචාරයක් සොයා දැන ගැනීමට ඉවහල් වන යම් තොරතුරක් බලෙන් ලබා ගැනීමේ කාර්යය සඳහා හෝ යම් දේපළක් හෝ වටිනා ඇපයක් නැවත ලබා ගැනීමට හෝ යම් අයිතිවාසිකම් කීමක් හෝ ඉල්ලීමක් සම්පූර්ණ කර ගැනීමට හෝ යම් දේපලක් හෝ වටිනා ඇපයක් නැවත ලබාගැනීමට ඉවහල් වන තොරතුරක් දීමට වේදනා විඳින්නාහට හෝ ඔහු කෙරෙහි සැළකිල්ලක් දක්වන්නකුට බල කිරීමේ කාර්යය සඳහා කැමැත්තෙන්ම තුවාළ සිදු කරන තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

(අ) පොලිස් නිලධාරියකු වූ "ඒ" "ඉසෙඩ්" අපරාධයක් සිදු කළ බව කියා පෑමට ඔහු පෙළඹවීම සඳහා "ඉසෙඩ්" ට වද දෙයි. "ඒ" මේ වගන්තිය යටතේ වරදකට වරදකාරයෙක් වේ.

(ආ) පොලිස් නිලධාරියකු වූ "ඒ" සොරකම් කරනු ලැබූ එක්තරා දේපළක් තැන්පත් කොට ඇති ස්ථානය පෙන්වීම පිණිස "බී" පෙළඹවීමට "බී" ට වද දෙයි. "ඒ" මේ වගන්තිය යටතේ වරදකට වරදකාරයෙක් වේ.

(ඇ) ආදායම් පිළිබඳ නිලධරයකු වූ "ඒ" "ඉසෙඩ්" ගෙන් අය විය යුතු එක්තරා හිඟ ආදායම් මුදලක් ගෙවීමට ඔහුට බල කරවීම සඳහා "ඉසෙඩ්" ට වද දෙයි. "ඒ" මේ වගන්තිය යටතේ වරදකට වරදකාරයෙක් වේ.

(ඈ) ඉඩම් හිමියෙකු වූ "ඒ" බදු කුලිය ගෙවීමට බල කරවීම සඳහා තම බදුකාරයාට වද දෙයි. "ඒ" මේ වගන්තිය යටතේ වරදකට වරදකාරයෙක් වේ.

වරද කියාපෑමක් බලෙන් කරවීමට හෝ දේපළක් නැවත ගැනීම බලකරවීමට කැමැත්තෙන් ම බරපතල තුවාල සිදු කිරීම.

**322.** වේදනා විඳින්නාගෙන් හෝ වේදනා විඳින්නා කෙරෙහි සැළකිල්ලක් දක්වන්නකුගෙන් යම් වරද කියාපෑමක් හෝ වරදක් හෝ විෂමචාරයක් සොයා දැන ගැනීමට ඉවහල් වන යම් තොරතුරක් බලෙන් ලබා ගැනීමේ කාර්යය සඳහා හෝ යම් දේපළක් හෝ වටිනා ඇපයක් නැවත ලබා ගැනීමට හෝ යම් අයිතිවාසිකම් කීමක් හෝ ඉල්ලීමක් සම්පූර්ණ කර ගැනීමට හෝ යම් දේපළක් හෝ වටිනා ඇපයක් නැවත ලබා ගැනීමට ඉවහල් වන තොරතුරක් දීමට වේදනා විඳින්නාට හෝ ඔහු කෙරෙහි සැළකිල්ල දක්වන්නකුට බල කිරීමේ කාර්යය සඳහා කැමැත්තෙන් ම බරපතළ තුවාල සිදු කරන තැනැත්තකුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

රජයේ සේවකයකු තම යුතුකම ඉෂ්ට කරනු ලැබීමෙන් වැළැක්වීම සඳහා කැමැත්තෙන්ම තුවාල සිදු කිරීම.

**323.** රජයේ සේවකයකු වශයෙන් සිය යුතුකම ඉෂ්ට කිරීමේ දී හෝ රජයේ සේවකයෙකු වශයෙන් එකී රජයේ සේවකයා විසින් හෝ වෙනත් රජයේ සේවකයකු විසින් සිය යුතුකම ඉෂ්ට කරනු ලැබීම වැළැක්වීමේ හෝ එයට බාධා කිරීමේ අදහසින් හෝ එබඳු රජයේ සේවකයකු වශයෙන් සිය යුතුකම නීත්‍යානුකූලව ඉෂ්ට කිරීමේ දී එකී රජයේ සේවකයා විසින් කරනු ලැබූ හෝ කිරීමට තැත් කරනු ලැබූ යම් ක්‍රියාවක ප්‍රතිඵලයක් නිසා රජයේ සේවකයකු වූ තැනැත්තකුට කැමැත්තෙන් ම යමකු තුවාළ සිදුකරතොත්, ඔහුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

රජයේ සේවකයකු තම යුතුකම ඉෂ්ට කරනු ලැබීමෙන් වැළැක්වීම සඳහා කැමැත්තෙන්ම බරපතල තුවාල සිදු කිරීම.

**324.** රජයේ සේවකයකු වශයෙන් සිය යුතුකම ඉෂ්ට කිරීමේ දී හෝ රජයේ සේවකයකු වශයෙන් එකී රජයේ සේවකයා විසින් හෝ වෙනත් රජයේ සේවකයකු විසින් සිය යුතුකම ඉෂ්ට කරනු ලැබීම වැළැක්වීමේ හෝ එයට බාධා කිරීමේ අදහසින් හෝ එබඳු රජයේ සේවකයකු වශයෙන් සිය යුතුකම නීත්‍යානුකූලව ඉෂ්ට කිරීමේ දී එකී රජයේ සේවකයා විසින් කරනු ලැබූ හෝ කිරීමට තැත් කරනු ලැබූ යම් ක්‍රියාවක ප්‍රතිඵලයක් නිසා රජයේ සේවකයකු වූ තැනැත්තකුට කැමැත්තෙන් ම යමකු බරපතළ තුවාළ සිදුකරතොත්, ඔහුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

ප්‍රකෝප කිරීමක් නිසා කැමැත්තෙන් ම තුවාල සිදු කිරීම.

**325.** තමා ප්‍රකෝප කර වූ තැනැත්තාට හැර අන් කෙනෙකුට තුවාළ සිදු කිරීමේ අදහසක් හෝ එසේ තුවාළ සිදු විය හැකි බව පිළිබඳ ව දැනුමක් නොමැති ව බරපතළ වූත්, හදිසි වූත්, ප්‍රකෝප කිරීමක් නිසා යමකු කැමැත්තෙන් ම තුවාළ සිදු කරතොත්, ඔහුට මාසය දක්වා කාලයකට, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් පනහ දක්වා දඩයකින් හෝ එකී දඩුවම් දෙකින් ම දඩුවම් කළ යුතු ය.

ප්‍රකෝප කිරීමක් නිසා කැමැත්තෙන් ම බරපතල තුවාල සිදු කිරීම.

**326.** තමා ප්‍රකෝප කර වූ තැනැත්තාට හැර අන් කෙනෙකුට බරපතල තුවාළ සිදු කිරීමේ අදහසක් හෝ එසේ බරපතල තුවාළ සිදු විය හැකි බව පිළිබඳ ව දැනුමක් නොමැති ව බරපතළ වූත්, හදිසි වූත්, ප්‍රකෝප කිරීමක් නිසා යමකු කැමැත්තෙන් ම බරපතල තුවාළ සිදු කරතොත්, ඔහුට අවුරුදු හතර දක්වා කාලයකට, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් දෙදහස දක්වා දඩයකින් හෝ එකී දඩුවම් දෙකින් ම දඩුවම් කළ යුතු ය.

පැහැදිලි කිරීම.-අන්තිමට සඳහන් වගන්ති දෙක 294 වෙනි වගන්තියේ පළමුවෙනි ව්‍යතිරේකය යටතේ අතුරු විධානවලට ම යටත් වේ.

ජීවිතය හෝ අන් තැනැත්තන්ගේ පුද්ගලික ආරක්ෂාව අන්තරාදායක කරනු ලබන ක්‍රියාවක් ගැන දඩුවම.

**327.** මනුෂ්‍ය ජීවිතය හෝ අන් තැනැත්තන්ගේ පුද්ගලික ආරක්ෂාව අන්තරාදායක කරවන අන්දමේ අපරීක්ෂාකාරී හෝ නොසැළකිලිමත් ක්‍රියාවක් කරන තැනැත්තකුට මාස තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමෙන් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඩුවම් දෙකින් ම දඩුවම් කළ යුතු ය.

ජීවිතය හෝ අන් තැනැත්තන්ගේ පුද්ගලික ආරක්ෂාව අන්තරාදායක වන ක්‍රියාවකින් තුවාල සිදු කිරීම.

**328.** මනුෂ්‍ය ජීවිතය හෝ අන් තැනැත්තන්ගේ පුද්ගලික ආරක්ෂාව අන්තරාදායක කරවන අන්දමේ අපරීක්ෂාකාරී හෝ නොසැළකිලිමත් ක්‍රියාවක් කිරීමෙන් යම් තැනැත්තකුට යමකු තුවාල සිදු කරතොත් ඔහුට හය මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඩුවම් දෙකින් ම දඩුවම් කළ යුතු ය.

ජීවිතය හෝ අන් තැනැත්තන්ගේ පුද්ගලික ආරක්ෂාව අන්තරාදායක වන ක්‍රියාවකින් බරපතල තුවාල සිදු කිරීම.

**329.** මනුෂ්‍ය ජීවිතය හෝ අන් තැනැත්තන්ගේ පුද්ගලික ආරක්ෂාව අන්තරාදායක කරවන අන්දමේ අපරීක්ෂාකාරී හෝ නොසැළකිලිමත් ක්‍රියාවක් කිරීමෙන් යම් තැනැත්තකුට යමකු බරපතල තුවාල සිදු කරතොත් ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් එක් දහස දක්වා දඩයකින් හෝ එකී දඩුවම් දෙකින් ම දඩුවම් කළ යුතු ය.

## අයුතු අවහිරය හා අයුතු සිරකර තැබීම

අයුතු අවහිරය.

**330.** යම් තැනැත්තකුට යාමට අයිති ඇති දිසාවකට යෑමෙන් එකී තැනැත්තා වලක්වන අන්දමින් ඔහුට කැමැත්තෙන් ම බාධා කරන යමකු ඒ තැනැත්තාට "අයුතු ලෙස අවහිර කල පරිදි" සලකනු ලැබේ.

**ව්‍යතිරේකය.**-තමාට බාධා කිරීමට නීත්‍යානුකූලව අයිතියක් ඇතැයි යමකු සද්භාවයෙන් විශ්වාස කරනු ලබන්නා වූ ඉඩමකින් හෝ ජලයකින් ඇති පුද්ගලික පාරක යාමට බාධා කිරීම මේ වගන්තියේ අර්ථය ඇතුළත වරදක් නො වේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

### නිදර්ශනය

පාරක යෑම බාධා කිරීමට තමාට අයිතියක් ඇති බව සද්භාවයෙන් විශ්වාස නො කරමින් ම "ඒ" එකී පාරෙහි යාමට අයිතිය ඇති "ඉසෙඩ්" ට එකී පාරෙහි යෑමට බාධා කරයි. "ඉසෙඩ්" යෑම ඉන් වළක්වනු ලැබේ. "ඒ" "ඉසෙඩ්" ට අයුතු ලෙස අවහිර කරයි.

**331.** එක්තරා මායිම් කරනු ලැබූ සීමාවලින් පිට යමකු යෑම වැළැක්වෙන ආකාරයකට එකී තැනැත්තාට අයුතු ලෙස යමකු අවහිර කළහොත්, ඔහු එකී තැනැත්තා "අයුතු ලෙස සිර කර තැබූ ලෙස" සලකනු ලැබේ. අයුතු සිර කර තැබීම.

### නිදර්ශන

(අ) "ඒ" තාප්පවලින් වට කරනු ලැබූ බිමක "ඉසෙඩ්" ට යෑමට සිදු කොට "ඉසෙඩ්" එහි ඇතුළත සිර කරයි. වට කරනු ලැබූ තාප්ප සීමාවෙන් එපිට යම් දිසාවක "ඉසෙඩ්" යාම මින් වැළකේ. "ඒ" අයුතු ලෙස "ඉසෙඩ්" සිර කර තබයි.

(ආ) "ඒ" ගොඩනැගිල්ලක දොරටුවල තුවක්කු සහිත මිනිසුන් සිටුවා, එම ගොඩනැගිල්ලෙන් "ඉසෙඩ්" පිටවීමට තැත් කළහොත් එම මිනිසුන් "ඉසෙඩ්" ට වෙඩි තබනු ලබන බව "ඉසෙඩ්" ට කියයි. "ඒ" "ඉසෙඩ්" අයුතු ලෙස සිර කර තබයි.

**332.** යම් තැනැත්තකුට යමකු අයුතු ලෙස අවහිර කළහොත් ඔහුට මාසය දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් පනහ දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය. අයුතු අවහිර කිරීම ගැන දඬුවම.

**333.** යමකු යම් තැනැත්තකු අයුතු ලෙස සිරකර තබත හොත්, ඔහුට අවුරුද්ද දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් දහස දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය. අයුතු සිර කර තැබීම ගැන දඬුවම.

**334.** යමකු යම් තැනැත්තකු දවස් තුනක් හෝ ඊට වැඩි ගණනක් අයුතු ලෙස සිරකර තබතහොත්, ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය. දවස් තුනක් හෝ ඊට වැඩි ගණනක් අයුතු ලෙස සිරකර තැබීම.

**335.** යමකු යම් තැනැත්තකු දවස් දහයක් හෝ ඊට වැඩි ගණනක් අයුතු ලෙස සිරකර තබතහොත්, ඔහුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. දවස් දහයක් හෝ ඊට වැඩි ගණනක් අයුතු ලෙස සිරකර තැබීම.

**336.** යම් තැනැත්තකු නිදහස් කිරීම සඳහා ආඥාපත්‍රයක් නිසි පරිදි නිකුත්කොට ඇති බව දනිමින් ම ඔහු සිරකර තබන තැනැත්තකුට මේ සංග්‍රහයේ වෙනත් වගන්තියක් යටතේ යටත් විය හැකි යම් බන්ධනාගාරගත කිරීමේ කාලයකට අතිරේකව, අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. යම් තැනැත්තකු නිදහස් කිරීම සඳහා ආඥා පත්‍රයක් නිකුත් කොට ඇති අවස්ථාවක දී ඔහු අයුතු ලෙස සිරකර තැබීම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

රහසේ අයුතු සිරකර තැබීම.

**337.** සිර කරනු ලැබූ තැනැත්තා කෙරෙහි සැලකිල්ලක් දක්වන්නකුට හෝ රජයේ සේවකයකුට එකී තැනැත්තාගේ සිරකර තැබීම දැනගත නොහැකි වන අන්දමේ හෝ සිර කිරීමේ ස්ථානය ඉහත සඳහන් තැනැත්තාට හෝ රජයේ සේවකයකුට දැන ගත නොහැකි වන අන්දමේ හෝ එකී ස්ථානය සොයා ගත නොහැකි වන අන්දමේ එකී ස්ථානය සොයා ගත නොහැකි වන අන්දමේ අදහසකින් එබන්දකු අයුතු ලෙස සිර කර තබන තැනැත්තකුට, එ බඳු අයුතු සිර කර තැබීම සඳහා ඔහු යටත් විය හැකි වෙනත්, දඬුවමකට අතිරේකව, අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය.

දේපළ බලෙන් පැහැර ගැනීම හෝ නීති විරෝධී ක්‍රියාවක් බලෙන් කරවීමේ කාර්යය සඳහා අයුතු සිරකර තැබීම.

**338.** සිර කරනු ලැබූ තැනැත්තාගෙන් හෝ සිර කරනු ලැබූ තැනැත්තා කෙරෙහි සැලකිල්ලක් දක්වන්නකුගෙන් යම් දේපළ හෝ වටිනා ඇපයක් බලෙන් පැහැර ගැනීමේ හෝ නීති විරෝධී යමක් කිරීමට හෝ වරදක් සිදු කිරීම පහසු විය හැකි යම් තොරතුරක් දීමට සිදු කරනු ලැබූ තැනැත්තාට හෝ ඒ තැනැත්තා කෙරෙහි සැලකිල්ලක් දක්වන යම් තැනැත්තකුට බලකරවීමේ කාර්යය සඳහා යමකු යම් තැනැත්තකු අයුතු ලෙස සිරකර තබතහොත් ඔහුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකටද යටත් විය යුතු ය.

වරද කියා පෑමක් බලෙන් කරවීමේ හෝ දේපළක් නැවත ලබා ගැනීමට බල කිරීමේ කාර්යය සඳහා අයුතු සිර කර තැබීම.

**339.** සිර කරනු ලැබූ තැනැත්තාගෙන් හෝ ඔහු කෙරෙහි සැලකිල්ලක් දක්වන්නෙකුගෙන් යම් වරද කියා පෑමක් හෝ වරදක්, හෝ අනිසි හැසිරීමක් සොයා දැන ගැනීමට මඟ පෙන් විය හැකි යම්, තොරතුරක්, බලෙන් ලබා ගැනීමේ කාර්යය සඳහා හෝ සිර කරනු ලැබූ තැනැත්තාට හෝ ඔහු කෙරෙහි සැලකිල්ලක් දක්වන්නකුට යම් දේපළක් හෝ වටිනා ඇපයක් නැවත ලබා ගැනීමට හෝ නැවත ලබා ගැනීමට සිදු කරවීමට හෝ යම් අයිතිවාසිකම් කීමක් හෝ ඉල්ලීමක් සම්පූර්ණ කර ගැනීමට හෝ යම් දේපලක් හෝ වටිනා ඇපයක් නැවත ලබා ගැනීමට මඟ පෙන්විය හැකි යම් තොරතුරක් දීමට බලකරවීමේ කාර්යය සඳහා යම් තැනැත්තකු අයුතු ලෙස සිරකර තබතහොත්, ඔහුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකටද යටත් විය යුතු ය.

## සාපරාධී බලහත්කාරය හා අඩත්තේට්ටම් කිරීම

බලහත්කාරය.

**340.** යමකු යම් තැනැත්තකුට චලනය හෝ චලනය වෙනස්වීම හෝ චලනය නැවැත්වීම සිදුකරතහොත් හෝ යම් ද්‍රව්‍යයක් එකී අන් තැනැත්තාගේ ශරීරයේ කොටසක් සමග හෝ ඔහු ඇඳ සිටින හෝ ගෙන යන යමක් සමග හෝ ගැටීමෙන් ඔහුගේ හැඟීම් කෙරෙහි බලපත්වන ආකාරයට පිහිටි යමක් සමග ගැටීම ඇති වන පරිද්දෙන් එකී ද්‍රව්‍යයට චලනය හෝ චලනය වෙනස් වීම හෝ චලනය නැවැත්වීම සිදුකළහොත්, එකී අන් තැනැත්තාට ඉහත කී තැනැත්තා බලහත්කාරය පෑ ලෙස සලකනු ලැබේ.

එසේ ද වුවත්, චලනය හෝ චලනය වෙනස් වීම හෝ චලනය නැවැත්වීම සිදු කරන තැනැත්තා එකී චලනය, චලනය වෙනස් වීම, චලනය නැවැත්වීම මින් මතු විස්තර කරනු ලබන මාර්ග තුනෙන් එක් මාර්ගයකින් කළ යුතු වේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**පළමු වනුව**- තමාගේ ම ශරීර ශක්තියෙන්.

**දෙ වනුව**-තමාගේ හෝ වෙනත් තැනැත්තකුගේ වැඩිපුර ක්‍රියාවක් නැති ව ම, චලනය හෝ චලනය වෙනස්වීම හෝ චලනය නැවැත්වීම සිදු වන ආකාරයකට යම් ද්‍රව්‍යයකට යමක් කිරීමෙන්.

**තුන් වනුව**-ගමන් කිරීමට, ගමන් කිරීම වෙනස් කිරීමට හෝ ගමන් කිරීම නැවැත්වීමට යම් සතකු පෙළඹවීමෙන්.

සාපරාධී බලහත්කාරය.

**341.** යම් වරදක් සිදු කිරීම සඳහා හෝ බලහත්කාරය පැමෙන් එසේ බලහත්කාරකමට යටත් වූ තැනැත්තාට නීති විරෝධිව පාඩුවක් සිදු කිරීමේ හෝ භය කිරීමේ හෝ අප්‍රසන්න තාවයක් ඇති කිරීමේ අදහසින් හෝ එ බඳු බලහත්කාරය පැමෙන් එකී තැනැත්තාට එබන්දක් විය හැකි බව දනිමින්ම යම් තැනැත්තකුට ඔහුගේ කැමැත්ත නොමැතිව යමෙක්, ඕනෑකමින් ම බලහත්කාරය පායි නම්, ඔහු එකී අතික් තැනැත්තාට "සාපරාධී බලහත්කරාය" පෑ ලෙස සලකනු ලැබේ.

**නිදර්ශන**

(අ) ගඟක කඹවලින් බඳිනු ලැබූ මරුවක "ඉසෙඩ්" වාඩි වී සිටියි. බඳිනු ලැබූ කඹ "ඒ" ලිහා දමා, ඉන් මරුව ගඟ පහළට යෑම ඕනෑ කමින්ම සිදු කරයි. මෙහි දී "ඒ" "ඉසෙඩ්" ට ඕන කමින්ම චලනය සිදු කරයි. මෙය ඔහු කරන්නේ කිසිවකුගේ වෙනත් ක්‍රියාවක් නොමැති ව, යම් ද්‍රව්‍යවලට යමක් කිරීමෙන් චලනය සිදු කරවීමෙනි. "ඒ" එනිසා "ඉසෙඩ්" ට ඕනෑකමින් ම බලහත්කාරය පා ඇත්තේ ය. ඔහු මෙසේ කරන ලද්දේ "ඉසෙඩ්" ගේ කැමැත්ත නොමැතිව, යම් වරදක් සිදු කිරීම සඳහා නම්, හෝ මෙලෙස බලහත්කාරය පැමෙන් පාඩුවක්, භයක් හෝ අප්‍රසන්න තාවයක් "ඉසෙඩ්" ට වන බව අදහස් කරමින් හෝ එලෙස වීමට ඉඩ ඇති බව දනිමින් නම්, "ඒ" "ඉසෙඩ්" ට සාපරාධී බලහත්කාරය පා ඇත්තේ ය.

(ආ) "ඉසෙඩ්" රථයකින් යයි. "ඒ" "ඉසෙඩ්" ගේ අශ්වයින්හට කසයකින් තැලීමෙන් ඔවුන්ගේ ගමන ඉක්මන් කරවීම සිදු කරයි. මෙහි දී ඒ සතුන්හට ඔවුන්ගේ චලනය වෙනස් කිරීමට පෙළඹ වූ නිසා "ඒ" "ඉසෙඩ්" ට චලනය වෙනස්වීම කර ඇත්තේය. ඒ නිසා "ඒ" "ඉසෙඩ්" ට බලහත්කාරය පා ඇත්තේය. ඔහු මෙසේ කරන ලද්දේ "ඉසෙඩ්" ගේ කැමැත්ත නොමැති ව, "ඉසෙඩ්" ට පාඩු කිරීමේ හෝ ඔහු භය කිරීමේ හෝ ඔහුට අප්‍රසන්නතාවයක් ඇති කිරීමේ අදහසින් හෝ එලෙස වීමට ඉඩ ඇති බව දනිමින් නම්, ඔහු "ඉසෙඩ්" ට සාපරාධී බලහත්කාරය පා ඇත්තේ ය.

(ඇ) "ඉසෙඩ්" දෝලාවකින් යයි. "ඒ" "ඉසෙඩ්" ගෙන් කොල්ල කෑමේ අදහසින් පොල්ල අල්වා දෝලාව නවත්වයි. මෙහි දී, "ඒ" "ඉසෙඩ්" ගේ චලනය නැවැත්වීම සිදු කොට ඇත්තේ ය. තව ද ඔහු මෙසේ සිදු කරනු ලැබුයේ තමාගේ ම ශරීරය ශක්තියෙනි. එ නිසා "ඒ" "ඉසෙඩ්" ට බලහත්කාරය පා ඇත්තේ ය. "ඉසෙඩ්" ගේ කැමැත්ත නොමැතිව, වරදක් සිදු කිරීම සඳහා මේ ලෙස "ඒ" ඕනෑකමින් ම ක්‍රියා කොට ඇති බැවින් ඔහු "ඉසෙඩ්" ට සාපරාධී බලහත්කාරය පා ඇත්තේ ය.

(ඇ) "ඒ" විටියේ දී ඕනෑකමින් ම "ඉසෙඩ්" වෙතට තල්ලුවෙයි. "ඒ" මෙහි දී "ඉසෙඩ්" ගේ ශරීරය සමඟ ගැටෙන පරිද්දෙන් තම ශරීර ශක්තියෙන් තමන්ගේ ශරීරය චලනය කර ඇත. ඒ නිසා ඔහු "ඉසෙඩ්" ට ඕනෑකමින් ම බලහත්කාරය පා ඇත්තේ ය. ඔහු මෙසේ කරන ලද්දේ "ඉසෙඩ්" ගේ කැමැත්ත නොමැතිව, "ඉසෙඩ්" ට පාඩු කිරීමේ අදහසින්, භය කිරීමේ හෝ ඔහුට අප්‍රසන්න තාවයක් ඇති කිරීමේ අදහසින් හෝ එ ලෙස වීමට ඉඩ ඇති බව දනිමින් නම්, ඔහු "ඉසෙඩ්" ට සාපරාධී බලහත්කාරය පා ඇත්තේ ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

(ඉ) "ඉසෙඩ්" ට හෝ "ඉසෙඩ්" ගේ රෙදිවලට හෝ ඔහු විසින් ගෙන යන යමකට ගලක් වදින ලෙස අදහස් කරමින් හෝ වැදිය හැකි බව දනිමින් ම හෝ ගල වතුරෙහි වැදී වතුර "ඉසෙඩ්" ගේ රෙදි වලට හෝ "ඉසෙඩ්" ගෙනයන යමකට වදින ලෙස අදහස් කරමින් හෝ වැදිය හැකි බව දනිමින් ම "ඒ" ගලක් විසි කරයි. මෙහි දී, ගල විසි කිරීමෙන් යම් දෙයක් "ඉසෙඩ්" ගේ රෙදිවලට ගැටීමේ ප්‍රතිඵලයක් ඇති වුවහොත්, "ඒ" "ඉසෙඩ්" කෙරෙහි බලහත්කාරකම් පා ඇත්තේ ය. ඔහු මෙසේ කරන ලද්දේ "ඉසෙඩ්" ගේ කැමැත්ත නොමැතිව "ඉසෙඩ්" ට පාඩු කිරීමේ හෝ ඔහු භය කිරීමේ හෝ ඔහුට අප්‍රසන්නතාවයක් ඇති කිරීමේ අදහසින් හෝ එලෙස වීමට ඉඩ ඇති බව දනිමින් නම්, ඔහු "ඉසෙඩ්" ට සාපරාධී බලහත්කාරය පා ඇත්තේ ය.

(ඊ) "ඒ" ස්ත්‍රියකගේ මුහුණ වැස්ම ඕනෑකමින් ම අදියි. මෙහි දී "ඒ" ඇයට ඕනෑකමින් ම බලහත්කාරය පායි. ඔහු මෙසේ කරන ලද්දේ ඇගේ කැමැත්ත නොමැතිව, ඇයට පාඩු කිරීමේ හෝ භය කිරීමේ හෝ අප්‍රසන්නතාවයක් ඇති කිරීමේ අදහසින් හෝ එලෙස වීමට ඉඩ ඇති බව දනිමින් නම්, ඔහු ඇයට සාපරාධී බලහත්කාරය පා ඇත්තේ ය.

(උ) "ඉසෙඩ්" නාමින් සිටියි. නටන බව තමා දන්නා වතුර ඒ නාන බාල්දියට වත් කරයි. මෙහිදී නටන වතුර "ඉසෙඩ්" සමග හෝ "ඉසෙඩ්" ගේ හැඟීම ක්‍රියා කරවන පරිදි ඇති වෙනත් ජලය සමග ගැටෙන ලෙස තමාගේ ශරීර ශක්තියෙන් "ඒ" ඕනෑකමින් ම නටන වතුරෙහි චලනය සිදු කෙරෙයි. එම නිසා "ඒ" "ඉසෙඩ්" ට ඕනෑකමින් ම බලහත්කාරය පා ඇත්තේ ය. ඔහු මෙසේ කරන ලද්දේ "ඉසෙඩ්" ගේ කැමැත්ත නොමැති ව, "ඉසෙඩ්" ට පාඩුවක් හෝ භයක් හෝ අප්‍රසන්නතාවයක් ඇති කිරීමේ අදහසින් හෝ එ ලෙස වීමට ඉඩ ඇති බව දනිමින් නම්, ඔහු "ඉසෙඩ්" ට සාපරාධී බලහත්කාරය පා ඇත්තේ ය.

(ඌ) "ඒ" "ඉසෙඩ්" ගේ කැමැත්ත නොමැති ව, ඔහු වෙත පැනීමට බල්ලකු උසි ගන්වයි. මෙහි දී "ඉසෙඩ්" ට පාඩුවක් හෝ භයක් හෝ අප්‍රසන්නතාවයක් ඇති කිරීමට "ඒ" අදහස් කරනු ලබන්නේ නම්, ඔහු "ඉසෙඩ්" ට සාපරාධී බලහත්කාරය පායි.

(එ) පාඨශාලාචාර්යවරයකු වූ "ඒ" ආචාර්යවරයකු වශයෙන් සිය අභිමතය යුක්ති සහගත ව පාවිච්චි කිරීමේ දී ඔහුගේ ශිෂ්‍යයකු වූ "බී" ට තලයි. මෙහි දී "බී" ට භය සහ අප්‍රසන්නතාවයන් ඇති කිරීමට "ඒ" අදහස් කළ නමුත් ඔහු බලහත්කාරය නීති විරෝධී ලෙස නො පානා බැවින් "ඒ" "බී" ට සාපරාධී බලහත්කාරය නො පායි.

අඩන්තේට්ටම්. **342** **312.** යම් තැනැත්තකු තම අංග වික්ෂේපය හෝ සූදානම්ව තමා ඉදිරියේ සිටින තැනැත්තකුට තමා සාපරාධී බලහත්කාරය පෑමට ආසන්න බව ඔහු සලකති යි හෝ එ ලෙස වීමට ඉඩ ඇතැයි අදහස් කරමින් හෝ දනිමින් අංග වික්ෂේපයක් හෝ සූදානමක් කරතොත්, ඔහු තමා ඉදිරියේ සිටින තැනැත්තාට "අඩන්තේට්ටමක්" කළ ලෙස සලකනු ලැබේ.

**පැහැදිලි කිරීම**.–උදක් වචන පමණක් අඩන්තේට්ටමක් බවට පත් නොවේ. එහෙත් යම් තැනැත්තකු විසින් පාවිච්චි කරනු ලබන වචන ඔහුගේ අංග වික්ෂේපවලට හෝ සූදානමට එකී අංග වික්ෂේප හෝ සූදානම අඩන්තේට්ටමක් බවට පත් කරන තේරුමක් දිය හැකි වන්නේ ය.

**නිදර්ශනය**

(අ) "ඒ" "ඉසෙඩ්" ට පහර දීමට ආසන්න බව "ඉසෙඩ්" විසින් විශ්වාස කරනු ලැබිය හැකි බව හෝ එසේ වීමට ඉඩ ඇති බව අදහස් කරමින් හෝ දනිමින් "ඒ" "ඉසෙඩ්" වෙත මිට මොළවයි. ඒ අඩන්තේට්ටමක් කර ඇත.

(ආ) "ඉසෙඩ්" බල්ලා විසින් හපා කවනු ලැබීමට ආසන්න බව "ඉසෙඩ්" විශ්වාස කරන බව හෝ "ඉසෙඩ්" ම එසේ විශ්වාස කිරීමට ඉඩ ඇති බව අදහස් කරමින් හෝ දනිමින් "ඒ" රෞද්‍ර වූ බල්ලකුගේ කටකලියාව ලිහීමට පටන් ගනියි. "ඒ" "ඉසෙඩ්" ට අඩන්තේට්ටමක් කර ඇත.



https://ezofz.web.lk/
Scanned with CamScanner

(ඇ) "මම තුඹට තලන්නෙමි" යි කියමින් "ඒ" කෝටුවක් ගනියි. මෙහි දී, "ඒ" විසින් පාවිච්චි කරනු ලැබූ වචන කොයිම අවස්ථාවක දී වුව ද, අඩන්තේට්ටමක් නො වන නමුදු, හා වෙනත් කරුණු නොමැතිව අංග වික්ෂේපයක් අඩන්තේට්ටමක් නොවන නමුදු වචනවලින් පැහැදිලි කරනු ලැබූ අංග වික්ෂේපය අඩන්තේට්ටමක් බවට පත් විය හැකි ය.

**343.** යම් කිසි තැනැත්තකු විසින් කරනු ලැබූ බරපතළ වූත්, හදිසි වූත්, ප්‍රකෝප කිරීමක් නො වූ අවස්ථාවක දී, එකී තැනැත්තාට අඩන්තේට්ටම් කරන හෝ සාපරාධී බලහත්කාරය පාන තැනැත්තකුට මාස තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් පනහ දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

බරපතල වූත්, හදිසි වූත්, ප්‍රකෝප කිරීමක් නොවූ අවස්ථාවක දී, සාපරාධී බලහත්කාරය පෑම ගැන දඬුවම.

**පැහැදිලි කිරීම**.–ප්‍රකෝප කිරීම, වරදකරු තම වරදට සමාවේ හේතුවක් වශයෙන් බලාපොරොත්තු වූ හෝ කැමැත්තෙන් ම කරවනු ලැබූ ප්‍රකෝප කිරීමක් නම්, හෝ

ප්‍රකෝප කිරීම නීතියට කීකරු වීමක් වශයෙන් කරන ලද යමකින් හෝ රජයේ සේවකයකු විසින් තම බලතල නීත්‍යානුකූල ව පාවිච්චි කිරීමේ දී වූ ප්‍රකෝප කිරීමක් නම්, හෝ

ප්‍රකෝප කිරීම පෞද්ගලික ආරක්ෂාවේ අයිතිය නීත්‍යානුකූල ව පාවිච්චි කිරීමේ දී කරනු ලැබූ යමකින් වූ ප්‍රකෝප කිරීමක් නම්,

එ බඳු බරපතල වූත්, හදිසි වූත්, ප්‍රකෝප කිරීම මේ වගන්තිය යටතේ වරදකට නියමිත දඬුවම ලිහිල් නො කරන්නේ ය.

ප්‍රකෝප කිරීම වරද ලිහිල් කිරීමට තරම් බරපතල ද, හදිසි ද යන්න, සිද්ධිය පිළිබඳ කරුණක් වේ.

**344.** රජයේ සේවකයකු වශයෙන් තම යුතුකම ඉෂ්ට කිරීමේ දී හෝ රජයේ සේවකයකු වශයෙන් තම යුතුකම ඉෂ්ට කිරීම වැළැක්වීමේ හෝ ඊට බාධා කිරීමේ අදහසින් හෝ රජයේ සේවකයකු වශයෙන් තම යුතුකම නීත්‍යානුකූල ව ඉෂ්ට කිරීමේ දී තමා විසින් කරනු ලැබූ හෝ කිරීමට තැත් කරනු ලැබූ යම් ක්‍රියාවක ප්‍රතිඵලයක් නිසා රජයේ සේවකයකු වූ තැනැත්තකුට යමකු අඩන්තේට්ටම් කරතොත්, හෝ ඔහුට සාපරාධී බලහත්කාරය පාතොත්, ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

තම යුතුකම ඉෂ්ට කිරීමෙන් වැළැක්වීම සඳහා රජයේ සේවකයකුට සාපරාධී බලහත්කාරය පෑම.

**345.** ස්ත්‍රියකගේ හිරි ඔතප් බිඳීමේ අදහසින් හෝ එයින් ඇයගේ හිරි ඔතප් බිඳීම වීමට ඉඩ ඇති බව දනිමින් යමකු ස්ත්‍රියකට අඩන්තේට්ටම් කරතොත්, හෝ සාපරාධී බලහත්කාරය පාතොත් ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය. තව ද අතිරේකව, ඔහුට කස පහර දීමකින් දඬුවම් කළ හැකි ය.

හිරිඔතප් බිඳීමේ අදහසින් ස්ත්‍රියකට අඩන්තෙට්ටම් කිරීම හෝ සාපරාධී බලහත්කාරය පෑම.

**346.** යම් තැනැත්තකු විසින් කරනු ලැබූ බරපතල වූත්, හදිසි වූත්, ප්‍රකෝප කිරීමක් නො වූ අවස්ථාවක දී, ඔහුට අගෞරව කිරීමේ අදහසින් යමකු අඩන්තේට්ටම් කරතොත් හෝ සාපරාධී බලහත්කාරය පාතොත්, ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

බරපතල වූත්, හදිසි වූත්, ප්‍රකෝප කිරීමක් නො වූ අවස්ථාවක දී යම් තැනැත්තකුට අගෞරව කරන අදහසින් අඩන්තේට්ටම් කිරීම හෝ සාපරාධී බලහත්කාරය පෑම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

යම් තැනැත්තකු විසින් ගෙන යන යම් දේපළක් සොරකම් කිරීමට තැත් කිරීමක දී අඩන්තේට්ටම් කිරීම හෝ සාපරාධී බලහත්කාරය පෑම.

**347.** යමකු යම් තැනැත්තකු ඇඳ සිටින හෝ ගෙන යන දේපළක් සොරකම් කිරීමට තැත් කරමින් ඔහුට අඩන්තේට්ටම් කරතොත් හෝ සාපරාධී බලහත්කාරය පාතොත් ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

යම් තැනැත්තකු අයුතු ලෙස සිර කර තැබීමට තැත් කිරීමේ දී අඩන්තේට්ටම් කිරීම හෝ සාපරාධී බලහත්කාරය පෑම.

**348.** යමකු යම් තැනැත්තකු අයුතු ලෙස සිර කර තැබීමට තැත් කරමින් ඔහුට අඩන්තේට්ටම් කරතොත් හෝ සාපරාධී බලහත්කාරය පාතොත් ඔහුට අවුරුද්ද දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් දහස දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

බරපතල වූත්, හදිසි වූත්, ප්‍රකෝප කිරීමක දී අඩන්තේට්ටම් කිරීම හෝ සාපරාධී බලහත්කාරය පෑම.

**349.** යමකු යම් තැනැත්තකු විසින් කරනු ලැබූ බරපතල වූත් හදිසි වූත්, ප්‍රකෝප කිරීමක දී, ඔහුට අඩන්තේට්ටම් කරතොත් හෝ සාපරාධී බලහත්කාරය පාතොත්, ඔහුට මාසය දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් පනහ දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

**පැහැදිලි කිරීම.**–මේ අවසාන වගන්තිය 343 වෙනි වගන්තියේ පැහැදිලි කිරීම්වලට ම යටත් වේ.

අපහරණය.

**350.** අපහරණය, දෙයාකාරයක වේ : ලංකාවෙන් අපහරණය කිරීම, හා නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය කිරීම.

ලංකාවෙන් අපහරණය කිරීම.

**351.** යම් තැනැත්තකුගේ කැමැත්ත නොමැති ව, හෝ ඔහු වෙනුවෙන් කැමැත්ත දීමට නීත්‍යානුකූල ව බලය ඇති තැනැත්තකුගේ කැමැත්ත නොමැති ව ඔහු ලංකාවේ සීමාවලින් ඔබ්බට යමකු ගෙන ගියහොත්, ඔහු "එකී තැනැත්තා ලංකාවෙන් අපහරණය කළ ලෙස" සලකනු ලැබේ.

නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය කිරීම.

**352.** පිරිමියකු නම් වයස දහ හතරෙන් අඩු වූ හෝ, ස්ත්‍රියක නම් වයස දහසයෙන් අඩු වූ බාල වයස් කාරයකු හෝ සිහිය විකල වූ තැනැත්තකු එකී බාල වයස් කාරයාගේ හෝ සිහි විකල වූ තැනැත්තා ගේ නීත්‍යානුකූල භාරකාරයා ගේ භාරයෙන් ඒ භාරකාරයාගේ කැමැත්ත නැති ව යමකු ගෙන ගියහොත්, හෝ යෑමට පෙළඹුවහොත් ඔහු "එකී බාල වයස්කාරයා හෝ තැනැත්තා නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය කළ ලෙස" සලකනු ලැබේ.

**පැහැදිලි කිරීම.**— මේ වගන්තියේ "නීත්‍යානුකූල භාරකාරයා" යන වචන වලට එකී බාල වයස් කාරයාගේ හෝ වෙනත් තැනැත්තාගේ ආරක්ෂාව හෝ භාරය නීත්‍යානුකූල ව භාර කරනු ලැබූ තැනැත්තෙක් ඇතුළත් වේ.

**ව්‍යතිරේකය.**— තමා අවජාත ළමයකුගේ පියකු බව සද්භාවයෙන් විශ්වාස කරන හෝ එකී ළමයා නීත්‍යානුකූල ව තම භාරයේ තබා ගැනීමට අයිති ඇති බව සද්භාවයෙන් විශ්වාස කරන තැනැත්තකුගේ ක්‍රියාවක් සම්බන්ධයෙන් එකී ක්‍රියාව කරනු ලැබුයේ දුරාචාර හෝ නීති විරෝධී කාර්යකට නොවේ නම් මේ වගන්තිය අදාළ නො වේ.

පැහැර ගෙන යාම.

**353.** යමකු යම් ස්ථානයකින් යෑමට යම් තැනැත්තකුට බලහත්කාරකමින් බල කරතොත් හෝ යම් වංචා සහගත ක්‍රම වලින් හෝ බලය අනිසි ලෙස පාවිච්චි කිරීමකින් හෝ වෙනත් බල කිරීම් මාර්ගයකින් පොළඹවතොත් ඔහු ඒ තැනැත්තා "පැහැර ගෙන ගිය ලෙස" සලකනු ලැබේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**අපහරණය කිරීම ගැන දඬුවම.**

**354.** යම් තැනැත්තකු ලංකාවෙන් හෝ නීත්‍යානුකූල භාරකාරත්වයෙන් යමකු අපහරණය කරතොත් ඔහුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

**මිනී මැරුම සඳහා අපහරණය කිරීම හෝ පැහැර ගෙන යාම.**

**355.** යම් තැනැත්තකු මරණයට පත් කිරීම සඳහා හෝ මරණය ලැබීමේ අන්තරායට භාජන විය හැකි ලෙස දැමීම සඳහා යමකු අපහරණය කරතොත් හෝ පැහැර ගෙන යතොත් ඔහුට අවුරුදු විස්ස දක්වා කාලයක, තදබල බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

**නිදර්ශන**

(අ) "ඉසෙඩ්" දෙව රූපයකට බිලි දීමට අදහස් කරමින් හෝ බිලි දීමට ඉඩ ඇති බව දනිමින් "ඒ" "ඉසෙඩ්" ලංකාවෙන් අපහරණය කරයි. මේ වගන්තියෙහි විස්තර කරනු ලැබූ වරද "ඒ" කර ඇත.

(ආ) "බී" මරනු සඳහා "ඒ" "බී" ගේ ගෙදරින් "බී" බලෙන් ගෙනයයි. නැතහොත් ගෙදරින් යාමට "බී" පොළඹවයි. මේ වගන්තියේ විස්තර කරනු ලැබූ වරද "ඒ" කර ඇත.

**රහසිගතව හා අයුතු ලෙස යම් තැනැත්තකු සිරකර තැබීමේ අදහසින් අපහරණය කිරීම හෝ පැහැර ගෙන යාම.**

**356.** යම් තැනැත්තකු රහසිගතව හා අයුතු ලෙස සිරකර තැබීමේ අදහසින් යමකු අපහරණය කළහොත් හෝ පැහැර ගෙන ගියහොත් ඔහුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත්විය යුතු ය.

**යම් ස්ත්‍රියක විවාහ කරවීම ආදිය පිණිස ඇය අපහරණය කිරීම හෝ පැහැර ගෙන යාම.**

**357.** තමාගේ කැමැත්ත නොමැතිව, යම් තැනැත්තකු සමග විවාහ කරවීමට බල කරවීමේ අදහසින් හෝ එ සේ බල කරවීමට ඉඩ ඇති බව දනිමින් හෝ නීති විරෝධි සංසර්ගයට බල කරවීම හෝ පෙළඹවීම සඳහා හෝ එ සේ නීති විරෝධි සංසර්ගයට බල කරවීමට ඉඩ ඇති බව හෝ පෙළඹවිය හැකි බව දනිමින් යමකු යම් ස්ත්‍රියක අපහරණය කලහොත් හෝ පැහැරගෙන ගියහොත් ඔහුට අවුරුදු දහය දක්වා කාලයක දෙයාකාරයෙන්, එක් ආකාරයක, බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

**බරපතල තුවාල කිරීමකට හෝ වහල් බවට ගැනීම් ආදියකට යම් තැනැත්තකු යටත් කරවීම සඳහා අපහරණය කිරීම හෝ පැහැර ගෙන යාම.**

**358.** යම් තැනත්තකු බරපතළ තුවාළ කිරීමකට හෝ වහල් කමකට හෝ යම් තැනැත්තකුගේ අස්භාවික කාමාශාවකට යටත් කිරීම සඳහා හෝ යටත් විය හැකි ලෙස කටයුතු සැලැස්වෙන පරිදි හෝ එ සේ යටත් වීමට ඉඩ ඇති බව හෝ කටයුතු සැලැස්වීමට ඉඩ ඇති බව දනිමින් යමකු එකී තැනැත්තා අපහරණය කළහොත් හෝ පැහැර ගෙන ගියහොත් ඔහුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

**අපහරණය කරනු ලැබූ තැනැත්තකු අයුතු ලෙස සැඟවීම හෝ සිර කර තබා ගැනීම.**

**359.** යම් තැනැත්තකු අපහරණය කරනු ලැබූ බව හෝ පැහැරගෙන යනු ලැබූ බව දනිමින් යමෙකු එකී තැනැත්තා, අයුතු ලෙස සඟවතොත් හෝ සිර කර තබතහොත් යම් අදහසකින් හෝ දැනුමකින් හෝ යම් කාර්යයක් සඳහා එකී තැනැත්තා සැඟවූයේ නම්, හෝ නතර කොට තැබුයේ නම්, එකී අදහසින් ම හෝ දැනුමෙන් ම හෝ එකී කාර්යය සඳහා එම තැනැත්තා අපහරණය කරනු ලැබූ සේ ම හෝ පැහැර ගෙන යනු ලැබූ සේ ම ඔහුට දඬුවම් කළ යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

වයස අවුරුදු දහයට අඩු දරුවකුගේ ශරීරයෙන් වංචල දේපළ සොරකම් කිරීමේ අදහසින් එබඳු ළමයකු අපහරණය කිරීම හෝ පැහැර ගෙන යාම.

**360.** වයස අවුරුදු දහයකට අඩු දරුවකුගේ ශරීරයෙන් වංක ලෙස යම් වංචල දෙපළක් ගැනීමේ අදහසින් එ බඳු දරුවකු අපහරණය කරන හෝ පැහැර ගෙන යන තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. තව ද ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

ස්ත්‍රීන් සැපයුම්.

**360අ.** යමකු—

(1) වයස අවුරුදු 21ට අඩු ගැහැණු ළමයකු හෝ ස්ත්‍රියක දිවයිනෙන් පිට යම් තැනැත්තකු සමග නීති විරෝධී ලිංගික සංසර්ගය සඳහා (ඇගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) සපයතොත් හෝ සැපයීමට තැත් කරතොත් හෝ, එකී කාර්යය සඳහා එ බඳු ගැහැණු ළමයකු හෝ ස්ත්‍රියක (ඇගේ කැමත්ත ඇති ව හෝ නැතිව) දිවයිනෙන් ඉවත් කරතහොත් හෝ ඉවත් කිරීමට තැත් කළහොත් ;

(2) අන් දෙසක ගණිකා නිවෙසක වසන්නියක හෝ ගැව සෙන්නියක කිරීමේ අදහසින් දිවයින අත්හැර යෑම සඳහා යම් ගැහැණු ළමයකු හෝ ස්ත්‍රියක (ඇගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) සපයතොත් හෝ සැපයීමට තැත් කරතොත් හෝ එකී කාර්යය සඳහා යම් ගැහැණු ළමයකු හෝ ස්ත්‍රියක (ඇගේ කැමැත්ත ඇති ව හෝ නැති ව) දිවයිනෙන් ඉවත් කරතහොත් හෝ ඉවත් කිරීමට තැත් කරතහොත් ;

(3) දිවයින තුළ හෝ පිටත යම් තැනැත්තකු සමග නීති විරෝධී ලිංගික සංසර්ගය සඳහා වයස අවුරුදු විසි එකට අඩු ගැහැණු ළමයකු හෝ ස්ත්‍රියක (ඇගේ කැමැත්ත ඇති ව හෝ නැති ව) දිවයිනට ගෙන එතොත් හෝ ගෙන ඒ මට තැත් කරතොත් ;

(4) දිවයින තුළ හෝ පිටත පොදු ගණිකාවක් කිරීම සඳහා යම් ගැහැණු ළමයකු හෝ ස්ත්‍රියක (ඇගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) සපයතොත් හෝ සැපයීමට තැත් කරතොත් ;

(5) ගණිකා වෘත්තියේ කාර්ය සඳහා දිවයින තුළ හෝ පිටත ගණිකා නිවෙසක විසීම හෝ ගැවසීම සඳහා යම් ගැහැණු ළමයකු හෝ ස්ත්‍රියක ලවා දිවයිනෙහි තමාගේ පුරුදු (ගණිකා නිවෙසක් නොවූ) වාසස්ථානය (ඇගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) අතහැර වීමට පිළියෙල කරතොත් හෝ පිළියෙල කිරීමට තැත් කරතොත් ;

ඔහු වරදකට වරදකාරයකු විය යුතු ය. එසේ වරදකාරයා වීමේ දී, ඔහු අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට යටත් විය යුතු ය. එසේ ම, වරදකරු පිරිමියෙක් නම් ඔහු එ බඳු බන්ධනාගාරගත කිරීමකට අතිරේක ව, කසයෙන් තලනු ලැබුමකට ද යටත් විය යුතු ය.

එසේ ද වුවත්, එක සාක්ෂිකරුවකුගේ සාක්ෂිය උඩ පමණක් එකී සාක්ෂිය යම්කිසි වැදගත් කරුණුවලින් විත්තිකාරයා අදුවන පරිදි වූ සාක්ෂිවලින් තහවුරු කරනු ලැබුවහොත් විනා, මේ වගන්තිය යටතේ යම් වරදකට කිසිවකු වරදකාරයකු නො කළ යුතු ය.

යම් තැනැත්තකු වහලකු ලෙස මිලයට ගැනීම හෝ අන් කිසිවක් කිරීමට.

**361.** යමකු යම් තැනැත්තකු වහලකු ලෙස මෙ රටට ගෙනවුවහොත්, පිටරට යැවුවහොත්, ඉවත් කළහොත් මිලයට ගතහොත්, විකුණුතහොත් හෝ ඔහුට අන් කිසිවක් කළහොත් හෝ යම් තැනැත්තකු වහලකු ලෙස පිළිගතහොත් බාර ගතහොත් හෝ ඔහුගේ කැමැත්තට විරුද්ධව නතර කර තබතොත් ඔහුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**362.** වහලුන් සිරිත් ලෙස මෙ රටට ගෙනවන්නා වූ, පිටරට යවන්නා වූ, ඉවත් කරන්නා වූ, මිලයට ගන්නා වූ, විකුණන්නා වූ, වෙළෙඳාම් කරන්නා වූ හෝ ඔවුන් පිළිබඳ ගනු දෙනු කරන්නා වූ තැනැත්තකුට අවුරුදු පහළොව දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

*වහලුන් සම්බන්ධයෙන් සිරිත් ලෙස ගනු දෙනු කිරීම.*

**362අ.** තමා සමග නීත්‍යානුකූලව විවාහ නොවූ යම් ස්ත්‍රියකට, ඇය තමා සමග නීත්‍යානුකූලව විවාහ වූ බව වංචා සහගතව විශ්වාස කරවමින් එම විශ්වාසය අනුව තමා සමග සංවාසයෙහි හෝ ලිංගික සංසර්ගයෙහි යෙදීම සිදු කරවන සෑම මිනිසකුටම අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

*නීත්‍යානුකූල විවාහයක විශ්වාසයක් වංචා සහගතව ඇති කරවමින් ඒ අනුව මිනිසකු විසින් සංවාසයෙහි යෙදීම.*

**362ආ.** ජීවත්ව සිටින ස්වාමිපුරුෂයකු හෝ භාර්යාවක සිටින අයකු එකී ස්වාමිපුරුෂයා හෝ භාර්යාව ජීවත් ව සිටින කාලය තුළ දී, සිදු වූ නිසා විවාහය අවලංගු වන අවස්ථාවක දී, විවාහ වුවහොත් ඒ අයට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඒ අය දඩයකට ද යටත් විය යුතු ය.

*ස්වාමිපුරුෂයා හෝ භාර්යාව ජීවත් ව සිටි කාලය තුල දී නැවත විවාහ වීම.*

**ව්‍යතිරේකය.**–එ බඳු ස්වාමිපුරුෂයකු සමග හෝ එබඳු භාර්යාවක සමග ඇති වූ යමකුගේ විවාහය නිසි අධිකරණ බලය ඇති අධිකරණයකින් අවලංගුකරනු ලැබූ තැනැත්තකුට මේ වගන්තිය අදාළ නො වේ. එ මෙන් ම පසු ව විවාහයකට ඇතුළත් වන වේලෙහි යම් ස්වාමිපුරුෂයකු හෝ භාර්යාවක අවුරුදු හතක කාලයක් තුළ නො කඩවා ම ඔවුනොවුන් වෙත නො පැමිණි විට හා එකී කාලයෙහි ජීවත් ව සිටින බව අසා දැන ගන්නට නො ලැබුණු විට පළමු ස්වාමිපුරුෂයාගේ හෝ භාර්යාවගේ ජීවිත කාලය තුළ දී විවාහයක් කරගන්නා තැනැත්තකුට ද මේ වගනති අදාළ නොවේ.

එ සේ ද වුවත්, පසු ව විවාහයක් කර ගනු ලබන තැනැත්තා එකී විවාහය සිදුකිරීමට ප්‍රථම විවාහය සිදු කර ගනු ලබන අයට තමාගේ දැනුම පරිදි නියම තත්ත්වය දැන්විය යුතු ය.

**362ඇ.** පසුව විවාහය කර ගනු ලැබූ අය සමග තම පළමු විවාහය පිළිබඳ කරුණු සැඟවීමෙන් ඉහතින් වූ වගන්තියෙහි විස්තර කරනු ලැබූ වරද යමකු කරතොත්, ඔහුට අවුරුදු දහය දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

*පසු විවාහය කර ගනු ලැබූ අය ගෙන් පළමු විවාහය සැඟවීමෙන් ඉහත කී වරද කිරීම.*

**362ඈ.** තමා එයින් නීති ප්‍රකාර විවාහ නොවූ බව දනිමින් ම වංක ලෙස හෝ වංචක අදහසින් විවාහ වීමේ චාරිත්‍රයකට සහභාගි වන තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඒ අය දඩයකට ද යටත් විය යුතු ය.

*නීති ප්‍රකාර විවාහවීමක් නොමැතිව, වංචා සහගත අදහසින් විවාහ වීමේ උත්සවයකට සහභාගි වීම.*

### ස්ත්‍රී දූෂණය

**363.** මින්මතු ව්‍යතිරේකයෙන් දැක්වෙන අවස්ථාවේ දී හැර පහත සඳහන් වන පස් වැදෑරුම් අවස්ථාවලින් යමකට වැටෙන පරිදි මිනිසකු ස්ත්‍රියක සමග ලිංගික සංසර්ගය ඇති වූ විට, ඔහු "ස්ත්‍රී දූෂණය" කළ ලෙස සලකනු ලැබේ.

*ස්ත්‍රී දූෂණය.*



https://ezofz.web.lk/
Scanned with CamScanner

**පළමු වනුව**.—ඇගේ කැමැත්තට විරුද්ධ ව.

**දෙ වනුව**—ඇගේ කැමැත්ත නොමැති ව.

**තුන් වනුව**.— මරණය හෝ තුවාළ කිරීම පිළිබඳ භයකට ඇය පමුණුවා ඉන් පසු ගනු ලැබූ කැමැත්ත ඇති ව.

**සතර වනුව**.—තමා ඇගේ ස්වාමිපුරුෂයා නොවන බව ද, තමා ඇය හා නීත්‍යානුකූලව විවාහ වූ නැතහොත් විවාහ වූ ලෙස විශ්වාස කරනු ලැබූ වෙනත් පුරුෂයකු බව ඇ විශ්වාස කළ නිසා ඇගේ කැමැත්ත දුන් බව ද, පුරුෂයා දන්නා වූ අවස්ථාවක දී ඇගේ කැමැත්ත ඇති ව.

**පස් වනුව**.—ඇගේ වයස අවුරුදු දොළහට අඩු වූ විට, ඇගේ කැමැත්ත ඇති ව හෝ නැති ව.

**පැහැදිලි කිරීම**.— ස්ත්‍රී දූෂණය කිරීමේ වරදට අවශ්‍ය ලිංගික සංසර්ගය ඇති කිරීමට, ප්‍රවේශය ප්‍රමාණවත් වේ.

**ව්‍යතිරේකය**.—භාර්යාවගේ වයස අවුරුදු දොළහට අඩු නො වූ විටක, තම භාර්යාව සමග පුරුෂයකු විසින් ලිංගික සංසර්ගයෙහි යෙදීම ස්ත්‍රී දූෂණය කිරීමක් නො වේ.

**ස්ත්‍රී දූෂණය ගැන දඬුවම.**

**364.** ස්ත්‍රී දූෂණය කරන තැනැත්තකුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

**බාල ගැහැණු ළමයින් සමග කාමුක සංසර්ගය**

**දොළහ සහ දහ හතර අතර වූ ගැහැණු ළමයින් කෙළසීම.**

**364අ.** (1) වයස අවුරුදු දොළහ හෝ ඊට වැඩි වූ හා වයස අවුරුදු දහ හතරට අඩු වූ යම් ගැහැණු ළමයකු සමග කාමුක සංසර්ගයෙහි යෙදෙන හෝ යෙදීමට තැත් කරන තැනැත්තකු වරදකට වරදකාරයකු විය යුතු ය. ඔහුට අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. එයට අතිරේක ව, ඔහුට කස පහර දීමකින් ද දඬුවම් කළ හැකි ය.

(2) මේ වගන්තිය යටතේ ගෙනෙනු ලැබූ චෝදනාවක දී ගැහැණු ළමයාගේ වයස අවුරුදු දහ හතර හෝ ඊට වැඩි බව චෝදනා කරනු ලැබූ තැනැත්තාට විශ්වාස කිරීමට යුක්ති සහගත කරුණු තිබුණ බව චෝදනාව ඉදිරිපත් කර ඇති අධිකරණයට හෝ ජූරියට දැන ගැන්මට සැලැස්වීම නිදහස් වීමට ප්‍රමාණවත් විය යුතු ය.

(3) තම භාර්යාව සමග ස්වාමිපුරුෂයකු විසින් ලිංගික සංසර්ගයෙහි යෙදීම හෝ ගැහැණු ළමයාගේ දෙමව්පියන්ගේ හෝ භාරකාරයින්ගේ කැමැත්ත ඇති ව අඹු සැමි වශයෙන් එක් ව වාසය කරන පුරුෂයකු හා ගැහැණු ළමයකු ගැහැණු ළමයාගේ වයස අවුරුදු දොළහ හෝ ඊට වැඩි නම් එලෙස ලිංගික සංසර්ගයෙහි යෙදීම මේ වගන්තිය යටතේ වරදක් නො වේ.

(4) වරද කර තුන් මසකට වැඩි කාලයක් ඉකුත් ව ගිය පසු, මේ වගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමක් ආරම්භ නොකළ යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

## අස්වාභාවික වැරදි

**365.** යම් පුරුෂයක, ස්ත්‍රියක හෝ සතකු සමග ස්වභාව ධර්මයට විරුද්ධව, කැමැත්තෙන් ම කාමුක සංසර්ගයෙහි යෙදෙන තැනැත්තකුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. අස්වාභාවික වැරදි.

**පැහැදිලි කිරීම.**- මේ වගන්තියේ විස්තර කරනු ලැබූ වරදට අවශ්‍ය වූ කාමුක සංසර්ගය ඇති කිරීමට ප්‍රවේශ කිරීම ප්‍රමාණවත් වේ.

**365අ.** ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ වෙනත් පුරුෂයකු සමග තදබල අශෝභන ක්‍රියාවක් කරන හෝ එබඳු ක්‍රියාවකට පාර්ශ්වකාරයකු වන හෝ එ බඳු ක්‍රියාවක් යම් පුරුෂයකු ලවා කරවන හෝ කරවීමට තැත් කරන පුරුෂයකු වරදකට වරදකාරයකු විය යුතු ය. ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය. එසේ ම, කස පහර දීමකින් දඬුවම් කරනු ලැබීමට ද, ඔහු යටත් විය යුතු ය. පුරුෂයන් අතර තදබල අශෝභන ක්‍රියා.

# XVII වෙනි පරිච්ඡේදය

## දේපල පිළිබඳ වැරදි

**366.** යමකු යම් චංචල දේපලක් යම් තැනැත්තකුගේ ස්වාමිත්වයෙන් එකී තැනැත්තාගේ කැමැත්ත නොමැති ව වංක ලෙස ගැනීමේ අදහසින් එබඳු ගැනීම සඳහා ඉවත් කරතොත් "සොරකම්" කළ ලෙස සලකනු ලැබේ. සොරකම.

**පැහැදිලි කිරීම 1.**—යම් දෙයක් පොළොවට සම්බන්ධ වී තිබෙන තාක්, එය චංචල දේපලක් නොවන හෙයින්, සොරකම් කළ හැකි දෙයක් නොවේ, එහෙත් එය පොළවෙන් වෙන් කළ විගස ම සොරකම් කළ හැකි දෙයක් බවට පත් වේ.

**පැහැදිලි කිරීම 2.**—වෙන් කිරීම සිදු කළ ක්‍රියාවෙන් ම වූ ඉවත් කිරීමක් සොරකමක් විය හැකි ය.

**පැහැදිලි කිරීම 3.**—යම් දෙයක් නියම ලෙස ඉවත් කිරීමෙන් මෙන්ම යමක් ඉවත් කිරීම වළක්වනු ලබන බාධකයක් අස් කිරීමෙන් හෝ එය වෙනත් දෙයකින් වෙන් කිරීමෙන් එකී දෙය යම් තැනැත්තකු විසින් ඉවත් කර වූ ලෙස සලකනු ලැබේ.

**පැහැදිලි කිරීම 4.**-යම් ක්‍රමයකින් සතකුට යාමට සිදු කරන තැනැත්තා එකී සතා ගමන් කර වූ ලෙස ද, එ ලෙස සිදු කළ චලනය නිසා ඉවත් කර වූ සියල්ල ම තමා ඉවත් කර වූ ලෙස ද, සලකනු ලැබේ.

**පැහැදිලි කිරීම 5.**—විස්තර කිරීමෙහි සඳහන් කැමැත්ත, ප්‍රකාශිත හෝ අඟවනු ලැබූ විය හැකි ය. ඒ කැමැත්ත ස්වාමිත්වය ඇති තැනැත්තා විසින් හෝ ඒ කාර්යය සඳහා බලය ප්‍රකාශිතව හෝ ඇඟවීමෙන් ලැබී ඇති තැනැත්තකු විසින් දිය හැකි ය.

**නිදර්ශන**

(අ) "ඉසෙඩ්" ගේ කැමැත්ත නොමැතිව, "ඉසෙඩ්" ගේ ස්වාමිත්වයෙන් වංකව ගෙන යාමේ අදහසින් "ඉසෙඩ්" ගෙ ඉඩමේ පිහිටි ගසක් "ඒ" කපාදමයි. ගෙනයාම සඳහා "ඒ" ගස වෙන් කළ විගස ම ඔහු සොරකම් කර ඇත.



https://ezofz.web.lk/
Scanned with CamScanner

(ආ) "ඒ" බල්ලන් සඳහා ඇමක් තමා සාක්කුවේ දා ගැනීමෙන් "ඉසෙඩ්" ගේ බල්ලාට එය පසුපස යෑමට පොළඹවයි. මෙහි දී "ඉසෙඩ්" ගේ කැමැත්ත නොමැති ව, "ඉසෙඩ්" ගේ ස්වාමිත්වයෙන් බල්ලා වංක ලෙස පැහැර ගැනීම "ඒ" ගේ අදහස නම් "ඉසෙඩ් ගේ බල්ලා "ඒ" පසුපස යෑමට පටන් ගත් විගස ම "ඒ" සොරකම කර ඇත.

(ඇ) වටිනා වස්තු ඇති පෙට්ටියක් ගෙන යන ගොනෙක් "ඒ" ට සමුවෙයි. එකී වටිනා වස්තු වංක ලෙස ඔහුට ගැනීමට හැකි වන පරිදි ඔහු ගොනා එක්තරා දිසාවකට එළවයි. ගොනා යෑමට පටන් ගත් විගස ම එකී වටිනා වස්තු සොරකම "ඒ" කර ඇත.

(ඈ) "ඉසෙඩ්" ගේ සේවකයකු වූ "ඒ" "ඉසෙඩ්" ගේ තැටිය ප්‍රවේසම් කිරීමට භාර දෙනු ලැබ, "ඉසෙඩ්" ගේ කැමැත්ත නොමැතිව, තැටිය රැගෙන වංක ලෙස පැන යයි. "ඒ" සොරකම කර ඇත.

(ඉ) "ඉසෙඩ්" ගමනක් යෑමේ දී, ඔහු ආපසු එනතෙක්, ගුදමක පාලකයකු වූ "ඒ" ට තම තැටිය භාර දෙයි. "ඒ" එම තැටිය ගෙන ගොස් රන්කරුවකුට විකුණයි. මෙහි දී තැටිය "ඉසෙඩ්" ගේ ස්වාමිත්වයෙහි නො තිබුණේ ය. එමනිසා "ඉසෙඩ්" ගේ ස්වාමිත්වයෙන් එය ගෙන යෑමට නො හැකි විය. එබැවින් "ඒ" සාපරාධී විශ්වාස කඩකිරීමක් කර ඇති වුව ද, සොරකම් කර නැත.

(ඊ) "ඉසෙඩ්" පදිංචිව සිටින නිවසෙහි මේසයක් උඩ තිබී "ඉසෙඩ්" ට අයිති මුද්දක් "ඒ" ට සම්භ වෙයි. මෙහි දී මුද්ද "ඉසෙඩ්" ගේ ස්වාමිත්වයෙහි ඇත්තේ ද, "ඒ" වංක ලෙස එය ඉවත් කරතොත් ඔහු සොරකම කරයි.

(උ) කිසිවකුගේ ස්වාමිත්වයෙහි නොව, මහපාරේ තිබී මුද්දක් "ඒ" ට සම්භ වෙයි. එය ගැනීමෙන් "ඒ" දේපළ සාපරාධී සාවද්‍ය පරිහරණය කිරීමක් සිදු කරනු ලැබිය හැකි නමුදු සොරකමක් නො කරයි.

(ඌ) "ඉසෙඩ්" ගේ ගෙදර මේසයක් උඩ ඔහුට අයිති මුද්දක් තිබෙන බව "ඒ" දකියි. සොයා දැන ගතහැකි යන බියෙන් එ වේලෙහි ම මුද්ද සාවද්‍ය පරිහරණයට නිර්භීත නොවමින් "ඒ" "ඉසෙඩ්" විසින් කිසි විටෙක, සොයා ගැනීමට බෙහෙවින් ම හැකි නො වනු ඇතැයි සිතිය හැකි ස්ථානයක මුද්ද සඟවයි. ඔහු විසින් එසේ කරනු ලබන්නේ නැතිවීම අමතක වූ විට මුද්ද සඟවන ලැබූ ස්ථානයෙන් ගෙන එය විකුණන අදහසිනි. මෙහි දී, පළමුවෙන් මුද්ද ඉවත් කළ වේලෙහි ම "ඒ" සොරකම කරයි.

(එ) "ඒ" සිය ඔර්ලෝසුව හරිගැස්සීම පිණිස රන් කරුවකු වූ "ඉසෙඩ්" ට බාර දෙයි. "ඉසෙඩ්" එය තම සාප්පුවට ගෙන යයි. රන්කරුවා විසින් ඇපයක් වශයෙන් ඔර්ලෝසුව නීත්‍යනුකූලව තබා ගැනීම සඳහා රන් කරුවාට ණයක් වී නැති "ඒ" ප්‍රසිද්ධියේ ම සාප්පුවට ඇතුළු ව, "ඉසෙඩ්" ගේ අතින් බලෙන් ම ඔරලෝසුව රැගෙන යයි. මෙහි දී "ඒ" සාපරාධී අයුතු ඇතුළුවීමක් හා අඩන්තේට්ටමක් කරන්නට ඇති වුව ද, තමා විසින් කළ දෙය වංක ලෙස නොකළ බැවින් සොරකම් කර නැත.

(ඒ) තමාගේ ඔර්ලෝසුව අළුත්වැඩියා කිරීම සඳහා "ඉසෙඩ්" ට "ඒ" ගෙන් මුදලක් ගන්නට තිබී. ණය පිළිබඳ ව ඇපයක් සඳහා ඔර්ලෝසුව නීත්‍යනුකූලව ඉසෙඩ් තබා ගත් අවස්ථාවක දී තම ණයට ඇපයක් වශයෙන් එකී දේපළ "ඉසෙඩ්" විසින් තබා ගනු ලැබීම වැළැක්වීමේ අදහසින් "ඒ" "ඉසෙඩ්" ගේ ස්වාමිත්වයෙන් ඔර්ලෝසුව පැහැර ගත හොත්, ඔහු එය වංක ලෙස ගත් බැවින් සොරකම කරයි.

(ඔ) නැවත "ඒ" තමාගේ ඔර්ලෝසුව "ඉසෙඩ්" ට උකස් කොට තිබී, ඔර්ලෝසුව වෙනුවෙන් ගත් මුදල නො ගෙවා "ඉසෙඩ්" ගේ කැමැත්ත නොමැති ව, ඔහුගේ ස්වාමිත්වයෙන් ඔර්ලෝසුව පැහැර ගතහොත්, එය තමාගේ දේපළක් වුව ද, පැහැර ගත්තේ වංක ලෙස බැවින් ඔහු සොරකම කරයි.

(ඕ) නැවත දීම සඳහා තෑගි වශයෙන් මුදල් ලැබෙන තෙක් තබා ගැනීමේ අදහසින් "ඉසෙඩ්" ට අයිති භාණ්ඩයක් "ඉසෙඩ්" ගේ කැමැත්ත නො මැති ව, ඔහුගේ ස්වාමිත්වයෙන් "ඒ" පැහැර ගනියි. එම නිසා "ඒ" සොරකම කර ඇත.



https://ezofz.web.lk/
Scanned with CamScanner

(ක) "ඉසෙඩ්" සමග යහළුව සිටින "ඒ" "ඉසෙඩ්" නැති විටක දී ඉසෙඩ්" ගේ පොත් ගුලට ගොස් නැවත ගෙනවිත් දීමේ අදහසින් කියවීමට පමණක් "ඉසෙඩ්" ගේ ප්‍රකාශිත කැමැත්ත නොමැතිව පොතක් ගෙන යයි. මෙහි දී "ඒ" ට "ඉසෙඩ්" ගේ පොත් පාවිච්චි කිරීමට "ඉසෙඩ්" ඇඟ වූ කැමැත්ත ඇතැ යි "ඒ" විශ්වාස කරන්නට ඉඩ ඇත. මෙය "ඒ" ගේ හැඟීම නම් "ඒ" සොරකම කර නැත.

(ග) "ඒ" "ඉසෙඩ්" ගේ භාර්යාවගෙන් පිනට ඉල්ලයි. ඈ "ඒ" ට ඇගේ ස්වාමිපුරුෂයා වූ "ඉසෙඩ්" ට අයිති දේවල් බව "ඒ" දන්වා වූ, මුදල් ආහාර හා රෙදි දෙයි. මෙහි දී "ඉසෙඩ්" ගේ භාර්යාවට පිනට දීමට බලය ඇතැයි "ඒ" විශ්වාස කරන්නට ඉඩ ඇත. මෙය "ඒ" ගේ හැඟීම නම්, "ඒ" සොරකම කර නැත.

(ජ) "ඒ" "ඉසෙඩ්" ගේ භාර්යාවගේ සොර සැමියා වෙයි. ඇයගේ ස්වාමිපුරුෂයා වූ "ඉසෙඩ්" ට අයිති බව ද දීමට "ඉසෙඩ්" ගෙන් ඇය බලය ලබා නැති බව ද "ඒ" දන්නා වූ වටිනා දේ පළක් ඈ දෙයි. "ඒ" එකී දේපළ වංක ලෙස ගතහොත් ඔහු හොරකම කරයි.

(ට) "ඉසෙඩ්" ට අයිති දේපළක් තමාගේ දේපළ යයි සද්භාවයෙන් විශ්වාස කරමින් "ඒ" එකී දේපළ "බී" ගේ ස්වාමිත්වයෙන් ගනියි. මෙහි දී "ඒ" වංක ලෙස නො ගන්නා බැවින් ඔහු සොරකම නො කරයි.

**367.** සොරකම් කරන තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ද දඬුවම් කළ යුතු ය. — සොරකම ගැන දඬුවම.

**368.** යමකු—

(අ) ගොනකු, එළදෙනකු, ගොන්නාම්බකු, මීහරකකු, වැස්සියක හෝ වස්සකු ; හෝ — ගවයන් සොරකම් කිරීම.

(ආ) පළතුරු, එළවලු හෝ වෙනත් කෘෂි ද්‍රව්‍යයක් හෝ මිනිසාගේ හෝ සතකුගේ ආහාර සඳහා හෝ බෙහෙත් සඳහා හෝ පෙරීම සඳහා හෝ වර්ණ කිරීම සඳහා හෝ යමක් නිපදවීමෙහි දී පාවිච්චි කරනු ලැබූ හෝ පාවිච්චි කළ හැකි යම් වවනු ලැබූ අලයක් හෝ පැලයක් ; — කෘෂි ද්‍රව්‍ය සොරකම් කිරීම.

සොරකම් කරතහොත්, ඔහුට සොරකම සඳහා දෙනු ලැබූ වෙනත් දඬුවමකට අතිරේකව, කස පහරදීමෙන් දඬුවම් කළ හැකි ය.

**369.** මනුෂ්‍ය වාසයට හෝ දේපළ ආරක්ෂා කර තැබීමට පාවිච්චි කරනු ලබන යම් ගොඩනැගිල්ලක, කූඩාරමක හෝ යාත්‍රාවක සොරකම් කරන තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. — පදිංචි ගෙයක් ආදියෙහි සොරකම් කිරීම.

**370.** යමකු ලිපිකරුවකු ව හෝ සේවකයකු ව නැතහොත් ලිපිකරුවකු වශයෙන් හෝ සේවකයකු වශයෙන් සේවයෙහි යොදවනු ලැබ, තම ස්වාමියාගේ හෝ සේවා යෝජකයාගේ ස්වාමිත්වයෙහි ඇති දේපළක් සම්බන්ධයෙන් සොරකමක් කළ හොත්, ඔහුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. — ස්වාමියාගේ ස්වාමිත්වයෙහි ඇති යම් දේපළක් ලිපිකාරයකු විසින් හෝ සේවකයකු විසින් සොරකම් කරනු ලැබීම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

සොරකමක් කිරීම සඳහා මරණය හෝ තුවාල කිරීමට වූ සූදානමින් පසු කරනු ලබන සොරකම.

**371.** සොරකමක් කිරීම සඳහා හෝ සොරකමක් කිරීමෙන් තමා බේරී යෑම සඳහා හෝ සොරකම්වලින් ගන්නා ලද දේපළ තබා ගැනීම සඳහා යම් තැනැත්තකුට මරණය හෝ තුවාළ හෝ අවහිර කිරීම සඳහා හෝ එබඳු අදහසකින් එබන්දකුට මැරීමේ හෝ තුවාළ කිරීමෙන් හෝ අවහිර කිරීමේ බියක් ඇති කිරීම සඳහා සූදානම් වීමෙන් පසු සොරකමක් කරන තැනැත්තකුට අවුරුදු දහය දක්වා කාලයක, තදබල බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

**නිදර්ශන**

(අ) "ඉසෙඩ්" ගේ ස්වාමිත්වයෙහි ඇති දේපළක් "ඒ" සොරකම් කරයි. මේ සොරකම් කරන අතර "ඉසෙඩ්" විරුද්ධ වුවහොත් ඔහුට තුවාළ කිරීමේ කාර්යය සඳහා සපයා ගත් පතරොන් දමනු ලැබූ පිස්තෝලයක් ඔහුගේ ඇඳුම් යට ඇත්තේ ය. මේ වගන්තියෙහි විස්තර කරනු ලැබූ වරද "ඒ" කර ඇත.

(ආ) තමා කරන දෙය පෙනී "ඉසෙඩ්" විරුද්ධ වුවහොත්, හෝ තමා අත්අඩංගුවට ගැනීමට තැත් කරතොත් එ බඳු විරුද්ධවීමෙන් හෝ අත් අඩංගුවට ගැනීමට තැත් කිරීමෙන් "ඉසෙඩ්" වැළැක් වීම සඳහා "ඒ" ගේ සහචරයන් කීපදෙනෙකු "ඉසෙඩ්" ළඟ සිටවීමෙන් පසු "ඒ" "ඉසෙඩ්" ගේ සාක්කුවෙන් සොරකම් කරයි. මේ වගන්තියෙහි විස්තර කරනු ලැබූ වරද "ඒ" කර ඇත.

## බලෙන් ලබා ගැනීම

බලෙන් ලබා ගැනීම.

**372.** යම් දේපළක් හෝ වටිනා ඇපයක් හෝ වටිනා ඇපයකට හැරවිය හැකි ව අත්සන් කරනු ලැබූ හෝ මුද්‍රා තබනු ලැබූ යමක් යමකුට දීම සඳහා යම් තැනැත්තකුට හෝ වෙනත් තැනැත්තකුට යම් පාඩු කිරීමේ බියක් ඕනෑකමින් ම ඇතිකර වීමෙන් ඒ තැනැත්තා වංක ලෙස පොළඹවතොත් ඔහු "බලෙන් ලබා ගැනීම" කරයි.

**නිදර්ශන**

(අ) "ඉසෙඩ්" තමාට මුදලක් නුදුන්නහොත්, ඔහු සම්බන්ධයෙන් අපහාස සහගත ලිඛිත ප්‍රකාශයක් ප්‍රසිද්ධ කරන බවට "ඒ" තර්ජන කර ඔහුට මුදලක් දීමට "ඉසෙඩ්" පොළඹවයි. "ඒ" බලෙන් ලබා ගැනීම කර ඇත.

(ආ) "ඒ" යම් මුදලක් ගෙවීමට "ඉසෙඩ්" බැඳෙන පොරොන්දු පත්‍රයක් "ඉසෙඩ්" අත්සන්කොට "ඒ" ට භාර නොදුනහොත් "ඉසෙඩ්" ගේ දරුවා අයුතු ලෙස සිර කර තබන බවට "ඒ" ඉසෙඩ් ට තර්ජනය කරයි. "ඉසෙඩ්" අත්සන් කර පත්‍රය බාර දෙයි. "ඒ" බලෙන් ලබා ගැනීම කර ඇත.

(ඇ) බරපතළ තුවාළ කිරීමේ බියකට "ඉසෙඩ්" පැමිණවීමෙන් හිස් කඩදාසියකට අත්සන් කර හෝ තම මුද්‍රාව තබා එය "ඒ" ට බාරදීමට "ඒ" වංක ලෙස "ඉසෙඩ්" පොළඹවයි. "ඉසෙඩ්" කඩදාසිය අත්සන් කර "ඒ" ට භාරදෙයි. අත්සන් කරනු ලැබූ කඩදාසිය වටිනා ඇපයකට හැරවිය හැකි බැවින් මෙහි දී, "ඒ" බලෙන් ලබා ගැනීම කර ඇත.

බලෙන් ලබා ගැනීම ගැන දඬුවම.

**373.** බලෙන් ලබා ගැනීම කරන තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

බලෙන් ලබා ගැනීම සඳහා පාඩු කිරීමේ බියකට යම් තැනැත්තකු පැමිණවීම.

**374.** බලෙන් ලබා ගැනීම සඳහා යම් තැනැත්තකු පාඩුකිරීමේ බියකට පමුණුවන හෝ පැමිණවීමට තැත් කරන තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

375. යම් තැනැත්තකුට හෝ වෙනත් තැනැත්තකුට මරණය හෝ බරපතළ තුවාල සිදු කිරීමේ බියකට පැමිණවීමෙන් බලෙන් ලබා ගැනීම සිදු කරන තැනැත්තකුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

මරණය හෝ බරපතල තුවාල කිරීමේ බියකට යම් තැනැත්තකු පැමිණවීමෙන් බලෙන් ලබා ගැනීම.

376. බලෙන් ලබා ගැනීම සඳහා යම් තැනැත්තකු හෝ වෙනත් තැනැත්තකුට මරණය හෝ බරපතළ තුවාළ සිදුකිරීමේ බියකට යමකු ඒ තැනැත්තා පමුණුවතොත් හෝ පැමිණවීමට තැත් කරතොත් ඔහුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

බලෙන් ලබා ගැනීම සඳහා මරණය හෝ බරපතල තුවාළ කිරීමේ බියකට යම් තැනැත්තකු පැමිණවීම.

377. මරණයෙන් හෝ අවුරුදු දහය දක්වා කාලයක, බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් සිදුකැළැයි හෝ සිදු කිරීමට තැත් කරන ලදැයි හෝ එ බඳු වරදක් සිදු කිරීමට වෙනත් තැනැත්තකු පෙළඹවීමට තැත් දරන ලදැ යි යන චෝදනාවක් යම් තැනැත්තකුට හෝ වෙනත් තැනැත්තකුට විරුද්ධව ගෙන ඒමේ බියක් පළමු කී තැනැත්තාට පැමිණ වීමෙන් බලෙන් ලබා ගැනීම සිදු කරන තැනැත්තකුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. එසේ ම, වරද 365 වෙනි වගන්තිය යටතේ දඬුවම් කළ හැකි වරදක් වූ විට අවුරුදු විස්ස දක්වා කාලයක, තදබල බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ හැකි ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

මරණය හෝ අවුරුදු දහයක බන්ධනාගාර ගත කිරීමකින් යනාදියෙන් දඬුවම් කළ හැකි වරදක් ගැන චෝදනා කිරීමේ තර්ජනයකින් බලෙන් ලබා ගැනීම.

378. මරණයෙන් හෝ අවුරුදු දහය දක්වා හෝ ඊට වැඩි කාලයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් සිදු කළැයි හෝ සිදු කිරීමට තැත් කරන ලදැ යි යම් තැනැත්තකුට හෝ වෙනත් තැනැත්තකුට විරුද්ධ ව චෝදනා කිරීමේ බියක් බලෙන් පැහැර ගැනීම සඳහා පළමු කී තැනැත්තාට පමුණුවන හෝ පැමිණවීමට තැත් කරන තැනැත්තකුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. එසේ ම, වරද 365 වෙනි වගන්තිය යටතේ දඬුවම් කළ හැකි වරදක් වූ විට අවුරුදු විස්ස දක්වා කාලයක, තදබල බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ හැකි ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

බලෙන් ලබා ගැනීම සඳහා යම් තැනැත්තකු වරදක් ගැන චෝදනා කිරීමේ බියකට පැමිණ වීම.

## කොල්ලකෑම

379. සියලු කොල්ලකෑම්වල සොරකම් හෝ බලෙන් ලබා ගැනීම ඇතුළත් වේ.

කොල්ලකෑම.

සොරකම කිරීම සඳහා හෝ සොරකම කිරීමේ දී හෝ සොරකමින් ලබාගත් දේපළ ගෙන යාමේ දී හෝ ගෙන යාමට තැත් කිරීමේ දී එකී පරමාර්ථය සඳහා වරදකරු කැමැත්තෙන්ම යම් තැනැත්තකුට මරණය හෝ තුවාල හෝ අයුතු අවහිරය සිදු කළහොත් හෝ සිදු කිරීමට තැත් කළහොත්, නැතහොත් ක්ෂණික මරණය හෝ ක්ෂණික තුවාල කිරීමේ හෝ ක්ෂණික අයුතු අවහිර කිරීමේ බියක් පැමිණවූවහොත් හෝ පැමිණවීමට තැත් කළහොත් සොරකම කොල්ලකෑම වේ.

සොරකම කොල්ලකෑම වන අවස්ථා



https://ezofz.web.lk/
Scanned with CamScanner

බලෙන් ලබාගැනීම කොල්ලකෑම වන අවස්ථා.

බලෙන් ලබා ගැනීම සිදු කරන වේලෙහි වරදකරු භය ගන් වනු ලැබූ තැනැත්තා ඉදිරිපිට සිටිමින් ඔහුට හෝ වෙනත් තැනැත්තකුට ක්ෂණික මරණයේ හෝ ක්ෂණික තුවාල කිරීමේ හෝ ක්ෂණික අයුතු අවහිර කිරීමේ බියක් පමුණුවා බලෙන් ලබා ගැනීම සිදු කිරීමෙන් පසු බලෙන් ලබා ගත් දෙය එ ලෙස බිය ගැන්වීමෙන් එවේලෙහි ම එ තැන දී ම බාරදීමට භය ගැන් වූ තැනැත්තා පෙළෙඹ වූ විට, බලෙන් ලබා ගැනීම කොල්ලකෑම වේ.

පැහැදිලි කිරීම.—වරදකරු අනෙක් තැනැත්තා ක්ෂණික මරණයේ හෝ ක්ෂණික තුවාළ කිරීමේ හෝ ක්ෂණික අයුතු අවහිර කිරීමේ බියට පැමිණිවීමට ප්‍රමාණවත් වන තරම් ළඟ සිටී නම්, වරදකරු ඉදිරිපිට සිටි ලෙස සලකනු ලැබේ.

**නිදර්ශන**

(අ) "ඒ" "ඉසෙඩ්" පහත් කොට අල්වා "ඉසෙඩ්" ගේ ඇඳුම්වලින් මුදල් සහ ආභරණ "ඉසෙඩ්" ගේ කැමැත්තක් නොමැති ව, වංචනික ලෙස ගනී. මෙහි දී, "ඒ" සොරකම කර ඇත්තේ ය. හොරකම කිරීම සඳහා "ඉසෙඩ්" ට කැමැත්තෙන් ම අයුතු අවහිරය කිරීම සිදු කළ හෙයින් "ඒ"කොල්ලකෑම කර ඇත.

(ආ) "ඒ" මහ පාරේ දී "ඉසෙඩ්" හමු ව පිස්තෝලයක් පෙන්වා "ඉසෙඩ්" ගේ පසුම්බිය ඉල්වයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් "ඉසෙඩ්" සිය පසුම්බිය ඔහුට දෙයි. මෙහි දී ක්ෂණික තුවාළ කිරීමේ බියක් "ඉසෙඩ්" ට පමුණුවා "ඒ" "ඉසෙඩ්" ගෙන් පසුම්බිය බලෙන් ලබාගත් හෙයින් ද, බලෙන් ලබා ගැනීම සිදු කරන වේලෙහි "ඒ" "ඉසෙඩ්" ඉදිරිපිට සිටි හෙයින් ද, "ඒ" කොල්ලකෑම කර ඇත.

(ඇ) "ඒ" ට මහ පාරේ දී, "ඉසෙඩ්" සහ "ඉසෙඩ්" ගේ දරුවා හමුවෙති. "ඒ" දරුවා ගෙන, "ඉසෙඩ්" ඔහුගේ පසුම්බිය තමාට නුදුන හොත් එකී දරුවා ප්‍රපාතයකින් පහතට හෙලන බවට තර්ජනය කරයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් "ඉසෙඩ්" ඔහුගේ පසුම්බිය බාර දෙයි එ තැනට පැමිණ සිටි දරුවාට ක්ෂණික තුවාළයක් සිදු කිරීමේ බියකට "ඉසෙඩ්" පමුණුවමින් "ඒ" ඔහුගේ පසුම්බිය බලෙන් ලබාගත් හෙයින් "ඒ" "ඉසෙඩ්" ගෙන් කොල්ලකෑම කර ඇත.

(ඈ) "නුඹේ දරුවා මගේ රංචුවේ අතට අසුවී සිටී, අප වෙත නුඹ රුපියල් දාහක් නො එව්වොත්, දරුවා මරණයට පමුණුවනු ලැබේ." යි කියමින් "ඒ" "ඉසෙඩ්" ගෙන් දේපළ ලබා ගනියි, මෙය බලෙන් ලබා ගැනීමක් වන අතර ම එ බඳු වරදක් වශයෙන් දඬුවම් කළ හැකි ය. එහෙත් එම දරුවාගේ ක්ෂණික මරණය පිළිබඳ ව බියකට "ඉසෙඩ්" පමුණුවනු ලැබුවහොත් මිස මෙය කොල්ලකෑමක් නො වේ.

කොල්ලකෑම සඳහා දඬුවම.

**380.** කොල්ලකෑම කරන තැනැත්තකුට අවුරුදු දහය දක්වා කාලයක, තදබල බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. එ සේ ම, ඉර බැසීම සහ ඉර නැගීම අතර කාලය තුළ මහ පාරේ දී, සිදු කරන ලද කොල්ලකෑමකට නම් බන්ධනාගාර ගත කිරීම අවුරුදු දහ හතර දක්වා වැඩි කළ හැකි ය.

කොල්ලකෑම කිරීමට තැත් කිරීම.

**381.** කොල්ලකෑමට කිරීමට තැත් කරන තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක, තදබල බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

කොල්ලකෑම කිරීමේ දී කැමැත්තෙන්ම තුවාල කිරීම.

**382.** කොල්ලකෑම කරමින් හෝ කිරීමට තැත් කරමින් යම් තැනැත්තෙකු කැමැත්තෙන් ම තුවාළ කළහොත්, එකී තැනැත්තාට ද, එ ලෙස කොල්ලකෑම කිරීමට හෝ තැත් කිරීමට එක් ව සම්බන්ධවුනු වෙනත් තැනැත්තකුට ද, අවුරුදු විස්ස දක්වා කාලයක, තදබල බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔවුන් දඩයකට හෝ කස පහර ලැබීමකට ද යටත් විය යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**383.** කොල්ලකෑම කරන වේලෙහි, වරදකරු යම් මාරක ආයුධයක් පාවිච්චි කරතොත් හෝ යම් තැනැත්තකුට බරපතළ තුවාළ කරතොත් හෝ යම් තැනැත්තකුට මරණය හෝ බරපතළ තුවාළ කිරීමට තැත් කරතොත් එබඳු වරදකරුවකුට දඬුවම් වශයෙන් බන්ධනාගාර ගත කළ යුතු කාලසීමාව අවුරුදු විස්ස දක්වා වැඩි කළ හැකි ය.

මරණය හෝ බරපතල තුවාල කිරීමට තැත් කිරීමත් සමග කොල්ලකෑම.

**384.** කොල්ලකෑමක් කිරීමට තැත් කරන වේලෙහි, වරදකරු යම් මාරක ආයුධයකින් සන්නද්ධ ව සිටියොත් ඔහුට දඬුවම් වශයෙන් බන්ධනාගාර ගත කළ යුතු කාලසීමාව අවුරුදු විස්ස දක්වා වැඩි කළ හැකි ය.

මාරක ආයුධයකින් සන්නද්ධව කොල්ලකෑමට තැත් කිරීම.

**385.** සිරිත් වශයෙන් සොරකම් හෝ කොල්ලකෑම කිරීමේ කාර්යය සඳහා සම්බන්ධ වූ තැනින් තැන ඇවිදින හෝ වෙනත් ආකාරය වූ තැනැත්තන් රංචුවකට අයත් වූවකුට අවුරුදු හත දක්වා කාලයක, තදබල බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

තැනින් තැන යන සොරු රංචුවකට අයත්වීම ගැන දඬුවම.

### දේපල පිළිබඳ සාපරාධී. සාවද්‍ය පරිහරණය

**386.** යම් චංචල දේපළක් වංක ලෙස සාවද්‍ය ව පරිහරණය කරන්නා වූ නැතහොත් සිය ප්‍රයෝජනයට ගන්නා වූ තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

දේපළ වංක ලෙස සාවද්‍ය පරිහරණය.

#### නිදර්ශන

(අ) ගන්නා වේලෙහි තමාගේ දේපළක් ය යි, සද්භාවයෙන් විශ්වාස කරමින් "ඒ" "ඉසෙඩ්" ට අයිති දේපළක්, "ඉසෙඩ්" ගේ ස්වාමිත්වයෙන් ගනියි. "ඒ" සොරකම ගැන වරදකාරයෙක් නොවේ එහෙත් තමාගේ වැරැද්ද දැන ගැනීමෙන් පසු වත්, එකී දේපළ වංක ලෙස තමාගේ ප්‍රයෝජනයට ඔහු ගනී නම් ඔහු මේ වගන්තිය යටතේ වරදකට වරදකාරයෙක් වේ.

(ආ) "ඉසෙඩ්" සමග මිත්‍ර සම්බන්ධයක් ඇති "ඒ" "ඉසෙඩ්" නැති විටක, ඔහුගේ පොත්ගුලට ගොස් "ඉසෙඩ්" ගේ ප්‍රකාශිත කැමැත්තක් නොමැතිව, පොතක් රැගෙන යයි, මෙහි දී පොත කියවීමේ කාර්යය සඳහා ගෙන යාමට "ඉසෙඩ්" ගේ ඇඟ වූ කැමැත්ත තමාට ඇතැයි යන හැඟීමක් "ඒ" කෙරෙහි තිබේ නම්, "ඒ" සොරකමක් කර නැත. එහෙත් පසුව, ඒකී පොත තමාගේ වාසිය සඳහා "ඒ" විකුණයි නම් මේ වගන්තිය යටතේ වරදකට ඔහු වරදකාරයෙක් වේ.

(ඇ) "ඒ" සහ "බී" අශ්වයකුගේ හවුල් අයිතිකාරයන් වීමෙන් පසු, "ඒ" උගෙන් ප්‍රයෝජන ගැනීම සඳහා "බී" ගේ ස්වාමිත්වයෙන් ඌ ගනී. මෙහි දී අශ්වයාගෙන් ප්‍රයෝජන ගැනීමට "ඒ" ට අයිතිකමක් තිබෙන බැවින් ඔහු අශ්වයා වංක ලෙස, සාවද්‍ය පරිහරණය නො කරයි. එහෙත්, "ඒ" අශ්වයා විකුණා, ඉන් ලැබෙන මුළු මුදල තමාගේ ප්‍රයෝජනයට ගතහොත් ඔහු මේ වගන්තිය යටතේ වරදකට වරදකාරයෙක් වේ.

**පැහැදිලි කිරීම 1**.– කාලයකට පමණක් වංක සාවද්‍ය පරිහරණය කිරීමක් මේ වගන්තියෙහි අර්ථය ඇතුළත සාවද්‍ය පරිහරණයක් වේ.

#### නිදර්ශන

"ඉසෙඩ්" ට අයිති වූ රැගෙන එන්නාට ගෙවතහැකි පොරොන්දු පත්‍රයක් "ඒ" ට සම්භවේ. එම පත්‍රය "ඉසෙඩ්" ට අයිති බව දනිමින් ම "ඒ" එය මතු දවසක දී "ඉසෙඩ්" ට නැවත භාර දෙන අදහසින් ණයකට ඇපයක් වශයෙන් බැංකු කරුවකුට උකස් කරයි. "ඒ" මේ වගන්තිය යටතේ වරදක් කර ඇත.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**පැහැදිලි කිරීම 2.–** (i) යම් තැනැත්තකුගේ ස්වාමිත්වයෙහි නොමැති දේපළක් සම්භවුණු විටක දී, එය අයිතිකාරයා වෙත ප්‍රවේසම් කර දීමේ කාර්යය සඳහා හෝ එය නැවත දීම සඳහා යම් තැනැත්තකු එකී දේපළ ගතහොත්, ඔහු එය වංක ලෙස ගැනීම හෝ සාවද්‍ය පරිහරණය නොකරයි. එමෙන් ම වරදකට වරදකාරයෙක් නොවේ. එහෙත් එහි අයිතිකාරයා දනිමින් ම හෝ අයිතිකාරයා සොයා ගැනීමේ මාර්ගයක් පිළියෙල වීමට හෝ අයිතිකාරයා සොයා දැනුම් දීමට සාධාරණ පිළිවෙළක් අනුගමනය කිරීමට පෙර හෝ අයිතිකාරයාට තම අයිතිය ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි සාධාරණ කාලයක් ඉකුත්වීමට පෙර ඔහු එය තමාගේ ප්‍රයෝජනයට ගතහොත්, ඔහු ඉහත විස්තර කරනු ලැබූ වරදකට වරදකාරයෙක් වේ.

(ii) එබඳු අවස්ථාවක දී, සාධාරණ පිළිවෙළ හෝ සාධාරණ කාලය යන්න සිද්ධිය පිළිබඳ ප්‍රශ්නයක් වේ.

(iii) එකී දේපළ අයිතිකාරයා කවරෙක් ද, යනු හෝ යම් විශේෂ තැනැත්තෙක් එහි අයිතිකාරයා ය ; යනු සම්භවුණු තැනැත්තා විසින් දැන ගනු ලැබීම අවශ්‍ය නො වේ. එය අත්කර ගන්නා වේලෙහි එය තමාගේ දේපළක් නො වන බව විශ්වාස කිරීම හෝ නියම අයිතිකාරයා සොයා ගැනීම නො හැකි යයි සද්භාවයෙන් විශ්වාස කිරීම ප්‍රමාණවත් වේ.

### නිදර්ශන

(අ) කවරකුට අයත්දැයි "ඒ" ට දැන ගත නො හැකි වූ රුපියලක් මහා මාර්ගයේ දී "ඒ" ට සම්භවේ. "ඒ" රුපියල ඇහිඳ ගනියි. මෙහි දී, මේ වගන්තියෙහි විස්තර කරනු ලැබූ වරද "ඒ" කර නැත.

(ආ) බැංකු නෝට්ටුවක් ඇතුළත් ලියුමක් "ඒ" ට පාරේ දී සම්භ වේ. ලියුමෙහි සඳහන් නියමවලින් හා එහි අඩංගු කරුණුවලින් එම නෝට්ටුව කාට අයත් දැයි දැන ගනියි. ඔහු නෝට්ටුව පරිහරණය කරගනියි. මේ වගන්තිය යටතේ වරදට ඔහු වරදකාරයෙක් වේ.

(ඇ) රැගෙන එන්නාට ගෙවත හැකි චැක් පතක් "ඒ" ට සම්භවෙයි. කා අතින් එම චැක්පත නැතිවුණේදැයි සිතා ගැනීමට ඔහුට නොහැකි ය. එහෙත් චැක්පත ලියා අත්සන් කරන ලද තැනැත්තාගේ නම සඳහන් ව ඇත. චැක්පත ලියා අත්සන් කර දෙන ලද්දේ කවරකුගේ වාසියට දැයි ඔහු විසින් තමාට දැන්විය හැකි බව "ඒ" දනියි. අයිතිකාරයා සොයා ගැනීමට තැත් නොකර "ඒ" චැක්පත පරිහරණය කර ගනියි. ඔහු මේ වගන්තිය යටතේ වරදකට වරදකාරයෙක් වේ.

(ඈ) මුදල් සහිත පසුම්බිය "ඉසෙඩ්" ගෙන් වැටෙන බව "ඒ" දකී. එය "ඉසෙඩ්" ට නැවත දීමේ අදහසින් "ඒ" එය ඇහිඳ ගනියි. එහෙත්, පසු ව එය තමාගේ ප්‍රයෝජනයට පරිහරණය කර ගනියි. "ඒ" මේ වගන්තිය යටතේ වරදක් කර ඇත.

(ඉ) කවරකුට අයත් දැයි නොදන්නා වූ මුදල් සහිත පසුම්බියක් "ඒ" ට සම්භවෙයි. එය "ඉසෙඩ්" ට අයත් බව ඔහු පසුව දැන ගෙන එය තමාගේ ප්‍රයෝජනයට ගනියි. "ඒ" මේ වගන්තිය යටතේ වරදකට වරදකාරයෙක් වේ.

(ඊ) කවරකුට අයත් දැයි නොදන්නා වූ වටිනා මුද්දක් "ඒ" ට සම්භවෙයි. අයිතිකාරයා සොයා ගැනීමට තැත් නොකර "ඒ" එකෙනෙහිම එය විකුණයි. "ඒ" මේ වගන්තිය යටතේ වරදකට වරදකාරයෙක් වේ.

මරණය සිදු වන වේලෙහි නැසීගිය තැනැත්තකුගේ ස්වාමිත්වයේ තිබූ දේපල වංක ලෙස සාවද්‍ය පරිහරණය.

**387.** යම් තැනැත්තකුගේ මරණය සිදුවන වේලෙහි, ඔහුගේ ස්වාමිත්වයෙහි තිබුණා වූ ද, ඉන් පසු එහි ස්වාමිත්වයට නීත්‍යානුකූලව බලය ඇති තැනැත්තාගේ ස්වාමිත්වයෙහි නොතිබුණා වූ ද බව දනිමින් යම් දේපළක් යම් තැනැත්තෙකු වංක ලෙස සාවද්‍ය පරිහරණයට ගතහොත් හෝ තමාගේ ප්‍රයෝජනයට ගතහොත් ඔහුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. එකී තැනැත්තා මියගිය වේලෙහි ඔහුගේ ලිපිකරුවකු වශයෙන් හෝ සේවකයකු වශයෙන් වරදකරු සේවයෙහි යෙදී සිටිය හොත්, බන්ධනාගාර ගත කිරීම අවුරුදු හත දක්වා වැඩි විය හැකි ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

ගෘහ භාණ්ඩ සහ මුදල් තම ස්වාමිත්වයෙහි තිබිය දී, "ඉසෙඩ්" මිය යයි. මුදල් අයත් වීමට බලය ඇති තැනැත්තකුගේ ස්වාමිත්වයට ඒමට පෙර එකී මුදල ඔහුගේ සේවකයකු වූ "ඒ" වංක ලෙස සාවද්‍ය පරිහරණය කරයි. මේ වගන්තියෙහි විස්තර කරනු ලැබූ වරද "ඒ" කර ඇත.

## සාපරාධී විශ්වාස කඩ කිරීම

**388.** යම් අන්දමකට යම් දේපළක් භාර දෙනු ලැබූ හෝ දේපළක යම් ආධිපත්‍යයක් භාර දෙනු ලැබූ තැනැත්තකු විසින් ඒ දේපළ වංක ලෙස සාවද්‍ය පරිහරණය කළහොත් හෝ තමාගේ ප්‍රයෝජනයට ගතහොත් හෝ එකී භාරය ඉෂ්ට කළ යුතු ක්‍රමය නියම කරනු ලබන නීතියේ නියමයකට විරුද්ධ ව හෝ එකී භාරය ඉෂ්ට කිරීම සම්බන්ධයෙන් තමා බැඳුණු ප්‍රකාශිත හෝ ඇඟවුණු නීත්‍යානුකූල ගිවිසුමක නීති පිළිබඳ නියමයකට විරුද්ධව දේපළ වංක ලෙස පාවිච්චි කළහොත් හෝ එකී දේපළවලට යමක් කළහොත් හෝ එබන්දක් වෙනත් තැනැත්තකු විසින් කරනු ලැබීමට ඕනෑවට ඉඩහරිතොත් ඔහු සාපරාධී "විශ්වාස කඩ කිරීම" සිදු කරයි. සාපරාධී විශ්වාස කඩ කිරීම.

### නිදර්ශන

(අ) "ඒ" නැසීගිය තැනැත්තකුගේ අන්තිම කැමති පත්‍රයක බුදල් බල කාරයකුව එකී දේපළ අන්තිම කැමති පත්‍රය ප්‍රකාර බෙදීමට නියම කරනු ලැබූ නීතිය වංක ලෙස නොපිළිපැද, දේපළ තමාගේ ප්‍රයෝජනයට අත්කර ගනී. "ඒ" සාපරාධී විශ්වාස කඩකිරීම කර ඇත.

(ආ) "ඒ" ගබඩා පාලකයෙකි. "ඉසෙඩ්" ගමනක් යාමෙහි දී, ගබඩා ගාස්තුව වශයෙන් පොරොන්දු වූ මුදලක් දීමෙන් පසු නැවත තමාට භාර දෙන ගිවිසුමක් යටතේ තම ගෘහ භාණ්ඩ "ඒ" ට භාර දෙයි. "ඒ" එකී බඩු වංක ලෙස විකුණයි, "ඒ" සාපරාධී විශ්වාස කඩ කිරීම කර ඇත.

(ඇ) කොළඹ පදිංචි "ඒ" එංගලන්තයේ පදිංචි "ඉසෙඩ්" ගේ නියෝජිතයෙකි. "ඉසෙඩ්" විසින් "ඒ" ට එවනු ලබන සියලු මුදල් "ඉසෙඩ්" ගේ නියමය පරිදි යෙදිය යුතු ය, යන ප්‍රකාශිත හෝ ඇඟවෙන ගිවිසුමක් "ඒ" හා "ඉසෙඩ්" අතර ඇත්තේ ය. රුපියල් දහදාහක් කෝපි වතු උකස් ගැනීමෙහි යෙදිය යුතු ය, යන නියමය පිට "ඉසෙඩ්" "ඒ" ට රුපියල් දහදාහක් යවයි. "ඒ" එකී නියමය වංක ලෙස නොපිළිපදිමින් එම මුදල තම ව්‍යාපාරයෙහි යොදවයි. "ඒ" සාපරාධී විශ්වාස කඩකිරීම සිදු කර ඇත.

(ඈ) එහෙත් "ඒ" ඉහත සඳහන් නිදර්ශනයේ දී , වංක ලෙස නොව සද්භාවයෙන් වෙළඳ සමාගමක කොටස් ලබා ගැනීම "ඉසෙඩ්" ගේ වැඩි යහපතට හේතුවේ යයි විශ්වාස කරමින් "ඉසෙඩ්" ගේ නියමය නො පිළිපැද එකී මුදල් උකස් ගැනීම් වලට නො යොදා වෙළඳ සමාගමක කොටස් "ඉසෙඩ්" ගේ නමින් ගැනීමට යෙදුවහොත් ඉන් "ඉසෙඩ්" ට අලාභ සිදුවීමෙන් එකී අලාභය සඳහා "ඒ" ට විරුද්ධව සිවිල් නඩුවක් පැවරීමට බලය ඇතත් "ඒ" වංක ලෙස ක්‍රියා නො කළ හෙයින් සාපරාධී විශ්වාස කඩකිරීම කර නැත.

(ඉ) ආදායම් නිලධාරියකු වූ "ඒ" ට මහජන මුදල් භාර කොට ඇත්තේ ය. තමා ලබා ඇති සියලුම මහජන මුදල් එක්තරා කච්චේරියකට ගෙවිය යුතු ලෙස ඔහුට නීතියෙන් නියම කොට හෝ ආණ්ඩුව සමග ප්‍රකාශිත හෝ ඇඟවුණු ගිවිසුමකින් ඔහු බැඳී ඇත්තේ ය. "ඒ" වංක ලෙස එකී මුදල පරිහරණය කර ගනී. ඔහු සාපරාධී විශ්වාස කඩ කිරීම කර ඇත.

(ඊ) බඩු ගෙන යන්නකු වූ "ඒ" ට ගොඩබිමෙන් හෝ ජලයෙන් ගෙන යාම සඳහා "ඉසෙඩ්" යම් දේපළක් භාර කොට ඇත්තේ ය. "ඒ" එකී දේපළ වංක ලෙස සාවද්‍ය පරිහරණය කරයි. "ඒ" සාපරාධී විශ්වාස කඩකිරීම කර ඇත.



https://ezofz.web.lk/
Scanned with CamScanner

සාපරාධි විශ්වාස කඩකිරීම ගැන දඬුවම.

**389.** සාපරාධි විශ්වාස කඩකරන තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ .එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

බඩු ගෙන යන්නකු ආදි තැනැත්තන් විසින් කරනු ලැබූ සාපරාධි විශ්වාස කඩ කිරීම.

**390.** යමකු බඩු ගෙන යන්නකු වශයෙන්, හෝ රේගු පාලකයකු වශයෙන් හෝ ගබඩා පාලකයකු වශයෙන් යම් දේපළක් භාර දෙනු ලැබ එකී දේපළ සම්බන්ධයෙන් සාපරාධි විශ්වාස කඩකරතහොත්, ඔහුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කල යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

ලිපිකරුවකු විසින් හෝ සේවකයකු විසින් කරනු ලැබූ සාපරාධි විශ්වාසය කඩ කිරීම.

**391.** යමකු ලිපිකරුවකු ව, හෝ සේවකයකු ව, හෝ එබන්දකු ලෙස සේවයෙහි යොදනු ලැබ, එබන්දකු වශයෙන් යම් දේපළක් යම් ආකාරයකට භාර දෙනු ලැබ හෝ යම් දේපළක අයිතියක් පවරනු ලැබ, එම දේපළ සම්බන්ධයෙන් සාපරාධි විශ්වාස කඩකරතොත් ඔහුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

රජයේ සේවකයකු විසින් හෝ බැංකුකාරයකු විසින් හෝ වෙළෙන්දකු විසින් හෝ නියෝජිතයකු විසින් කරනු ලැබූ සාපරාධි විශ්වාස කඩකිරීම.

**392.** රජයේ සේවකයකු වශයෙන් හෝ සිය ව්‍යාපාරයේ යෙදී සිටින බැංකුකාරයකු, වෙළෙන්දකු, වෙළඳ නියෝජිතයකු බ්‍රෝකර්කෙනකු හෝ පරකාර්ය සාධකයකු හෝ නියෝජිතයකු වශයෙන් යම්කිසි ආකාරයකට දේපළ භාර දෙනු ලැබූ හෝ දේපළ පිළිබඳ ආධිපත්‍යයක් පවරනු ලැබූ තැනැත්තකු එකී දේපළ සම්බන්ධයෙන් සාපරාධි විශ්වාසකඩ කරතහොත්, ඔහුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

මුදල් සම්බන්ධයෙන් හෝ ඉතිරි මුදල් සම්බන්ධයෙන් රජයේ සේවකයකු විසින් කරගනු ලැබූ සාපරාධි විශ්වාසකඩ කිරීම.

**392අ.** රජයේ සේවකයකු වශයෙන් යම් මුදලක් භාරය හෝ ආධිපත්‍යය පවරනු ලැබූ තැනැත්තකුට, ඔහුගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා විසින් හෝ භාණ්ඩාගාරයේ ලේකම් තැන විසින් හෝ එහි නියෝජ්‍ය ලේකම් තැන විසින් හෝ ගණන් පරීක්ෂකාධිකාරි විසින් හෝ සහකාර ගණන් පරීක්ෂකාධිකාරි විසින් හෝ ඔහුගේ දෙපාර්තමේන්තුවේ ගනු දෙනු පරීක්ෂා කිරීම පිණිස භාණ්ඩාගාරයේ ලේකම් තැන විසින් විශේෂයෙන් පත් කරනු ලැබූ යම් නිලධාරියකු විසින්, එබඳු රජයේ සේවකයකු වශයෙන් ඔහු ළඟ ඇති ලෙස හෝ ඔහුගෙන් අය විය යුතු ලෙස හෝ ඔහු විසින් යථා පරිදි ගනුදෙනු පෙන්විය යුතු ලෙස, ඔහු විසින් තබනු ලැබූ හෝ අත්සන් කරනු ලැබූ පොත්වල හෝ, ගනු දෙනු ලේඛනවල හෝ ප්‍රකාශවල පෙනෙන යම් මුදලක් හෝ ඉතිරි මුදලක් වහාම ගෙවන ලෙස හෝ ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ අවස්ථාවක දී, එකෙනෙහිම එසේ ඉදිරිපත් කිරීම හෝ ගෙවීම නොකළ හොත්, ඔහු සාපරාධි විශ්වාස කඩකිරීමේ වරදට වරදකාරයෙක් වේ. එසේ වරදකාරයා වීමේ දී, ඔහු 392 වෙනි වගන්තියෙන් සලස්වා ඇති දඬුවමට යටත් විය යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**392ආ.** යම් තැනැත්තකුගේ නියෝජිතයකු ලෙස ක්‍රියා කරන නැතහොත් ක්‍රියා කරන බවක් හඟවන තැනැත්තකුට එකී අතික් තැනැත්තාට භාර දීම පිණිස යම් තැපැල් භාණ්ඩයක් තැපැල් නිලධාරියකුගෙන් ලැබුණු විට,

තැපැල් භාණ්ඩ සම්බන්ධයෙන් නියෝජිතයකු, විසින් කරනු ලබන සාපරාධී විශ්වාස කඩකිරීම.

(අ) එය ඕනෑවට විසි කළහොත්, විනාශ කළහොත්, තබා ගතහොත්, හෝ සඟවතොත්, හෝ

(ආ) සාධාරණ සමාවේ හේතුවක් නොමැතිව, (එකී සමාවේ හේතුව ඔප්පු කිරීම පළමු කී තැනැත්තා වෙත රැඳේ) එකී භාණ්ඩය ගැන යථා පරිදි වගකීම පැහැර හැරියොත් හෝ එකී භාණ්ඩය භාර දීම අයථා ලෙස ප්‍රමාද කළහොත්,

ඔහු සාපරාධී විශ්වාස කඩකිරීම ගැන වරදකාරයකු ලෙස සැලකිය යුතුවාක් මෙන් ම, ඒ පිළිබඳ නියමිත දඬුවමට ද යටත් විය යුතු ය.

## සොරබඩු බාර ගැනීම

**393.** සොරකමින් හෝ බලෙන් ගැනීමෙන් හෝ කොල්ල කෑමෙන් හෝ කූට ලේඛනයෙන් හෝ වංචා කිරීමෙන් ස්වාමිත්වය පවරා ගනු ලැබූ බඩු ද, සාපරාධී ලෙස, සාවද්‍ය පරිහරණය කරනු ලැබූ බඩු හෝ සාපරාධී විශ්වාස කඩ කිරීමකින් ලැබුණු බඩු ද, එකී පවරාගනු ලැබීම හෝ සාවද්‍ය පරිහරණය හෝ විශ්වාස කඩ කිරීම මේ දිවයින ඇතුළත හෝ පිටත වුව ද, "සොර බඩු" ලෙස නම් කරනු ලැබේ. එහෙත්, එබඳු බඩුවල ස්වාමිත්වයට නීත්‍යානුකූලව බලය ඇති තැනැත්තකුගේ ස්වාමිත්වය යටතට එම බඩු පසුව පැමිණේ නම්, එය සොර බඩු වීම කෙළවර වේ.

හොර බඩු.

**394.** යම් සොර බඩු, සොර බඩු බව දනිමින් ම හෝ එලෙස බව විශ්වාස කිරීමට කරුණු තිබිය දී ම, යමකු වංක ලෙස බාර ගතහොත්, නැතහොත් තබා ගතහොත්, ඔහුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමෙන් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

සොර බඩු වංක ලෙස බාර ගැනීම.

**395.** යම් බඩු, සොර බඩු බව දනිමින් ම හෝ එලෙස බව විශ්වාස කිරීමට කරුණු තිබිය දී යමකු සිරිත් ලෙස බාර ගතහොත්, හෝ ගනුදෙනු කළහොත් ඔහුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

සිරිත් ලෙස සොර බඩු අලෙවි කිරීම.

**396.** යම් බඩු, සොර බඩු දනිමින් ම හෝ එලෙස බව විශ්වාස කිරීමට කරුණු තිබිය දී ම සැඟවීමට හෝ අලෙවි කිරීමට හෝ විනාශ කිරීමට යමකු කැමැත්තෙන් ම සහාය වෙතොත්, ඔහුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

සොර බඩු සඟවා තැබීමට සහාය වීම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

සොකරම් කරනු ලැබූ ගවයන් හෝ කෘෂි ද්‍රව්‍ය බාර ගැනීම.

**397.** ඉහතින් දැක්වුණු වගන්ති තුනෙහි සඳහන් සොර බඩු 368 වෙනි වගන්තියෙහි සඳහන් විස්තරවලින් යමක් වී නම්, වරදකරුට ඒ වගන්ති තුනෙන් නියම කරනු ලැබූ දඬුවම්වලට අතිරේක ව, කස පහර දීමෙන් දඬුවම් කළ හැකි ය.

## වංචා කිරීම

වංචා කිරීම.

**398.** යමකු යම් තැනැත්තකු රැවටීමෙන් පසු එ ලෙස රැවටූ තැනැත්තා යම් තැනැත්තකුට දේපළක් බාරදීමට හෝ යම් තැනැත්තකු ළඟ යම් දේපළක් තබා ගැනීමට කැමතිවීමට වංකව හෝ වංචක ලෙස පෙළඹුවහොත්, හෝ එලෙස රැවටුණු තැනැත්තා නොරැවටී සිටියේ නම් ඔහු කරනු නො ලබන හෝ නොකර හරිනු නො ලබන යම් දෙයක් කිරීමට හෝ පැහැර හැරීමට එකී තැනැත්තා ඕනෑකමින් ම පොළඹවතොත් හෝ එකී ක්‍රියාවෙන් හෝ නොකර හැරීමෙන් එකී තැනැත්තාට කයින්, හෝ සිතින් හෝ කීර්තියෙන් හෝ දේපළවලින් හානියක් හෝ පීඩාවක් නැතහොත් ආණ්ඩුවට අලාභයක් හෝ හානියක් සිදු වන්නේ නම් හෝ, සිදුවිය හැකි වන්නේ නම් එකී තැනැත්තා "වංචා කළ" ලෙස සලකනු ලැබේ.

**පැහැදිලි කිරීම** .–සිද්ධිය වංක ලෙස සැඟවීමක් මේ වගන්තියේ අර්ථය ඇතුළත රැවටීමක් වේ.

### නිදර්ශන

(අ) "ඒ" තමා සිවිල් සේවයෙහි යෙදී සිටින බව අසත්‍ය ලෙස හඟවමින් ඕනෑකමින් ම "ඉසෙඩ්"රවටා තමා ගෙවීමට අදහස් කරනු නොලැබූ බඩු ණයට දීමට වංක ලෙස "ඉසෙඩ්" පොළඹවයි. "ඒ" වංචා කරයි.

(ආ) යම් භාණ්ඩයක ව්‍යාජ ලකුණක් දැමීමෙන් එකී භාණ්ඩය එක්තරා සුප්‍රසිද්ධ නිපදවන්නකු විසින් සාදා ඇතැ යි යන විශ්වාසයක් ඇති කරවීමෙන් ඕනෑකමින් ම "ඒ" "ඉසෙඩ්" රවටයි. එසේ රවටා භාණ්ඩය මිලයට ගැනීමට හා එහි මුදල් ගෙවීමට "ඉසෙඩ්" වංක ලෙස පොළඹවයි. "ඒ" වංචා කරයි.

(ඇ) යම් භාණ්ඩයක අසත්‍ය සැම්පලයක් පෙන්වමින් භාණ්ඩය එකී සැම්පලයට සමාන වෙතැ යි විශ්වාසයක් ඇති කොට "ඒ" ඕනෑකමින් ම "ඉසෙඩ්" රවටයි. රවටා එකී භාණ්ඩය මිලයට ගැනීමට හා ඊට මුදල් ගෙවීමට වංක ලෙස "ඉසෙඩ්" පොළඹවයි. "ඒ" වංචා කරයි.

(ඈ) "ඒ" තමා මුදල් තැන්පත් නො කරන්නා වූ බැංකුවක චෙක්පතක් භාණ්ඩයකට ගෙවීමක් වශයෙන් දී එකී චෙක්පත බැංකුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම බලාපොරොත්තු වී, ඕනෑකමින් ම "ඉසෙඩ්" රවටයි. එසේ රවටා එම භාණ්ඩයට ගෙවීමට අදහසක් නැති ව එය තමාට බාර දීමට "ඉසෙඩ්" වංක ලෙස පොළඹවයි. "ඒ" වංචා කරයි.

(ඉ) දියමන්ති නොවන බව තමා දන්නා වූ භාණ්ඩ දියමන්ති වශයෙන් "ඒ" උගසට තබා ඕනෑකමින් ම "ඉසෙඩ්" රවටා තමා මුදල ණයට දීමට වංක ලෙස "ඉසෙඩ්" පොළඹවයි. "ඒ" වංචා කරයි.

(ඊ) "ඉසෙඩ්" තමාට ණයට දෙනු ලබන යම් මුදලක් නැවත ගෙවීමේ විශ්වාසයක් "ඉසෙඩ්" කෙරෙහි ඇති කරමින් "ඒ" ඕනෑකමින් ම "ඉසෙඩ්" රවටයි. රවටා එකී මුදල නොගෙවන අදහස ඇතිව තමාට මුදල් ණයට දීමට වංක ලෙස "ඉසෙඩ්" පොළඹවයි. "ඒ" වංචා කරයි.



https://ezofz.web.lk/
Scanned with CamScanner

(උ) තමා බාර දීමට අදහස් නැති ව එක්තරා කොප්පරා ප්‍රමාණයක් "ඒ" විසින් "ඉසෙඩ්" ට බාර දෙනු ලැබීමේ අදහසක් "ඉසෙඩ්" කෙරෙහි ඇති කරවමින් "ඒ" ඕනෑකමින් ම "ඉසෙඩ්" රවටයි. එසේ රවටා එබඳු බාර දීමේ විශ්වාසයක් උඩ තමාට අත්තිකාරම් මුදලක් දීමට වංක ලෙස "ඉසෙඩ්" පොළඹවයි. "ඒ" වංචා කරයි. එහෙත් "ඒ" මුදල් ලබා ගන්නා වේලෙහි, කොප්පරා බාර දීමට අදහසක් ඇතිව, පසුව එම ගිවිසුම කඩ කිරීමෙන්, ඔහු කොප්පරා බාර නුදුන් විටක ඔහු වංචාවක් නොකරයි ; එහෙත් ගිවිසුම කඩ කිරීම සම්බන්ධයෙන් සිවිල් නඩුවකට පමණක් යටත් වේ.

(ඌ) "ඒ" විසින් "ඉසෙඩ්" සමග ඇති කර ගනු ලැබූ ගිවිසුමකට තම කොටස ඉටු නොකර ඉටු කළැ යි යන විශ්වාසයක් "ඉසෙඩ්" කෙරෙහි ඇති කරවමින් "ඒ" ඕනෑකමින් ම "ඉසෙඩ්" රවටයි. රවටා මුදල් ගෙවීමට වංක ලෙස "ඉසෙඩ්" පොළඹවයි. "ඒ" වංචා කරයි.

(එ) "ඒ" "බී" ට වත්තක් විකුණා පවරා දෙයි. එකී විකිණීමේ ප්‍රතිඵලයක් වශයෙන් තම දේපළවලට "ඒ" ට අයිතිවාසිකමක් නැති බව "ඒ" දනිමින් ම දේපළ කලින් "බී" ට විකුණා පැවරූ බව "ඉසෙඩ්" ට නො දන්වා ඔහුට එය විකුණා නැතහොත් උකස් කොට, විකිණීමේ මුදල හෝ උකස් මුදල "ඉසෙඩ්" ගෙන් ලබා ගනියි. "ඒ" වංචා කරයි.

**399.** යමකු වෙනත් තැනැත්තකු ලෙස බොරුවට හඟවමින් හෝ වෙනත් තැනැත්තකු වෙනුවට තවත් තැනැත්තකු දැනුවත් ව පෙනී සිටුවමින්, හෝ එකී තැනැත්තා හෝ වෙනත් තැනැත්තකු නියම වශයෙන්ම එකී තැනැත්තා හෝ වෙනත් තැනැත්තකු නොව, අන් තැනැත්තෙක් ය යි නිරූපනය කරමින් රවටතොත්, ඔහු "අනෙකකු ලෙස පෙනී සිටීමෙන් වංචා කළ ලෙස" සලකනු ලැබේ. අනෙකකු ලෙස පෙනී සිටීමෙන් වංචා කිරීම.

**පැහැදිලි කිරීම**.- පෙනී සිටිනු ලැබූ තැනැත්තා සත්‍ය තැනැත්තකු වුව ද, සිතින් මවා ගත් තැනැත්තකු වුව ද වරද සිදු කෙරේ.

**නිදර්ශන**

(අ) එක නම ම ඇති එක්තරා ධනවත් වෙළෙන්දකු බව හඟවමින් "ඒ" වංචා කරයි. "ඒ" අනෙකකු ලෙස පෙනී සිටීමෙන් වංචා කරයි.

(ආ) නැසීගිය තැනැත්තකු වන "බී" ය යි හඟවමින් "ඒ" වංචා කරයි. "ඒ" අනෙකකු ලෙස පෙනී සිටීමෙන් වංචා කරයි.

**400.** යමකු වංචා කරතහොත්, ඔහුට අවුරුද්ද දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය. වංචා කිරීම ගැන දඬුවම.

**401.** වංචා කිරීමට අදාළ වූ ගනුදෙනුවෙහි යම් තැනැත්තකුගේ සම්බන්ධතාව නීතිය අනුව හෝ නීත්‍යානුකූල ගිවිසුමක් අනුව ආරක්ෂා කිරීමට තමා බැඳී සිටිය දී එකී තැනැත්තාට අයුතු ලාභයක් සිදුවිය හැකි බව දනිමින් ම වංචා කරන තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමෙන් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය. යම් තැනැත්තකුගේ සම්බන්ධතාව ආරක්ෂා කිරීමට බැඳී ඇති වරදකරුවකු විසින් එකී තැනැත්තාට අයුතු අලාභයක් සිදුවිය හැකි බව දනිමින් ම වංචා කිරීම.

**402.** අනෙකකු ලෙස පෙනී සිටිමින් වංචා කරන තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය. අනෙකකු ලෙස පෙනී සිටීමෙන් වංචා කිරීම ගැන දඬුවම.





https://ezofz.web.lk/
Scanned with CamScanner

වංචා කිරීම හා යම් දේපළක් බාරදීමට වංක ලෙස පෙළඹවීම.

**403.** යමකු වංචා කොට එකී වංචාවෙන් රැවටූ තැනැත්තා යම් තැනැත්තකුට දේපළක් බාර දීමට පොළඹවතොත් හෝ වටිනා ඇපයක් සම්පූර්ණයෙන් හෝ එහි කොටසක් හෝ වටිනා ඇපයකට හැරවිය හැකි අත්සන් කරනු ලැබූ හෝ මුද්‍රා තබනු ලැබූ යමක් සෑදීමට හෝ වෙනස් කිරීමට හෝ විනාශ කිරීමට එකී තැනැත්තා පොළඹවතොත් ඔහුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කල යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

## වංචක ඔප්පු හා දේපළ අලෙවි කිරීම

ණයකාරයන් අතර බෙද හැරීම වළක්වනු සඳහා වංක ලෙස හෝ වංචක ලෙස දේපළ ඉවත් කිරීම හෝ දේපළ සැඟවීම.

**404.** තම ණයකාරයින් අතර හෝ වෙනත් තැනැත්තකුගේ ණයකාරයින අතර නීතිය අනුව බෙදා හැරීම වැලැක්වීමේ අදහසින් හෝ ඉන් වැළකෙන බව දනිමින් ම යමකු යම් දේපළක් වංක ලෙස හෝ වංචක ලෙස ඉවත් කළහොත් හෝ සැඟවුවහොත් හෝ යම් තැනැත්තකුට බාර දුනහොත් හෝ ප්‍රමාණවත් වූ අගයක් ලබා නො ගෙන වෙනත් කෙනකුට පැවරුවහොත් හෝ පැවරීමට සැලැස්වුවහොත් ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

වරදකරුට අය විය යුතු ණයක් හෝ ණය ඉල්ලීමක් ඔහුගේ ණයකාරයන් හට ලබා ගැනීම වංක ලෙස හෝ වංචක ලෙස වැළැක්වීම.

**405.** තමාට හෝ වෙනත් තැනැත්තකුට අය විය යුතු ණයක් හෝ ණය ඉල්ලීමක් තම ණය හෝ එකී තැනැත්තාගේ ණය ගෙවීම සඳහා නීතිය අනුව ලබා ගැනීම යමකු වංක ලෙස හෝ වංචක ලෙස වැළක්වුවහොත්, ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

අගය පිළිබඳ අසත්‍ය ප්‍රකාශයක් ඇතුළත් පැවරුම්කරයක් වංක ලෙස හෝ වංචක ලෙස ලියා අත්සන් කිරීම.

**406.** යම් දේපළක් හෝ යම් දේපළක සම්බන්ධතාවක් පැවරෙතැයි සැලකෙන හෝ යම් බැඳීමකට යටත් කරනු ලබන යම් ඔප්පුවක් හෝ නීත්‍යානුකූල ලේඛනයක් එකී පැවරුම්කරයෙහි හෝ බැඳුමෙහි අගය සම්බන්ධ ව හෝ එකී පැවරුම්කරය බැඳුම් ක්‍රියාවෙහි යෙදවීමට ඇත්ත වශයෙන් අදහස් කරනු ලැබුයේ යම් තැනැත්තකුගේ හෝ තැනැත්තන්ගේ ප්‍රයෝජනය හෝ යහපත සඳහා නම් එකී තැනැත්තා හෝ තැනැත්තන් සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශයක් ඇතුළත් ව තිබේ නම්, එබඳු ඔප්පුවක් හෝ නීත්‍යානුකූල ලේඛනයක් යමකු වංක ලෙස හෝ වංචක ලෙස ලියා අත්සන් කළහොත් නැතහොත් එබන්දකට පාර්ශවකාරයකු වෙතොත්, ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකකින්ම දඬුවම් කළ යුතු ය.

වංක ලෙස හෝ වංචක ලෙස දේපළ සැඟවීම හෝ අයිතිවාසිකම් ඉල්ලීම නිදහස් කිරීම.

**407.** තමාගේ හෝ වෙනත් තැනැත්තකුගේ යම් දේපළක් වංක ලෙස හෝ වංචක ලෙස යමකු හඟවතොත් හෝ ඉවත් කරතහොත් හෝ එකී දේපළ සැඟවීමේ දී හෝ ඉවත් කිරීමෙහි දී වංක ලෙස වංචක හෝ සහාය වුවහොත් හෝ තමාට අයිතිය ඇති ඉල්ලීමක් හෝ අයිතිවාසිකමක් වංක ලෙස නිදහස්කොට හරිතහොත් ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

## අනර්ථ හා නීති විරෝධී ලෙස සුත්බුත් ඉවත් කිරීම

**408** මහජනයාට හෝ යම් තැනැත්තකුට අයුතු හානියක් හෝ අලාභයක් කිරීමේ අදහසින් හෝ එබන්දක් වීමට ඉඩ ඇති බව දනිමින් ම යමකු යම් දේපළක විනාශය සිදු කළහොත් හෝ යම් දේපළක වටිනාකම හෝ ප්‍රයෝජනය නැති වන පරිද්දෙන් හෝ අඩු වන පරිද්දෙන් හෝ දේපළට පාඩුවක් වන පරිද්දෙන් දේපළවල හෝ දේපළ පිහිටීමේ වෙනසක් ඇති කළහොත් ඔහු "අනර්ථය" කරන්නේ ය. අනර්ථය.

**පැහැදිලි කිරීම 1.**– වරදකරු විසින් පාඩු කරනු ලැබූ හෝ විනාශ කරනු ලැබූ දේපළ අයිතිකරුට හානියක් හෝ අලාභයක් සිදු කිරීමට අදහස් කරනු ලැබීම අනර්ථය කිරීමේ වරද සම්බන්ධයෙන් අවශ්‍ය නොවේ. යම් දේපළකට පාඩුවක් කිරීමෙන් යම් තැනැත්තකුට, එකී දේපළ ඔහුට අයිති වුව ද, නො වුව ද, අයුතු හානියක් හෝ අලාභයක් සිදු කිරීමට වරදකරු අදහස් කිරීම, නැතහොත් එබන්දක් වීමට ඉඩ ඇති බව වරදකරු දැන සිටීම ප්‍රමාණවත් වේ.

**පැහැදිලි කිරීම 2.**–අනර්ථය කරන තැනැත්තාට හෝ ඔහුට හා වෙනත් තැනැත්තන්හට එක්ව ම අයත් වූ දේපළ සම්බන්ධයෙන් කරනු ලැබූ ක්‍රියාවකින් අනර්ථය කළ හැකි ය.

**නිදර්ශන**

(අ) "ඉසෙඩ්" ට අයුතු අලාභයක් කිරීමේ අදහසින් ඔහුට අයිති වූ වටිනා ඇපයක් "ඒ" කැමැත්තෙන් ම පුළුස්සයි. "ඒ" අනර්ථය කර ඇත.

(ආ) "ඉසෙඩ්" ට අයුතු අලාභයක් කිරීමේ අදහසින් "ඉසෙඩ්" ට අයිති හිම ගෙයකට "ඒ" වතුර දමා හිම දිය කරවයි. "ඒ" අනර්ථය කර ඇත.

(ඇ) "ඉසෙඩ්" ට අයුතු අලාභයක් කිරීමේ අදහසින් ඔහුට අයිති මුද්දක් "ඒ" කැමැත්තෙන් ම ගඟකට දමයි. "ඒ" අනර්ථය කර ඇත.

(ඈ) "ඉසෙඩ්" ට තමාගෙන් අය විය යුතු ණයක් ගෙවා නිදහස් කර ගැනීම සඳහා තමාගේ බඩු බාහිරාදිය ආඥාවක් ක්‍රියාවේ යෙදවීමෙන් ගැනීමට ආසන්න බව දනිමින් ම "ඒ" එකී ණය "ඉසෙඩ්" ට ලැබීම වැළැක්වීමේ අදහසින් එකී බඩු බාහිරාදිය විනාශ කිරීමෙන් "ඉසෙඩ්" ට හානියක් කරයි. "ඒ" අනර්ථය කර ඇත.

(ඉ) නැවක් රක්ෂණ සහතික කරවීමෙන් පසු සහතිකය දුන් තැනැත්තාට හානියක් කිරීමේ අදහසින් "ඒ" එකී නැව කැමැත්තෙන් ම අබලන් කරවයි. "ඒ" අනර්ථය කර ඇත.

(ඊ) නැව ඇපයට තබා ගෙන මුදල් ණයට දුන් "ඉසෙඩ්" ට හානියක් කිරීමේ අදහසින් "ඒ" එකී නැව අබලන් කරවයි. "ඒ" අනර්ථය කර ඇත.

(උ) "ඉසෙඩ්" සමග අශ්වයකුට හවුල් අයිතිකමක් ඇති "ඒ" "ඉසෙඩ්" ට අයුතු අලාභයක් කිරීමේ අදහසින් අශ්වයාට වෙඩි තබයි. "ඒ" අනර්ථය කර ඇත.

(ඌ) "ඉසෙඩ්" ගේ අස්වැන්නට ලට හානි කිරීමේ අදහසින් හා එලෙස හානි වීමට ඉඩ ඇති බව දනිමින් ම "ඒ" "ඉසෙඩ්" ට අයිති කුඹුරකට ගවයන් ඇතුළු කරයි. "ඒ" අනර්ථය කර ඇත.

**409.** අනර්ථය කරන තැනැත්තකුට මාස තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය. අනර්ථය කිරීම ගැන දඬුවම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

අනර්ථය කිරීම හා එයින් රුපියල් පණහක හානිය කිරීම.

**410.** අනර්ථය කර එයින් රුපියල් පණහක හෝ ඊට වැඩි ගණනක හානිය හෝ අලාභය කරන තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකකින් ද දඬුවම් කල යුතු ය.

රුපියල් දහයක වටිනාකම ඇති සතකු මැරීමෙන් හෝ අංග විකල කිරීමෙන් අනර්ථය කිරීම.

**411.** රුපියල් දහයක හෝ ඊට වැඩි ගණනක වටිනාකම ඇති යම් සතකු හෝ සතුන් මැරීමෙන් හෝ වස දීමෙන් හෝ අංග විකල කිරීමෙන් හෝ අප්‍රයෝජනවත් කිරීමෙන් අනර්ථය කරන තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

ගවයන් ආදීන් මැරීමෙන් හෝ අංග විකල කිරීමෙන් හෝ රුපියල් පණහක් වටිනා වෙනත් සතකු මැරීමෙන් හෝ අංග විකල කිරීමෙන් අනර්ථය කිරීම.

**412.** වටිනාකම කුමක් වුව ද, යම් ඇතකු, ඔටුවකු, අශ්වයකු, බූරුවකු, කොටළුවකු, මීහරකකු, ගොනකු, එළදෙනක හෝ ගවයකු හෝ රුපියල් පණහක හෝ ඊට වැඩි ගණනක වටිනාකම ඇති වෙනත් සතකු මැරීමෙන් හෝ වස දීමෙන් හෝ අංග විකල කිරීමෙන් හෝ අප්‍රයෝජනවත් කිරීමෙන් යමකු අනර්ථය කළහොත්, ඔහුට අවුරුදු පහ දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

වාරි කර්මාන්ත වලට හානියක් කිරීමෙන් හෝ වතුර අයුතු ලෙස හැරවීමෙන් අනර්ථය කිරීම.

**413.** කෘෂිකාර්මික කාර්යය සඳහා හෝ මනුෂ්‍යයින්හට හෝ දේපළ වූ සතුන් හට ආහාර සඳහා පානය සඳහා හෝ පිරිසිදුකම සඳහා හෝ යම් නිපදවීමක් කර ගෙන යාම සඳහා ඇති ජලය සැපයීම අඩුවන හෝ අඩු වීමට ඉඩ ඇති බව තමා දන්නා යම් ක්‍රියාවක් කිරීමෙන් අනර්ථය කරන තැනැත්තකුට අවුරුදු පහ දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

ප්‍රසිද්ධ පාරකට, පාලමකට හෝ ගඟකට පාඩුවක් කිරීමෙන් අනර්ථය කිරීම.

**414.** යම් ප්‍රසිද්ධ පාරක්, පාලමක්, යාත්‍රා කළ හැකි ගඟක් හෝ ස්වාභාවික හෝ නිර්මිත යාත්‍රා කළ හැකි ඇලක් යා නො හැකි වන අන්දමේ හෝ ගමනාගමනය සඳහා හෝ බඩු ගෙන යාම සඳහා ආරක්ෂාව අඩුවන අන්දමේ යම් ක්‍රියාවක් කිරීමෙන් අනර්ථය කරන තැනැත්තකුට අවුරුදු පහ දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

හානියක් වන ලෙස මහජන කාණු ක්‍රමයකට වතුර ගැලීමක් හෝ බාධාවක් සිදුකිරීමෙන් අනර්ථය කිරීම.

**415.** යම් මහජන කාණු ක්‍රමයකට පාඩුවක් හෝ හානියක් වන ලෙස ජල ගැල්මක් හෝ බාධාවක් සිදුවන අන්දමේ හෝ සිදුවීමට ඉඩ ඇති බව දන්නා වූ අන්දමේ යම් ක්‍රියාවක් කිරීමෙන් අනර්ථය කරන තැනැත්තකුට අවුරුදු පහ දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**416.** යම් ප්‍රදීපාගාරයක් හෝ මුහුදු සලකුණක් ලෙස පාවිච්චි කරනු ලබන වෙනත් ආලෝකයක් හෝ යාත්‍රාකරුවන්ගේ මාර්ගදේශකයකු වශයෙන් තබනු ලැබූ මුහුදු සලකුණක් හෝ ඉපියාවක් හෝ වෙනත් දෙයක් විනාශ කිරීමෙන් හෝ වෙන තැනකට ගෙන යාමෙන් පසු යාත්‍රාකරුවන්ගේ මාර්ග දේශකයකු වශයෙන් එබඳු ප්‍රදීපාගාරයක, මුහුදු සලකුණක, ඉපියාවක හෝ ඉහත සඳහන් කරනු ලැබූ වෙනත් දෙයක ඇති ප්‍රයෝජනය අඩු කරවන අන්දමේ යම් ක්‍රියාවකින් අනර්ථය කරන තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

ප්‍රදීපාගාරයක් හෝ මුහුදු සලකුණක් විනාශ කිරීමෙන් හෝ අන් තැනකට ගෙන යාමෙන් හෝ එබන්දක ප්‍රයෝජනය අඩු කිරීමෙන් අනර්ථය කිරීම.

**417.** රජයේ සේවකයකුගේ බලය පිට සවි කරනු ලැබූ යම් මායිම් සලකුණක් විනාශ කිරීමෙන් හෝ අන් තැනකට ගෙන යෑමෙන් හෝ එකී මායිම් සලකුණෙහි ප්‍රයෝජනය අඩුවන අන්දමේ යම් ක්‍රියාවක් කිරීමෙන් අනර්ථය කරන තැනැත්තකුට අවුරුද්ද දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

රජයේ සේවකයකුගේ බලය පිට, සවි කරනු ලැබූ මායිම් සලකුණක් විනාශ කිරීමෙන් හෝ වෙන තැනකට ගෙන යාම ආදියෙන් අනර්ථය කිරීම.

**418.** යම් දේපළකට රුපියල් සියයක හෝ ඊට වැඩි ගණනක අලාභයක් කිරීමේ අදහසින් හෝ එ බඳු අලාභයක් වීමට ඉඩ ඇති බව දනිමින් ම ගින්නෙන් හෝ යම් පුපුරන ද්‍රව්‍යයකින් අනර්ථය කරන තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

රුපියල් සියයක හානියක් සිදු කිරීමේ අදහසින් ගින්නකින් හෝ පුපුරණ ද්‍රව්‍යයකින් අනර්ථය කිරීම.

**419.** පූජනීය ස්ථානයක් වශයෙන් හෝ මනුෂ්‍ය වාසස්ථානයක් වශයෙන් හෝ දේපළ ගබඩා කිරීමේ ස්ථානයක් වශයෙන් සාමාන්‍යයෙන් පාවිච්චි කරනු ලබන ගොඩනැගිල්ලක් විනාශ කිරීමේ අදහසින් හෝ එයින් විනාශ වීමට ඉඩ ඇති බව දනිමින් ම ගින්නෙන් හෝ යම් පුපුරණ ද්‍රව්‍යයකින් අනර්ථය කරන තැනැත්තකුට අවුරුදු පහළොව දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

ගෙයක් ආදිය විනාශ කිරීමේ අදහසින් ගින්නෙන් හෝ පුපුරණ ද්‍රව්‍යයකින් අනර්ථය කිරීම.

**420.** යම් තට්ටු ඇති යාත්‍රාවක් හෝ ටොන් දහයක් හෝ ඊට වැඩි ගණනක බර ඇති යාත්‍රාවක් විනාශ කිරීමේ හෝ අන්තරාදායක කිරීමේ අදහසින් හෝ එයින් විනාශ වීමට හෝ අන්තරාදායක වීමට ඉඩ ඇති බව දනිමින් ම එබන්දකට අනර්ථය කරන තැනැත්තකුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

තට්ටු ඇති යාත්‍රාවක් හෝ ටොන් දහයක හෝ ඊට වැඩි ගණනක බරක් ඇති යාත්‍රාවක් විනාශ කිරීමේ හෝ අන්තරාදායක කිරීමේ අදහසින් අනර්ථය කිරීම.

**421.** ඉහතින් වූ වගන්තියේ විස්තර කරනු ලැබූ අනර්ථය කිරීම ගින්නකින් හෝ යම් පුපුරණ ද්‍රව්‍යයකින් යම් තැනැත්තකු සිදු කළ හොත්, හෝ සිදු කිරීමට තැත් කළහොත් ඔහුට අවුරුදු විස්ස දක්වා කාලයක දෙයාකාරයෙන් එක් අකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

ඉහතින් වූ වගන්තියෙහි විස්තර කරනු ලැබූ අනර්ථය කිරීම ගින්නකින් හෝ යම් පුපුරණ ද්‍රව්‍යයකින් සිදු කිරීම ගැන දඬුවම.





https://ezofz.web.lk/
Scanned with CamScanner

සොරකම් ආදිය කිරීමේ අදහසින් යාත්‍රාවක් ඕනෑකමින් ම ගොඩ ඇනීම හෝ වෙරළට ගෙන ඒම ගැන දඬුවම.

**422.** යම් යාත්‍රාවක ඇති දේපළක් සොරකම් කිරීම හෝ වංක ලෙස සාවද්‍ය පරිහරණය කිරීම සඳහා නැතහොත් එ බඳු දේපළ සොරකම් හෝ සාවද්‍ය පරිහරණය සිදු කළ හැකි ය යන අදහසින් එකී යාත්‍රාව ඕනෑකමින් ම ගොඩ අනින හෝ වෙරළට ගෙන එන තැනැත්තකුට අවුරුදු දහය දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

යාත්‍රාවක් බේරාගැනීමට බාධා කිරීම ගැන දඬුවම.

**423.** යම් මුහුදක හෝ වඩ බාදිය ඇති ජලයක හෝ එවැන්නක අසළ ගොඩ ඇනුණු හෝ ගොඩ ඇනීමේ අන්තරාවට භාජන වූ හෝ වෙනත් ආකාරයකින් විපතට පත් වූ යාත්‍රාවක හෝ එකී යාත්‍රාවෙහි පැටවුණු බරවලින් හෝ එකී යාත්‍රාවෙහි ආයිත්තම් වලින් කොටසක් හෝ සුන්බුන් බේරා ගැනීම වැළැක්වීමට හෝ බාධා කිරීමට නීත්‍යානුකූල සමාවේ හේතුවක් නොමැති ව, යම් තැනැත්තකු තැත් කරතොත් ඔහුට අවුරුදු පහ දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

සුන්බුන් ඉවත් කිරීම හෝ සැඟවීම ගැන දඬුවම.

**424.** යම් මුහුදක හෝ වඩ බාදිය ඇති ජලයක, වෙරළක හෝ එවැන්නක් අසළක ගොඩ ඇනුණු හෝ ගොඩ ඇනීමේ අන්තරාවට භාජන වූ වෙනත් ආකාරයකින් විපතට පත්වූ යාත්‍රාවක කොටසක් හෝ එහි පටවනු ලැබූ බඩුවලින් හෝ ආයිත්තම් වලින් කොටසක හෝ සුන්බුන් නීති විරෝධී ව ගෙන යන හෝ ඉවත් කරන තැනැත්තකුට ද යම් සුන්බුන් නීති විරෝධී ව සඟවන හෝ එහි ඇති සලකුණු මකන හෝ විරූප කරන තැනැත්තකුට ද අවුරුද්ද දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

සුන්බුන් විදේශීය වරායකට ගෙන යාම.

**425.** ලංකාවෙහි, මුහුදු වෙරළක හෝ වඩ බාදිය ඇති ජලයක, වෙරළක හෝ එවැන්නක් අසළක ගොඩ ඇනුණු හෝ අතහැර දැමූ හෝ වෙනත් ආකාරයකින් විපතට පත් වූ යම් යාත්‍රාවක් හෝ එහි පටවනු ලැබූ බඩුවලින් කොටසක් හෝ එහි ආයිත්තම් හෝ එයට අයත් වෙනත් දෙයක් හෝ එබඳු මුහුදු වෙරළක හෝ වෙරළක හෝ එවැන්නක් අසළක සමුවූ සුන්බුන් යම් විදේශීය වරායකට හෝ විදේශීය ස්ථානයකට නීති විරෝධී ව ගෙන ගොස් විකුණන තැනැත්තකුට අවුරුදු පහ දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ ඒකී දඬුවම් දෙකින්ම කළ යුතු ය.

**පැහැදිලි කිරීම.**– 423 වෙනි, 424 වෙනි හා 425 වෙනි වගන්තිවල පාවිච්චි කරනු ලැබූ සුන්බුන් යන වචනයට මුහුදට විසි කරන දේ, වෙරළට සෝදා ආ දේ, මුහුදු පත්ලේ, රැඳුණු හා නැවකින් අත්හැර දැමූ දේ ඇතුළත් වේ.

මරණය හෝ තුවාල සිදු කිරීම සඳහා සූදානම් වීමෙන් පසු සිදු කරනු ලැබූ අනර්ථය.

**426.** යම් තැනැත්තකුට මරණය හෝ තුවාළ හෝ අයුතු සිරකර තැබීම හෝ එබන්දක බියක් ඇති කිරීම සඳහා සූදානම් වීමෙන් පසු අනර්ථය කරන තැනැත්තකුට අවුරුදු පහ දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**427.** වරදක් කිරීමේ අදහසින් හෝ යම් දේපළක පදිංචි ව සිටින තැනැත්තකුට බිය ගැන්වීමේ හෝ නින්දා කිරීමේ හෝ අප්‍රසන්න තාවය ඇති කිරීමේ අදහසින් එකී තැනැත්තාගේ දේපළ තුළ හෝ දේපළ මත ඇතුළුවන නැතහොත් එබඳු දේපළකට නීත්‍යානුකූලව ඇතුළුව එකී තැනැත්තාට බිය ගැන්වීමේ හෝ නින්දා කිරීමේ හෝ අප්‍රසන්නතාවය ඇති කිරීමේ හෝ වරදක් කිරීමේ අදහසින් නීති විරෝධී ව එහි නැවතී සිටින තැනැත්තකු "සාපරාධී" අයුතු ඇතුළුවීම කළ ලෙස සලකනු ලැබේ. සාපරාධී අයුතු ඇතුළුවීම.

**428.** යම් ගොඩනැගිල්ලකට හෝ කූඩාරමකට හෝ මනුෂ්‍ය වාසයක් සඳහා පාවිච්චි කරනු ලැබූ යාත්‍රාවකට හෝ පූජනීය ස්ථානයක් වශයෙන් හෝ දේපළ ගබඩා කිරීමේ ස්ථානයක් වශයෙන් පාවිච්චි කරනු ලැබූ ගොඩනැගිල්ලකට ඇතුළු වීමෙන් හෝ එහි නැවතී සිටීමෙන් සාපරාධී අයුතු ඇතුළුවීම කරන තැනැත්තා "ගෙයකට අයුතු ඇතුළුවීමක්" කළ ලෙස සලකනු ලැබේ. ගෙයකට අයුතු ඇතුළුවීම.

**පැහැදිලි කිරීම.**– සාපරාධී අයුතු ඇතුළුවීම කරන්නාගේ ශරීරයෙන් යම් කොටසක් ඇතුළු කිරීම ගෙයකට අයුතු ඇතුළුවීම සිදු කිරීම සඳහා ප්‍රමාණවත් වේ.

**429.** අයුතු ඇතුළුවීමකට යටත් වූ ගොඩනැගිල්ලෙන් හෝ කූඩාරමෙන් හෝ යාත්‍රාවෙන් අයුතු ඇතුළුවන්නා පිටමං කිරීමට හෝ නෙරපීමට බලය ඇති යම් තැනැත්තකුගෙන් සැඟවී සිටීමට විධිවිධාන සලස්වා ගැනීමෙන් පසු අයුතු ලෙස ගෙයකට ඇතුළුවීම සිදු කරන තැනැත්තා "සැඟවී සිට ගෙයකට අයුතු ඇතුළුවීම" කළ ලෙස සලකනු ලැබේ. සැඟවී සිට ගෙයකට අයුතු ඇතුළු වීම.

**430.** ඉර බැසීමෙන් පසු ද ඉර නැගීමෙන් පෙර ද, සැඟවී සිට ගෙයකට අයුතු ඇතුළුවීම සිදු කරන තැනැත්තා රාත්‍රියේ සැඟ වී සිට "ගෙයකට අයුතු ඇතුළුවීම" කළ ලෙස සලකනු ලැබේ. රාත්‍රියේ සැඟවී සිට ගෙයකට අයුතු ඇතුළුවීම.

**431.** මින්මතු දැක්වෙන ක්‍රම හයෙන් එක් ක්‍රමයකින් යම් ගෙයකට හෝ ඉන් කොටසකට ඇතුළුවීමෙන් ගෙයකට අයුතු ඇතුළුවීම සිදු කළහොත් හෝ වරදක් කිරීමේ කාර්යය සඳහා ගෙයි හෝ ඉන් කොටසක සිට හෝ එ හිදී යම් වරදක් කර එකී ගෙයින් හෝ ඉන් කොටසකින් ඉහත දැක් වූ පරිදි එකී ක්‍රම හයෙන් යම් ක්‍රමයකින් පිට ව ගියහොත් එ ලෙස කරන තැනැත්තා ගෙවල් බිඳීම සිදු කළ ලෙස සලකනු ලැබේ. ගෙවල් බිඳීම.

එකී ක්‍රම නම් :–

**පළමු වනු ව.**– තමා විසින් හෝ අයුතු ලෙස ගෙට ඇතුළු වීමට අනුබල දෙන්නකු විසින් ගෙට අයුතු ඇතුළුවීම සිදු කිරීම සඳහා සාදනු ලැබූ ප්‍රවේශයකින්, ඔහු ඇතුළුවීම හෝ පිටවීම ;

**දෙ වනු ව.**–මනුෂ්‍ය ප්‍රවේශය සඳහා ඔහු විසින් හෝ වරදට අනුබල දෙන්නකු විසින් හැර, අන් කිසිවකු විසින් අදහස් නොකරනු ලැබූ ප්‍රවේශයකින් හෝ යම් බිත්තියකට හෝ ගොඩනැගිල්ලකට නැගීමෙන් ලබා ගත් ප්‍රවේශයකින් ඔහු ඇතුළුවීම හෝ පිටවීම ;



https://ezofz.web.lk/
Scanned with CamScanner

**තුන් වනු ව.**– ගෙයකට අයුතු ඇතුළුවීම සිදු කිරීම සඳහා යම් ප්‍රවේශයක් එකී ගෙය පදිංචිකාරයා විවෘත කිරීමට අදහස් කරනු නො ලැබූ අන්දමකින් ඔහු විසින් හෝ ගෙට අයුතු ඇතුළුවීමට අනුබල දෙන්නකු විසින් විවෘත කර එ බඳු ප්‍රවේශයකින් ඔහු ඇතුළුවීම හෝ පිටවීම ;

**සතර වනු ව.**– ගෙට අයුතු ඇතුළුවීම සිදු කිරීම සඳහා හෝ ගෙට අයුතු ඇතුළුවීමෙන් පසු ගෙයින්පිටවී යාම සඳහා යම් අගුලක් විවෘත කිරීමෙන් ඔහු ඇතුළුවීම හෝ පිටවීම ;

**පස් වනු ව.**– යම් තැනැත්තකුට සාපරාධී බලහත්කාරය පැමෙන් හෝ අඩන්තේට්ටම් කිරීමෙන් හෝ අඩන්තේට්ටම් කරන බවට තර්ජනය කිරීමෙන් ඔහු ඇතුළුවීම හෝ පිටවීම ;

**හය වනු ව.**– ඇතුළුවීමට හෝ පිටවීමට නොහැකි වන ලෙස සවි කරනු ලැබූ බව හා තමා විසින් හෝ ගෙට අයුතු ඇතුළු වීමට අනුබල දෙන්නකු විසින් විවෘත කරනු ලැබූ බව තමා දන්නා වූ යම් ප්‍රවේශයකින් ඇතුළුවීම හෝ පිටවීම ;

**පැහැදිලි කිරීම.**– ගෙයක් හා පදිංචිය සඳහා ඇති යම් පිට ගෙයක් හෝ ගොඩනැගිල්ලක් අතර නුදුරුම වූ අභ්‍යන්තරික මාර්ග සම්බන්ධයක් ඇතහොත් එකී පිට ගෙය හෝ ගොඩනැගිල්ල මේ වගන්තියේ අර්ථය ඇතුළත ගෙයින් කොටසක් වේ.

**නිදර්ශන**

(අ) "ඉසෙඩ්" ගේ ගෙයි බිත්තියෙහි සිදුරක් ඇති කොට තම අත එම සිදුරෙන් දැමීමෙන් "ඒ" ගෙට අයුතු ඇතුළුවීම සිදු කරයි. මෙය ගෙවල් බිඳීමක් වෙයි.

(ආ) නැවේ තට්ටු දෙක අතර කවුළුවකින් නැවකට බඩ ගා යෑ මෙන් "ඒ" ගෙයකට අයුතු ඇතුළුවීම සිදු කරයි. මෙය ගෙවල් බිඳීමක් වෙයි.

(ඇ) "ඉසෙඩ්" ගේ ගෙට ජනේලයකින් ඇතුළුවීමෙන් "ඒ" ගෙයකට අයුතු ඇතුළුවීම සිදු කරයි. මෙය ගෙවල් බිඳීමක් වෙයි.

(ඈ) අගුල් ලනු ලැබූ දොරක් විවෘත කොට, එකී දොරෙන් "ඉසෙඩ්" ගේ ගෙට ඇතුළුවීමෙන් "ඒ" ගෙයකට අයුතු ඇතුළුවීම සිදු කරයි. මෙය ගෙවල් බිඳීමක් වෙයි.

(ඉ) දොරෙහි සිදුරකින් කම්බියක් දැමීමෙන් දොරෙහි අගුල උස්සා එකී දොරෙන් "ඉසෙඩ්" ගේ ගෙට ඇතුළුවීමෙන් "ඒ" ගෙයකට අයුතු ඇතුළුවීම සිදු කරයි. මෙය ගෙවල් බිඳීමක් වෙයි.

(ඊ) "ඉසෙඩ්" අතින් නැතිවුණු "ඉසෙඩ්" ගේ ගෙයි යතුර "ඒ" ට සම්භ වේ. එම යතුරෙන් දොර හැර "ඉසෙඩ්" ගේ ගෙට ඇතුළු වීමෙන් ගෙයකට අයුතු ඇතුළුවීම "ඒ" සිදු කරයි. මෙය ගෙවල් බිඳීමක් වෙයි.

(උ) තමාගේ දොරකඩ "ඉසෙඩ්" සිටියි. "ඉසෙඩ්" ට ගැසීමෙන් ඔහු බිම දමා "ඒ" බලෙන් ප්‍රවේශයක් ඇති කොට එමගින් ගෙට ඇතුළු වීමෙන් ගෙයකට අයුතු ඇතුළුවීම සිදු කරයි. මෙය ගෙවල් බිඳීමක් වෙයි.

(ඌ) "වයි" ගේ දොරටුපාලයා වූ "ඉසෙඩ්" "වයි" ගේ දොරකඩ සිටියි. "වයි" ට ගසන බවට තර්ජනය කොට තමාට විරුද්ධවීම වළකා "ඒ" ගෙට ඇතුළුවීමෙන් ගෙයකට අයුතු ඇතුළුවීම සිදු කරයි. මෙය ගෙවල් බිඳීමක් වෙයි.

රාත්‍රියේ ගෙවල් බිඳීම.

**432.** ඉර බැසීමෙන් පසු හා ඉර නැගීමට පෙර ගෙවල් බිඳීම සිදු කරන තැනැත්තා "රාත්‍රියේ ගෙවල් බිඳීම" සිදු කළ ලෙස සලකනු ලැබේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

*සාපරාධී අයුතු ඇතුළුවීම ගැන දඬුවම.*

**433.** සාපරාධී අයුතු ඇතුළුවීම සිදු කරන තැනැත්තකුට මාස තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

*ගෙයකට අයුතු ඇතුළුවීම ගැන දඬුවම.*

**434.** ගෙයකට අයුතු ඇතුළුවීම සිදු කරන තැනැත්තකුට අවුරුදු දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ රුපියල් දහස දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

*මරණයෙන් දඬුවම් කළ හැකි වරදක් සිදු කිරීම සඳහා ගෙයකට අයුතු ඇතුළුවීම.*

**435.** මරණයෙන් දඬුවම් කළ හැකි වරදක් සිදු කිරීම සඳහා ගෙයකට අයුතු ඇතුළුවීම සිදු කරන තැනැත්තකුට අවුරුදු විස්සකට නොවැඩි කාලයක, තදබල බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

*අවුරුදු දහයක හෝ ඊට වැඩි කාලයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් සිදු කිරීම සඳහා ගෙයකට අයුතු ඇතුළුවීම.*

**436.** අවුරුදු දහයක හෝ ඊට වැඩි කාලයක, බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් සිදු කිරීම සඳහා ගෙයකට අයුතු ඇතුළුවීම සිදු කරන තැනැත්තකුට අවුරුදු දහයකට නොවැඩි කාලයක්, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

*අවුරුදු දහයකට අඩු කාලයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් කිරීම සඳහා ගෙයකට අයුතු ඇතුළුවීම.*

**437.** අවුරුදු දහයකට අඩු කාලයක බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදක් සිදු කිරීම සඳහා ගෙයකට අයුතු ඇතුළුවීම සිදු කරන තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. කිරීමට අදහස් කරනු ලැබූ වරද සොරකම නම්, බන්ධනාගාර ගත කිරීමේ කාලය අවුරුදු හත දක්වා වැඩි විය හැකි ය.

*යම් තැනැත්තකුට තුවාල කිරීමට සූදානම් වීමෙන් පසු ගෙයකට අයුතු ඇතුළුවීම.*

**438.** යම් තැනැත්තකුට තුවාල කිරීම සඳහා හෝ යම් තැනැත්තකුට අඩන්තේට්ටම් කිරීම සඳහා හෝ යම් තැනැත්තකුට අයුතු අවහිර කිරීම සඳහා හෝ යම් තැනැත්තකුට තුවාල කිරීමේ හෝ අඩන්තේට්ටම් කිරීමේ හෝ අයුතු අවහිර කිරීමේ බියක් පැමිණවීම සඳහා සූදානම් වීමෙන් පසු, ගෙයකට අයුතු ඇතුළුවීම සිදු කරන තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත්විය යුතු ය.

*සැඟවී සිට ගෙයකට අයුතු ඇතුළුවීම ගැන හෝ ගෙවල් බිඳීම ගැන දඬුවම.*

**439.** සැඟ වී සිට ගෙයකට අයුතු ඇතුළුවීම හෝ ගෙවල් බිඳීම කරන තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත්විය යුතු ය.

*බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් කිරීම සඳහා සැඟවී සිට ගෙයකට අයුතු ඇතුළු වීම හෝ ගෙවල් බිඳීම.*

**440.** බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් කිරීම සඳහා සැඟ වී සිට ගෙයකට අයුතු ඇතුළුවීම හෝ ගෙවල් බිඳීම සිදු කරන තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. කිරීමට අදහස් කරනු ලැබූ වරද සොරකම නම්, බන්ධනාගාර ගත කිරීමේ කාලය අවුරුදු දහය දක්වා වැඩි කළ හැකි ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

යම් තැනැත්තකුට තුවාල කිරීම සඳහා සූදානම් වීමෙන් පසු සැඟවී සිට ගෙයකට අයුතු ඇතුළුවීම හෝ ගෙවල් බිඳීම.

**441.** යම් තැනැත්තකුට තුවාල කිරීම හෝ යම් තැනැත්තකුට අඩන්තේට්ටම් කිරීම හෝ යම් තැනැත්තකුට අයුතු අවහිර කිරීම සඳහා හෝ යම් තැනැත්තකුට තුවාල කිරීමේ හෝ අඩන්තේට්ටම් කිරීමේ හෝ අයුතු අවහිර කිරීමේ බියක් පැමිණවීම සඳහා සූදානම් වීමෙන් පසු, සැඟ වී සිට ගෙයකට අයුතු ඇතුළුවීම හෝ ගෙවල් බිඳීම කරන තැනැත්තකුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩය කට ද යටත් විය යුතු ය.

රාත්‍රියේ සැඟවී සිට ගෙයකට අයුතු ඇතුළුවීම ගැන හෝ රාත්‍රියේ ගෙවල් බිඳීම ගැන දඬුවම.

**442.** රාත්‍රියේ දී සැඟ වී සිට ගෙයකට අයුතු ඇතුළුවීම හෝ රාත්‍රියේ දී ගෙවල් බිඳීම කරන තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් කිරීම පිණිස රාත්‍රියේ සැඟ වී සිට ගෙයකට අයුතු ඇතුළුවීම හෝ ගෙවල් බිඳීම.

**443.** බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදක් කිරීම පිණිස සැඟ වී සිට, රාත්‍රියේ ගෙයකට අයුතු ඇතුළුවීම හෝ රාත්‍රියේ ගෙවල් බිඳීම සිදු කරන තැනැත්තකුට අවුරුදු පහ දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. කිරීමට අදහස් කරනු ලැබූ වරද සොරකම නම්, බන්ධනාගාරගත කිරීමේ කාලය අවුරුදු දහ හතර දක්වා වැඩි කළ හැකි ය.

යම් තැනැත්තකුට තුවාල කිරීම සඳහා සූදානම් වීමෙන් පසු රාත්‍රියේ සැඟ වී සිට ගෙයකට අයුතු ඇතුළුවීම හෝ රාත්‍රියේ ගෙවල් බිඳීම.

**444.** යම් තැනැත්තකුට තුවාල කිරීම හෝ යම් තැනැත්තකුට අඩන්තේට්ටම් කිරීම හෝ යම් තැනැත්තකුට අයුතු අවහිර කිරීම සඳහා හෝ යම් තැනැත්තකුට තුවාළ කිරීමේ හෝ අඩන්තේට්ටම් කිරීමේ හෝ අයුතු අවහිර කිරීමේ බියක් පැමිණවීම සඳහා සූදානම් වීමෙන් පසු, රාත්‍රියේ සැඟවී සිට ගෙයකට අයුතු ඇතුළුවීම හෝ රාත්‍රියේ ගෙවල් බිඳීම කරන තැනැත්තකුට අවුරුදු දහ හතර දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

සැඟ වී සිට ගෙයකට අයුතු ඇතුළුවීම හෝ ගෙවල් බිඳීම කරන අතරම බරපතල තුවාල කිරීම.

**445.** යමකු සැඟ වී සිට ගෙයකට අයුතු ඇතුළුවීම හෝ ගෙවල් බිඳීම කරන අතර ම යම් තැනැත්තකුට බරපතළ තුවාල කළ හොත් හෝ යම් තැනැත්තකුට මරණය හෝ බරපතල තුවාළ කිරීමට තැත් කළහොත් ඔහුට අවුරුදු විස්ස දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට හෝ කස පහර දීමකට ද යටත් විය යුතු ය.

රාත්‍රියේ සැඟවී සිට ගෙයකට අයුතු ඇතුළු වීම හෝ රාත්‍රියේ ගෙවල් බිඳීම ආදියකට එක්ව සම්බන්ධවුණු සියල්ලන්හට ම ඔවුන්ගෙන් එක් කෙනකු විසින් සිදු කරනු ලැබූ මරණය හෝ බරපතල තුවාල කිරීම පිළිබඳව දඬුවම් කළ හැකි බව.

**446.** රාත්‍රියේ සැඟ වී සිට ගෙයකට අයුතු ඇතුළු වීම හෝ රාත්‍රියේ ගෙවල් බිඳීම සිදු කරන වේලෙහි එ බඳු වරදකට වරදකාරයා වන තැනැත්තකු විසින් කැමැත්තෙන් ම යම් තැනැත්තකුට මරණය හෝ බරපතල තුවාළ සිදු කළහොත් හෝ සිදු කිරීමට තැත් කළහොත් එසේ රාත්‍රියේ සැඟ වී සිට, ගෙයකට අයුතු ඇතුළුවීමට හෝ රාත්‍රියේ ගෙවල් බිඳීමට එක්ව සම්බන්ධවුණු සෑම තැනැත්තකුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**447.** යම් දෙයක් ඇතුළත් ව ඇති හෝ ඇතුළත් ව ඇතැයි තමා විශ්වාස කරන වැසූ භාජනයක් වංක ලෙස හෝ අනර්ථය කිරීමේ අදහසින් යමකු කඩා විවෘත කළහොත් හෝ ගලවතොත් ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

යම් දෙයක් ඇතුළත්ව ඇති හෝ ඇතුළත්ව ඇතැයි සලකන වැසූ භාජනයක් වංක ලෙස කඩා විවෘත කිරීම.

**448.** යම් දෙයක් ඇතුළත් ව ඇති හෝ යම් දෙයක් ඇතුළත් ව ඇතැයි තමා විශ්වාස කරන, වැසූ භාජනයක් යම් තැනැත්තකුට ආරක්ෂාව සඳහා භාර දෙනු ලැබ, එය විවෘත කිරීමේ බලයක් නොමැති ව ඔහු වංක ලෙස හෝ අනර්ථය කිරීමේ අදහසින් එකී භාජනය කඩා විවෘත කළහොත් හෝ ගලවතොත් ඔහුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

ආරක්ෂා කිරීම භාර දෙනු ලැබූ තැනැත්තකු විසින් එම වරද කරනු ලැබූ විට එයට දඬුවම.

**449.** යම් තැනැත්තකුගේ භාරයේ හෝ ස්වාමිත්වයේ තමා විසින් ඔප්පු කළ යුතු නීත්‍යානුකූල සමාවේ හේතුවක් නැති ව යම් ගෙවල් බිඳීමේ උපකරණයක් තිබී හෝ නීත්‍යානුකූල නො වන ක්‍රියාවක් කිරීමේ අදහසින් යම් අන්තරාදායක හෝ වරද කළ හැකි ආයුධයක් ළඟ තබා සිටිය දී යම් තැනැත්තකු අසු වුවහොත් ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය. එකී උපකරණය හෝ ආයුධය ආණ්ඩුව සතු කළ යුතු ය.

ගෙවල් බිඳීමේ උපකරණයක් නීති විරෝධී ලෙස ස්වාමිත්වයෙහි තබා ගැනීම හෝ වරද කළ හැකි ආයුධයක් ලඟ තබා ගැනීම.

**450.** යම් ගොඩනැගිල්ලක හෝ ආවරණයක යම් නීතිවිරෝධී කාර්යයක් සඳහා සිට අසුවන තැනැත්තකුට ද, යම් ගොඩනැගිල්ලක හෝ ආවරණයක සිට තමා අසු ව තමා ගැන සතුටුදායක විස්තරයක් දීම පැහැර හරින තැනැත්තකුට ද මාස තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් පණහකට වැඩි නොවන දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

නීති විරෝධී කාර්යයක් සඳහා යම් ගොඩනැගිල්ලක් ආදියක සිට අසුවීම.

**451.** ප්‍රසිද්ධ සොරකු වූ යම් තැනැත්තකු සොරකම් කිරීමේ අදහසින් හෝ වෙන යම් නීති විරෝධී ක්‍රියාවක් කිරීමේ අදහසින් යම් පොදු ස්ථානයක හෝ නැවෙන් බඩු බාන තැනක, බඩු ගබඩාවක හෝ යම් වරායක හෝ වෙනත් ජලාශයක යම් යාත්‍රාවක ගැවසෙතොත් හෝ, සැඟ වී සිටියහොත් ඔහුට මාස තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් පණහකට වැඩි නොවන දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

ප්‍රසිද්ධ සොරකු ගැවසීම.

## XVIII වෙනි පරිච්ඡේදය

### ලේඛන හා දේපල ලකුණු සම්බන්ධයෙන් ද මුදල් නෝට්ටු හා බැංකු නෝට්ටු සම්බන්ධයෙන් ද වන වැරදි

**452.** මහජනයාට හෝ යම් තැනැත්තකුට හෝ ආණ්ඩුවට හානියක් හෝ පාඩුවක් කිරීමේ අදහසින් හෝ යම් අයිතිවාසිකම් කීමක් හෝ අයිතියක් තහවුරු කිරීමට හෝ යම් දේපළක් යම් තැනැත්තකුගෙන් වෙන් කරවීමට හෝ ප්‍රකාශිත හෝ ඇඟවෙන ගිවිසුමකට යම් තැනැත්තකු

කූට ලේඛන සැදීම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

ඇතුළු කරවීමට හෝ වංචාවක් කිරීමේ අදහසින් හෝ වංචාවක් සිදුවන ලෙස යම් තැනැත්තකු අසත්‍ය ලේඛනයක් හෝ ලේඛනයක කොටසක් සැදුවහොත් ඔහු කූට ලේඛන සෑදීම කරයි.

අසත්‍ය ලේඛනයක් සෑදීම.

**453.** **පළමු වනු ව.**– යම් ලේඛනයක් හෝ ලේඛනයක කොටසක් සාදන ලද්දේ හෝ අත්සන් කරන ලද්දේ හෝ මුද්‍රා තබන ලද්දේ හෝ ලියා අත්සන් කරන ලද්දේ යම් තැනැත්තකු විසින් හෝ යම් තැනැත්තකුගේ බලය ප්‍රකාර නො වන බව දනිමින් ම එය සාදන ලද්දේ හෝ අත්සන් කරන ලද්දේ හෝ මුද්‍රා තබන ලද්දේ හෝ ලියා අත්සන් කරන ලද්දේ හෝ මුද්‍රා තබන ලද්දේ හෝ ලියා අත්සන් කරන ලද්දේ හෝ එය සාදන ලද්දේ හෝ අත්සන් කරන ලද්දේ එකී තැනැත්තා විසින් බව හෝ එකී තැනැත්තාගේ බලය ප්‍රකාර බව හෝ එකී වේලාවේ දී බව විශ්වාස කරවීමේ අදහසින් වංක ලෙස හෝ වංචක ලෙස එ බඳු ලේඛනයක් හෝ ඉන් කොටසක් සාදන, අත්සන් කරන හෝ මුද්‍රා තබන හෝ ලියා අත්සන් කරන හෝ යම් ලේඛනයක් ලියා අත්සන් කරනු ලැබූ බව දක්වන ලකුණක් කරන තැනැත්තකු හෝ,

**දෙ වනු ව.**– තමා විසින් හෝ වෙනත් තැනැත්තකු විසින් යම් ලේඛනයක් සාදනු ලැබීමෙන් හෝ ලියා අත්සන් කරනු ලැබීමෙන් පසු ව නීත්‍යනුකූල බලයක් නොමැති ව වංක ලෙස හෝ වංචක ලෙස කපා ගෑමෙන් හෝ වෙනත් ආකාරයකින්, ඒ වෙනත් තැනැත්තා ජීවත් ව සිටිය දී හෝ මිය ගොස් සිටිය දී එකී ලේඛනයෙහි අවශ්‍ය කොටසක් වෙනස් කරන තැනැත්තකු හෝ,

**තුන් වනු ව.**– යම් තැනැත්තකුගේ සිහි විකල භාවය නිසා හෝ මත්කම නිසා හෝ ඔහු රවටනු ලැබීම නිසා යම් ලේඛනයක අඩංගු වූ දෙය හෝ වෙනස් කිරීමේ ස්වභාවය ඔහු නොදන්නා බව දනිමින් ම ඔහු ලවා වංක ලෙස හෝ වංචක ලෙස අත්සන් කරවන හෝ මුද්‍රා තබන බව හෝ ලියා අත්සන් කරවන හෝ වෙනස් කරවන තැනැත්තකු, අසත්‍ය ලේඛනයක් සාදන ලෙස සලකනු ලැබේ.

**නිදර්ශන**

(අ) "ඉසෙඩ්" විසින් "බී" වෙත ලියනු ලැබූ රුපියල් 10,000 ක ණය පත්‍රයක් "ඒ" ළඟ ඇත්තේ ය. "ඒ" "බී" ට වංචාවක් කිරීමට "ඉසෙඩ්" එකී පත්‍රයෙහි ලියනු ලැබුවක් ලෙස "බී" ලවා විශ්වාස කරවීමේ අදහසින් එකී පත්‍රයෙහි සඳහන් 10,000 ට බිංදුවක් එකතු කිරීමෙන් මුදල 1,00,000 කරයි. "ඒ" කූට ලේඛන සෑදීම කර ඇත.

(ආ) වත්තක් "බී" ට විකුණා, එය විකුණූ මුදල "බී" ගෙන් ගැනීමේ අදහසින් "ඉසෙඩ්" ගෙන් "ඒ" ට එකී වත්ත පවරනු ලබන පැවරුම්කරයකැයි ඇඟවෙන ලේඛනයකට "ඉසෙඩ්" ගේ බලය නොමැති ව, "ඒ" "ඉසෙඩ්" ගේ මුද්‍රාව තබයි. "ඒ" කූට ලේඛන සෑදීම කර ඇත.

(ඇ) "බී" විසින් අත්සන් කරනු ලැබූ ද, චෙක් පතෙහි මුදලක් සඳහන් නො කරනු ලැබූ ද, රැගෙන එන්නකුට ගෙවන හැකි වූ ද, බැංකු කාරයකු සඳහා වූ චෙක් පතක් "ඒ" ඇහිඳ ගනියි. රුපියල් දහදාහක මුදල දැමීමෙන් "ඒ" වංචක ලෙස එය සම්පූර්ණ කරයි. "ඒ" කූට ලේඛන සෑදීම කරයි.

(ඈ) ගෙවිය යුතු මුදල සඳහන් නො කොට, තමා විසින් අත්සන් කරනු ලැබූ බැංකුකාරයකු සඳහා වූ චෙක් පතක් "ඒ" තම නියෝජිතයා වූ "බී" ළඟ තබා යම් ගෙවීම් වගයක් ගෙවීමේ කාර්යය සඳහා රුපියල් දහ දාහකට වැඩි නො වන ගණනක් එහි සඳහන් කොට, චෙක්පත් සම්පූර්ණ කරන ලෙස, "බී" ට බලය දෙයි. රුපියල් විසිදාහක මුදලක් සඳහන් කිරීමෙන් "බී" වංචක ලෙස එකී චෙක්පත සම්පූර්ණ කරයි. "බී" කූට ලේඛන සෑදීම කරයි.



https://ezofz.web.lk/
Scanned with CamScanner

(ඉ) සැබෑ හුවමාරු පත්‍රයක් ලෙස බැංකුකරුවකු ලවා මාරු කරවා ගැනීමේ හා දිනය සම්පූර්ණ වූ වහා ම හුවමාරු පත්‍රයෙහි මුදල් ලබා ගැනීමේ අදහසින් "බී" ගේ බලය නොමැති ව, "බී" ගේ නමින් හුවමාරු පත්‍රයක් "ඒ" තමා වෙත ලියා අත්සන් කොට ගනියි. "ඒ" ට "බී" ගේ ආරක්ෂාව ඇති වීමෙන් හුවමාරු පත්‍රය මාරු කර ගැනීමට පුළුවන් කම තිබෙන බව බැංකුකරුට අඟවා ඔහු රැවටීමේ අදහසින් "ඒ" හුවමාරු පත්‍රය ලියා අත්සන් කළ බැවින් මෙහි දී "ඒ" කූට ලේඛන සෑදීම ගැන වැරදි කාරයෙක් වේ.

(ඊ) "ඉසෙඩ්" ගේ අන්තිම කැමති පත්‍රයෙහි මේ වචන ඇතුළත් වෙයි. "මගේ ඉතුරු සියළු දේපළ "ඒ" "බී" හා "සී" අතර සමාන ව බෙදා දෙන ලෙස මම නියම කරමි." තමාට හා "සී" ට මුළු දේපළ ම දුන් බව විශ්වාස කරවීමේ අදහසින් "ඒ" "බී" ගේ නම වංක ලෙස සූරා දමයි. "ඒ" කූට ලේඛන සෑදීම කර ඇත.

(උ) පොරොන්දු පත්‍රයක මුදල "ඉසෙඩ්" ට හෝ ඔහුගේ නියමය අනුව ගෙවන හැකි වන පරිද්දෙන් එකී පත්‍රයෙහි "ඉසෙඩ්" ට හෝ ඔහුගේ නියමය අනුව ගෙවනු, යන වචන "ඒ" ලියා සහතික කර අත්සන් කරයි. "බී" "ඉසෙඩ්" ට හෝ ඔහුගේ නියමය අනුව ගෙවනු යන වචන වංක ලෙස මකා එකී විශේෂ ලියා සහතික කිරීම හිස් ලියා සහතික කිරීමකට හරවයි. "බී" කූට ලේඛන සෑදීම කරයි.

(ඌ) "ඒ" වත්තක් "ඉසෙඩ්" ට විකුණා පවරා දෙයි. "ඒ" "ඉසෙඩ්" ට තම වත්ත හිමිවීම වැළැක්වීමේ අදහසින් ඔහු එකී වත්ත "ඉසෙඩ්" ට පවරා දීමට ප්‍රථමයෙන්, "බී" ට පවරා දුන් ලෙස විශ්වාස කරවීමේ අදහසින් යුතු ව, "ඉසෙඩ්" ගේ පැවරුම් කරයෙහි දිනට හය මාසයකට ඉහතින් වූ දිනයකින් යුත් පැවරුම් කරයකින් එකී වත්ත ම "බී" ට පවරා දෙයි. "ඒ" කූට ලේඛන සෑදීම කරයි.

(එ) "ඉසෙඩ්" "ඒ" ට ලියා ගැනීම පිණිස තම අන්තිම කැමති පත්‍රය කියවයි. "ඉසෙඩ්" විසින් නම් කරනු ලැබූ අන්තිම කැමති පත්‍රයෙන් හිමිවන්නකු වෙනුවට වෙනත් හිමිවන්නකුගේ නමක් "ඒ" ඕනෑ කමින් ම ලියා, "ඉසෙඩ්" ගේ උපදෙස් ප්‍රකාර ඔහු අන්තිම කැමති පත්‍රය පිළියෙළ කළ බව දක්වමින් එකී අන්තිම කැමති පත්‍රය අත්සන් කිරීමට "ඉසෙඩ්" පොළඹවයි. "ඒ" කූට ලේඛන සෑදීම කර ඇත.

(ඒ) ලියුමක මාර්ගයෙන් "ඉසෙඩ්" ගෙන් හා වෙනත් තැනැත්තන්ගෙන් පිනට ඉල්ලා ගැනීමේ අදහසින් තමා හොඳ චරිතයක් ඇත්තකු බවක් කලින් දත නො හැකි වූ අවාසනාවක් නිසා දැනට දුක් ජීවිතයක් ගත කරන බවත්, සහතික කරන අන්දමේ ලියමනක් "ඒ" ලියා "බී" ගේ බලයක් නොමැති ව, එය "බී" ගේ නමින් අත්සන් කරයි. මෙහි දී, තම දේපළවලින් වෙන්වීමට "ඉසෙඩ්" පෙළඹවීම සඳහා "ඒ" අසත්‍ය ලේඛනයක් සෑදූ බැවින් "ඒ" කූට ලේඛන සෑදීම කර ඇත.

(ඔ) "ඉසෙඩ්" යටතේ රක්ෂා ලබා ගැනීමේ අදහසින් තමාගේ චරිතය ගැන සහතික කොට ඇති ලියුමක් "බී" ගෙන් බලයක් නොමැති ව, "ඒ" ලියා "බී" ගේ නමින් අත්සන් කරයි. කූට ලෙස සම්පාදනය කරනු ලැබූ සහතිකයෙන් "ඉසෙඩ්" රවටා සේවය සඳහා ප්‍රකාශිත හෝ ඇඟවුණු ගිවිසුමකට ඇතුළුවීමට "ඉසෙඩ්" පෙළඹවීමට "ඒ" අදහස් කළ බැවින් ඔහු කූට ලේඛන සෑදීම කර ඇත.

පැහැදිලි කිරීම 1 – යම් තැනැත්තකු තම නම අත්සන් කිරීම කූට ලේඛන සෑදීමක් බවට පත් විය හැකි ය.

**නිදර්ශන**

(අ) තමාගේ නම ඇති වෙනත් තැනැත්තකු විසින් ලියන ලදැයි විශ්වාස කරවන අදහසින් හුවමාරු පත්‍රයකට "ඒ" තම නමින් අත්සන් කරයි. "ඒ" කූට ලේඛන සෑදීම කර ඇත.

(ආ) "ඒ" කඩදාසි කැබැල්ලක "පිළිගත්තා ලදී" වචන ලියා "ඉසෙඩ්" ගේ නමින් එහි අත්සන් කරයි. ඔහු මෙසේ කළේ කඩදාසිය මත "බී" විසින් "ඉසෙඩ්" වෙත ලියනු ලැබූ හුවමාරු පත්‍රයක් "බී" විසින් පසු ව ලියා එකී පත්‍රය "ඉසෙඩ්" විසින් පිළිගනු ලැබුවක් ලෙස ගනු දෙනු කිරීමට හැකිවන ලෙස ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

"ඒ" කුට ලේඛන සෑදීම ගැන වැරදිකාරයකු වේ. තව ද, "බී" එකී කරුණු දනිමින් ම "ඒ" ගේ අදහස ප්‍රකාර එකී කඩදාසියෙහි හුවමාරු පත්‍රය ලියතොත්, ඔහු ද කුට ලේඛන සෑදීම ගැන වරද කාරයෙක් වේ.

(ඈ) එක ම නම ඇති, වෙනත් තැනැත්තකුගේ නියමයක් අනුව ගෙවිය යුතු හුවමාරු පත්‍රයක් "ඒ" ඇහිඳ ගනියි. එය ගෙවිය යුතු වන්නෙ යම් කිසිවකුගේ නියමයකට නම්, එකී තැනැත්තා විසින් එය අත්සන් කරනු ලැබූ ලෙස විශ්වාස කරවීමේ අදහසින්, "ඒ" තම නමින් එය අත්සන් කරයි. මෙහි දී, "ඒ" කුට ලේඛන සෑදීම කර ඇත.

(ඇ) "බී" ට විරුද්ධ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවේ යෙදවීම යටතේ විකුණනු ලැබූ වත්තක් "ඒ" මිලයට ගනියි. එකී වත්ත අල්ලා ගැනීමෙන් පසු, "බී" "ඉසෙඩ්" සමග කුමන්ත්‍රණය කිරීමෙන්, නාම මාත්‍ර මුදලකට දීර්ඝ කාලයකට, "ඉසෙඩ්" නමට එකී වත්ත සඳහා බද්දක් ලියා අත්සන් කොට, "ඒ" ට වංචාවක් කිරීමේ හා බද්ද දෙනු ලැබූයේ තහනම් කිරීමට පෙර බව විශ්වාස කරවීමේ අදහසින්, බදුකරයෙහි දිනය තහනමට හය මාසයකට පෙර දිනයක් ලෙස සඳහන් කරයි. "බී" එකී බදුකරය අත්සන් කරනු ලබන්නේ තම නමින් වුව ද, එහි කලින් දිනයක් දැමීමෙන් ඔහු කුට ලේඛන සෑදීම කරයි.

(ඉ) වෙළෙන්දකු වූ "ඒ" වස්තු භංගත්වය ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන්, තම යහපත සඳහා ඔහුගේ දේපළ "බී" ළඟ තබයි. තව ද ඔහුගේ ණය කාරයන් වංචා කිරීමේ අදහසින් හා තම ක්‍රියාවට සැබෑ වර්ණයක් දීම සඳහා ලබා ගන්නා ලද වටිනාකමට යම් මුදලක් දීමට තමා බැඳෙන පරිදි වූ පොරොන්දු පත්‍රයක් ලියා එය ඔහු වස්තු භංගත්වය ලැබීම ආසන්නවීමට පෙර ලියන ලද්දක් බව විශ්වාස කරවීමේ අදහසින් එකී පොරොන්දු පත්‍රයෙහි දිනය කලින් දිනයක් ලෙස සඳහන් කරයි. විස්තර කිරීමෙහි පළමුවෙනි ශීර්ෂය යටතේ "ඒ" කුට ලේඛන සෑදීම කර ඇත.

**පැහැදිලි කිරීම 2.**– ලේඛනයක් සැබෑ තැනැත්තකු විසින් කරනු ලැබුවක් ලෙස විශ්වාස කරවීමේ අදහසින්, ව්‍යාජ තැනැත්තකුගේ නමින් අසත්‍ය ලේඛනයක් සෑදීම හෝ යම් ලේඛනයක් ජීවත්ව සිටිය දී සාදන ලද්දක් බව විශ්වාස කරවීමේ අදහසින් නැසීගිය තැනැත්තකුගේ නමින් අසත්‍ය ලේඛනයක් සෑදීම කුට ලේඛන සෑදීම බවට පත්විය හැකි ය.

**නිදර්ශනය**

ව්‍යාජ තැනැත්තකු සඳහා "ඒ" හුවමාරු පත්‍රයක් සාදා එය ගනු දෙනු කිරීමේ අදහසින් එකී ව්‍යාජ තැනැත්තකුගේ නමින් වංචක ලෙස එය පිළිගන්වයි. "ඒ" කුට ලේඛන සෑදීම කරයි.

කුට ලේඛන සෑදීම ගැන දඬුවම.

**454.** කුට ලේඛන සෑදීම කරන තැනැත්තකුට අවුරුදු පහ දක්වා කාලයක, දෙයා කාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

අධිකරණයක වාර්තාවක් හෝ ආණ්ඩුවේ උප්පැන්න ලේඛන පොතක් ආදියක වාර්තාවක් කුට ලෙස සෑදීම.

**455.** අධිකරණයක නඩු පොතක් හෝ නීති කෘත්‍යයක් හෝ උප්පැන්න සටහන් කිරීමේ හෝ බව්තීස්ම කිරීමේ හෝ විවාහ කිරීමේ හෝ භූමදාන කිරීමේ ලේඛනයක් හෝ එ බඳු කාර්යයක් සඳහා රජයේ සේවකයකු විසින් තැබූ ලේඛනයක් ලෙස ඇඟවෙන ලේඛනයක් හෝ රජයේ සේවකයකු විසින් තම නිල තත්ත්වය අනු ව කරන ලදැයි සලකන සහතිකයක් හෝ සාදන ලදැ යි සලකන ලේඛනයක් හෝ නඩුවක් පැවරීමට හෝ නඩුවක දී, නිදහසට කරුණු කීමට හෝ එහි යම් නීති කෘත්‍යයක් ලබා ගැනීමට හෝ නඩුවක නඩු තීන්දුව කට එකඟවීමට දෙනු ලැබූ බලයක් හෝ පරකාර්ය සාධක බලයක් කුට ලෙස සෑදීම කරන තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**456.** වටිනා ඇප පත්‍රයක් යයි හෝ අන්තිම කැමති පත්‍රයක් යයි හෝ යම් වටිනා ඇප පත්‍රයක් සෑදීමට හෝ පැවරීමට හෝ එහි මුල් මුදල, පොළිය හෝ ලාභ කොටසක් ලබා ගැනීමට හෝ යම් මුදලක් හෝ චංචල දේපලක් හෝ වටිනා ඇප පත්‍රයක් ලබා ගැනීමට හෝ බාරදීමට බලය දෙතැයි සැලකෙන ලේඛනයක් හෝ යම් මුදලක් ගෙවීම නිදහස් කිරීමක් යයි හෝ යම් මුදලක් ගෙවීම පිළිගන්නා වූ කුවිතාන්සියක් යයි හෝ යම් චංචල දේපළක් හෝ වටිනා ඇප පත්‍රයක් බාර ගැනීම නිදහස් කිරීමක් යයි හෝ බාර ගැනීමේ කුවිතාන්සියක් යයි සැලකෙන ලේඛනයක් කූට ලෙස සෑදීම කරන තැනැත්තකුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

වටිනා ඇප පත්‍රයක් හෝ අන්තිම කැමති පත්‍රයක් කූට ලෙස සෑදීම.

**457.** කූට ලෙස සාදනු ලැබූ ලේඛනය වංචා කිරීමේ කාර්යය සඳහා පාවිච්චි කිරීමේ අදහසින් කූට ලේඛන සෑදීම කරන තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

වංචා කිරීමේ කාර්යය සඳහා කූට ලේඛන සෑදීම.

**458.** සම්පූර්ණයෙන් ම හෝ කොටස් වශයෙන් කූට ලෙස සාදනු ලැබූ අසත්‍ය ලේඛනයක් "කූට ලෙස සාදනු ලැබූ ලේඛනයක්" යි නම් කරනු ලැබේ.

"කූට ලෙස සාදනු ලැබූ ලේඛනයක්."

**459.** කූට ලෙස සාදනු ලැබූ ලේඛනයක් බව තමා දන්නා වූ හෝ එබන්දක් බව විශ්වාස කිරීමට තමාට කරුණු ඇත්තා වූ යම් ලේඛනයක් සැබෑ ලේඛනයක් ලෙස වංචක ලෙස හෝ වංක ව යමකු පාවිච්චි කළහොත්, ඔහු එකී ලේඛනය කූට ලෙස සාදනු ලැබුයේ නම්, ඔහුට දඬුවම් කරන ආකාරයට ම දඬුවම් කළ යුතු ය.

කූට ලෙස සාදනු ලැබූ ලේඛනයක් සැබෑ ලේඛනයක් ලෙස පාවිච්චි කිරීම.

**460.** 456 වෙනි වගන්තිය යටතේ දඬුවම් කළ හැකි කූට ලේඛන සෑදීමේ වරදක් කිරීමේ කාර්‍ය්‍යය සඳහා පාවිච්චි කිරීමේ අදහසින් යම් මුද්‍රාවක්, තහඩුවක් හෝ අච්චුවක් සෑදීම සඳහා වෙනත් උපකරණයක් තනන හෝ කූට ලෙස සාදන තැනැත්තකුට හෝ එබඳු යම් මුද්‍රාවක්, තහඩුවක් හෝ වෙනත් උපකරණයක් කූට ලෙස සාදන ලද බව දනිමින් ස්වාමිත්වයෙහි තබා ගෙන සිටින තැනැත්තකුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

456 වෙනි වගන්තිය යටතේ දඬුවම් කළ හැකි කූට ලේඛන සෑදීමේ වරදක් කිරීමේ අදහසින් කූට මුද්‍රාවක්, තහඩුවක් යනාදියක් සෑදීම හෝ ස්වාමිත්වයෙහි තබා ගැනීම.

**461.** මේ පරිච්ඡේදයෙහි 456 නොවන වෙනත් වගන්තියක් යටතේ දඬුවම් කල හැකි කූට ලේඛන සෑදීමේ වරදක් කිරීම සඳහා පාවිච්චි කිරීමේ අදහසින් යම් මුද්‍රාවක් හෝ තහඩුවක් හෝ අච්චුවක් සෑදීම සඳහා වෙනත් උපකරණයක් සාදන හෝ කූට ලෙස සාදන තැනැත්තකුට හෝ එ බඳු අදහසකින් එ බඳු යම් මුද්‍රාවක්, තහඩුවක් හෝ වෙනත් උපකරණයක් කූට ලෙස සාදන ලද බව දනිමින් ස්වාමිත්වයෙහි තබාගෙන සිටින තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

වෙනත් ආකාරයකට දඬුවම් කළ හැකි කූට ලේඛන සෑදීමේ වරදක් කිරීමේ අදහසින් කූට මුද්‍රාවක්, තහඩුවක් යනාදියක් සෑදීම හෝ ස්වාමිත්වයෙහි තබා ගැනීම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

කූට ලෙස සාදනු ලැබූ බව දන්නා වාර්තාවක් හෝ වටිනා ඇප පත්‍රයක් සැබෑ අන්තිම කැමති පත්‍රයක් සැබෑ ලේඛනයක් ලෙස පාවිච්චි කිරීමේ අදහසින් ස්වාමිත්වයෙහි තබාගැනීම.

**462.** කූට ලෙස සාදනු ලැබූ බව දනිමින් සැබෑ වූ ලේඛනයක් ලෙස වංචකව හෝ වංකව පාවිච්චි කිරීමේ අදහසින් යම් ලේඛනයක් ස්වාමිත්වයෙහි තබා ගන්නා තැනැත්තකුට එකී ලේඛනය 455 වෙනි වගන්තියේ සඳහන් විස්තරයට වැටෙන්නේ නම් අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. එම ලේඛනය 456 වෙනි වගන්තියේ සඳහන් විස්තරයට වැටෙන්නක් නම් ඔහුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

456 වෙනි වගන්තියෙහි විස්තර කරනු ලැබූ ලේඛන සත්‍ය බව සහතික කිරීම සඳහා පාවිච්චි කරනු ලැබූ සලකුණක් කූට ලෙස සාදනු ලැබීම හෝ ඒ ලෙස සළකුණු කරනු ලැබූ ද්‍රව්‍යයක් ළඟ තබාගැනීම.

**463.** යම් ද්‍රව්‍යයක් මත එවකට කූට ලෙස සාදනු ලැබූ හෝ ඉන්පසු කූට ලෙස සාදනු ලබන යම් ලේඛනයකට සත්‍යභාවයේ පෙනුමක් දීම සඳහා පාවිච්චි කිරීමේ අදහසින්, 456 වෙනි වගන්තියේ විස්තර කරනු ලැබූ යම් ලේඛනයක සත්‍යතාව සහතික කිරීමේ කාර්‍ය්‍යය සඳහා පාවිච්චි කරනු ලැබූ යම් සලකුණක් යම් ද්‍රව්‍යයක් මත කූට ලෙස සාදන තැනැත්තකුට හෝ එ බඳු සලකුණක් කූට ලෙස සලකුණු කරන ලද ද්‍රව්‍යයක් එ බඳු අදහසකින් තම ස්වාමිත්වයෙහි තබා ගන්නා වූ තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

456 වෙනි වගන්තියෙහි විස්තර කරනු ලැබූ ලේඛන නොවන වෙනත් ලේඛන සත්‍ය බව සහතික කිරීම සඳහා පාවිච්චි කරනු ලැබූ සලකුණක් කූට ලෙස සාදනු ලැබීම හෝ කූට ලෙස සලකුණු කරනු ලැබූ ද්‍රව්‍යයක් ළඟ තබා ගැනීම.

**464.** යම් ද්‍රව්‍යයක් මත එවකට කූට ලෙස සාදනු ලැබූ හෝ ඉන්පසු කූට ලෙස සාදනු ලබන යම් ලේඛනයකට සත්‍යභාවයේ පෙනුමක් දීම සඳහා පාවිච්චි කිරීමේ අදහසින් 456 වෙනි වගන්තියේ විස්තර කරනු ලැබූ ලේඛනයක් නො වන යම් ලේඛනයක සත්‍යතාව සහතික කිරීමේ කාර්‍ය්‍යය සඳහා පාවිච්චි කරනු ලැබූ යම් සලකුණක් යම් ද්‍රව්‍යයක් මත කූට ලෙස සාදන තැනැත්තකුට හෝ එබඳු සලකුණක් කූට ලෙස සලකුණු කරන ලද ද්‍රව්‍යයක් එ බඳු අදහසකින් තම ස්වාමිත්වයෙහි තබා ගන්නා වූ තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

අසත්‍ය පණිවුඩයක් විදුලි මගින් යැවීම.

**465.** යම් තැනැත්තකුට වංචා කිරීමේ හෝ පාඩු කිරීමේ හෝ අප්‍රසන්නත්වය ඇති කිරීමේ අදහසින් ආණ්ඩුවට හෝ මහජන ශුභ සිද්ධියට හානියක් විය හැකි අසත්‍ය දූෂමාන ආරංචියක් පැතිරවීමේ අදහසින් යමකු යම් අසත්‍ය පණිවුඩයක් දැන දැනම, විදුලි මගින් යැවීමට සිදු කළහොත් හෝ එසේ යැවීම සඳහා විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුවේ සේවයෙහි යෙදී සිටින යම් රජයේ නිලධාරියකු වෙත ඉදිරිපත් කළහොත් ඔහුට අවුරුද්ද දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් කළ යුතු ය.

අන්තිම කැමති පත්‍රයක් වංචක ලෙස අවලංගු කිරීමේ, විනාස කිරීමේ ආදිය.

**466.** මහජනයාට හෝ යම් තැනැත්තකුට හානියක් හෝ පාඩුවක් කිරීමේ අදහසින් අන්තිම කැමැත්තක් වූ හෝ වටිනා ඇප පත්‍රයක් වූ හෝ රජයේ සේවකයකු වශයෙන් යමකු විසින් තබනු ලැබූ හෝ යම් ආඥාපනතක් හෝ ව්‍යවස්ථාවක් ප්‍රකාර යමකු විසින් තබනු ලැබූ යම් සටහනක් වූ හෝ ලේඛන පොතක් වූ හෝ පොතක් වූ හෝ ලේඛනයක්



https://ezofz.web.lk/
Scanned with CamScanner

වූ හෝ ඉහත සඳහන් යමෙකැයි සලකන්නා වූ යම් ලේඛනයක් වංචක ලෙස හෝ වංක ලෙස අවලංගු කරන, විනාශ කරන හෝ එබන්දකට හානියක් කරන හෝ එබන්දක් විරූප කරන හෝ එබන්දක් අවලංගු කිරීමකට හෝ විනාශ කිරීමකට හෝ එබන්දකට හානි කිරීමම හෝ එබන්දක් විරූප කිරීමට තැත් කරන හෝ එබන්දක් සඟවන හෝ සැඟවීමට තැත් කරන යම් තැනැත්තකුට හෝ එබඳු සටහනකට ලේඛන පොතකට, පොතකට හෝ ලේඛනයකට අනර්ථය කරන තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

**467.** යමකු ලිපිකරුවකු ව නිලධාරියකු වූ හෝ සේවකයකු ව, හෝ ලිපිකරුවකු, නිලධාරියකු හෝ සේවකයකු වශයෙන් සේවයෙහි යෙදී සිටිය දී හෝ ක්‍රියා කිරීමේ දී සිය ස්වාමියාට අයිති හෝ ස්වාමියාගේ ස්වාමිත්වයෙහි ඇති හෝ එම ස්වාමියා සඳහා හෝ ඔහු වෙනුවට තමාට ලැබී ඇති, යම් පොතක්, කඩදාසියක්, ලියවිල්ලක්, වටිනා ඇප පත්‍රයක් හෝ ගනුදෙනු ලේඛනයක් ඕනෑවට හා වංචා කිරීමේ අදහසින් විනාශ කරන, වෙනස් කරන, කපා හරින හෝ එබන්දක වැරදි යෙදුම් යොදන තැනැත්තකුට හෝ එබඳු පොතක, කඩදාසියක, ලියවිල්ලක වටිනා ඇප පත්‍රයක හෝ ගනු දෙනු ලේඛනයක ඕනෑවට හා වංචා කිරීමේ අදහසින් යම් අසත්‍ය සටහනක් කරන හෝ කිරීමට අනුබල දෙන හෝ යම් අවශ්‍ය තොරතුරක් යෙදීම නො කර හරින හෝ වෙනස් කරන හෝ එබන්දක් කිරීමට අනුබල දෙන තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

ගනුදෙනු අසත්‍ය ලෙස තැබීම.

පැහැදිලි කිරීම.-මේ වගන්තිය යටතේ යම් චෝදනාවක දී, වංචා කරනු ලැබීමට අදහස් කරනු ලැබූ යම් තැනැත්තකු, නම් කිරීමක් හෝ වංචා කිරීමට යටත් වෙතැයි අදහස් කරනු ලැබූ විශේෂ මුදල් ගණනක් සඳහන් කිරීමක් හෝ වරද කරනු ලැබූ විශේෂ දිනයක් සඳහන් කිරීමක් නොමැති ව, වංචා කිරීමේ සාමාන්‍ය අදහස චෝදනා කිරීම ප්‍රමාණවත් විය යුතු ය.

**468.** (1) චෝදිත තැනැත්තා විසින් ඔප්පු කල යුතු නීත්‍යනුකූල බලයක් හෝ සමාවේ හේතුවක් නොමැතිව, මහ රජතුමාණන්ගේ විජිතවල කිසියම් කොටසක හෝ වෙනත් විදේශීය රටක නීත්‍යනුකූලව වලංගු වන්නා වූ යම් වලංගු මුදල් නෝට්ටුවක, බැංකු නෝට්ටුවක හෝ කාසියක යම් අනුකරණයක්, තම ස්වාමිත්වයෙහි තබා ගන්නා තැනැත්තකු වරදකට වරදකාරයකු විය යුතු ය. තව ද අවුරුදු දෙකකට නොවැඩි කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට හෝ එකී දඬුවම් දෙකටම ඔහු යටත් විය යුතු ය.

යම් වලංගු මුදල් නෝට්ටුවක, බැංකු නෝට්ටුවක හෝ කාසියක අනුකරණයක් ස්වාමිත්වයෙහි තබා ගැනීම.

(2) මේ වගන්තියේ කාර්‍යය සඳහා –

"අනුකරණය" යන යෙදුමට මහරජතුමාණන් ගේ විජිතවල හෝ යම් විදේශීය රටක නීත්‍යනුකූලව වලංගු වන්නා වූ යම් වලංගු මුදල් නෝට්ටුවක්, බැංකු නෝට්ටුවක් හෝ කාසියක් අනුකරණය කිරීමෙන් සැපයුණු සැලැස්මවල් ඔබ්බවනු ලැබූ, කපු, පට හෝ වෙනත් වියනු ලැබූ ද්‍රව්‍ය ඇතුළත් වෙයි.



https://ezofz.web.lk/
Scanned with CamScanner

දේපළ ලකුණු.

**469.** යම් චංචල දේපළක් එක්තරා තැනැත්තකුට අයත් බව දක්වීමේ ලකුණකට දේපළ ලකුණකැ යි කියනු ලැබේ.

අසත්‍ය දේපළ ලකුණක් පාවිච්චි කිරීම.

**470.** ලකුණු කරනු ලැබූ දේපළ හෝ භාණ්ඩ හෝ එසේ ලකුණු කරනු ලැබූ පෙට්ටියක, පොදියක හෝ වෙනත් භාජනයක ඇතුළත් දේපළ හෝ භාණ්ඩ ඒවා අයත් නැති තැනැත්තකුට අයත් ලෙස විශ්වාස කරවීමේ අදහසින් යමකු යම් චංචල දේපළක් හෝ භාණ්ඩ හෝ චංචල දේපළ ඇතුළත් පෙට්ටියක් හෝ පොදියක් හෝ වෙනත් භාජනයක් ලකුණු කරතහොත් හෝ ලකුණක් සහිත පෙට්ටියක්, පොදියක් හෝ වෙනත් භාජනයක් පාවිච්චි කරතහොත් ඔහු "අසත්‍ය දේපළ ලකුණක් පාවිච්චි කළ" ලෙස සලකනු ලැබේ.

යම් තැනැත්තකු රැවටීමේ හෝ ඔහුට පාඩුවක් කිරීමේ අදහසින් අසත්‍ය දේපළ ලකුණක් පාවිච්චි කිරීම ගැන දඬුවම.

**471.** යම් තැනැත්තකු රැවටීමේ හෝ ඔහුට පාඩුවක් කිරීමේ අදහසින් අසත්‍ය දේපළ ලකුණක් යමකු පාවිච්චි කරතහොත්, ඔහුට අවුරුද්ද දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

වෙනත් තැනැත්තකු විසින් පාවිච්චි කරනු ලැබූ දේපළ ලකුණක් හානියක් හෝ පාඩුවක් කිරීමේ අදහසින් කූට ලෙස තැනීම.

**472.** වෙනත් තැනැත්තකු විසින් පාවිච්චි කරනු ලැබූ දේපළ ලකුණක් මහජනයාට හෝ යම් තැනැත්තකුට හානියක් හෝ පාඩුවක් කිරීමේ අදහසින් දැන දැනම, යමකු විසින් කූට ලෙස තනනු ලැබුවහොත්, ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

රජයේ සේවකයකු විසින් පාවිච්චි කරනු ලැබූ දේපළ ලකුණක් හෝ යම් දේපළ නිපදවීමේ තත්ත්වය ආදිය දක්වනු සඳහා ඔහු විසින් පාවිච්චි කරනු ලැබූ යම් ලකුණක් කූට ලෙස තැනීම.

**473.** මහජනයාට හෝ යම් තැනැත්තකුට හානියක් හෝ පාඩුවක් කිරීමේ අදහසින් රජයේ සේවකයකු විසින් පාවිච්චි කරනු ලැබූ යම් දේපළ ලකුණක් හෝ යම් දේපළක් එක්තරා තැනැත්තකු විසින් හෝ එක්තරා වේලාවක දී හෝ එක්තරා ස්ථානයක දී නිපදවනු ලැබූ බව හෝ එක්තරා තත්ත්වයක බව හෝ එක්තරා කාර්යාලයකින් පිට වී ඇති බව හෝ එයට නිදහස් කිරීමක් හිමි බව දැක්වීම සඳහා එකී රජයේ සේවකයා විසින් පාවිච්චි කරනු ලැබූ යම් ලකුණක් දැන දැනම යමකු කූට ලෙස තැනුවහොත් හෝ එබඳු ලකුණක් කූට ලෙස තනනු ලැබූවක් බව දනිමින් ම එය සැබෑ ලකුණක් ලෙස පාවිච්චි කළහොත් ඔහුට අවුරුදු තුන දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට යටත් විය යුතු ය.

යම් මහජන හෝ පුද්ගලික දේපළ ලකුණක් කූට ලෙස තැනීම සඳහා යම් අච්චුවක්, තහඩුවක් හෝ වෙනත් උපකරණයක් වංචක ලෙස සෑදීම හෝ ස්වාමිත්වයෙහි තබා ගැනීම.

**474.** කූට ලෙස තැනීමේ කාර්‍යය සඳහා පාවිච්චි කිරීමේ අදහසින් යම් මහජන හෝ පුද්ගලික දේපළ ලකුණක් කූට ලෙස තැනීම සඳහා යම් අච්චුවක්, තහඩුවක් හෝ වෙනත් උපකරණයක් සාදන්නා වූ හෝ ස්වාමිත්වයෙහි තබා ගෙන සිටින්නා වූ හෝ යම් භාණ්ඩ හෝ වෙළෙඳ බඩු ඒවා සාදනු නොලැබූ එක්තරා තැනැත්තකු විසින් හෝ වෙළෙඳ සමාගමක් විසින් සෑදූ බව හෝ නිපද වූ බව හෝ සාදනු නොලැබූ වේලාවක හෝ ස්ථානයක සෑදූ බව හෝ එක්තරා තත්ත්වයක නොවන නමුත්, එම තත්ත්වයේ බව හෝ අයත් නොවන තැනැත්තකුට අයත්



https://ezofz.web.lk/
Scanned with CamScanner

බව හෝ දැක්වීමේ කාර්‍ය්‍යය සඳහා පාවිච්චි කිරීමේ අදහසින් එබඳු දේපල ලකුණක් ළඟ තබා ගන්නා වූ තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

**475.** යම් භාණ්ඩවල හෝ එකී භාණ්ඩ පුරවනු ලැබූ හෝ ඇතුළත් කරනු ලැබූ යම් පෙට්ටියක හෝ වැස්මක හෝ භාජනයක සවි කරනු ලැබූ හෝ ඔබ්බවනු ලැබූ මහජන හෝ පුද්ගලික කූට ලෙස තනනු ලැබූ යම් දේපළ ලකුණක් සහිත භාණ්ඩ එකී ලකුණ කූට ලෙස තනනු ලැබූ බව එකී ලකුණෙන් හඳුන්වනු ලැබූ තැනැත්තා විසින් හෝ වේලාවෙහි හෝ ස්ථානයෙහි සාදනු නොලැබූ හෝ නිපදවනු නොලැබූ හෝ භාණ්ඩලවලට හෝ වෙළෙඳ බඩුවලට එකී ලකුණ සවි කරනු ලැබූ බව හෝ ඔබ්බවනු ලැබූ බව හෝ එකී වෙළෙඳ ලකුණු හඳුන්වනු ලැබූ තත්ත්වයක එකී භාණ්ඩ හෝ වෙළෙඳ බඩු නොවන බව දනිමින් ම යම් තැනැත්තකු රැවටීමේ හෝ ඔහුට පාඩුවක් කිරීමේ හෝ හානියක් කිරීමේ අදහසින්, විකුණන තැනැත්තකුට අවුරුද්ද දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය. කූට ලෙස තනනු ලැබූ දේපළ ලකුණකින් සලකුණු කරනු ලැබූ භාණ්ඩ දැන දැනම විකිණීම.

**476.** යම් පොදියක හෝ භාජනයක ඇතුළත් නො වන භාණ්ඩ එහි ඇතුළත් බව හෝ එහි ඇතුළත් භාණ්ඩ එහි ඇතුළත් නොවන බව හෝ එකී පොදියෙහි හෝ භාජනයෙහි ඇතුළත් භාණ්ඩවල නියම ස්වභාවයට හෝ තත්ත්වයට වෙනස් භාණ්ඩ එහි ඇතුළත් බව යම් රජයේ සේවකයකුට හෝ වෙනත් තැනැත්තකුට විශ්වාස කරවීමේ අදහසින් එබඳු භාණ්ඩ ඇතුළත් එ බඳු පොදියක හෝ භාජනයක වංචක ලෙස අසත්‍ය ලකුණු යොදන තැනැත්තකුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය. භාණ්ඩ ඇතුළත් යම් පොදියක හෝ භාජනයක වංචක ලෙස අසත්‍ය ලකුණක් යෙදීම.

**477.** ලකුණ අසත්‍ය බව දනිමින් ඉහත සඳහන් අදහසින් එ බඳු අසත්‍ය ලකුණක් වංචක ලෙස පාවිච්චි කරන තැනැත්තකුට ඉහතින් දක් වූ වගන්තියෙහි සඳහන් ආකාරයට දඬුවම් කළ යුතු ය. එබඳු යම් අසත්‍ය ලකුණක් පාවිච්චි කිරීම ගැන දඬුවම.

**478.** යම් තැනැත්තකුට පාඩු කිරීමේ අදහසින් හෝ එයින් පාඩු වීමට ඉඩ ඇති බව දනිමින් යමකු යම් දේපළ ලකුණක් ඉවත් කළ හොත් හෝ විනාශ කළහොත් හෝ විරූප කළහොත් ඔහුට අවුරුද්ද දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය. පාඩු කිරීමේ අදහසින් යම් දේපළ ලකුණක් විරූප කිරීම.

### මුදල් නෝට්ටු හා බැංකු නෝට්ටු

**478අ.** (1) යම් මුදල් නෝට්ටුවක් හෝ බැංකු නෝට්ටුවක් කූට ලෙස සාදන හෝ කූට ලෙස තනන හෝ කූට ලෙස තැනීමේ හෝ සෑදීමේ වැඩෙහි යම් කොටසක් දැන දැනම ඉෂ්ට කරන තැනැත්තකුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක, බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. මුදල් නෝට්ටු හෝ බැංකු නෝට්ටු කූට ලෙස තැනීම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

(2) මේ වගන්තියේ ද, 478ආ, 478ඇ, 478ඈ යන වගන්ති වල ද කාර්ය සඳහා -

(අ) "බැංකු නෝට්ටුව" යන්නෙන්, ලෝකයේ යම් කොටසක බැංකු ව්‍යාපාරය ගෙන යන තැනැත්තකු විසින් හෝ යම් රාජ්‍යයක බලයකින් හෝ බලය යටතේ නිකුත් කරනු ලැබූ මුදල් වලට සමාන වූවක් ලෙස හෝ මුදල් වෙනුවට යෙදිය හැකි වූවක් ලෙස පාවිච්චි කිරීමේ අදහසින් පොරොන්දු පත්‍රයක් හෝ ඉල්වා සිටීමෙහි දී ඊගෙන එන්නකුට මුදල් ගෙවීමේ පොරොන්දුවක් අදහස් කෙරෙයි.

(ආ) "මුදල් නෝට්ටුව" යන්නෙන්, 291 වෙනි අධිකාරය වූ කඩදසි මුදල් නෝට්ටු ආඥාපනත හෝ ලංකාවෙහි කඩදසි මුදල් නෝට්ටු නිකුත් කිරීම සම්බන්ධයෙන් එවකට ක්‍රියාවෙහි යෙදෙන යම් ආඥාපනතක් යටතේ නිකුත් කරනු ලැබූ මුදල් නෝට්ටුවක් අදහස් කෙරෙයි. තව ද, මහා බ්‍රිතාන්‍යයේ හා උතුරු අයර්ලන්තයේ එක්සත් රාජධානියේ හෝ ලංකාවෙන් පිට මහා රැජිණියගේ රාජ්‍යවල කොටසක හෝ යම් විදේශීය රාජ්‍යයක ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුව වෙනුවට නිකුත් කරනු ලැබූ කිනම් නමකින් කියනු ලැබුව ද, සමාන තත්ත්වයක වූ යම් නෝට්ටුවක් ද එයට ඇතුළත් වෙයි.

කූට ලෙස තනනු ලැබූ හෝ සාදනු ලැබූ මුදල් නෝට්ටු හෝ බැංකු නෝට්ටු සත්‍ය ඒවා ලෙස පාවිච්චි කිරීම.

**478ආ.** කූට ලෙස තනනු ලැබූ හෝ සාදනු ලැබූ මුදල් නෝට්ටුවක් හෝ බැංකු නෝට්ටුවක් කූට ලෙස තනනු ලැබූ හෝ සාදනු ලැබූ බව දනිමින් හෝ විශ්වාස කිරීමට කරුණු තිබිය දී යමකු එකී කූට ලෙස තනනු ලැබූ හෝ සාදනු ලැබූ මුදල් නෝට්ටුවක් හෝ බැංකු නෝට්ටුවක් වෙනත් තැනැත්තකුට විකුණුවහොත්, වෙනත් තැනැත්තකුගෙන් මිලයට ගතහොත් හෝ ලබා ගතහොත් හෝ වෙනත් ලෙස අලෙවි කරතහොත් හෝ සත්‍ය වූවක් ලෙස පාවිච්චි කරතහොත් ඔහුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.

කූට ලෙස තනනු ලැබූ හෝ සාදනු ලැබූ මුදල් නෝට්ටු හෝ බැංකු නෝට්ටු ස්වාමිත්වයෙහි තබා ගැනීම.

**478ඇ.** කූට ලෙස තනනු ලැබූ හෝ සාදනු ලැබූ මුදල් දනිමින් හෝ විශ්වාස කිරීමට කරුණු තිබිය දී සත්‍ය වූවක් ලෙස පාවිච්චි කිරීමේ අදහසින් හෝ සත්‍ය වූවක් ලෙස පාවිච්චි කළ හැකි වන ලෙස යම් කූට ලෙස තනනු ලැබූ හෝ සාදනු ලැබූ මුදල් නෝට්ටුවක් හෝ බැංකු නෝට්ටුවක් ස්වාමිත්වයෙහි තබා ගන්නා වූ තැනැත්තකුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

මුදල් නෝට්ටු හෝ බැංකු නෝට්ටු කූට ලෙස තැනීම හෝ සෑදීම සඳහා උපකරණයක් හෝ ද්‍රව්‍ය සෑදීම හෝ ස්වාමිත්වයෙහි තබා ගැනීම.

**478ඈ.** යම් මුදල් නෝට්ටුවක් හෝ බැංකු නෝට්ටුවක් කූට ලෙස තැනීමට හෝ සෑදීමට පාවිච්චි කිරීමේ කාර්‍යය සඳහා හෝ පාවිච්චි කිරීමට අදහස් කරනු ලැබූ බව දනිමින් හෝ විශ්වාස කිරීමට කරුණු තිබිය දී යම් යන්ත්‍රෝපකරණයක්, උපකරණයක් හෝ ද්‍රව්‍යයක් සාදන්නා වූ හෝ සෑදීමේ වැඩක යම් කොටසක් ඉෂ්ට කරන්නා වූ හෝ මිලයට ගන්නා වූ හෝ විකුණන්නා වූ හෝ අලෙවි කරන්නා වූ හෝ ස්වාමිත්වයෙහි තබා ගන්නා වූ තැනැත්තකුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

## XIX වෙනි පරිච්ඡේදය

### කීර්ති හානි කිරීම

**479.** කථා කරනු ලැබූ වචනවලින් හෝ කියවීමට අදහස් කරනු ලැබූ වචනවලින් හෝ සංඥාවලින් හෝ පෙනෙන නිරූපනයන්ගෙන් යම් තැනැත්තකු පිළිබඳ ආරෝපණය කිරීමකින් ඔහුගේ කීර්තියට හානියක් කරන අදහසින් හෝ කීර්තියට හානියක් වන බව දනිමින් ම හෝ එබන්දකින් එ ලෙස වන බව විශ්වාස කිරීමට කරුණු තිබියදී ඔහු සම්බන්ධයෙන් එ බඳු ආරෝපණය කිරීමක් යමකු කළහොත් හෝ ප්‍රසිද්ධ කළහොත් මින්මතු දක්වෙන අවස්ථාවල දී හැර, ඔහු ඉහත කී තැනැත්තාගේ කීර්ති හානි කළ ලෙස සලකනු ලැබේ. කීර්ති හානි කිරීම.

**පැහැදිලි කිරීම. 1**–යම් ආරෝපණය කිරීමකින් මිය ගිය තැනැත්තකුගේ කීර්තියට ඔහු ජීවත් ව සිටිය දී හානියක් විය හැකි වී නම් හා එහි ආරෝපණය කිරීම මිය ගිය තැනැත්තාගේ පවුලට හෝ වෙනත් ළඟ ඥාතීන්ට රිදවීමට අදහස් කරන ලද නම් එකී මිය ගිය තැනැත්තාට යමක් ආරෝපණය කිරීම කීර්ති හානි කිරීමක් බවට පත් විය හැකි ය.

**පැහැදිලි කිරීම. 2.**–වෙළෙඳ සමාගමක් හෝ සංගමයක් හෝ එ ලෙස යම් තැනැත්තන්ගේ එකමුතුවීමක් සම්බන්ධයෙන් ආරෝපණය කිරීමක් කීර්ති හානි කිරීමක් බවට පත් විය හැකි ය.

**පැහැදිලි කිරීම. 3.**–විකල්පයක් වශයෙන් හෝ විරුද්ධ අර්ථයක් ලෙස ප්‍රකාශ කරනු ලැබුවක් වශයෙන් කරනු ලැබූ ආරෝපණය කිරීමක් කීර්ති හානි කිරීමක් බවට පත් විය හැකි ය.

**පැහැදිලි කිරීම. 4.**–අන් තැනැත්තන් විසින් ගණන් ගැනීමක දී නියම ලෙස හෝ අනියම් ලෙස යමකුගේ සදාචාරය පිළිබඳ ව හෝ බුද්ධිය පිළිබඳව තත්ත්වය හෝ චරිතය පහත් කරන්නා වූ හෝ ඔහුගේ කුලය හෝ ඔහුගේ රක්ෂාව සම්බන්ධයෙන් චරිතය පහත් කරන්නා වූ හෝ ඔහුගේ ගෞරවය අඩුකරන්නා වූ හෝ නැතහොත්, එකී තැනැත්තාගේ ශරීරය පිළිකුල් කටයුතු තත්ත්වයක හෝ සාමාන්‍යයෙන් නින්දිත ලෙස සලකනු ලබන තත්ත්වයක ඇති බව විශ්වාස කරවන්නා වූ ආරෝපණය කිරීමකින් හැර, අන් කිසි ආරෝපණය කිරීමකින් එකී තැනැත්තාගේ කීර්තියට හානියක් වෙතැයි සලකනු නො ලැබේ.

#### නිදර්ශනය

(අ) "ඉසෙඩ්" "බී" ගේ ඔර්ලෝසුව සොරකම් කළ බව විශ්වාස කරවීමේ අදහසින්, "ඉසෙඩ්" අවංක මිනිහෙකි; ඔහු කවදවත් "බී" ගේ ඔර්ලෝසුව සොරකම් නො කළේ ය; යනු "ඒ" කියයි. මෙය ව්‍යතිරේකවලින් යමකට නො වැටෙතහොත්, කීර්ති හානි කිරීමක් වේ.

(ආ) "බී" ගේ ඔර්ලෝසුව සොරකම් කරනු ලැබුයේ කවුරුන් විසින් දැයි "ඒ" ගෙන් අසනු ලැබේ. "බී" ගේ ඔර්ලෝසුව "ඉසෙඩ්" සොරකම් කළ බව විශ්වාස කරවීමේ අදහසින් "ඒ" "ඉසෙඩ්" පෙන්නුම් කරයි. මෙය ව්‍යතිරේකවලින් යමකට නො වැටෙතහොත්, කීර්ති හානි කිරීමක් වේ.

(ඇ) "ඉසෙඩ්" "බී" ගේ ඔර්ලෝසුව සොරකම් කළ බව විශ්වාස කරවීමේ අදහසින් "බී" ගේ ඔර්ලෝසුව රැගෙන "ඉසෙඩ්" පැන යන බව දක්වන චිත්‍රයක් "ඒ" අඳියි. මෙය ව්‍යතිරේකවලින් යමකට නො වැටෙතහොත්, කීර්ති හානි කිරීමක් වේ.

**පළමුවෙනි ව්‍යතිරේකය.**–ආරෝපණය කිරීම කළ යුතු වන්නේ හෝ ප්‍රසිද්ධ කළ යුතු වන්නේ මහජන යහපත සඳහා නම්, යම් තැනැත්තකු සම්බන්ධයෙන් සත්‍ය වූ යමක් ආරෝපණය කිරීම කීර්ති හානි කිරීම නො වේ. එය මහජන යහපත සඳහා ද, නැද්ද යන වග සිද්ධිය පිළිබඳ ප්‍රශ්නයක් වේ. මහජන යහපත සඳහා කිරීමට හෝ ප්‍රසිද්ධ කිරීමට උවමනා වූ යම් සත්‍යයක් ආරෝපණය කිරීම.



https://ezofz.web.lk/
Scanned with CamScanner

ආණ්ඩුවේ කාර්‍ය ඉෂ්ට කිරීමේ දී රජයේ සේවකයකුගේ හැසිරීම.

**දෙවෙනි ව්‍යතිරේකය.**–ආණ්ඩුවේ කාර්යය ඉෂ්ට කිරීමේ දී, රජයේ සේවකයකුගේ හැසිරීම සම්බන්ධයෙන් හෝ එකී හැසිරීමේ දී, ඔහුගේ චරිතය විද්‍යමාන වන පමණට ඔහුගේ චරිතය සම්බන්ධයෙන් යම් මතයක් සද්භාවයෙන් ප්‍රකාශ කිරීම කීර්ති හානි කිරීම නො වේ.

යම් පොදු ප්‍රශ්නයක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු ගේ හැසිරීම.

**තුන්වෙනි ව්‍යතිරේකය.**–යම් මහජන ප්‍රශ්නයක් පිළිබඳ ව යම් තැනැත්තකුගේ හැසිරීම සම්බන්ධයෙන් ද එකී හැසිරීමේ දී ඔහුගේ චරිතය යම් තරමක් දුරට විද්‍යමාන වේ නම්, එපමණක් දුරට ඔහුගේ චරිතය සම්බන්ධයෙන් ද, යම් මතයක් සද්භාවයෙන් ප්‍රකාශ කිරීම කීර්ති හානි කිරීම නො වේ.

**නිදර්ශනය**

මහජන ප්‍රශ්නයක් ගැන ආණ්ඩුවට පෙත්සමක් යැවීමේ දී හෝ මහජන ප්‍රශ්නයක් ගැන රැස්වීමක් රැස් කරවීමේ නියමයක් අත්සන් කිරීමේ දී හෝ එ බඳු රැස්වීමක මූලාසනය ගැනීමේ දී හෝ එබඳු රැස්වීමකට පැමිණ සිටීමෙහි දී හෝ මහජන ආධාරය ඉල්ලා සිටින යම් සමාගමක් පිහිටුවීමෙහි දී හෝ එ බඳු සමාගමකට බැඳීමෙහි දී හෝ මහජනයා සැලකිල්ලක් දක්වන කාර්‍ය කාර්‍යක්ෂම ලෙස ඉෂ්ට කිරීම සඳහා වූ යම් පදවියකට එක්තරා අපේක්ෂකයකුට ඡන්දය දීමෙහි දී හෝ ඔහුට ආධාර කිරීමේ දී, "ඉසෙඩ්" ගේ හැසිරීම සම්බන්ධයෙන් යම් මතයක් සද්භාවයෙන් "ඒ" විසින් ප්‍රකාශ කරනු ලැබීම කීර්ති හානි කිරීම නො වේ.

අධිකරණ නීති කෘති පිළිබඳව වාර්තා ප්‍රසිද්ධ කිරීම.

**හතර වෙනි ව්‍යතිරේකය.**–අධිකරණයක නීති කෘති පිළිබඳ ව හෝ එ බඳු නීති කෘත්‍යවල ප්‍රතිඵල පිළිබඳ ව සැහෙන සත්‍ය කරුණින් යුත් වාර්තාවක් ප්‍රසිද්ධ කිරීම කීර්ති හානි කිරීම නො වේ.

**පැහැදිලි කිරීම.**–අධිකරණයක නඩු විභාගයකට ප්‍රථමයෙන් සුළු අපරාධ විනිශ්චයකරුවකු විසින් හෝ වෙනත් නිලධාරියකු විසින් ප්‍රසිද්ධ ස්ථානයක විභාගයක් පවත්වනු ලැබූ අවස්ථාවක දී, එකී ස්ථානය ඉහත සඳහන් ව්‍යතිරේකයේ අර්ථය ඇතුළත අධිකරණයක් වේ.

අධිකරණයක විනිශ්චය කරනු ලැබූ නඩුවක සුදුසුකම් හෝ එයට සම්බන්ධ වූ සාක්ෂිකරුවන් හා වෙනත් තැනැත්තන්ගේ හැසිරීම.

**පස්වෙනි ව්‍යතිරේකය.**–අධිකරණයකින් විනිශ්චය කරනු ලැබූ සිවිල් නඩුවක හෝ අපරාධ නඩුවක සුදුසුකම් සම්බන්ධයෙන් හෝ එ බඳු නඩුවක පාර්ශ්වකාරයකු වූ හෝ සාක්ෂිකරුවකු හෝ නියෝජිතයකු වූ යම් තැනැත්තකුගේ හැසිරීම සම්බන්ධයෙන් හෝ එකී හැසිරීමෙන් ඔහුගේ චරිතය විද්‍යමාන වන පමණට එකී තැනැත්තාගේ චරිතය සම්බන්ධයෙන් යම් මතයක් සද්භාවයෙන් ප්‍රකාශ කිරීම කීර්ති හානි කිරීම නො වේ.

**නිදර්ශන**

(අ) "නඩු විභාගයේ දී, "ඉසෙඩ්" ගේ සාක්ෂිය කොතරම් පරස්පර විරෝධි ද, කිවහොත්, ඔහු මෝඩයකු හෝ වංක තැනැත්තකු හෝ විය යුතු යයි මම සිතමි." යනු "ඒ" කියයි. සාක්ෂිකරුවකු වශයෙන් "ඉසෙඩ්" ගේ හැසිරීමේ දී විද්‍යමාන වන ප්‍රමාණයකට පමණක් "ඉසෙඩ්" ගේ චරිතය සම්බන්ධයෙන් ඔහුගේ අදහස සද්භාවයෙන් කියන ලද්දක් වූවහොත්, "ඒ" මේ ව්‍යතිරේකයට ඇතුළත් වේ.

(ආ) එහෙත්, "ඉසෙඩ්" සත්‍යවාදී පුද්ගලයෙකු නොවන බව මා දන්නා බැවින් නඩු විභාගයේ දී "ඉසෙඩ්" කියන ලද දෙය මම විශ්වාස නොකරමි." යි "ඒ" කිවහොත් ඔහු "ඉසෙඩ්" ගේ චරිතය පිළිබඳ ප්‍රකාශ කරනු ලබන අදහස සාක්ෂිකරුවකු වශයෙන් "ඉසෙඩ්" ගේ හැසිරීම පදනම් කොට නැති බැවින් "ඒ" මේ ව්‍යතිර්කයට ඇතුළත් නො වේ.

ප්‍රසිද්ධ දැක්වීම්හි සුදුසුකම්.

**හය වෙනි ව්‍යතිරේකය.**–යම් ප්‍රසිද්ධ දැක්වීමක කතුවරයා විසින් මහජනයාගේ විනිශ්චයට භාර කරනු ලැබූ එකී දැක්වීමේ සුදුසුකම් සම්බන්ධයෙන් හෝ එකී දැක්වීමෙහි එම කතුවරයාගේ චරිතය විද්‍යමාන වන ප්‍රමාණයට පමණක් ඔහුගේ චරිතය සම්බන්ධයෙන් යම් මතයක් සද්භාවයෙන් ප්‍රකාශ කරනු ලැබීම කීර්ති හානි කිරීම නො වේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

**පැහැදිලි කිරීම**.– මහජනයාගේ විනිශ්චයට යටත් කිරීම හඟවන නිෂ්පාදක ගේ ක්‍රියාවලින් හෝ ප්‍රකාශිත ලෙස, දක්වීමක් මහජනයාගේ විනිශ්චයට භාජන කළ හැකි ය.

**නිදර්ශන**

(අ) පොතක් ප්‍රසිද්ධ කරන තැනැත්තෙක් ඒ පොත මහජනයාගේ විනිශ්චයට ඉදිරිපත් කරයි.

(ආ) ප්‍රසිද්ධියේ දේශනයක් කරන තැනැත්තෙක් ඒ දේශනය මහජනයාගේ විනිශ්චයට ඉදිරිපත් කරයි.

(ඇ) ප්‍රසිද්ධ වේදිකාවක පෙනී සිටින නළුවෙක් හෝ ගායකයෙක් ඔහුගේ රඟ දක්වීම හෝ ගායනය මහජනයාගේ විනිශ්චයට ඉදිරිපත් කරයි.

(ඈ) "ඉසෙඩ්" විසින් ප්‍රසිද්ධ කරනු ලැබූ පොතක් සම්බන්ධයෙන් "ඒ" මෙසේ කියයි. "ඉසෙඩ්" ගේ පොත නිසරු පොතකි. "ඉසෙඩ්" දුර්වල මිනිසකු විය යුතු ය. "ඉසෙඩ්" ගේ පොත අසභ්‍ය ය. "ඉසෙඩ්" අපිරිසිදු හිතක් ඇත්තකු විය යුතු ය." "ඉසෙඩ්" ගේ චරිතය පිළිබඳව "ඒ" විසින් ප්‍රකාශ කරනු ලැබූ අදහස් එකී චරිතය" "ඉසෙඩ්" ගේ පොතෙන් දක්වෙන ප්‍රමාණයට ම පමණක් බැවින් ඔහු එකී අදහස ප්‍රකාශ කරනු ලැබුයේ සද්භාවයෙන් නම්, "ඒ" මේ ව්‍යතිරේකයට ඇතුළත් වේ.

(ඉ) එහෙත් "ඉසෙඩ්" දුර්වල මිනිසකු හා සල්ලාලයකු වන නිසා ඔහුගේ පොත නිසරු වූ ද, අසභ්‍ය වූ ද, පොතක් වීම ගැන මම පුදුම නොවෙමි." යි "ඒ" කිවහොත් "ඉසෙඩ් " ගේ චරිතය පිළිබඳව "ඒ" විසින් ප්‍රකාශ කරනු ලබන අදහස "ඉසෙඩ්" ගේ පොත පදනම් කොට නැති බැවින් "ඒ" මේ ව්‍යතිරේකයට ඇතුලත් නො වේ.

**හත් වෙනි ව්‍යතිරේකය**.–නීතියෙන් පවරනු ලැබූ හෝ යම් තැනැත්තකු සමග කරනු ලැබූ නීත්‍යානුකූල ගිවිසුමකින් පැන නැගුණු බලයක් යම් තැනැත්තකු කෙරෙහි හෝ එ බඳු ගිවිසුමකින් බැඳුණු තැනැත්තා කෙරෙහි හෝ ඇති තැනැත්තකු විසින් එකී නීත්‍යානුකූල බලය සම්බන්ධයෙන් ඉහත කී තැනැත්තාගේ හැසිරීම පිළිබඳව සද්භාවයෙන් දෝෂාරෝපණයක් කරනු ලැබීම කීර්ති හානි කිරීම නො වේ.

යම් තැනැත්තකු කෙරෙහි නීත්‍යානුකූල බලය ඇති තැනැත්තකු විසින් සද්භාවයෙන් දෝෂාරෝපණය කිරීම.

**නිදර්ශනය**

සාක්ෂිකාරයකුගේ හෝ අධිකරණයේ නිලධරයකුගේ හැසිරීම ගැන විනිශ්චයකාරයකු විසින් සද්භාවයෙන් දෝෂාරෝපණය කරනු ලැබීම; තමාගේ නියම යටතේ සිටින තැනැත්තන් හට දෙපාර්තමේන්තුවේ ප්‍රධානියකු විසින් සද්භාවයෙන් දෝෂාරෝපණය කරනු ලැබීම ; අනෙක් දරුවන් ඉදිරියේ මවක හෝ පියකු විසින් සද්භාවයෙන් දරුවකුට දෝෂාරෝපණය කරනු ලැබීම ; දෙමාපියන්ගෙන් බලය පැවරුණු පාඨශාලාචාර්යවරයකු විසින් අනෙක් ශිෂ්‍යයන් ඉදිරියේ එක් ශිෂ්‍යයකුට සද්භාවයෙන් දෝෂාරෝපණය කරනු ලැබීම ; සේවයේ අඩුපාඩුවක් සඳහා ස්වාමියකු විසින් සේවකයකුට සද්භාවයෙන් දෝෂාරෝපණය කරනු ලැබීම සහ මුදල් භාර ගන්නකු වශයෙන් බැංකුවක මුදල් භාර ගන්නකුගේ හැසිරීම ගැන බැංකු කරුවකු විසින් තම බැංකුවෙහි මුදල් භාරගන්නා හට සද්භාවයෙන් දෝෂාරෝපණය කරනු ලැබීම මේ ව්‍යතිරේකයට ඇතුළත් වේ.

**අට වෙනි ව්‍යතිරේකය**.–චෝදනාවට හේතු වූ කරුණ සම්බන්ධයෙන් යම් තැනැත්තකු කෙරෙහි නීත්‍යානුකූල බලයක් ඇති යම් තැනැත්තකු වෙත එකී තැනැත්තාට විරුද්ධව සද්භාවයෙන් චෝදනාවක් ඉදිරිපත් කරනු ලැබීම කීර්ති හානි කිරීම නො වේ.

යම් තැනැත්තකුට විරුද්ධව එකී තැනැත්තා කෙරෙහි නීත්‍යානුකූල බලයක් ඇති තැනැත්තකු වෙත සද්භාවයෙන් චෝදනාවක් ඉදිරිපත් කිරීම.

**නිදර්ශනය**

"ඒ" සද්භාවයෙන් සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරියේ "ඉසෙඩ්" ට චෝදනා කරතහොත් හෝ, සේවකයකු වූ "ඉසෙඩ්" ගේ හැසිරීම පිළිබඳව "ඉසෙඩ්" ගේ ස්වාමියාට "ඒ" සද්භාවයෙන් පැමිණිලි කරතහොත් හෝ ; දරුවකු වූ "ඉසෙඩ්" ගේ හැසිරීම පිළිබඳව "ඉසෙඩ්" ගේ පියාට "ඒ" සද්භාවයෙන් පැමිණිලි කරතහොත් "ඒ" මේ ව්‍යතිරේකයට ඇතුළත් වේ.



https://ezofz.web.lk/
Scanned with CamScanner

තම සම්බන්ධකම් ආරක්ෂා කිරීම සඳහා යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් ආරෝපණය කිරීම.

**නව වෙනි ව්‍යතිරේකය.**–ආරෝපණය කරන තැනැත්තකුගේ සම්බන්ධකම් හෝ වෙනත් තැනැත්තකුගේ සම්බන්ධකම් ආරක්ෂා කිරීම සඳහා හෝ මහජන යහපත සඳහා යම් තැනැත්තකුගේ චරිතය පිළිබඳව සද්භාවයෙන් ආරෝපණය කරන ලද නම් එය කීර්ති හානි කිරීම නොවේ.

## නිදර්ශන

(අ) සාප්පුකාරයකු වූ "ඒ" ඔහුගේ ව්‍යාපාරය පාලනය කරන "බී" ට මෙසේ කියයි. "ඉසෙඩ්" ගේ අවංකභාවය ගැන මගේ කිසි විශ්වාසයක් නොමැති බැවින් ඔහු මුදල් නොගෙවතොත් ඔහුට කිසිවක් නො විකුණනු". "ඒ" විසින් මේ ආරෝපණය කරන ලද්දේ තමාගේ සම්බන්ධකම් ආරක්ෂා කිරීම සඳහා සද්භාවයෙන් නම් ඔහු මේ ව්‍යතිරේකයට ඇතුළත් වේ.

(ආ) තම ප්‍රධාන නිලධාරියාට වාර්තාවක් සපයන රජයේ සේවකයකු වූ "ඒ" "ඉසෙඩ්" ගේ චරිතය පිළිබඳ ආරෝපණයක් කරයි. මෙහි දී එකී ආරෝපණ මහජන යහපත සඳහා "ඒ" විසින් සද්භාවයෙන් කරන ලද්දේ නම් "ඒ" මේ ව්‍යතිරේකයට ඇතුළත් වේ.

දන්වනු ලැබූ තැනැත්තාගේ යහපත සඳහා අදහස් කරනු ලැබූ අනතුරු දැන්වීම.

**දස වෙනි ව්‍යතිරේකය.**–දන්වනු ලැබූ තැනැත්තාගේ හෝ එකී තැනැත්තා සම්බන්ධකමක් දක්වන වෙනත් තැනැත්තකුගේ යහපත සඳහා හෝ මහජන යහපත සඳහා අදහස් කරනු ලැබූ යම් අනතුරු දැන්වීමක් යමකුට විරුද්ධව තවත් තැනැත්තකුට දන්වනු ලැබීම කීර්ති හානි කිරීම නො වේ.

කීර්ති හානි කිරීම ගැන දඬුවම්.

**480.** කීර්ති හානි කිරීම කරන තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් කළ යුතු ය.

කීර්ති හානිය වන බැව් දන්නා වූ යම් දෙයක් මුද්‍රණය කිරීම හෝ කැටයම් කිරීම.

**481.** යම් තැනැත්තකු පිළිබඳ ව යම් දෙයක් කීර්ති හානි විය හැකි බව දනිමින් ම හෝ එසේ වන බවට සැහෙන කරුණු තිබිය දී යමකු එබඳු දෙයක් මුද්‍රණය කරතහොත්, හෝ කැටයම් කරතහොත් ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

කීර්ති හානි කර වන කරුණු ඇතුළත් මුද්‍රිත හෝ කැටයම් කරනු ලැබූ ද්‍රව්‍යයක් විකිණීම.

**482.** කීර්ති හානි කරවන ද්‍රව්‍යයක් ඇතුළත් බව දනිමින් එ ලෙස කීර්ති හානි කරවන කරුණු ඇතුළත් මුද්‍රිත හෝ කැටයම් කරනු ලැබූ ද්‍රව්‍යයක් යමකු විකුණතහොත් හෝ විකිණීමට ඉදිරිපත් කරතහොත් ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

මේ පරිච්ඡේදය යටතේ වැරදිවලට දඬුවම.

**482අ.** මේ පරිච්ඡේදය යටතේ දඬුවම් කල හැකි වරදක් සඳහා දොළොස් මාසයක කාලයක හෝ ඊට වැඩි කාලයක, බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් ලැබූ තැනැත්තකු මේ පරිච්ඡේදය යටතේ දඬුවම් කළ හැකි යම් වරදකට යළිත් වරදකාරයා වුවහොත් ඔහු එකී පසුව සිදුවන සෑම වරදකාරයා කිරීමක දී ම අධිකරණයේ අභිමතය පරිදි අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට හෝ එකී දඬුවම් දෙකට ම යටත් විය යුතු ය.



https://ezofz.web.lk/
Scanned with CamScanner

## XX වෙනි පරිච්ඡේදය

### සාපරාධී, බියගැන්වීම, නින්ද කිරීම හා අප්‍රසන්නතාවය

**483.** තැති ගැන්වීමක් ඇති කරවන අදහසින් හෝ තර්ජනය ක්‍රියාත්මක කරවීම වැළැක්වීමේ මාර්ගයක් වශයෙන් තමා නීත්‍යානුකූලව කිරීමට බැඳී නැති ක්‍රියාවක් කරවීමට හෝ තමා නීත්‍යානුකූලව කිරීමට බලය ඇති යම් ක්‍රියාවක් නොකර හැරවීමට යමකු යම් තැනැත්තකුගේ ශරීරයට හෝ දේපළ වලට හෝ ඔහු සම්බන්ධතාවයක් දක්වන වෙනත් තැනැත්තකුගේ ශරීරයට හෝ කීර්තියට පාඩුවක් කරන බවට තර්ජනය කරතහොත්, ඔහු සාපරාධී බිය ගැන්වීම කරයි. සාපරාධී බිය ගැන්වීම.

**පැහැදිලි කිරීම.**—තර්ජනය කරනු ලැබූ තැනැත්තා සම්බන්ධතාවයක් දක්වන මියගිය තැනැත්තකුගේ කීර්තියට පාඩු කිරීමේ තර්ජනයක් මේ වගන්තියට ඇතුළත් වේ.

**නිදර්ශනය**

සිවිල් නඩුවක් ගෙනයාමෙන් වැළැක්වීමට "බී" පෙලඹවීමේ කාර්යය සඳහා "ඒ" "බී" ගේ ගෙය ගිනි තබන බවට තර්ජනය කරයි. "ඒ" සාපරාධී බිය ගැන්වීමේ වරදට වරදකාරයෙක් වේ.

**484.** යමකු ඕනෑකමින් ම නින්ද කර ඉන් යම් තැනැත්තකු ප්‍රකෝප කරවීමෙන් ඔහු ලවා මහජන සාමය කඩකරවීමේ හෝ වෙනත් වරදක් කරවීමේ අදහසින් හෝ එබන්දක් සිදුවන බවට දනිමින් ම එකී තැනැත්තා ප්‍රකෝපකර වුවහොත්, ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය. සාමය කඩ කරවීමට ප්‍රකෝපකරවීමේ අදහසින් ඕනෑකමින්ම කරනු ලැබූ නින්දාව.

**485.** මහරජතුමන්ගේ නාවික හමුදාවේ හෝ යුද්ධ හමුදාවේ හෝ ගගන හමුදාවේ නිලධරයකු, නැවියකු, සෙබළකු හෝ අහස් නැවියකු, කැරළි ගැස්වීමේ අදහසින් හෝ මහජනයාට බියක් හෝ තැති ගැන්වීමක් ඇති කරවීමේ අදහසින් අසත්‍ය බව තමා දන්නා වූ යම් ප්‍රකාශයක්, දූෂමාන ආරංචියක් හෝ වාර්තාවක් ප්‍රචාරය කරවා හෝ ප්‍රසිද්ධ කරවා එයින් රාජ්‍යයට හෝ මහජන සාමයට විරුද්ධ වරදක් කිරීමට යම් තැනැත්තකු යමකු පෙලඹුවහොත්, ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය. කැරැල්ලක් ඇති කරවීමේ හෝ රජයට විරුද්ධව වරදක් ආදිය කරවීමේ අදහසින් අසත්‍ය වාර්තා ප්‍රචාරය කිරීම.

**486.** සාපරාධී බිය ගැන්වීමේ වරද කරන තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය. සාපරාධී බිය ගැන්වීම ගැන දඬුවම.

තව ද, බිය ගැන්වීම, කරන ලද්දේ මරණය හෝ බරපතල තුවාල කිරීමට නම්, හෝ යම් දේපළක් ගින්නෙන් විනාශ කරවීමට නම්, හෝ මරණයෙන් අවුරුදු හත දක්වා කාලයක බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදක් කිරීමට නම්, හෝ ස්ත්‍රියකට පතිව්‍රතාව කැඩීමක් ආරෝපනය කිරීමට නම්, ඔහුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමෙන් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය. බිය ගැන්වීම කරන ලද්දේ මරණය හෝ බරපතළ තුවාල ආදිය කිරීමට නම්.



https://ezofz.web.lk/
Scanned with CamScanner

නිර්නාමික ලියුමකින් සාපරාධී බිය ගැන්වීම.

**487.** නිර්නාමික ලියුමකින් හෝ බිය ගැන්වීම කරන්නා වූ තැනැත්තාගේ නම හෝ පදිංචි ස්ථානය සැඟවීමට පරිස්සම් වී සාපරාධී බිය ගැන්වීමේ වරද කරන්නා වූ තැනැත්තකුට එකී වරදට ඉහත දක්වුනු වගන්තියෙන් සඳහන් දඬුවමට අතිරේකව අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය.

### නිදර්ශනය

"බී" තර්ජනය කරමින් "ඒ" නිර්නාමික ලියුමක් ලියා එකී ලියුම "සී" "බී" ට පෙන්වනු ඇත යන බලාපොරොත්තුවෙන් හා විශ්වාසයෙන් "බී" සමග ජීවත්වන "සී" ට යවයි. මේ වගන්තිය යටතේ "ඒ" වරදකාරයෙක් වේ.

ප්‍රසිද්ධ ස්ථානයක මත් වූ තැනැත්තකුගේ විෂමාචාරය.

**488.** යමකු මත් ව සිටිය දී ප්‍රසිද්ධ ස්ථානයකට හෝ තමාට ඇතුළුවීමට බලය නැති වෙන ස්ථානයකට ඇතුළුව එහි දී යම් තැනැත්තකුට අප්‍රසන්නතාවයක් වන ආකාරයට හැසුරුණහොත් ඔහුට මාසය දක්වා කාලයක, ලිහිල් බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියය දක්වා දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

## XXI වෙනි පරිච්ඡේදය

### නීති විරෝධී දිවුරුම්

වරදක් කිරීම සඳහා දිවුරුමක් දෙවීම හෝ ගැනීම හෝ දෙවීමට හෝ ගැනීමට අනුබල දීම.

**489.** දිවුරුම කරන්නා වූ තැනැත්තා යම් වරදක් කිරීමට හෝ එබඳු වරදක් කිරීමට අනුබල දීමට බැඳ ගැනීමේ බලාපොරොත්තුවෙන් හෝ අදහසින් යමකු යම් දිවුරුමක් හෝ දිවුරුමක ස්වභාවය ඇති වෙනත් බැඳුමක් කරවතොත්, හෝ කරවීම සිදු කරවතොත් හෝ එබන්දක් කරවීමට හෝ ගැනීමට අනුබල දෙතොත් හෝ නැතහොත් එබඳු දිවුරුමක්, ගිවිසුමක් හෝ බැඳුමක් දිවුරවතොත් හෝ ඇති කරවතොත් ඉහත කී දිවුරුම, ගිවිසුම හෝ බැඳුම සම්බන්ධයෙන් වූ වරද මරණයෙන් හෝ අවුරුදු විස්සක කාලයක, බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් නම්, ඔහුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය. තව ද, එකී වරද අවුරුදු විස්සකට අඩු වූ කාලයක, බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් නම් එකී දිවුරුම, ගිවිසුම හෝ බැඳුම සම්බන්ධයෙන් වූ වරදකට දිය හැකි දඬුවමෙන් ඔහුට දඬුවම් කළ යුතු ය.

## XXII වෙනි පරිච්ඡේදය

### වරදවල් කිරීමට තැත් කිරීම

බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදවල් කිරීමට තැත් කිරීම ගැන දඬුවම.

**490.** මේ සංග්‍රහය ප්‍රකාර බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් කිරීමට හෝ කරවීමට තැත් කරන්නා වූ ද, එකී තැත් කිරීමේ දී, එම වරද කිරීම පිළිබඳ ව යම් ක්‍රියාවක් කරන්නා වූ ද, තැනැත්තකුට ඒ තැත් කිරීම සඳහා මේ සංග්‍රහයෙහි දී, ප්‍රකාශිත ව දඬුවමක් සලස්වා නැති අවස්ථාවක දී, එකී වරද සඳහා නියම කොට



https://ezofz.web.lk/
Scanned with CamScanner

ඇති දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමේ වැඩි ම කාල සීමාවෙන් දෙකෙන් කොටස දක්වා කාලයක, බන්ධනාගාරගත කිරීමකින් හෝ එකී වරද සඳහා නියමිත දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.

### නිදර්ශන

(අ) පෙට්ටියක් කඩා විවෘත කොට මැණික් කීපයක් සොරකම් කිරීමට "ඒ" තැත් කරයි. එසේ පෙට්ටිය විවෘත කිරීමෙන් පසු, එහි මැණික් නැති බව ඔහු දැන ගනියි. ඔහු සොරකම් කිරීම සඳහා යම් ක්‍රියාවක් කොට ඇත්තේ ය. ඒ නිසා මේ වගන්තිය යටතේ ඔහු වරදකාරයෙක් වේ.

(ආ) "ඉසෙඩ්" ගේ සාක්කුවට "ඒ" ගේ අත දැමීමෙන් ගැට කැපීමට "ඒ" තැත් කරයි. "ඉසෙඩ්" ගේ සාක්කුවේ කිසිවක් නො තිබීම නිසා "ඒ" ගේ තැත නිෂ්ඵල වෙයි. මේ වගන්තිය යටතේ "ඒ" වරදකාරයෙක් වේ.

Scanned with CamScanner
https://ezofz.web.lk/

# දණ්ඩ නීති සංග්‍රහය

## 19 වැනි අධිකාරය

පටුන

| සංශෝධන පනත | | 19 වැනි අධිකාරයේ ඇති පිටු අංකය | සංශෝධිත වගන්තිය |
|---|---|---|---|
| 01 | 1991 අංක 32 | 01 | 19 වැනි අධිකාරයේ 2 වන වගන්තිය |
| 02 | 1995 අංක 22 | 75 | 286අ. අලුත් වගන්තිය |
| | | 83 | 308අ. අලුත් වගන්තිය |
| | | 84 | 311 වගන්තිය ප්‍රතියෝජනය කිරීම |
| | | 93 | 345 වගන්තිය ප්‍රතියෝජනය කිරීම |
| | | 94 | 350 වගන්තිය ප්‍රතියෝජනය කිරීම |
| | | 96 | 360අ. වගන්තිය ප්‍රතියෝජනය කිරීම |
| | | 96 | 360ආ. 360ඇ. අලුත් වගන්ති ඇතුළත් කිරීම |
| | | 96 | 361 වගන්තිය ඉවත් කිරීම |
| | | 97 | 362 වගන්තිය ඉවත් කිරීම |
| | | 97 | 363 ප්‍රතියෝජනය කිරීම |
| | | 98 | 364 ප්‍රතියෝජනය කිරීම |
| | | | 364අ. ප්‍රතියෝජනය කිරීම |
| | | 99 | 365 වගන්තිය සංශෝධනය කිරීම |
| | | | 365අ. වගන්තිය ප්‍රතියෝජනය කිරීම |
| | | | 365ආ. වගන්තිය ඇතුළත් කිරීම |
| | | | 365ඇ. වගන්තිය ඇතුළත් කිරීම |
| 03 | 1998 අංක 29 | 75, 76 | 19 වැනි පරිච්ඡේදයේ 286අ. සංශෝධනය කිරීම |
| | | | 288, 288අ., 288ආ. අලුත් වගන්ති ඇතුළත් කිරීම |
| | | 82 | 302 වැනි වගන්තිය ඉවත් කිරීම |
| | | 96, 97 | 360අ., 363 වැනි වගන්ති සංශෝධනය කිරීම |
| | | 99 | 365ආ. සංශෝධනය කිරීම |
| 04 | 2002 අංක 12 | 31, 131 | 118 වගන්තිය ඉවත් කිරීම<br>XIX පරිච්ඡේදය ඉවත් කිරීම |
| 05 | 2006 අංක 16 | 01, 75, 83 | ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වැනි වගන්තිය සංශෝධනය කිරීම |
| | | | ප්‍රධාන ප්‍රඥප්තියට 286අ. සහ 286ඇ. අලුත් වගන්ති ඇතුළත් කිරීම |
| | | | ප්‍රධාන ප්‍රඥප්තියේ 308අ.වගන්තිය සංශෝධනය කිරීම |



https://ezofz.web.lk/
Scanned with CamScanner

| | |
|---|---|
| 93 | ප්‍රධාන ප්‍රඥප්තියේ 345 වගන්තිය සංශෝධනය කිරීම |
| 94 | ප්‍රධාන ප්‍රඥප්තියේ 350 වගන්තිය ප්‍රතියෝජනය කිරීම |
| 95 | ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 358අ. වගන්තිය ඇතුළත් කිරීම |
| 96 | ප්‍රධාන ප්‍රඥප්තියේ 360ඇ. වගන්තිය ප්‍රතියෝජනය කිරීම |
| 96 | ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 360ඈ. සහ 360ඉ. වගන්ති ඇතුළත් කිරීම |
| 98, 99 | 364, 365 වගන්ති සංශෝධනය කිරීම |
| | 365අ. සහ 365ආ. වගන්ති සංශෝධනය කිරී |

https://ezofz.web.lk/
Scanned with CamScanner

https://ezofz.web.lk/
Scanned with CamScanner